# නොයෙල් නඩේසන්

පරිවර්තනය

සාමිනාදන් විමල්

**පෙරවදන**

මම ඉන්දියාවෙහි වාසය කළ කාලයෙහි (1984-87) මා ලද අත්දැකීම් සහ අදහස් මම මෙහිදී ලිවීමෙහි අරමුණ වන්නේ මාව පුම්බා පෙන්වීම හෝ නැතහොත් අනෙක් අයගේ වැරැදි පෙන්වාදීම හෝ නොවෙයි. එමෙන්ම මගේ දැක්ම තමයි සත්‍යයැයි තර්ක කිරීම ද නොවෙයි. මම කියන දේවල් වලින් කිසිවෙකුටවත් කිසිම ලාභයක් නැති බව ද මම දනිමි. මම සමහර සිදුවීම් දුටුවෙමි. සමහර පුද්ගලයන්ව හමුවුනෙමි. එම පුද්ගලයන්ව එම සිදුවීම් මම දුටුවේ කෙලෙසින් ද යන මගේ දැක්ම මෙහි අන්තර්ගතය.

1983න් පසුව ආයුධ සන්නද්ධ අරගලයට සහයෝගය නොදුන් දෙමළ ජනතාව සංඛ්‍යාවෙන් අතේ ඇඟිලිවලින් ගණන් කළ හැකි තරමිය. උතුර, නැගෙනහිර, කඳුකරය පමණක් නොව නැගෙනහිර පළාතේ මුස්ලිම් තරුණයන් බොහෝ දෙනෙක් පවා සටන්කාමී සංවිධානවල උන්හ. නමුත් සංවිධාන අතර සහෝදර ඝාතණ පටන් ගත් පසුව ලංකාවෙහි හමුදාවටත් වඩා අපේ අයම අපි සතුරන් වශයෙන් දැක්කෙමු යැයි පැවසීමට මම කිසිසේත්ම නොපැකිළෙමි. ලංකාවෙහි රජය තම සතුරා ලෙසින් සලකා ඒ වනවිටත් සටන් කරමින් සිටි අයට අපේ ජාතියෙන්ම සතුරා නිර්මාණය වෙද්දී මානසිකව කෝපය සහෝදර අය වෙත වේගයෙන් හැරෙයි. එය මිනිස් ස්වභාවයයි.

එයට පසුව පැතිරුණු ආයුධ දේශපාලන රෝගය තව තවත් දෙමළ අයව ඝාතණය කරයි යන්න පිළිබඳව පැහැදිළි අවබෝධයක් සහිතව උන්නෙමි. දහ දෙනෙකුගේ ජීවිත අහිමිව දාහක පිරිසකට යහපතක් සිදුවන්නේ නම් දත්මිටි කාගෙන ඉවසාගෙන සිටින්නට හැකිව තිබුණි. නමුත් ලක්ෂ ගණනක් මළ සිරුරු බවට පත්ව දහ දෙනෙකුට යහපත සැලසෙන දෙයක් බවට අරගලය වෙනස් වී ඇති බව දැනෙන්නට වෙද්දී කෙසේ හෝ මෙම අරගලය නතරවිය යුතුය යන්න පිළිබඳව කැමැති වුනෙමි.

මම පශු වෛද්‍ය අධ්‍යනයෙන් ඉගෙනගත් පාඩමක් නම් වසංගත රෝගයක් ඇතිවුවහොත් රෝගය පවතින ස්ථානය හුදකලා කර රෝගයට භාජනය වූ සතුන්ව විනාශ කරන්නෙමු. රෝගය නොවැළඳුණු සතුන්ව එන්නත් කර ආරක්ෂා කරන්නෙමු. මෙම වෛද්‍ය ක්‍රමය අද කාලයේ මිනිසුන් විෂයෙහි භාවිතා කළ නොහැකි බව අන් අය පැවසිය හැකිය. නමුත් වර්තමානයෙහි විනාශයන්ගෙන් ඉගැන්වෙන පාඩම එය බව වෙනස් මත දරන්නන්ට පවා ප්‍රතික්ෂේප කළ නොහැකිය.

1987 වසරෙහි ආරම්භක සමයෙහිදී ඊළම යනු මෘත දේහයක් ලෙසින් මට පෙනෙන්නට විය. එය දැකිය හැකි ස්ථානයක මම සිටියෙමි. එම මෘත දේහය පිටතට රැගෙන ගොස් වළලන්නේ කවුද? යන්න එයට පසුව වූ ශත වර්ෂ කාලක කාලයෙහි මගේ ප්‍රශ්නය විය. නිර්මාණය කළ ඉන්දියාව විසින් වත් එය සිදු කළේ නම් සතුටු වීමි.

විමුක්ති කොටි පමණක් නොව අනෙක් අය ද වැරැදි කළේය යන්න මම පිළිගනිමි. මෙම පොතෙහි ඔවුන්ව ද විවේචනයට ලක් කර ලියා ඇත්තෙමි. ඔවුන්ව විනාශ කළ පසුව සමස්ත ඊළම් ජනතාවට නායකත්වය දීමේ අවස්ථාවක් විමුක්ති කොටි සංවිධානයට ඉන්දු - ලංකා ගිවිසුම මගින් ද පසුව ලංකා රජයෙන් ද අවස්ථා කීපයකදීම හිමිවිය. තම වැරැදි හදාගෙන දෙමළ ජනතාවට සාධාරණ විසඳුමක් ලබා ගැනීම සඳහා කිසිවක් ඔවුන් අවසානය දක්වා සිදු කළේ නැත. අනෙක් අයව විනාශ කර කිසිම යහපතක් ළඟා කර නොදී විමුක්ති කොටි විනාශයට පත් වූ අවස්ථාවෙහි ඔවුන් කළ අධර්මය දෙගුණ විය.

පාපය වෙනුවෙන් ලැබෙන වැටුප මරණයයි යැයි කියන්නා සේ ඊළම සඳහා වන සාධාරණ අරගලය විනාශ කිරීමට දායකවූවෝ බොහෝ සිටියත් ප්‍රධාන අපරාධකරුවා ලෙසින් දඬුවම් ලැබිය යුත්තේ ප්‍රභාකරන් වන නිසා මම එයට බොහෝ කාලයක් කල් බලමින් උන්නෙමි.

වසර 22ක් ඒ වෙනුවෙන් කල් ගත කිරීමට සිදුවිය.

1977 වසරෙහිදී දෙමළ ජනතාව විසින් දියත් කළ නිරායුධ දේශපාලනය ආයුධ සමඟින් විනාශයෙන් අහවරව ඇත යනුවෙන් ඉතිහාසය පවසයි. අපි එය අත්දැක ඇත්තෙමු. නමුත් දැන් එම පිළිල සැඳුණු ගසෙන් නව ශාඛා ඇති කර පළදාව නෙළන්නට උත්සහ දරන නාට්‍ය රංග ගත වෙයි. මෙය එක්කෙනෙක් දෙන්නෙක් නොව බොහෝ දෙනෙක් සිදු කරති. මෙම කටයුත්ත පෙන්වා දෙන්නේ අපි ඉතිහාසයෙන් පාඩම් ඉගෙන නොගත්තෙමු යන්නයි.

වසර තිහක් තිස්සේ විනාශයට මුහුණ දුන් සමාජයක අයෙක් ලෙසින් මෙය ලියද්දී සිතෙහි සතුටක් නැත. මම උපන් ජාතියට සහ අපේ නායකයන්ට දොස් නැඟීම පහසු දෙයක් නොවෙයි. එය තම පවුල කෙරෙහි දොස් කියනවා වැනිය. නමුත් අනාගත දෙමළ පරම්පරාව ගැන සිතා මෙය කළ යුතුව ඇත. පරිහානියන් වසං කළ නොහැකිය. වෙනස්වීම්වලට මුහුණ දිය යුතුය,ක්‍රියාත්මක කළ යුතුය. විමුක්ති කොටින්ගේ දොස් කියන අපි දැන් සිටින නායකයන්ගේ දොස් කියන දිනය වැඩි ඈතක නොවෙයි.

මෙම පොතේ අනෙක් සංවිධානවලට දොස් පවරන මම ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ කෙරෙහි මෘදු දෘෂ්ඨියකින් බලන්නෙමි. එයට හේතු දෙකක් ඇත. එම සංවිධානය සහ දෙමළ ජනතා විමුක්ති සංවිධානය කිසිම කලෙක සිංහල ජනතාව පිළිබඳ ජාති ද්වේෂය සහිත අදහස් ඉදිරිපත් කළේ නැත. හැකි පමණින් සිංහල වාමාංශිකයන් සමඟ එක්ව කටයුතු කළහ. දෙවන හේතුව නම් දෙමළ ජනතාවගේ තිස් වසරක අරගලයෙහි ලැබුණු එකම යහපත ඉන්දු - ලංකා ගිවිසුමවීමයි. එම ගිවිසුමේ මම දකින වැදගත්ම දෙය නම් ප්‍රජා අයිතිය අහිමිව සිටි කඳුකරයෙහි දෙමළ විශාල පිරිසකට ප්‍රජා අයිතිය හිමිවීමයි. කඳුකරයෙහි දෙමළ ජනතාවගේ මෙම ප්‍රශ්නය පිළිබඳව මහත් උනන්දුවක් දැක්වූවේ ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ සහ ඊරෝශ් සංවිධානයයි. එහෙයින් මෙම සංවිධාන තුන වෙනස් ප්‍රමාණයන්ගෙන් මගේ කැමැත්ත දිනාගෙන තිබුණි.

තම අභ්‍යන්තර ගැටුම් විසඳා ගැනීම සඳහා අවසානය දක්වාම ප්‍රචණ්ඩත්වය භාවිතා නොකළ හෙයින් 1987ට පෙර ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ ඔවුන්ගේ වැරැදි නොගැලපෙන න්‍යායන්ට බැහැරව මම අවධානය යොමු කරමි. දේශපාලනයෙහිදී ඔවුන් කොටස් කීපයක්ව වෙන්ව කටයුතු කළත් ඔවුන්ගේ මෙම ස්වභාවයම දේශපාලනයෙහිදී ඔවුන්ව ස්ථාවරව සිටීමට සැළැස්වූවේය.

මේ අතර විමුක්ති කොටි සංවිධානය සහ ටෙලෝ සංවිධානය තනිකර මිලිටරි සංවිධානයන්ය. ඔවුන්ගෙන් කිසිම කලෙක ජනතාවට යහපතක් නොවෙයි යන්න මගේ අදහසයි. ඇත්තෙන්ම විමුක්ති කොටි සංවිධානයට ටෙලෝ සංවිධානයෙහි අයව ඝාතණය නොකර මුළුමනින්ම අන්තර්ග්‍රහණය කරගන්නට තිබුණා යැයි මම සිතමි.

සැම සංවිධානයකම මට මිතුරෝ උන්හ. ඔවුන්ගේ මරණයන් මට බලපෑවේය. සැම සංවිධානයකම සිටියේ අපේ සමාජයේ ඉහළ අගයක් සහිත අයයි. නමුත් ඔවුන්ව තේ දල්ලක් සේ ගතවූ තිස් වසරක යුද්ධයෙහිදි කඩා විසි කර දැමුණි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ව මම මෙම අවස්ථාවෙහි අනුස්මරණය කරන අතරෙහි මෙම දකුණු ඉන්දීය මතකයන් මාව දෙමළ වෛද්‍ය සංවිධානයට යැවූ තවමත් මම සහෝදරයා යැයි කියා අමතන ඩග්ලස් දේවානන්දාට පිළිගන්වමි.

**නොයෙල් නඩේසන්**
**uthayam12@gmail.com**
FB: **Noel Nadesan**
**https://noelnadesan.com/**

## අසූ හතරෙහි පිටුවහල

එක් දහස් නවසිය අසූ හතරෙ අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිදු කෙරුණු මගේ මෙම ගමන පොට්ට පූසෙක් කරුවලේ පනින්නාක් මෙන් විය. රට හැර පිටව යන බොහෝ දෙනෙක් වෙළෙඳා ව්‍යාපාර, සංචාරය යන හේතූන් මත වෙන්ව යද්දී එම ගමන හැඟීම්බර නොමැත. නමුත් මගේ මෙම පිටව යෑම හේතුවෙන් මගේ රට, මිනිස්සු, ඥාතියෝ වශයෙන් වූ බැඳුම් කැඩී යයි. අට මස් ගැබිනියකව සිටින බිරිඳත් තවම දෑවුරුද්ද සපුරා නැති පුතාත් අත්හැර පිටස්තර දේශයකට යන්නේ කුමටද? යැයි නොදැන මම මගේ ගමන ආරම්භ කර ඇත්තෙමි.

තලෙමන්නාරමෙහි සිට රාමේශ්වරන් කරා යන නැවෙහි උඩ තට්ටුවෙහි මා සමඟ තවත් කීප දෙනෙක් උන්හ. ඔවුන් රැගෙනවිත් ඇති ලට්ට ලොට්ට ඔවුන් කඳුකරයෙහි සිට පැමිණෙන්නන් බවට හඳුන්වා දීමට සමත් විය.

ඈසට පෙනෙන මානයෙන් වූ මන්නාරම් මුහුදු වෙරළ මුළුමනින්ම නොපෙනී යන තෙක් මම දිගටම දෑස් යොමා ගෙන සිටියෙමි. කැළඹුණු දෙනෙතින් ද බර වුණු හදවතින් ද යුතුව මම මගේ මතකයන් වමාරන්නට වූවෙමි. අනෙක් පසින් දෑසට පෙනෙන මානයේ පෝක් සමුද්‍ර සන්ධිය නිල් පැහැයෙන් දිස් වෙයි.

කිසිම කෙනෙකුට රටහැර යෑම යනු සරළ දෙයක් නොවෙයි. අහල පහළ අය සහ මිත්‍රාදීහු වැනි බාහිර කාරණා ඇතුළු සියල්ලක් පිළිබඳවම එපාවීමක් ඇති විය යුතුය. නමුත් මම සිටින රට පිළිකුල් කිරීමක් මගේ ගමනට අදාළ නොවෙයි. ඇරත් මම ආණ්ඩුවේ රස්සාවක් ඇති කෙනෙක්. බිරිඳගේ රැකියා ස්ථානය ද නිවසට ආසන්නයෙහිමය. දරුවෝ බලා ගැනීමට මාමයි නැන්දයි සිටිති.  සියලු පහසුකම් සහිතව සිටි මට මගේ මෙම ඉන්දීය ගමන මටවත් නොතේරෙන මහත් ප්‍රහේලිකාවක් විය. මටවත් නොතේරෙන විට අම්මාට හෝ සහෝදරයන්ට හෝ නැතහොත් බිරිඳ, මාමා නැන්දා යන අයට හෝ කෙසේ නම් තේරෙන්නද?

1983 දී වූ ජාතිවාදි කෝලහාලයේදි මැදවච්චියේ වැඩ කර එයට පසුව මාස තුනක් කිසිම රැකියාවක් නොකර සිටියෙමි. 1983 වසරෙහි නොවැම්බර් මාසයෙහිදී රාගල ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා ලෙසින් රාජකාරිය ආරම්භ කළෙමි. රාගලට යෑම මට අලුත් අත්දැකීමක් විය. වියළි යාපනයේ ඉපිද හැදුණු වැඩුණ මට ශීත පළාත මහත් වෙනසක් විය. මම එයට සූදානම්ව නොගිය හෙයින් පළමු දවස් දෙකේ ශීතල හේතුවෙන් නින්ද මා වෙත පැමිණියේ නැත. පසුව මම නුවරඑළියෙහි උන් මගේ මිතුරාගේ නිළ නිවෙසට ගොස් නතර වුනෙමි. එයට පසුව ශිතල පළවා හරින පොරෝනා සහ කම්බිළි සමඟ රාගලට පැමිණියෙමි.

රාගල මගේ  සිත් ගත් කරුණක් වූවේ 1983 ජූලි කෝලහාලයෙහිදි දෙමළ කඩවලට කිසිම හානියක් සිදු නොවීම නිසයි. එයට හේතුව එම ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රි සහ නුවර එළිය දිස්ත්‍රික් ඇමැති රේණුකා හේරත් මහත්මිය කෝලාහලය සිදු වූ දින තුන පුරාම දිවා රාත්‍රි තම සැමියා සමඟ ජීප් රථයෙන් සංචාරය කරමින් කුරිරු බලවේග විසින් කඩවල් ගිනි තැබීම වැළැක්වීමයි. ඒ වනවිට රේණුකා හේරත්ගේ වයස අවුරුදු තිහක් පමණ ඇති. මේ අතර එවක ඇමැතිවරයෙකුව සිටි රාජතුරෙරෙගේ දියණිය තවත් කිලෝ මීටර් කීපයකට එහායින් පිහිටි නුවරඑළියේ වෛද්‍යවරියක් ලෙසින් කටයුතු කළාය. ඇයව හෙළිකොප්ටරයක නංවා එවක වැවිළි කර්මාන්ත ඇමැති ගාමිණි දිසානායක මහතා කැඳවා ගෙන ගිය පසුව නුවරඑළියේ කඩ වීදිවලට ගිනි තැබීම සිදු කෙරුණි. එයට පවා හේතුවූවේ ජාතිවාදය නොවෙයි.

එකල ඇමැතිව සිටි තොණ්ඩමාන් මහතා සහ ගාමිණි දිසානායක මහතා අතර වෘත්තීය සමිති තරඟය එයට හේතුව විය. දෙදෙනාම වෘත්තීය සමිති දෙකක නායකත්වය දැරූ හෙයින් පැමිණි ප්‍රතිඵලයකි එය. ජාති තුනෙහිම මිනිසුන්ට අවශ්‍ය වූවේ නිවී සැනසිල්ලේ ජීවත්වීමයි.

1984 වසරෙහි මාර්තු මාසයෙහි රාගල සූරියකාන්ති තේ වත්තේ සිදුවූ සිදුවීමක් මගේ ඉන්දීය ගමනට ක්ෂණික හේතුව විය.

මගේ පශු වෛද්‍ය කාර්යාලය සූරියකාන්ති තේ වත්තේ කම්කරු නිවාසවලට මදක් ඈතින් පිහිටා තිබුණි. මගෙ නවාතැන වූවේ එම ගොඩනැගිල්ලේ කාමරයකි. කඳුකරයෙහි උදෑසන ඉතාමත් රම්‍යය. තෙත් වලාකුළු පොරවා ගත් රාත්‍රියෙහි තෙතබරිත වූ තේ පඳුරු ඈසට අසුවන මානය තෙක් පැතිර පවතියි. අතරින් පතර කම්කරු නිවාසත් අනෙකුත් නිළධාරි නිවාසත් කොළ පැහැ පොරෝණයක පුල්ලි සේ දිස්වෙයි. ඈත කඳුවල දැවටී ඇති කම්මැලි වළාකුළු සෙමින් බැස යනු දැකීම නෙතට සුවදායකය. තේ කර්මාන්තශාලාවෙහි අඹරන

තේ කොළවල සුවඳ සුළඟ සමග මුසුව එන එම උදෑසන මඳක් වෙලා රස විඳීමෙන් පසුව මම මගේ වැඩ කටයුතු ආරම්භ කරමි.

උදෑසන එළිය වැටුණු අවස්ථාවෙහිදි නැගිට බැලුවිට කම්කරු නිවාසවල වහලෙන් නැගෙන දුම් දිස්වෙයි. නමුත් මම එදින දුටුවේ ඔවුන්ගේ ඔවුන්ගේ දෛනික ආහාර පිසීමේ කාර්‍යය හේතුවෙන් මතුවෙන දුම නොවෙයි.

බොහෝ ලැයිම් කාමරවල වහලය දක්නට ලැබුණේ නැත. සිදු ඇති දෙය දැන ගැනීමේ කුහුලෙන් යුතුව මම එම වත්තේ වාසය කරන මගේ උදව්කරුවෙකු වූ රත්තිනම්ගේ පැමිණීම බලාපොරොත්තුව සිටියෙමි.

රත්තිනම් කැළඹුණු මුහුණින් යුතුව ටික මොහොතකින් පැමිණියේය.

"රෑ සිද්ද වුනදේ ආරංචි වුනාද මහත්යා?" යැයි ඔහු මගෙන් ඇසුවේය.

"නෑනේ".

"රෑ මැද්දේ  සිංහල අය ගමේ ඉඳන් ඇවිල්ලා ගිනි තිබ්බනේ. වත්තේ වැඩ කරන මිනිස්සු දරු පවුල් පිටින් තේ පඳුරු අස්සෙයි ගල් ගුහා අස්සෙයි හැංගිලා දැන් තමයි එළියට එන්නේ".

"මොකක්ද ප්‍රශ්නෙ?"

"වත්තෙ වැඩ කරන එක්කෙනෙක් පුංචි මහත්තයාට පිහියෙන් ඇනලා. පුංචි මහත්තයා ගිහිං ගමේ සිංහල අයට කිව්වට පස්සේ තමයි ලැයිම් කාමරවලට ගිනි තියල තියෙන්නේ".

වත්තේ පාලකයා කටයුතු කරන්නා සුපිරින්ටන් වන අතර ඔහුගේ සහායකයා පුංචි මහත්තයා යනුවෙන් හැඳින්වෙයි. තව දුරටත් ඔහුගෙන් විමසූ අවස්ථාවෙහිදි මෙම පුංචි මහත්තයා එම කම්කරුවාගේ බිරිඳට ලිංගික හිරිහැරයක් සිදු කළ හෙයින් කම්කරුවා පුංචි මහත්තයාට පිහියෙන් ඇන ඇත.

දෙමළ කම්කරුවෝ රාත්‍රියෙහි අඹු දරුවන් සමග කඳුවල සැඟව උන්හ. රාගල පශු වෛද්‍ය රෝහල පිහිටා තිබුණේ මෙම තේ වත්ත මැද්දේය. ඔවුහු තේ දළු නෙළීමත් ගවයන් ඇතිකර කිරි අළෙවි කිරීමත් තම ජීවනෝපාය කරගෙන සිටියහ. ඔවුහු කිරි නිපදවන්නන්ගේ සමූපකාර සංගමයෙහි සාමාජිකයෝ වූහ. ග්‍රාමීය කිරි නිපදවන්නන්ගේ සංගමයෙහි සභාපති ලෙසින් මම කටයුතු කළ හෙයින් මේ අය සමග මට හොඳ සම්බන්ධයක් තිබුණි. එම සම්බන්ධතාවය නිසාම මම රත්තිනම් සමග ගොස් කම්කරුවන් සමග කථාබස් කළෙමි. ඔවුන්ගේ දුක් ගැනවිළිවලට සවන් දුන් අවස්ථාවෙහි ඔවුන් පෙළෙන බිය අවබෝධ කරගත හැකි විය.

ලංකාවෙහි කුඩා දබරයක් ජාතිවාදි කෝලාහලයක් බවට පත් විය. සූරියකාන්ති තේ වත්ත වටා පිහිටි ගම්වල වාසය කරන්නේ සිංහල ජනයාය. දෙමළ කම්කරුවෙක් පුංචි මහත්තයා වූ සිංහලයාට පිහියෙන් ඇන්නේය යනුවෙන් පුංචි මහත්තයා ගොස් ගම්වැසියන් වෙත ගොස් පැවසූ හෙයින් දෙමළෙක් සිංහලෙකුට පිහියෙන් ඇනලා යන පුවත පැතිරිණ.

"පර දෙමළ පළයවු" යැයි පවසමින් එදින රාත්‍රියෙහි වත්තේ ලැයිම් කාමරවලට සිංහල ගම්වැසියෝ ගිනි තැබූහ.

මම ගොස් දෙමළ කම්කරුවන් සමග කථාබස් කළ හෙයින් සමහරු මාව කොටියෙක් ලෙසින් හැඳින්වූහ.

මෙම කොටියා යන වචනය බොහෝ දෙනෙක් දෙමළ අයට එරෙහිව භාවිත කළහ. මම ඒ පිළිබඳව ආරම්භයේදි තැකීමක් නොකළෙමි. නමුත් පසුව මාව නුවරඑළිය පොලිස් ස්ථානයට කැඳවා ප්‍රශ්න කිරීමට නියමිතය යන්න මා සමග වැඩ කළ සිංහල අයෙකු මාර්ගයෙන් මට සැළ විය.

අප්‍රේල් අලුත් අවුරුද්දට යාපනයට යෑමට සිතා සිටි මම කොළඹට ගොස් ඉන්දීය වීසා ලබා ගත්තෙමි.

මා රටෙන් පිටව යෑමට රුකුල් දුන්නේ සූරියකාන්ති තේ වත්තේ ඇති වූ සිද්ධිය පමණක් ද?

ඇත්තෙන්ම පොලිසියෙන් මාව ප්‍රශ්න කළත් එයින් මට ප්‍රශ්නයක් ඇති නොවෙන්නට ඉඩ තිබුණි.

අලුත් අවුරුද්දට නිවෙසට යෑමට උත්සහ කළ අවස්ථාවේ මගේ ඉහළ නිළධාරියා මෙම ප්‍රදේශයේ පශු වෛද්‍යවරු බොහෝදෙනෙක් නිවාඩු ලබා ඇති හෙයින් මගේ නිවාඩුව අනුමත කළේ නැත. මම මහනුවර සිටින ඉහළ නිළධාරියාට දැනුම් දී නිවාඩු ලබා ගන්නා බව පැවසීම ඔහුගේ කෝපය ඇවිස්සීමට හේතු විය.

මෙම කරුණු පමණක් නොවෙයි.

නිශ්චය ලෙසින්ම මෙයට වඩා හේතු තිබිය යුතුය.

ඉන්දියාවේදී දෙමළ තරුණයන්ට ඉන්දීය ආණ්ඩුව විසින් පුහුණුව ලබා දෙන බව බොහෝ පුවත්පත්වල පළ වී තිබුණි.

ලංකාවෙහි දකුණු පළාතේ රැකියාව කරගෙන ජීවත් වී අනාගතයේදී මම ඉතිහාසයෙහි වැරැදි ස්ථානයක ස්ථානගත වෙයිදෝ යන බිය මා තුළ ඇති විය.

එසේවුවත් මම ඒ තරම් දේශපාලනයෙහි ක්‍රියාත්මකවූවෙක් නොවෙමි. යාපනය හින්දු විදුහලෙහි අධ්‍යාපනය ලබා පළමු වතාවෙම විශ්ව විද්‍යාලයට තේරී පත්වුණු මගේ මගේ ජීවිතය ක්‍රමවත්ව ඉදිරිය කරා යමින් තිබුණි.

ලංකාවෙහි ජාතිමය වශයෙන් බෙදීමක් ඇතිවීම ද මට එකඟ විය හැකි කරුණක් නොවෙයි. මට සිංහල සහ මුස්ලිම් මිතුරෝ බොහෝ දෙනෙක් වූහ. ජාතිය, ආගම යනාදිය අප විසින් අපට දමා ගත් පළිහක් යන්න මම තේරුම් ගෙන උන්නෙමි. නමුත් එවක මගේ සම වයසේ තරුණයන්ට දේශපාලන සායම් තැවරීමට ලක් වීමෙන් ගැළවීම අපහසු දෙයක් විය. හෝලි උත්සව දවසේදී එම උත්සවය සමරන්නේ නැති අය පවා හෝලි සායම් තවරා ගන්නා සේ දේශපාලන සුවඳ මාව වෙළා ගත්තේය.

මම දොළහ පන්තියේදී ඉගෙනගනිමින් සිටිද්දී සිවුවන ලෝක දෙමළ පර්යේෂණ සමුළුව යාපනයෙහි පැවැත්විණි. එහිදී ඇති වූ සිදුවීම් මගේ මනසෙහි අමු ගසකට ගැසූ ඇණ මෙන් පැළපැදියම් විය.

එකොළොස් දෙනෙක් මරණයට පත් වූ දිනයට පෙර දින රාත්‍රියේ (1971.01.02) තිදෙනෙක් මරණයට පත් වූහ. මෙම අයගේ මරණවලට මම සාක්ෂිකරුවෙකුව උන්නෙමි. රාත්‍රි අටට පමණ මාළුවන්ගේ හැඩයෙන් සැරසිළි කරන ලද වාහන යාපනය රෝහල පාරේ පැමිණෙමින් තිබුණි. පාරේ ඉහළින් ඇද තිබුණු විදුලිය රැහැනක් වාහනයේ ඉහළ කොටසේ පැටලී එම විදුලිය රැහැන බිමට වැටුණු හෙයින් තිදෙනෙක් එම ස්ථානයෙහිම මරණයට පත් වූහ. විදුලිය රැහැන බිමට වැටුණ වහාම විදුලිය ආලෝකය ඇනහිටියත් මම සිටි ස්ථානය ආසන්නයෙහි ගොඩට දැමූ මාළුවෙක් මෙන් අයෙක් දඟළා මිය යනු මා මගේ දෑසින් දුටුවෙමි. එය අපේ ගමේ දැළට අසුවී මසුන් දඟලන්නාසේ විය. එයට පෙර මළ සිරුරු මිස කෙනෙකුගේ මරණය මගේ දෑස් ඉදිරිපිට සිදුවෙනු මම නොදුටුවෙමි. මරණය යන ක්‍රියාව කෲර අන්දමින් සිදු විය.

මහත් කම්පනයට පත්ව මම නිවෙසට ගියෙමි.

පසුදින සමුළුවෙහි අවසන් දිනය විය. ඥානම් මාස්ටර්ගේ භෞතික විද්‍යා පංතියට ගොස් අපි පස් දෙනෙක් සවස සමුළුව පැවැත්වෙන ස්ථානයට යෑමට අදහස් කරගෙන උන්නෙමු. ඥානම් මාස්ටර් සමුළුවෙහි කමිටු සාමාජිකයෙකුව සිටි හෙයින් පංතිය කල් ඇතුව අවසන් විය.

ඔරලෝසුව කණුව අසළ පිහිටි නිවෙසක වාසය කරන මගේ මිතුරෙකුවූ රත්තින කාන්තන්ගේ නිවෙසෙහි පා පැදිය තබා මම ඔහු සමඟ වීරසිංහම් ශාලාව කරා ගමන් කළෙමු. සෑම තැනකම ජනයා පිරී සිටියේය. උතුරේ සෑම කෙනෙක්ම පැමිණුතයැයි මෙන් මට සිතුණි.

මුනියප්පර් කෝවිල, පුල්ලංකුළම් වැව ආශ්‍රිත ප්‍රදේශ අප ඉතාමත් හොඳින් දන්නා ස්ථානවන හෙයින් අපි ඉක්මනින්ම වීරසිංහම් ශාලාවට ළඟා වුනෙමු. ශාලාවට ඉදිරිපසින් වේදිකාවක් තනා තිබුණි. අපි එම වේදිකාවට පිටුපසින් උන්නෙමු.

වේදිකාවෙහි බොහෝ දෙනෙක් කථා පැවැත්වූහ. නමුත් අමිර්තලිංගම් කථාකරන විට ජනතාව ඔල්වරසන් දෙන්නට විය. අමිර්තලිංගම්ගේ කථාව අවසන් වෙත්ම අයෙක් වේදිකාවට පැමිණියහ. ඔහු ජනාර්ථනන් යැයි සමහරු පැවසූහ.

ආර්.ජනාර්ථනන්ට ලංකාවට පැමිණීමට ලංකාවේ ආණ්ඩුව වීසා නොදුන් පුවත අපි ඒවනවිටත් දැනගෙන උන්නෙමු. අපේ අසළ සිටි සමහරු ඔහු වල්ලමකින් පැමිණි බව පැවසූහ.

කථා කරමින් සිටියේ මහාචාර්ය නෛනාර් මුහම්මදු නම් තැනැත්තාය. ඔහු කථාකරමින් සිටිද්දී ජනතාව ආර්.ජනාර්ථනන් කථා කරන්නේ යැයි සිතා ඔල්වරසන් දුන්නේය. ඒ අවස්ථාවෙහි වීදුරු කැඩෙන ශබ්දයක් ඇසුනේය. ඒ සමගම කඳුළු ගෑස් උණ්ඩ ද අප අතරට පැමිණියේය. වෙඩි තියනවා, වෙඩි තියනවා හැමෝම බිම දිගාවෙන්න යැයි බොහෝ දෙනෙක් කෑ ගැසූහ.

මම බිම දිගාවුනෙමි. අඩුම වශයෙන් පහලොස් දෙනෙක්වත් මට උඩින් වැතිරෙන්නට ඇත.

එක්වරම විදුලිය ආලෝකය නිවී ගියේය. සැම තැනකින්ම කෑ ගැසීම් සහ විලාපයන් පැතිරෙන්නට විය. අඳුර නිසා සිදුන්නේ කුමක්දැයි පැහැදිළිව පෙනුණේ නැත. මට උඩින් වැතිර සිටි අය නැගිට්ට පසුව මම ද නැගිට කඳුළු ගෑස් ප්‍රහාරයට ලක් වීම හේතුවෙන් දැවෙන දෑස් පොඩිකරමින් අවට බැලුවෙමි. මම සිටි ශාලාවෙහි ඉදිරිපස යකඩ බටවලින් වූ ප්‍රදේශයේ කිසිවෙකු දක්නට නොමැත. ගේට්ටුව පසුකර යෑමට උත්සහ කරද්දී යකඩ බට මත දෙදෙනෙක්ගේ මළ සිරුරු එල්ලෙමින් තිබෙනු දුටුවෙමි. එය පෙර එක් දිනක බැලු ඉංග්‍රිසි ක්‍රියාදාම චිත්‍රපටයක් මතකයට ගෙන ආවේය.

විදුලිය රැහැනක් අසළ විය.

යකඩ බටයටත් විදුලිය කාන්දුවිය හැකිය යැයි සිතා ගේට්ටුවට ඉහළින් පැන යාපනය තැපැල් කාර්යාලය දෙසට දුවගෙන ගියෙමි.

මා සමඟ පැමිණි මිතුරෝ ගියේ කොහේටදැයි මම නොදැන උන්නෙමි. මම තැපැල් කාර්යාලයෙහි විශාල කුළුන අසළ සිටිද්දී මවක් සහ දැරියක් මගේ අත අල්ලා ගෙන මට එක්වූහ. මම ඔවුන්වද ඇදගෙන කොට්ටඩි ප්‍රදේශය දෙසට දිව ගියෙමි. කොට්ටඩි ප්‍රදේශයේ විවෘතව තිබූ නිවෙසක ඔවුන්ට සිටින මෙන් පවසා මම හනි හනික තට්ටාතෙරු හන්දිය දෙසට ගමන් කර නිවෙස කරා පැමිණියෙමි.

කඳුළු ගෑස් සහ දිවීම නිසා ඇති වූ වෙහෙස හේතුවෙන් එදින රාත්‍රියේ මම නොකෑවෙමි. නිවෙසෙහි අය සමඟ කිසිවක් කථා නොකළ මම කිරි පමණක් පානය කර නින්දට ගියෙමි.

පාපැදිය ගැනීම සඳහා පසුදින මම ගිය අවස්ථාවෙහි පෙර දින සිද්ධිය පිළිබඳව මම කීප දෙනෙක් සමඟ කථාබහ කළෙමි. නැවැතත් සිද්ධිය වූ තැනට ගියෙමි.

වීරසිංහම් ශාලාව ඉදිරියෙහි සෙරෙප්පු කන්දක් විය. බොහෝ දෙනෙකු මාර්ගයෙන් දැනගත් කරුණු මෙසේය. මහාචාර්ය නෛනාර් මුහම්මදු වේදිකාවෙහි දක්නට ලැබුණු වහාම ඔහු ආර්.ජනාර්ථනන් යැයි සිතාගත් පොලිස් අධ්‍යක්ෂක චන්ද්‍රසේකරන්ගේ අණදීමට අනුව පොලිස් නිළධාරින් වේදිකාව දෙසට පැමිණෙද්දී කෝපයට පත් ජනතාව පොලීසියට සෙරෙප්පු ප්‍රහාරයක් එල්ල කළේය. ඒ සමඟ පොලීසිය ජනතාවට කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කළ අතර තුවක්කුවලින් ඉහළට වෙඩි තැබුවේය. එම තුවක්කු වෙඩි අධි බලැති විදුලිය රැහැනක් වෙත පතිත වූ හෙයින් එය කඩා වැටි විදුලිය සැර වැදීමෙන් ජනතාවගෙන් කීප දෙනෙක් මරණයට පත් වූහ.

මෙම තොරතුරු මුළුමනින්ම සත්‍යයැයි කීමට මම නොදනිමි. නමුත් ආණ්ඩුව හෝ දෙමළ නායකයෝ හෝ වෙනස් අයුරකින් පැවසුවේ නැත. පොලිස් අධ්‍යක්ෂක චන්ද්‍රසේකරන්ව බෝම්බ ප්‍රහාරයකින් ඝාතනය කිරීමට ශිවකුමාරන් උත්සහ කිරීමටත් මෙම දෙමළ පර්යේෂණ සමුළු සිද්ධිය හේතු විය.

****** ****** ****** ****** ****** ****** ****** ****** ****** ****** ******

ඉන්දියාවෙහි රාමේශ්වරන් වෙරළට එදා සවස නැව ළඟා වූ පසුව ඊළඟට කළ යුත්තේ කුමක්දැයි දැන නොසිටියෙමි. මා සතුව ඇමරිකන් ඩොලර් පන්සීයක් තිබුණි. ඉන්දීය මුදල් මා ළඟ නොතිබුණි.

නැවෙන් එළියට පැමිණි මගෙන් " මොනවද සේර් ලංකාවෙන් ගෙනාවේ?" යැයි අසමින් කීප දෙනෙක් මාව වටකර ගත්හ.

ප්‍රාණ භය සහ වේදනාවන් ගෙනාවෙමි යැයි පිළිතුරු දිය හැකිද?

ඒ කාලයේ සිංගප්පූරු කුඩ, ලක්ස් සබන් ආදිය ඉන්දියාවෙහි මිලට ගැනීමට නොහැකි හෙයින් මට ප්‍රයෝජනවත් වෙතැයි සිතා මන්නාරමේ වසන මගේ නැන්දා ඒවා මිලදී ගෙන මට දුන්නාය. ඒවා ඔවුන්ට අළෙවි කිරීමෙන් ඉන්දීය රුපියල් තුන් සීයක් උපයා ගත හැකි විය.

**යාපනය හින්දු විදුහල**

චෙන්නෙ කරා යන දුම්රිය ගමන ආරම්භ කළ හැක්කේ පසුදින සවසය. එහෙයින් රාත්‍රියෙහි රාමේශ්වරන්හී නවාතැන් ගත යුතුය. එදා රෑ ගත කිරීමට රුපියල් දහයකට හොටල් කාමරයක් ලැබීම මහත් පුදුමයට හේතුවක් විය.

සාමාන්‍ය වැසියෙකුට නවාතැන් ගතහැකි මෙවැනි හෝටල් ලංකාවෙහි නොමැත. අපේ කාලයේ යාපනයෙහි නවාතැන්ගත හැකි හෝටල් තිබුණු බවක් නොදනිමි. රාමේශ්වරන්හී එදා මට ලැබුණු එම කාමරය නාන කාමරයක් සහිත ඉතාමත් පිරිසිදු කාමරයක් විය. මගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි කුඩා ඇඳක් ද විය.

උදෑසන අවදි වූ අවස්ථාවෙහි කොහොම හරි පැය දොළහක්වත් මෙහි රැදී සිටිය යුතුය යනුවෙන් ද මෙම ගමට පැමිණි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන අඩුම වශයෙන් රාමයණයෙහි සඳහන් වන කෝවිලවත් බැලිය යුතුය යැයි ද සිතාගෙන ඇවිද ගියෙමි. කෝවිලට ඒ තරම් දුරක් නොමැත. එවන් විශාල කෝවිලක් වගේ ජීවිතයෙහි මම එයට පෙර දැක නොතිබුණෙමි.

රාමේශ්වරන්හි කෝවිලේ ශාලා සහ කුලුනු නරඹමින් සිටිද්දී තරබාරු දේහයක් සහිත කාළ වර්ණ පුද්ගලයෙක් කිළිටි වේට්ටියක් සහ කළු පැහැ භාජන සහිත කරත්තයක් සමඟ මා ඉදිරියට පැමිණ ගංගා නම් ගඟේ ශුද්ධ ජලය යැයි පවසා කුඩා සෙම්බුවකින් මට ජලය දුන්නේය.

මෙවැනි ශුද්ධ වූ ජලය යනාදිය ගැන මගේ විශ්වාසයක් නැතත් දුන් පුද්ගලයාගේ හිත වේදනාවට පත් නොවිය යුතු යැයි සිතා එය පානය කළ විට නැවැතත් වෙනත් භාජනයකින් වතුර ටිකක් දී සරස්වති දෙවියන්ගේ කෝවිලේ ශුද්ධ වූ ජලය යැයි පැවසුවේය. එය ද ප්‍රතික්ෂේප කළ නොහැකි විය. මෙලෙසින් දිගටම ශුද්ධ වූ ජලය වර්ග විසිපහක් පමණ පානය කළෙමි.

එම පුද්ගලයා මට කෝවිල දැක වන්දනා කරගැනීමට ඉඩක් දුන්නේ නැත. ශරීර භාෂාවෙන් හෝ ගණනකට නොගෙන සිටීමෙන් හෝ එම පුද්ගලයාව ප්‍රතික්ෂේප කළ නොහැකි විය. කපු රෙද්දක තැවැරුණු හොදි පැල්ලමක් සේ එම පුද්ගලයා මට ඇළී උන්නේය.

අලුත් රටකට ගිය පළමු දිනයෙහිදීම පුද්ගලයෙකුට සැර පරුෂව බැන වැදී මුහුණ රතුසු කර ගැනීම මාහට කළ නොහැකි දෙයක් විය. හිත හොඳ ගැණි හැමදාම බඩින් යැය කියන්නා සේ වතුර බීමෙන්ම මගේ බඩ පිරී ගියේය. එම පුද්ගලයා ද අතහැරියේ නැත. අන්තිමේ කෝවිලෙන් එළියට පැමිණි පසුවයි ඔහු ඉවත්ව ගියේ. මම සිතින් ඔහුව බොහෝ වතාවක් ඝාතනය කළෙමි.

මෙයට වැඩිය හොඳයි ලංකාවෙදි නුවරඑළියේ පොලීසියට අහුවුනා නං යැයි සිතීමට මට එදින එම සිද්ධිය හේතු විය. අවසානයෙහි ඔහු මගෙන් රුපියල් විසිපහක් ඉල්ලා සිටි අවස්ථාවෙහි මම එය ප්‍රතික්ෂේප කළෙමි. දුන්න වතුරට ගාස්තුව ද?, මම වතුර ඉල්ලුවේ නැනේ යැයි පැවසුවත් එයින් පලක් වූවේ නැත. අන්තිමේ දී ඒ තක්කඩියාට රුපියල් දහයක් දුන් මම මින් මතු කෝවිල්වලට නොයා සිටීමට පරිස්සම් වුනෙමි. ඉන්දියාවෙහි වාසය කළ තුන් අවුරුදු කාලය තුළ මම මෙම ප්‍රතිපත්තිය අනුගමනය කළෙමි. චිදම්බරම්, මදුරා සහ තිරුච්චි යන ස්ථානවලට ගියත් එම ස්ථානවල පිහිටි කෝවිල්වලට යෑමෙන් වැළකී සිටියෙමි. බිරිඳ සහ දරුවෝ කෝවිල් වැඳගෙන පැමිණෙන තෙක් ඔවුන්ගේ පාවහන්වලට ආරක්ෂාව සැපයුවෙමි.

ලංකාවෙහි තියෙන සෑම කෝවිලකටම විශ්වාසයක් නැතත් යන පුරුද්දක් ඇති මම ඉන්දියාවෙහිදි කෝවිල් මග හැරියෙමි.

එදා රාමේශ්වරන්හිදි ඉක්මණින්ම හෝටලයේ කාමරයට පැමිණි මම පැරණි සිදුවීම් සහ දේශපාලන පුවත් ස්මරණය කරන්නට වූවෙමි. හුදකලාව සිටින විට අප සමඟ සිටින්නේ සැමරුම් පමණි.

හින්දු විදුහල පිහිටා ඇත්තේ යාපනයෙහි කංකසන්තුරෙ පාරෙහිය. එහි ඉහළ මාලයෙහි සිටින අපට කංකසන්තුරෙ පාර පෙනෙයි. එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල දිනක් එදින ශිෂ්‍ය සභාවෙහි පෙළපාලියක් යන බව මට ආරංචි විය. යාපනය හින්දු විදුහලෙහි උද්භිද විද්‍යාගාරයට මම යද්දී මගේ පංතියේ සිසුහු මා සමග පැමිණියහ. වීදියෙහි වෙනත් පාසල්වල ජ්‍යෙෂ්ඨ සිසුන් පඹයන් ද සහිතව බෙර, තම්මැට්ටම් වාදනය කරමින් පෙළපාලියෙහි ගමන් කරන්නට වූහ. පෙළපාලියට පොලිස් අවසරය ලැබී නැත. පෙළපාලියෙහි යන අයට පොලිස් පහරදීමක් නියතය යනුවෙන් බොහෝ දෙනෙක් කථාබහ කළහ.

විද්‍යාගාරයෙහි ජනේලයෙන් මම පෙළෙපාලියෙහි අපේ පාසලේ කිසිවෙකු හෝ ගමන් කරන්නේ දැයි බැලුවෙමි. එවක අධ්‍යාපන ඇමැතිධුරය දැරූ බදියුදීන් මුහමද් ඇමැතිවරයා සේ පිදුරුවලින් සකස් කළ පඹයෙක් සමහරු එම පෙළපාලියෙහි ඔසවා ගෙන ගියහ.

මගේ පංතියෙහි මිතුරෙකු වූ සෙල්වවඩිවේල් උඩුක්කුවක් වාදනය කරමින් ඉහළ මාලයෙහි සිටින අපට සිනහවක් පාමින් ගමන් කිරීම මට පුදුමයකට කරුණක් විය. මා තුළ ඔහු කෙරෙහි එම මොහොතේ ඇතිවූවේ අනුකම්පාවකි. පොරට අද හොඳ පොලිස් කෑමක් ලැබෙයි යනුවෙන් මම කනගාටු වූවෙමි.

පසුදින තුවාළ හෝ තැළීම් සීරුම් හෝ නැතිව හිස කෙලින් තබාගෙන ඔහු මා ඉදිරියේ පෙනී සිටි අවස්ථාවෙහි මගේ කනගාටුව අහෝසි විය.

පාසලෙහි අපේ පංතියෙහි බොහෝදෙනෙකුට කුමන අන්දමෙහි ප්‍රමිතිකරණයන් පැමිණියත් අපිට විශ්ව විද්‍යාලයට යා හැකිය යන විශ්වාසය තිබුණි. තවත් සමහරු ලංකාවෙහි විශ්ව විද්‍යාලයකට යා නොහැකි වුවහොත් ඉන්දියාවෙහි හෝ එන්ගලන්තයෙහි හෝ විශ්ව විද්‍යාලයකට ගොස් ඉගෙන ගත හැකිය යන විශ්වාසය ද හැකියාව ද සමගින් උන්හ. එවන් ආකල්පයක් සහිතව සිටි අපට පෙළපාළි හෝ අරගල පිළිබඳව විශ්වාසයක් නොතිබුණි. තවද විරෝධතා පෙළපාලි ගොස් ගුටි කෑ හැකි තරමට ශරීරයෙහි ශක්තියක් හෝ සිතෙහි ධෛර්‍යයක් හෝ තිබුණේ නැත. මෙම තත්ත්වය තුළ මගේ ශිෂ්‍ය සගයෙකු වූ සෙල්වවඩිවේල් එම පෙළපාලියෙහි දක්නට ලැබීම මා තුළ මහත් පුදුමයක් ඇති කළේය.

සෙල්වවඩිවේල් වෙනස් අන්දමකින් සිතා එම පෙළපාලියෙහි ගමන් කළේය යන්න සමග එදින ඔහු පෑ සිනහව අද වන තුරු මගේ සිතෙහි තැන්පත්ව ඇත. සැමවිටම අපූරු අය සහ අපූරු සිදුවීම් මනසෙහි ගැඹුරින් තැන්පත් වෙයි. සාමාන්‍ය සිදුවීම් සහ දිනපතා හමුවන්නන් චින්තන ධාරාවෙහි ගලා යන දිය සේ පසුකර යන බව ධර්මතාවයකි.

අරගලය යන්න ඉදිරියෙහි බොහෝ දෙනෙක් කැමැත්ත දරන්නේ එය මගහැර සිටීමටයි. පැන ගොස් ගැලවීමට උත්සහ කරති. නමුත් වෙලාව සහ පරිසරය විසින් ඔවුන්ව එයට තල්ලු කරනු ලැබෙති. පාසලේ මගේ පංතියෙහි එදා සිටි විසි දෙනාගෙන් එක් අයෙක් එදින පෙළපාලියට ගියා සේ සීයට අනූ පහක්ම එදා එම විරෝධතා පෙළපාලිය හැකි උපරිමයෙන් මඟ හැර සිටීමට කැමැත්ත දැක්වූහ. එයට හේතුව බොහෝ දෙනෙකුට ජීවිතයම අරගලයක් වූ නිසාවෙන්ය.

මේ අතර අරගලයෙහි සුවඳවත් තමන් වෙත නොපැමිණෙන ලෙසින් කටයුතු කරමින් කට වචනයෙන් පිරිස් උසි ගැන්වූ අය එම කාලයෙහි ද උන්හ. මා දන්නා තරමින් වණ්ණෙ ආනන්දන්ගේ ගිනි පුපුරු විසි වෙන කථා ද කාසි ආනන්දන්ගේ ලෙයින් පොට්ටු තැබීම් ද එකල මිදුණු ලේ ගිනියම් කළේ කෙලෙසින් ද යන්න මගේ වයසේ අය දනිති. නමුත් වර්තමානයෙහි අන්තර් ජාලයෙහි දහස් ගණනින් ලක්ෂ ගණනින් ආනන්දන්ලා සිටිති. එකල ඔවුන් අවම වශයෙන් ජනතාව ඉදිරියට පැමිණ තම අදහස් ප්‍රකාශ කළ යුතුව තිබුණි. සිරගතව සිටීමේ අත්දැකීම ද ලබා ගත යුතුය.

මම මේ කියන එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල දේශපාලනය සෙවනැල්ලක් ලෙසින් අප හඹා පැමිණියේය. සෙවනැල්ලට බියේ පළාගොස් සැඟවෙන්නට නොහැකි සේම අඛණ්ඩව අපව ලුහුබැඳ පැමිණියේය.

ජනරජ දිනයෙහිදී පාසලට නොයා සිටීම මෙන්ම අනෙක් අය යෑම වැළැක්වීම වර්ජනය යන නාමයෙන් එලෙස කිරීමට උසි ගැන්වීම අපේ ආරම්භක ක්‍රියාකාරකම ලෙසින් අඛණ්ඩව පැවතියේය.

මෙවැනි සිදුවීම් දෙකක් මගේ මතකයෙහි පැළපැදියම්ව ඇත.

එයින් එකක් මගේ මිතුරෙකු පැවසූ දෙයකි. එයට මගේ ඍජු සම්බන්ධයක් නැත.

පළමුවන ජනරජ උත්සව දිනයෙහි වෛතීශ්වරා විද්‍යාලයේ සිසුහු පාසල වර්ජනය කළ අවස්ථාවෙහි සන්සුන්ව පංති කාමරවලට යන මෙන් විදුහල්පතිතුමා සිසුන්ගෙන් ඉල්ලා සිටියේය. නමුත් වර්ජනය සංවිධානය කළ අය පාසලට ගල් ප්‍රහාර එල්ල කරන්නට වූහ. එම මොහොතේ පාපැදියෙන් පාරේ ගමන් කරමින් සිටි වැඩිහිටියෙක් "ඇයි පුතේ ඉගෙන ගන්න ඉස්කොළෙට ගල් ගහන්නේ? ගල් ගහන්ඩ ඕනෑනං ගහපල්ලකෝ මේ යන්නේ ආණ්ඩුවේ ගමනාගමන මණ්ඩලේ බස් එකක් " යැයි පැවසුවේය.

කොහොමද ඒක?

ජෙහෝවා (jehova) පැවැසූ දේව වාක්‍යයට අනුව ඊශ්‍රායල්වරුන්ව ඊජිප්තුවෙහි සිට මොසෙස් (moses) විසින් පිටත් කර හරිනු ලැබූහ.

එලෙසින් එදා වැඩිහිටියන්ගේ දේව වාක්‍යයට අනුව පාසලෙහි සවිමත්බව පරීක්ෂා කර බැලූ ගල් ගමනාගමන මණ්ඩලයෙහි බස් රථය කරා එල්ල කෙරුණි. මා දන්නා තරමින් දේශපාලන හේතුන් මත යාපනයෙහි එල්ල කරන ලද පළමු ගල් ප්‍රහාරය එය වෙයි. එයට පසුව යාපනය අර්ධද්වීපයෙහි සෑම තැනකම ලංකා ගමනාගමණ මණ්ඩලයේ බස් රථ ධාවනය නතර වනතෙක්ම ගල් ගසා කඩා දැමීමත් ගිනි තැබීමත් අපේ ඉතිහාසය බවට පත් විය.

දෙවැනි සිද්ධිය එක්දහස් නවසිය හැත්තෑ පහේ වසර යැයි සිතමි. යාපනය හින්දූ විද්‍යාලයේ සිසුහු ජනරජ දිනයෙහිදී පාසල වර්ජනය කළහ. එය අප විසින් පහසුවෙන්ම කළ හැකි අරගල ක්‍රියාමාර්ගය විය. අපි හරිහැටි ඉගෙන ගන්නේ පාසලෙන් බැහැරව ටියුෂන් පංතියෙහිදීය. අපේ කාලයෙහි පාසලෙහි හොඳින් නොඉගැන්වූ ප්‍රැන්සිස් මාස්ටර් එළියේ ටියුසන් එකේදී අපිට ඉගැන්වූවේය. නමුත් ශාන්ත ජෝන් පාසලෙහි ශිෂ්‍යයෝ පංති වර්ජනය කිරීමට කැමැත්තක් නොදක්වති. එයට හේතුව එහි ගුරුවරු ඔවුන්ට පාසලේදී මැනවින් ඉගැන්වීමයි.

හින්දූ විදුහලේ සිසුහු මුළුමනින්ම පංති වර්ජනය කළ හෙයින් එක්තරා අන්දමක ජයග්‍රාහී ප්‍රමෝදයක් සහිතව මම මගේ මිතුරු සුන්දරේසන් සමඟ පාපැදියෙන් ශාන්ත ජෝන් පාසල කරා ගියේ සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමටයි. සුන්දරේසන් මඳක් මිටි අයෙකි. ඔහු පාපැදිය නතර කර පාසලෙහි තාප්පයට නැඟී බැලුවේය. ඔහුගේ නරක වෙලාවට පොලිස් රථයක් පැමිණ නතර කෙරුණි. අප දෙදෙනාව පොලිස් කොස්තාපල් සිව් දෙනෙකු සහ ඉන්ස්පෙක්ටර්වරයෙකු විසින් වටකර ගනු ලැබිණ.

අපි බිය පත්ව තාප්පයෙහි ඇළවූ පෝස්ටරයක් සේ උන්නෙමු. තාප්පයට සිරවී සිටින සුන්දරේසන්ගෙන් " මොනවද යකෝ ලිව්වේ?" යැයි කැඩිච්ච දෙමළෙන් එම ඉන්ස්පෙක්ටර් ඇසුවේ සුන්දරේසන්ගේ කෙස් වැටියෙන් අල්ලා ගන්නා ගමන්ය.

එම තාප්පයෙහි ඒවන විටත් රතු පැහැයෙන් තඩි ඉංග්‍රීසි අකුරෙන් "ජනරජ දිනය වර්ජනය කරමු" යැයි ලියා තිබුණි.

සුන්දරේසන් ගොත ගසමින් "මම ලියුවෙ නෑ මහත්තයා"යැයි කීවේය.

පොලිස් ඉන්ස්පෙක්ටර් සුන්දරේසන්ට පහර දීමට අත ඔසවද්දී "එහෙම කරන එක හරි නෑ මහත්තයා" යැයි පවසමින් දෑත් එක්කර ගෙන බිමට පහත් වුනේය. ඔහුගේ මුහුණෙහි ඇති වූ බය භීතිය තවමත් මට වචනයෙන් පැවසිය නොහැකිය. කොටින්ම කිවහොත් යකෙක් ගැසුවාක් මෙන් විය. ජීවිතයෙහිදි එලෙසින් බයක් මුහුණෙහි ජනිතව පහර වළක්වා ගැනීමට නැමුණහොත් තැම්බූ ඉස්සෙකුගේ වකුටුවීම තමයි සිහියට නැගෙන්නේ. මිතුරා එසේ නැමෙනු දුටු මා තුළ සිනහවක් ඇති වී මැකී ගියේය.

තිරුක්කුරල් ග්‍රන්ථය ලියූ වල්ලුවර් පැවැසූ ප්‍රශ්නයක් උද්ගත වූ විට හිත චංචල කර නොගෙන සිනාමුසුව මුහුණ දෙනු යන්නට අනුව එදා මා තුළ ඇති වූ සිනාව ලංකා රාජ්‍යයේ නගරාරක්ෂකයන්ගේ හිතට ඇල්ලුවේ නැත.

මගේ සිනහව හිතට නැල්ලුවේ ඔවුන්ගේ පමණක් නොව සුන්දරේසන්ගේ හිතට ද බව මට දැනගන්නට ලැබුනේ පසුවය. ඔහු පසුව තමන් දන්නා සියලු කුණුහරුප භාවිතයට ගෙන මට බැන වැදුණු අවස්ථාවෙහිදි පොලීසිය කෙරෙහි වූ කෝපයට වඩා මා කෙරෙහි පවතින කෝපය අධිකබව තේරුම් ගත්තෙමි.

ඉන්ස්පෙක්ටර් ඔහුට තරවටු කිරීමට උත්සහ කළ ආකාරය මගේ මා තුළ සිනහවක් ඇති කිරීමට හේතු විය. එම සිනහව ඉන්ස්පෙක්ටර් තුළ නුරුස්සන තත්ත්වයක් ඇති කළේය. ඔහු මගේ දෙස මුහුණ රෞද්‍ර කරගෙන

"මොකක්ද ඉස්කෝලෙ?" යැයි ඇසුවේය.

"හින්දු කොලේජ්"
"මොකටද දැන් මෙහෙ ආවේ?"
"නෑදෑ කෙනෙක්ගේ ගෙදර ආවා"
"කොහේද ඒ ගෙදර තියෙන්නෙ?"

මගේ අනාගත බිරිඳගේ නිවෙස වූවේ ශාන්ත ජෝන් පාසල අසළය. මම එම නිවෙසෙහි ලිපිනය ඔවුන්ට පැවසුවෙමි.

"දූවපල්ලා" යැයි පොලිසිය අප දෙදෙනාව පළවා හැරියේය. එම සිද්ධියට පසුව බොහෝ මිතුරෝ සුන්දරේසන්ව කොහේදී ඔහු මුණගැසෙන විට "එහෙම කරන එක හරි නෑ මහත්තයා" යැයි පවසති.

දැන් අපි නැවැතත් යාපනය අර්ධද්වීපයෙහි සිට රාමේශ්වරන් වෙත ගමන් කරමු.

එදින සවස චෙන්නෛ කරා යැමට දුම්රියට නැඟුනෙමි. එය මට දිගු ගමණක් විය. මිනිසුන්ගේ මුහුණු සූක්ෂම ලෙසින් නිරීක්ෂණය කිරීම මගේ මට ඉතාමත් ප්‍රියජනක විනෝදාංශයකි. ලේඛණ කටයුතුවල නියළීමෙහි උනන්දුව ද එයින් ඇති වූවක් විය හැකිය.

මම යාපනය හින්දු විදුහලේ නේවාසිකාගාරයෙහි සිටි කාලය චිත්‍රපට කළු සුදුවල සිට වර්ණ චිත්‍රපට දක්වා වෙනස්වෙමින් තිබුණු සමයයි. එකළ මගේ මත්ද්‍රව්‍ය වූවේ චිත්‍රපටයි. ආරම්භක කාලයෙහි මගේ සිහිනය වූවේ සිනමාශාලාවක රැකියාවක් කළ යුතුය යන්නයි. ඒ තරමට මම ඡායාවන් කෙරෙහි ආදරය කළෙමි. පාසල් නිවාඩුව අහවරව හින්දු විදුහලේ ආරම්භක දිනයෙහි නේවාසිකාගාරයෙහි සිටින අපට කිසිම වෙලාව පාලනයක් නැත. කැමැති වෙලාවට යැමටත් ඒමටත් හැකි හෙයින් එක දිනකදී චිත්‍රපට තුනක් පවා බැලුවෙමි. මම ශිවාජි ගනේෂන්ගේ රසිකයෙක්මි.

මෙලෙසින් දකුණු ඉන්දීය චිත්‍රපට බැලූ හෙයින් අපේ මනසෙහි ඉන්දියාව පිළිබඳ වර්ණකාන්ත දසුනක් නිර්මාණය වී තිබුණි. වර්ණවත් කෝට් ෂූට් පමණක් නොව රතු පැහැ, සුදු පැහැ පාවහන් පැළැඳ සිටින එම්.ජී.ආර්., ශිවාජි යන අය රිදී තිරයෙහි දැක උන්නෙමු. එමෙන්ම කාන්තාවන් ඇපල් වන් මුහුණුවලින් යුතුව සැරිසරන දසුන් මනසෙහි සිතුවම්ව තිබුණි. අපි කියවූ දෙමළ කතාපොත් පවා කළු පැහැ අයව හඳුන්වා තිබුණේ මා නිරම් යනුවෙනි.

ඔබ මගෙන් මෙසේ ඇසිය හැකිය? ඇයි ඔබ ජෙයකාන්තන්ගේ කතා කියවා නැද්ද? ඒවාගේ පාත්‍ර වර්ගයා මුඩුක්කුවාසි ජනයා නොවෙයිද? නමුත් මට ඉන්දියාවෙහි ජනයා මා බැලූ සිනමාවෙහි සහ මා කියවූ කතාවල මෙන් සිටිනු ඇතැයි යන අදහස පැවතියේය.

එදා දුම්රිය ගමනෙහිදි මට කෝට් ෂූට්වලින් සැරසුණු එකම එක අයෙක්වත් දක්නට ලැබුණේ නැත. මම මෙය ලියන්නේ සිනහසීම සඳහා නොවෙයි. දකුණු ඉන්දීය සංස්කෘතියෙහි යථාර්ථය එයින් බැහැර සමාජයට දෙමළ සිනමාව සහ කතා පොත් විසින් එකල ගෙන ගියේ කෙළෙසින්ද යන්නත් අපි ඒවා අවශෝෂණය කරගත්තේ කෙසේද? යන්නත් පිළිබඳවත් මාවත් සාක්ෂිකරුවක් කිරීමටයි.

### ඉන්දීය දෙමළ ජනයා සහ ලංකාවෙහි දෙමළ ජනයා එක්කරන දම්වැළ

රාමේශ්වරන්වලින් ආරම්භ වූ මගේ දුම්රිය ගමන එග්මෝර් දුම්රිය ස්ථානයෙන් අවසන් විය. මට පුරුදු කොළඹ කොටුව දුම්රිය ස්ථානය සමඟ සංසන්දනය කර බලන විට මෙය එය මෙන් දහගුණයක් පමණ විය. බැලූ බැලූ තැන එකම මිනිස් පොදියකි. කුඩා රටක් වූ ලංකාවෙහි සිට පැමිණි මම මේ තරම් සෙනඟක්! යැයි විමතියට පත් වූවෙමි. මේ මහ ජන කන්දරාවක් තුළ තනි පුද්ගලයෙකු ජීවත්වීම සඳහා කොයිතරම් වෙහෙසක් ගත යුතුද? ස්වභාවික සම්පත් සහ නිෂ්පාදන සම්පත් එකිනෙකා බෙදාහදා ගන්නේ කෙසේද?

අපරිමිත වූ ස්වභාවික සම්පත් පිරුණු ලංකාවෙහි සිට යුද්ධය හේතුවෙන් ඉන්දියාවට පැමිණ සිටින මා හට ඉන්දීය වෙරළට ගොඩබැස්ස මොහොතේ සිට ලංකාවෙහි ඇතිවූ තිබෙන ජනවාර්ගික ප්‍රශ්නය යනු මවගේ වඩා ගැනීම වෙනුවෙන් රණ්ඩු කරන ළදරුවෝ දෙදෙනෙකුගේ ක්‍රියාවක් ද? යන සිතිවිල්ල ඇති විය.

දස වසරකට පෙර වනතෙක් තමිල්නාඩුවෙහි සිට දෙමළ අය බොහෝ දෙනෙක් මුහුදු යාත්‍රාවල (කල්ලත්තෝණි) නැඟී ජීවිකාව උදෙසා ලංකාවට පැමිණියහ. ඔවුන්ගෙන් සමහරු මගේ ගම වූ එළුවතීවු දූපත හරහා පැමිණි අය වෙති. මම එහි ඉපදීමට පෙරම කුඩා කොළුවෙකු ලෙසින් ඉන්දියාවෙහි රාමනාදපුරයෙහි සිට අපේ රටට පැමිණ අපේ ගමේ හැදී වැඩී තරුණ වයසෙහිදී රා මැදීමේ රැකියාව කළ මාව වඩා ගෙන නැළවූ රාමලිංගම් අය්යාගේ දාඩිය සුවඳ මට තවමත් මතකය.

මහත පළල් උරහිසින් ද බොකුටු හිස කෙසින් ද කාල වර්ණයෙන් යුතු නමුත් දිදුළන සමකින් ද හෙබි ඔහුගේ සමෙහි රෝම ද්වාරයන්ගෙන් එළියට එන දහඩිය රා ගඳ සමඟ මුසුව ඇත. දහඩිය ගලන සිරුරින් යුතු ඔහු මාව ඔහුගේ උරහිස් මත ඔසවා තබා ගැනීම පුරුද්දක් කරගෙන උන්නේය.

"නාගෙන පුතාව වඩා ගනිං බං" යැයි අම්මා නිතර නිතර පැවසුවත් " පුංචි අම්මා පුංචි අම්මගේ වැඩක් බලාගෙන ඉන්ඩකෝ " යනුවෙන් ඔහු පැවසීමත් ළමාවියේ මගේ මතකය තුළ ඇත. කල්ලතෝණි ලෙසින් පැමිණ අපේ නිවෙසෙහි නතරව ඉඳ කෑම කා ලංකාවෙහි වෙනත් ප්‍රදේශවලට සමහරු පළා යති. සමහරු පොලීසියට අසුවෙති. මේවා මම ළමාවියෙහිදී දුටු දර්ශනයන්ය. රාමලංගම් පමණක් ආරක්ෂා සහිතව අපේ නිවෙසෙහි වසර ගණනාවක් වාසය කර නැවැතත් රාමනාදන්පුරම් කරා ගොස් ඔහු අයත් නාඩාර් කුලයෙහි කාන්තාවක් විවාහ කරගෙන ජීවත් වන බව පසු කලෙක මම දැන ගත්තෙමි.

1984 කාලයෙහි ලංකාවෙහි ඔටෝ රික්ෂෝ තිබුණේ නැත. ගොම කුරුමිණියන්ගේ පෝලිමක් මෙන් ඒවා එග්මෝර් දුම්රිය ස්ථානය ආසන්නයෙහි දක්නට ලැබීම මට පුදුම සහගත දෙයක් විය. එකල සිනමාවෙහි පවා ඔටෝ රික්ෂෝ දැක තිබුණු බවක් මගේ මතකයෙහි නැත. මෙම ස්ථානයෙන් පිටව යා යුතුය යන අරමුණින් සිටි හෙයින් එක් ත්‍රීරෝද රථයකට නැගෙමි.

අඩි පහහමාරක පමණ උසින් යුතු කෙට්ටු තරුණයෙක් මා දෙසට පැමිණියේය. ඔහුගේ වයස අවුරුදු විසි පහක් පමණ ඇති.

"කොහේටද සර් යන්න ඕනෑ?" යැයි සිනාමුසුව අසද්දී ඔහුගේ දෙනෙත් යොමුව ඇත්තේ මට පිටුපසින් සිටින අයෙකු දෙස විය හැකි යැයි මම සිතුවෙමි. එනිසාම මම නිහඬව උන්නෙමි.

"ඔයාගෙන් තමයි සර් ඇහැවුවේ. කොහෙටද යන්න ඕනෑ?"

ඉගැන්වූ ගුරුවරුන්ව සහ පසු කලෙක විශ්ව විද්‍යාලයෙහි ඉගැන්වූ ආචාර්යවරුන්ව හැර වෙනත් කිසිවෙකුට සර් යැයි කියා පුරුද්දක් නැති මට කිසිම දැන හැඳුණුම්කමක් නැති තරුණයෙක් සර් යැයි ඇමතීම මා තුළ සියුම් විමතියක් ඇති කිරීමට හේතු විය.

"මාම්පලම් කියන තැනට"

"සර්, ලංකාවෙන් ද නැත්තං මලයාලි ද ?"

"ලංකාවෙන්"

"නඟින්න සර්. එහෙ දෙමළ අයව මරනව කියලනේ කියන්නේ. දැන් කොහොමද සර්"?

මම ඔහු සමඟ දේශපාලනය කථාකිරීමට සූදානම්ව නොසිටියෙමි. තවද ගමන් මහන්සිය කට ගොළුකර තිබුණි.

"කීයක් ගන්නවාද?"

"මොන ගාස්තුවක්ද? ඔයා අපේ කෙනෙක් නේ. පුළුවන් ගානක් දෙන්ඩ"

"එහෙම නෙමෙයි. මම අද තමයි මේ රටට ආවේ. ඒ නිසා ගාණ කීයද කියල කිව්ව නං හොඳයි"

"මොකක් ද සර් ? අපි අතරෙ ඕක මහ ලොකු දෙයක්ද?"
"නෑ. එහෙම කියල බැනේ. ගාස්තුව කියන්ඩ"
"හරි, රුපියල් පහක් දෙන්ඩ".
එම ගාස්තුව සාමාන්‍යයෙන් අය කරන ගාස්තුවද? නැතහොත් වැඩියෙන් ඉල්ලන්නේ ද? යන්න නොදැන සිටියත් ඔහුගේ විවෘත කථාබහේ සැබෑ බවක් දක්නට විය.
"කොහේද නතර වෙන්නෙ?"
"ඒකට තමයි මාම්පලම්වලට යන්නෙ".
"ඉගෙන ගත්ත කෙනෙක්වගේ පෙනෙන්නෙ. හොඳ හෝටලයකට එක්කර ගෙන යන්ඩද?"
"සල්ලි ඒතරම් නෑ. හොඳ පිරිසිදු තැනක්වුනොත් ඇති"
"රුපියල් හතලිස් පහකට හොඳ පහසුකම් තියෙන තැනක් තියෙනවා"
ඇත්තෙන්ම ඔහු කැඳවා ගෙන ගොස් පෙන්නූ හෝටලයේ මූලික පහසුකම් විය.

ගතේ වෙහෙස නිවා ගැනීමට නාගෙන පහළට බැස කෑම කඩයක් හෙව්වෙමි. බොහෝ කෑම කඩ නිර්මාංශ ආහාර පමණක් ඇති ඒවා විය. එළුවතීවු දූපතේ උපතා ලබා වැඩුණු අවධියෙහිදී මාළු ව්‍යංජනය, මාළු හොද්ද, මාළු බැදුම, බටු කිරට සහ මුරුංගා ආදිය පමණක් කා වැඩුණු හෙයින් කොහේ ගියත් මස් මාළු සහිත කෑම සෙවීම මගේ පුරුද්දයි. සිකුරාදා සහ මස් මාළු නොඋයන වෙනත් දිනවලදී අඩුම වශයෙන් මැස්සෙන් රැගෙන කරවල කැල්ලක් පුළුස්සා නැතහොත් බිත්තරයක් තම්බා කෑම පුරුද්දක් විය. ආඩි *අමාවාසෙ* වැනි පුන්‍ය දිනවලදී එළවළු ව්‍යංජන සහ උළුහාල් ව්‍යංජනය උගුරෙන් පහළට යන්නේ කසාය බොනවිට මෙන්ය.
නැවට නැඟීමට පෙර අවසන් වතාවට මන්නාරමෙහිදී නැන්දා *කයල්* මාළු ව්‍යංජනයක් උයා මට සංග්‍රහ කළාය. රාමේශ්වරන්වලට ගොඩබැස්ස මොහොතේ සිට පැය හතලිස් අටක පමණ කාලයක් මස් මාළු සහිත කෑමක් ඇසට දක්නට ලැබුනේ නැත. දුම්රියෙහිදී අඩුම වශයෙන් මස් මාළු සුවඳවත් දැනුනේ නැත. මා ගමන් කළ දුම්රියේ මුදවපු කිරි, සාම්බාරු සහ ඇඹුල්බත් යනාදියෙහි සුවඳ පමණක් ආඝ්‍රාණය කළ හැකි විය.
මස් මාළු සහිත කෑමක් සඳහා පැය බාගයකට ආසන්න කාලයක් ගමන්කර අවසානයෙහි මදුරෙ මුනියාණ්ඩි විලාස් කඩය සොයා ගත්තෙමි. චෙන්නෙහි එකල මගේ ගත සහ පණ එකට ගැටගසා තැබුවේ මදුරෙ මුනියාණ්ඩි විලාස් නැතහොත් කේරළ මුස්ලිම් අයගේ කඩවල්ය.
මධ්‍යාහ්නයෙහි නිදා ගෙන අවදි වී චිත්‍රපටයක් බැලීමට යා යුතුය යනුවෙන් සිතමින් හෝටල් කාමරයෙහි ජනේලයෙන් පාර දෙස බැලූවිට ලංකාවෙහි විපක්ෂ නායක යනුවෙන් දුරින් පෙනන පෝස්ටරයක සටහන්ව තිබෙනු දක්නට ලැබුණි. එය අමිර්තලිංගම් මහතා සම්බන්ධයෙන් පවසන්නක් වුවද මගේ මතකයට එක්වරම නැගුනේ චෙල්වනායගම් මහතාය.
මම සත්වනවියෙහි නැතහොත් අටවන වියෙහි සිටිද්දී මැතිවරණයක් පැවැත් විය. එවක ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයෙහි නායක චෙල්වනායගම් මහතා එවක දූපත් අයත් ආසනයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රී වී.ඒ.කන්දය්යා මහතා සමග එළුවත්තීවු දූපතට පැමිණි අවස්ථාවෙහි අපේ නිවෙසට ද පැමිණියහ. මගේ මව් පාර්ශ්වයෙන් මගේ සීයා වෙන නමසිවායම් විශ්‍රාමගිය ගුරුවරයෙකි. එමෙන්ම තැපැල් ස්ථානාධිපති ලෙසින් ද කටයුතු කළ අයෙකි. දූපත් ප්‍රදේශයෙහි මෝටාර් බෝට්ටු සංගමයෙහි ද වැදගත් තනතුරක් දැරුවෙකි. ඔහු අපේ නිවෙසට චෙල්වනායගම් මහතා පැමිණි අවස්ථාවෙහි නිවෙසෙහි තම හාන්සි පුටුවෙහි ඔහුට අසුන් ගැනීමට පවසා සීයා ඉදිරියෙහි වූ පුටුවක අසුන් ගත්තේය. ඔහුගේ පසෙකින් වී.ඒ.කන්දය්යා මහතා අසුන් ගත්තේය.
චෙල්වනායගම් මහතා ඉතාමත් මෘදු ස්වරයෙන් "ඉස්කොලේ මහත්තයෝ, මේ සැරෙත් ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයට ඡන්දය දෙන්න. ඔබතුමන්ලගේ ආධාරය අපට අවශ්‍යයි" යැයි කීවේය.

" ඕක කියන්න බෝට්ටුවල නැගල මේ තරම් දුරක් ඇවිල්ල මහන්සි වෙන්ඩ ඕනෑද මහත්තයා? ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්‍ෂෙ අපෙක්ෂයයි කියල පොල් පිත්තක් ඉදිරිපත් කෙරුවත් මේ ගමේ මිනිස්සු ඔයාලට තමයි ඡන්දෙ දෙන්නෙ"
" ඒක මං දන්නවා. ඔයාලවත් බලල යන්ඩ කියලයි ආවේ. ඒ වගේම කීප දෙනෙක් අනෙක් අයට වැඩ කරනව කියල ආරංචියි".
" ජඩ බල්ලො කීප දෙනෙක් අරක්කු බොන්ඩ සල්ලි ගන්ඩ ඇති. මහත්තයා ඒ ගැන කරදර වෙන්ඩ ඕනෑ නෑ".

මෙම සංවාදය මා සමග අපේ ගමේ කීප දෙනෙක්ම නිවෙසෙහි මඩුවට වී සවන් දීගෙන උන්නෙමු.
ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයෙහි නායක චෙල්වනායගම් මහතා සහ වී.ඒ.කන්දය්යා මහතා අපේ නිවෙසෙන් දිවා ආහාරය ලබාගෙන සවස බෝට්ටුවෙහි නැඟී පිටව ගියහ.
එයට පසුව ආ සතියෙහි දෙමළ කොංග්‍රස් පක්ෂයෙහි අය ගමේ කීප දෙනෙක් රැස්කර රැස්වීමක් සංවිධානය කර තිබුණි. අපේ ගමෙහි එකළ විදුලිය බලය නොමැති හෙයින් රාත්‍රී කාලයෙහි රැස්වීම් පවත්වන්නේ

පෙට්රල්මැක්ස් ලාම්පුවල ආලෝකයෙන්ය. එම රැස්වීමට සහභාගි වී ඇත්තේ දහයකටත් අඩු සංඛ්‍යාවකි. නමුත් හරි ඉලක්කෙට පෙට්රල්මැක්ස් ලාම්පුවලට එල්ල කෙරුණු ගල් ප්‍රහාරයක් හේතුවෙන් එම රැස්වීම කඩාකප්පල් විය. එම කඩාකප්පල්කාරී ක්‍රියාව කළේ අපේ ඥාතීන්ය. ඔවුන් රැස්කර යවනු ලැබුවේ නමසිවායම් ඉස්කෝලේ මහත්තයා විසින්ය. මෙහිදී වැදගත් කරුණ වන්නේ එළුවත්තීවු දූපතේ අති බහුතරය ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයෙහි ආධාරකරුවෝය. කීප දෙනෙක් පමණක් දෙමළ කොංග්‍රසයට මාරුවූවේ ඇයි? එයට හේතුව ඔවුන් නවසිවායම් ඉස්කොලේ මහත්තයාට අකැමැතිවීමයි. එහෙයින් ඔවුහු අනිත් පක්ෂය දෙසට යොමු වූහ.

මෙම කුඩා සිද්ධිය පසුකලෙක මට බොහෝ කරුණු වටහාදීමට සමත් විය.

ජනප්‍රිය දේශපාලන පක්ෂයක් වැළඳගෙන අල්ලා ගෙන සිටියහොත් ඒ පක්ෂය වෙනුවෙන් ඡන්දය ඉල්ලන්ට කිසිම අන්දමක දැනුමක් හෝ දක්ෂකමක් හෝ සදාචාරයක් හෝ අවශ්‍ය නැත. මගේ සීයා වසර හතළිස් ගණනක් ගුරුවරයෙක් සහ විදුහල්පතිවරයෙක් වශයෙන් සේවය කළ අයෙකි. එමෙන්ම එකල වැදගත් පුද්ගලයෙක් වශයෙන් දූපත් ප්‍රදේශය පුරා ප්‍රකටව සිටි අයෙකි. ඔහු පවා ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයෙන් නම් පොල් පිත්තටත් ඡන්දය දමන්නෙමු යැයි කියයි. පෙට්රල්මැක්ස් ලාම්පුවලට ගල් ගැසීමේ ප්‍රචණ්ඩත්වය එකල සුළුවශයෙන් සිදුවුවත් එය පසු කලෙක සිදු කළ තුවක්කු වෙඩි ප්‍රහාරවලට සමානය. අද පොළඟා එදා පොළොං පැටියෙකුව සිටියා පමණි.

නවසිවායම් ඉස්කෝලෙ මහත්තයා නොකියාම ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක විය. ගල් ප්‍රහාරය එල්ල කෙරුණේ මෙය නවසිවායම් ඉස්කෝලෙ මහත්තයාත් අනුමත කරන්නේය යන උද්වේගයෙන්ය.

**ඡායාරූපය. අමිර්තලිංගම්,චෙල්වනායගම්, කරුණානිධි**

මේ සියල්ලටම වඩා වැදගත් දෙය වන්නේ එවක ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයට විරුද්ධ පක්ෂය ලෙසින් කිසිම සිංහල දේශපාලන පක්ෂයක් එහි නොපැවතියේය. දෙමළ කොංග්‍රසය වෙනුවෙන් කීපදෙනෙක් එහි වැඩ කිරීම ඉලංගෛත්තමිළරසුක් කට්චි පක්ෂයට ඉවසිය නොහැකි දෙයක් විය.

මේ ගමේ දේශපාලනය පැත්තකට විසිකර ගිහින් ළඟ තියෙන චිත්‍රපට ශාලාවට ගොස් චිත්‍රපටයක් බලමු යන සිතිවිල්ලෙන් පාණ්ඩියන් බජාර් දෙසට ගමන් කරන්නට වූවෙමි. මට වැඩි දුරක් ගමන් කිරීමට ඉඩ ලැබුනේ නැත. අනපේක්ෂිත දර්ශනයක් මට සම්මුඛ විය. පිරිසක් වීදියෙහි රවුමට රැස්ව උන්හ. මම ද ඇතුළට රිංගාගෙන බැලුවෙමි. චිත්‍රපටයක රූගත කිරීම් සිදුවෙයි.

චිත්‍රපටයක් නැරඹීමට අදහස් කරගෙන පැමිණි මට මහ පාරෙදි චිත්‍රපටයක රූගත කිරීම් නැරඹීමට හැකි විය. ජීවියෙහි මුල් වතාවට චිත්‍රපටයක රූගත කිරීම් නැරඹීමට අවස්ථාවක් වෙන්නෙ නගරයට පැමිණි පළමු දිනයෙහිම ලැබුණි. මම කිසිම චිත්‍රපටයක නොදුටු නළුවෙක් පොලිස් ඉන්ස්පෙක්ටර්වරයෙකුගේ නිල ඇඳුමෙන් පැමිණ පුද්ගලයෙකුට බොහෝ වතාවක් වෙනස් වෙනස් කෝණවලින් පා පහර දෙන්නට වූවේය. ඉතාමත් කාල වර්ණ පැහැයෙන් ද ශක්ති සම්පන්න සිරුරකින් ද යුතු ඔහුගේ දැස් පමණක් රත් පැහැයෙන් යුතු විය. දෑසෙහි කුඩා ලේ නහර පෙනෙයි. මෙතුවක් කල් තිරයෙහි දුටු චිත්‍රපට කථානායකයන්ට වඩා හාත්පසින් වෙනස් පෙනුමක් ඔහුට තිබීම මගේ විමතියට හේතු විය. මම පසෙක සිටි අයෙකුගෙන් "මෙයා කවුද? " යැයි ඇසුවෙමි. ඔහු මා දෙස වෙනත් ග්‍රහ ලෝකයෙන් පැමිණි අයෙකු දෙස බලන්නාක් මෙන් පුදුමයෙන් බලා "විජයකාන්ත් මහත්තයානේ" යැයි පැවසුවේය.

"අලුත් නළුවෙක්ද?"

"ඔව්, මේ දෙවෙනි චිත්‍රපටෙ, ඒක හරි මහත්තයා කොහෙන්ද?"

" ලංකාවෙන්"

" ඒක තමයි, දෙමළ වෙනස්. මං හිතුවෙ මදුරෙ පැත්තෙ වෙන්ඩ ඇති කියලා. අපේ විජයකාන්ත් මහත්තයා මේ කිට්ටුව තමයි ඉන්නෙ. එයා ලංකාවෙ අය ගැන හරි ඇල්මක් තියෙන කෙනෙක් " යැයි ඔහු දිගටම පවසන්නට වූවේය.

විජයකාන්ත් කීප වතාවක්ම පනිමින් පහර දුන්නේය. ඒ සෑම පහරක් වෙනුවෙන්ම අඩුම තරමෙහි පස් වතාවක්වත් විජයකාන්ත් පහර දීමට සැළැස්සුවේය.

චිත්‍රපට රූගත කිරීම මෙන් නීරස තවත් දෙයක් තිබේද? යැයි මම සිතුවෙමි. සෑම ක්‍රියාවක්ම කීප වතාවක්ම කෙනෙකු කළ යුතුව තිබුණි. මෘත දේහයක් පවා කීප වතාවක්ම රූ ගත කිරීමට සිදුවනු ඇතැයි මම සිතුවෙමි. චිත්‍රපට රූගත කිරීම නැරඹීමේ ආශාව එදින සිතින් තුරන් විය. ඉක්මනින් එම ස්ථානයෙන් ඉවත්ව චිත්‍රපට ශාලාව වෙත ගියෙමි.

කළ හැකි ප්‍රයෝජනවත් දෙයක් නැතැයි සිතූ හෙයින් - අව් වැසි පින්නෙන් බේරීමට චිත්‍රපට ශාලාව මට අභය ස්ථානය විය. පසු කලෙක බොහෝ වතාවක් කාලය ගෙවා ගැනීමට පමණක්ම මම දෙමළ

සිනමාව ප්‍රයෝජනයට ගත්තෙමි. දෙමළ සිනමාවෙහි පළමු අරමුණ වශයෙන් අද පවා පවතින්නේ එය යැයි මම සිතමි. සමහරවිට එයම අවසන් අරමුණත් වෙයි.

පෝක් සමුද්‍ර සන්ධියට පමණක් දෙවැනි වන ලෙසින් ලංකාවෙහි දෙමළ ජනයා ඉන්දීය දෙමළ ජනයා සමඟ එක්කරන දම් වැලක් ලෙසින් දෙමළ සිනමාව ඉදිරියට එමින් තිබේ. දේශපාලනය, භාෂාව, සංගීතය සහ ආගම යනාදිය ද්විතිකය.

**පුතුගේ උපන් දිනයඃ බිරිඳගේ එඩිතරබව**

දින දෙකක් හෝටලයෙහි නතරව සිට කෝඩම්පාකම් ආට්‍රිකාඩු පාරෙහි පිහිටා ඇති පැරණි ගොඩනැඟිල්ලක ඉහළ මාලයෙහි කුඩා කාමරයක් මාසික කුළියට ලබා ගත්තෙමි. එම කාමරයෙහි ජනේලය සහ දොරට අමතරව පැරණි මළකඩ කෑ විදුළිය පංකාවක් සහ කුඩා විදුළිය බල්බයක් මගේ තනියට තිබුණි. එම කාමරයෙහි දැඩි රස්නයටත් වඩා මාව පීඩාවට පත් කළේ තනිකමය. මෙම මහ චෙන්නෙ නගරයෙහි තනිව සිටිමි යන හැඟීම මට ඇතිවිය. පවුලේ සහ ඥාති මිත්‍රාදින්ගේ වටිනාකම අවබෝධ කරගැනීමට එම කාලය අවශ්‍යය විය.

අනවශ්‍ය ලෙසින් ලංකාව අතහැර පැමිණියෙමිද? යන අදහස අනවරතයෙන් - ගල්පරයක හැපෙන මුහුදු රළ සේ ගැටෙන්නට විය. ලංකාවෙහි සිටිද්දී සුළුවට තිබුණු සිගරට් බීමේ පුරුද්ද සුළං පිරවූ බැලුං බෝලයක් මෙන් විශාල විය. ආට්‍රිකාඩු පාරෙහි පිහිටා තිබූ බැහැරදෙන පුස්තකාලයෙහි වූ සුජාතා, රාජේන්ද්‍ර කුමාර් සහ පුෂ්පා තංගතුරෛ යන අයගේ පොත් සමීප සහායකයෝ වූහ.

දිනක් රාත්‍රියෙහි මගේ බිරිඳ ලංකාවෙහි සේවය කරන ගුරුනගර්වල පිහිටි හෝලි ක්‍රොස් රෝහලට ගුවන් බෝම්බ ප්‍රහාර එල්ලවී එහි සිටින අය පණ බේරා ගැනීමට දඟත දිවයනු සිහිනෙන් දැක අවදිව ඇඬුවෙමි. සිහින සහ කඳුළු යනාදිය මට මතක ඇති කාලයෙහි සිට ඉතාමත් දුර්ලබ ඒවා විය. මධ්‍යම පාංතික පවුලක වැඩිමහල් දරුවා ලෙසින් ඉපදීම එක්තරා අන්දමක වාසනාවකි.

හිතුණු ගමන්ම කථා කරන්න හැකි විදියට අද වගේ එවක දුරකථන තිබුණේ නැත. වෙනත් මාර්ග ද නැත. සිහින සැබෑ නොවන්නේය යන විශ්වාසයෙන් යුතුව මම එදා මැදියම් රැයෙහි අවදිව විල්ස් සිගරට්ටුවක් දල්වා ගත් මොහොතේ 1983 කළු ජූලිය මගේ මතකයට ආවේය.

මැදවච්චියෙහි වැඩ කළ මම ජූලි 21 වන දින කොළඹදී ග්‍රාමීය කර්මාන්ත ඇමැති තොණ්ඩමාන් මහතාගේ කාර්යාලයෙහි පැවැත්වූ රැස්වීමට අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පශු වෛද්‍යවරුන් සමඟ සහභාගි වූවෙමි. එවක බොහෝ සංවර්ධන ව්‍යාපෘති අනුරාධපුරයෙහි දියත් කෙරුණු අවස්ථාවල බලයෙහි සිටියේ එක්සත් ජාතික පක්ෂය හෙයින් මැදවච්චිය මෛත්‍රිපාල සේනානායක මහතාගේ ආසනය කොන් කිරීමට ලක් විය.

ලංකාවෙහි දෙමළ අයව පමණක් කොන් කිරීමට ලක්වන්නේය යැයි දොස් පැවරුවත් ඇත්තෙන්ම කිසිම ආණ්ඩුවක් විරුද්ධ පක්ෂයෙහි ආධාරකරුවන්ව සහ ඔවුන්ගේ මැතිවරණ ආසන පිළිබඳව සැළකිල්ලක් දක්වන්නේ නැත. සිංහල අය මෙයට දේශපාලන සායම් තවරන අතරෙහි දෙමළ ජනතාව නිතරම ආණ්ඩුවට එරෙහිව සිටින හෙයින් ජාතිවාදි සායම් තවරනු ලැබීම තමයි ඇත්ත.

මම එම කාලයෙහිදී බලවත් විරෝධයන් මැද්දේ මැදවච්චිය සහ පදවිය යන ස්ථාන දෙකෙහිම කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ද මැදවච්චියෙහි අලුතින් පශු වෛද්‍ය රෝහලක් ද මගේ උත්සහයෙන් විවෘත කෙරුණි. අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන රැස්වීම්වලට මෛත්‍රිපාල සේනානායක මහතා සහභාගි වූවේ නැත.

පශු වෛද්‍ය සහ පශු සම්පත් කටයුතුවලදී මා මැදවච්චිය ජනතා නියෝජිතයෙක් යැයි එවක දිස්ත්‍රික් අමාත්‍ය චන්ද්‍ර බණ්ඩාර මහතා මගේ අත අල්ලා ගෙන දිනක් පැවසුවේය. එක්තරා අයුරකින් එවක විසිපස් වයසෙහි පසුවූ මාව ඇගයීමට ලක්කර ඔහු එසේ පැවසීම මට ධෛර්‍යයක් සැපයුවේය. ඕනෑම මොහොතක දේශපාලඥයන් සමඟ සෘජුව කථා කළ හැකි ධෛර්‍යය මට සැපයුවේ එම රැස්වීම්ය.

කොළඹදී මෙවැනි රැස්වීමකට සහභාගි වූ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි සිට පැමිණි අනෙකුත් වෛද්‍යවරු පසුව සිකුරාදා කොළඹ නතරව හිඳ සති අන්තය කොළඹ ගතකර යෑමට කැමැත්තෙන් උන්හ. මට ද නතරව සිට යනමෙන් ඔවුහු බල කළහ. ඇත්තෙන්ම අනුරාධපුරය වැනි ස්ථානයක සිට කොළඹට ගිය අවස්ථාවක නගරයෙහි ජීවන අත්දැකීම් ලබාගැනීමට කැමැත්තක් දැක්වීම ස්වභාවිකය.

මම මගේ පුතාගේ පළමු උපන් දිනය ජූලි මාසයෙහි 25 වන දිනට යෙදී ඇති හෙයින් යාපනයට යායුතු බව පවසා 21 වන දින සවස පිටත් වූ අවස්ථාවෙහි මම අනුරාධපුරයෙහි සේවය කරන මගේ මිතුරු පශු වෛද්‍යවරයෙකු වන කළුආරච්චිගේ අනුරාධපුරය නිවෙසෙහි යතුරක් ඉල්ලා ගත්තෙමි. "රෑ මැදහරිය වෙනකොට අනුරාධපුරෙට ගිහිං නිදාගෙන පහුවදා උදේම යන්ඩයි කල්පනාව. ඒ හින්දා ඔයාලගේ ගෙදර නතරවෙලා යන්නං" යැයි මම පැවසූ අවස්ථාවෙහි ඔහු මට යතුර දුන්නේය.

මම කෙළින්ම කොළඹ සිට හෝ මහනුවර සිට යාපනයට නොයමි යන්න ආරක්‍ෂාව පිළිබඳ පියවරක් වශයෙන් බොහෝ කාලයක් අනුගමනය කළෙමි. කොළඹ සිට යාපනයට යන්නන් හමුදාව විසින් පරීක්‍ෂාවට ලක් කිරීමත් ප්‍රශ්න කිරීමත් එකල වූ සුපුරුදු කටයුතු විය.

මම කොළඹ සිට හෝ මහනුවර සිට අනුරාධපුරයට හෝ මැදවච්චියට ගමන් කරන විට එම මාර්ගයෙහි බොහෝ ලෙසින් ගමන් කළේ සිංහල ජනතාවයි. තවද එහි සිට වවුනියාවට ගමන් කරන වාහන නතර කර පරීක්‍ෂා කිරීමක් සිදු කෙරුණේ නැත. ගමන් කාලය මඳක් වැඩිවුවත් එය පහසුවක් විය.

උඩුරැවුල රහිතව ඉංග්‍රිසි පුවත්පතක් අතැතිව ගමන් කරද්දී බොහෝ දෙනෙක් සිංහල අයෙක් යැයි සිතාගෙන කථාබහෙ යෙදෙමින් පැමිණෙති. වැඩිපුර කථාබහට නොයා පුවත්පත තුළට ගුළිව පැමිණෙන්නෙමි. උඩු රැවුල රහිත මුහුණ ද තල තෙල් නොගෑ හිස ද සිංහල භාෂාවෙහි යම්තාක් දක්‍ෂ බව ද මගේ ආරක්‍ෂක සන්නාහකයන්ය යන්න එකල මගේ සිතේ තිබුණි.

මෙය සිදුවූවේ 1981 දී යැයි මම සිතමි. මම අනුරාධපුරයෙහි සිට වෑන් රථයකින් නුවරට යද්දී මාතලේ කිට්ටුව ගමන් කරමින් උන්නෙමි. සවස හයට සිංහල ප්‍රවෘත්තිවලට පොලිස් නිළධාරීන් දෙදෙනෙකු ඝාතනය කර ඇති බව පැවසූ අවස්ථාවෙහි එම වෑන් රථයෙහි සිටි සිංහල තරුණයෝ කීපදෙනෙක් නැගිට දෙමළුන්ව මරන්ඩ ඕනෑ යැයි පවසමින් වටපිට නෙත් යොමු කළහ. මම රියදුරු අසුනට පසුපස අසුනෙහි උන්නෙමි. එය සවන් වැකුණු වහාම මම *SUN* පුවත්පත ඔසවා ගෙන "ඒක ඇත්ත" යැයි කියමින් නැගිට්ටෙමි. එම තරුණයෝද "ඒකනේ මහත්තයා" යැයි පැවසූහ. එම ප්‍රවෘත්තිය අවසන් වූ වහාම එම තරුණයන්ගේ කෝපය විවෘත කළ සෝඩා බෝතලයෙන් පිට වූ ගෑස් මෙන් පහව ගියේය. මම දිගටම *SUN* පුවත්පත කියවමින් නුවර දක්වා ගමන් කළෙමි.

එදා රාත්‍රියෙහි මම අනුරාධපුරයෙහි නිදාගෙන පසුදින ඒ ආසන්නයෙහි වූ කළුආරච්චිගේ ඥාතින් මාව හොඳින් දන්නා අය හෙයින් එම අය සමඟ එක්ව උදේ ආහාරය ගෙන මැදවච්චියට ගොස් මගේ රෝහලෙහි කටයුතු කීපයක් නිම කර මගේ රාජකාරි යතුරු පැදියෙන් යාපනය කරා පිටත්වූවෙමි. යාපනයට යනවිට රාත්‍රි අට පමණ විය. දින දෙකකින් උපන් දිනය සමරන පුතාව සුරතල් කරමින් සිටිද්දී රෝහලෙහි සිට පැමිණි බිරිඳ "යාපනේ ටවුමෙ කේක් එකකට ඕඩර් කරල තියෙනවා" යැයි පැවසුවාය.

පසුදින උදෑසන අවදිව යාපනය රෝහලෙහි සේවය කරන බිරිඳ එහි ගෙන ගොස් ඇරලවා කේක් එක රැගෙන ඒම මගේ කාර්‍යය විය.

එදින රැය සතුටින් ගත විය. සතියකට වතාවක් දරු පවුල සමඟ ගත කරන රජයේ නිළධාරියෙකුගේ සති අන්තය එසේ නොවෙයිද? කිසිම උනන්දුවක් නැතිව, වර්තමානය හෝ අනාගතය ගැන සිතීමකින් තොර ජීවිතය. පවුලේ දෙන්නටම ආදායම් ලැබෙයි. යාපනයට පැමිණි විට පැදවීමට මාමාගේ කාර් රථය ද පහසුකම් සහිත නිවෙස ද වෙයි. ඒ ගමන්ම කොක්කුවිල්වල පිහිටි මගේ නිවෙසටත් ගොස් එයට පසුව මිතුරෙකු සමඟ ආනෙක්කෝට්ටෙට ගමට ගොස් රෑ බී පැමිණෙන විට ඒ දවස් දෙක ගෙවුනේ කෙසේදැයි හිතා ගන්නට බැරි අයුරින් ජීවත් වූ එම කාලය වසන්ත කාලය බව සැබෑවකි.

බිරිඳව යාපනයේ නගරයේ රැකියා ස්ථානයට කැටුව යන ගමණ සෙනසුරාදා උදේ අටට පමණ පිටත් වූවෙමි. මගේ යතුරු පැදිය යාපනයේ ප්‍රධාන වීදියෙහි ගමන් කර රෝහල පාරට වැටෙන තෙක් සියල්ල සුපුරුදු අයුරින් සිදු විය. රෝහල ඉදිරියෙන් ගමන් කරද්දී අනුරාධපුරයෙහි මගේ ඉහළ නිළධාරියෙකු වන දොස්තර පද්මනාදන් ඔහුගේ නිවෙසෙහි ඉදිරිපස සිට මට අත වැනුවේය. මම ඔහුට අත වනමින් රෝහල ඉදිරිපිට යතුරු පැදිය නතර කළෙමි. මගේ බිරිඳ රෝහල ඇතුළට ගියාය.

අහල පහල පරිසරයෙහි කුමක්දෝ වෙනසක් දක්නට දැනුණි. බොහෝවිට රෝහලට ඉදිරියෙන් වූ දෙපසට දිවෙන මාවතේ මැද්දෙහි කුලී වාහන සහ කුඩා බස්රථ අඩුම වශයෙන් කිලෝ මීටර් භාගයක් පමණ දුරටවත් නතර කර තිබෙයි. එනම් වේම්බඩි පාරෙහි සිට කන්කසංතුරෙ පාර දක්වා වන ප්‍රදේශය වාහන නතර කර තබන ප්‍රදේශය වශයෙන් පැවතිණ. නමුත් එදින කිසිම වාහනයක් මගේ ඇසට ලක්වූවේ නැත. ඇසට අසුවන ප්‍රදේශය පුරාවටම පාළුවට ගොස් තිබුණි. තව ද මා අසළ පොළොවෙහි කැඩී ගිය වීදුරු කැබැළි විසිරී තිබුණි. මම පුදුමයෙන් යුතුව එදෙස බලාගෙන සිටිද්දී කවුදෝ මාව නම කියා අඬ ගැසුවේය. මම හිස ඔසවා බැලූවිට මා සමඟ ඉගෙනගත් දොස්තර ජෙයච්චන්දිරන් මිතුරන් සමඟ වෛද්‍යවරුන්ගේ නිල නිවාසයෙහි බැල්කෙනියෙහි සිට "ඉක්මනට ඇතුළට වරෙං. එහෙම නැතිනම් ගෙදරට පළයං" යැයි කීවේය.

ඔහු කියූ දෙය ඇසුනත් එහි අරුත තේරුම්ගත නොහැකිව සිනාමුස්ව මම සිටින විට " ආයෙ වතාවක් ආමි එකෙන් ගුටි කන්න වගෙයි ලැස්තිය" යැයි ඔහු කීවේය.

අහළ පහළ කිසිවෙකුත් දක්නට නැති හෙයින් කුමක්දෝ නරක දෙයක් සිදුව ඇති බව සිතා ගෙන මම යතුරු පැදිය හරවා ගෙන දොස්තර පත්මනාදන්ගේ නිවෙස කරා ගියෙමි.

"මං උඹට අඬ ගැහුවෙ ඒ ගැන කියන්ඩ තමයි. රෑ කොල්ලො ආමිකාරයෝ කීපදෙනෙක් මරා දැම්ම කියන තරහට ආමි එක ඇවිල්ලා මේ හරියෙ නතර කරල තිබුණ කාර් එහෙම ගහල පොඩි කෙරුවා.

පිල්රෙලෙයාර් විලාස් හෝටලේ වැන් එකත් පොඩිකරල දැම්මා. ආපහු එයි කියන බයටයි පාරෙ කවුරුවත් නැත්තේ. අද කිසිම කඩයක් අරින එකක් නෑ"යැයි පත්මනාදන් දොස්තර මහත්තයා කීවේය.

පුතාගේ උපන් දින කෙක් එක අමතක කර කෙටි පාරවල් වලින් වුණ්ඩිකුලියට ගොස් මෙම පුවත මාමා සහ නැන්දා වෙත සැළ කළෙමි.

එයට පසුව හිතේ ඇතිවූ කනගාටුව වූවේ සවස බිරිඳ වැඩ අහවරව නිවෙසට එන්නේ කෙසේද? යන ප්‍රශ්නයයි. රෝහලෙහි සිටින තෙක් ප්‍රශ්නයක් නැත. මඟ දී කිසිම කරදරයක් සිදු නොවිය යුතුය යනුවෙන් සිතමින් උන්නෙමි.

සවස බිරිඳ නිවෙසට පැමිණියා පමණක් නොව එම කේක් එක ද ගෙනවිත් තිබුණි.

"කොහොමද ආවේ"යැයි මම ඇසුවෙමි.

"පයින් තමයි" ඇය කීවාය.

බොහෝ ආකාරයෙන් ස්ත්‍රීන් පිරිමින්ට වඩා ධෛර්‍යවන්තය යන්න මම අවබෝධ කරගත්තෙමි. මම හමුදාවට බයේ කේක් එක දමා ආවත් තම පුතු වෙනුවෙන් කේක් එකත් රැගෙන අවම වශයෙන් කිලෝ මීටර් තුනක දුරක් පයින් පැමිණීමට හේතුව මාතෘත්වයද? එසේත් නැතිනම් කාන්තාවන් සතු අසාමාන්‍ය එඩිතරබවද? එසේත් නැතිනම් සැබෑ තත්ත්වය අවබෝධ නොවීමේ නොදැනුවත්කමද?

මගේ පුතුගේ උපන්දිනය පවුල් දෙකෙහිම අය එක්ව ඉරිදා දිනයෙහි පැවැත්විණි.

24වන දින රාත්‍රියෙහි කොළඹ සිදුවූ කිසිම සිද්ධියක් පිළිබඳව හාංකවිස්සියක් නොදැන මම සඳුදා උදයේ සුපුරුදු ලෙසින් රජයේ යතුරු පැදියෙන් මැදවච්චිය කරා ගියෙමි. මගදී කිසිම බාධාවක් නොතිබුණි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රමුඛයෙක් වන කන්දසාමි - ඔහු පේදුරුදූඩුවෙහි දෙමළ අයෙකි - එම ප්‍රදේශයෙහි සිටි හෙයින් එම ප්‍රදේශයෙහි කිසිම බරතල සිද්ධියක් සිදුවූවේ නැත.

මගේ පුතුගේ උපන් දිනය නොයෙදෙන්නට මම අනිවාර්යයෙන්ම එදින කොළඹ සිටීම නිශ්චිතය. එසේ නම් මෙම ස්වයං චරිතාපදානය ලිවීමට සිදුවන්නේ පරලොව සිටය.

නැවතත් වෙන්නෙ.

මගේ ළඟ ඇති එකම එක ලිපිනයට හෙට ගොස් උපකාර ඉල්ලා සිටීමට මම සිතා ගත්තෙමි. මගේ බිරිඳගේ සහෝදරයා ලබා දුන් ලිපිනයේ සිටින අය මම පෙර සිටම දන්නා අය වෙති. මා සමඟ හින්දු විදුහලෙහි අධ්‍යාපනය ලබා පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරුවෙකු වී දැන් ඇමරිකාවෙහි වාසය කරන සෙල්වකුමාර්ගේ පියා වන කාසි විශ්වනාදන් ඉස්කෝලෙ මහත්තයාගේ නිවෙස අමෙන්තකරෙ නම් ස්ථානයෙහි පිහිටා තිබුණි. කුළී රථයකින් ඉස්කෝලෙ මහත්තයාගේ නිවෙසට මා ගිය අවස්ථාවෙහි මා සමඟ හින්දු විදුලෙහි අධ්‍යාපනය හැදෑරූ චාවච්කච්චේරි පරන්තාමන් ද එහි උන්නේය.

## හිසරදයට ඔසුවක් වූ සිග්නල් දන්තාලේපය

අමෙන්දකරෙ නම් ස්ථානයෙහි මහල් නිවාසයෙහි නිවෙසක කාසි විශ්වනාදන් ඉස්කෝලෙ මහත්තයා තම බිරිඳ සමග වාසය කළේය. එම දෙපල මා සමග ඉගෙනගත් සෙල්වකුමාරන්ගේ මව්පියෝ වූ හෙයින් පෙර සිටම මම ඔවුන්ව දැනගෙන උන්නෙමි.

ඔවුන්ගේ නිවෙසෙහිදී පරන්තාමන් නම් වූ මගේ ළමාවියෙහි සගයාව ඥානම් යන නමින් මට හඳුන්වා දෙනු ලැබූ අතර ඔහු ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි ප්‍රමුඛයෙක් ලෙසින් කාසි විශ්වනාදන් ඉස්කෝලෙ මහත්තයා විසින් මා වෙත හඳුන්වා දෙනු ලැබිණ. මා සමග ඉගෙනගත් අය මෙලෙසින් දේශපාලනයෙහි ප්‍රමුඛ පුද්ගලයෙකුව සිටීම එක්තරා අන්දමකින් මා තුළ විස්මයක් ඇති කිරීමට සමත් වූ අතර එම හඳුන්වා දීම මා තුළ කම්පනයක් ඇති කළේය.

ඒවන තෙක් සංවිධානය යනු මා නොදන්නා දෙයක්ය සහ මගේ සම්බන්ධයක් නැති අයය යන සිතිවිල්ල මා තුළ තිබුණි. එය බොහෝ මධ්‍යම පාංතිකයන්ට පොදුවූ අදහස යැයි මම සිතමි. ඇතින් පෙනෙන දෙයක්ව තිබූ ආයුධ සන්නද්ධ කණ්ඩායම් අපේ යාපනය සමාජයට තමන්ගේ ඒවා ලෙසින් සිතීමට සලස්වන්නට 1983 ජූලි සිදුවීම් හේතු වූවා විය හැක. නමුත් මම රැකියාව කළේ සිංහල ප්‍රදේශවල හෙයින් එම අදහස මා තුළ ඇති වීමට මම ඉන්දියාවට පැමිණෙන තෙක් කල් ගත්තා විය හැකිය. යමෙක් ජීවත්වන පරිසරය විසින් ඔහුගේ චින්තනය, සංස්කෘතිය සහ හැදියාව යනාදිය සකස් කරනු ලැබෙයි යන්න කොයිතරම් සත්‍යයක් ද යන්න මම ඒ අවස්ථාවෙහි අවබෝධ කරගත්තෙමි.

ඉගෙන ගන්නා කාලයෙහිදීම පරන්තාමන් වෙනස් විදියේ අයෙක්ය. යාපනය හින්දු පාසලෙහිදි ඔහු මගේ අංශයෙහි නොව වෙනත් අංශයක වුවත් අපි පාසලට ඇතුළුවූවේ එකම පංතියෙහිදීය. එහෙයින් වසර ගණනක් එකම පාසලේ ඉගෙනගත් ආශ්‍රය අප සතුව තිබුණි.

පාසල් නේවාසිකාගාරයෙහි සිටි එකල අපේ සාමාන්‍ය විනෝදාංශය වූවේ දෙමළ චිත්‍රපට බැලීමයි. මේ හැර එකල ප්‍රකට නළුවෙකුගේ රසිකයෙකුව ඉඳ එම නළුවා පිළිබඳ කථා කිරීමත් ඔහු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමත් අපේ පාසල් ජීවිතයෙහි ප්‍රධාන ලක්ෂණ විය.

මම ශිවාජි ගනේෂන්ගේ රසිකයෙක්ව සිටියෙමි. එකල බොහෝ දෙනෙක් එම්.ජී.ආර්.ගේ රසිකයන්ව උන්හ. නමුත් එකල *ශාන්ති නිලෛයම්* නමින් වූ චිත්‍රපටයෙහි ළඳැරියකගේ චරිතය රඟ පෑ මංජුලාගේ රසිකයෙක්ව එම චිත්‍රපටය නව වතාවක් නැරඹූ අයෙකි මෙම පරන්තාමන්. ඒ හේතුව නිසාම ඔහු වෙනස් සිනමා රසඥතාවයක් ඇත්තෙකු ලෙසින් අප අතරෙහි හැඳින්වීමට ලක් වූවේය. පරන්තාමන් දකින සෑම අවස්ථාවකදීම මංජුලා නම් නිළියගේ රූපය මගේ සිතෙහි මතුවෙයි.

**ඡායාරූපයඃ පරන්තාමන්, පුෂ්පරාජා, පද්මනාභා.**

කාලය ගෙවී මම විශ්ව විද්‍යාලයට ගිය පසුව පරන්තාමන්ගේ පියා මියගිය පුවත මගේ සවන් වැකුණි. ජීවිතය යන දුම්රිය ගමනේ වෙනස් වෙනස් දිසාවන් බලා ගමන් කළ හෙයින් අපි පසුකළෙක වසර ගණනාවක් යනතෙක් හමුවූවේ නැත.

ඉස්කෝලේ මහත්තයාගේ නිවෙසෙහිදී හමුවූ පරන්තාමන් දැකීමෙන් ඇතිවූ විමතියෙන් මිදීමට පෙර පරන්තාමන් මාහට "උඹේ යාළුවා කුන්ජිත් මෙහෙ ඉන්නවා" යැයි කියූ අවස්ථාවෙහි හින්දු විදුහලේ නේවාසිකාගාරයෙහි සිටි ඉඩෛක්කාඩු ගුණසේකරම් මගේ සිතෙහි දර්ශනය විය.

මම මැදවච්චියෙහි වැඩ කරන කාලයෙහි මම ඔහුව දෙතුන් වතාවක් යාපනය බස් නැවතුම්පළෙහි හමුවූවෙමි. ඒ සවස් කාලයෙහි රැවුල වවාගත් අයෙක් මගේ අත හුරද්දී මම හැරී බැලුවෙමි. බැලූ බැල්මට යාචකයෙක් සේ වැවුණු රැවුළකින් ද හිසෙහි බැඳගත් තුවායකින් ද යුතුව ඔහු උන්නේය. "කොහොමද වාසේ දේසේ?" යැයි අසා ඔහු එක්වරම කුරුල්ලෙකුසේ කොහෝටදෝ සැඟව ගියේය. ඔහු සැඟවුණු ජීවිතයක් ගත කරන බව මම පසුව සිතන්නට වූවෙමි.

"වෙන කවුරුද අපිත් එක්ක ඉගෙන ගත්ත අපි දන්න අය මෙහෙ ඉන්නේ?" යැයි මම අලුත් ස්ථානයෙහි ඉන්නා අය දැන ගැනීමේ සාමාන්‍ය උනන්දුවෙන් ඇසුවෙමි.

"කුගන් තව හරිශ්චන්දිරන් කියල හින්දු කොලේජ් එකේ ඉගෙන ගත්ත දෙන්නෙක් කොටි සංවිධානෙත් එක්ක ඉන්නවා".

"එහෙමද? හරිශ්චන්දිරන් සංවිධානෙකට බැඳිල ඉන්නවා කියන එක හීනෙකින් වත් හිතපු දෙයක් නෙමෙයි".

අපි මෙසේ කථාබහේ යෙදී සිටිද්දී "ඉලන්දාරියෝ දෙන්නෙක්ම ඉන්නවනේ" යැයි පවසමින් ඉස්කෝලේ මහත්තයා ලීටරයක පරිමාවකින් යුතු බ්ලැක් ඇන්ඩ් වයිට් බෝලතයක් අප ඉදිරියෙහි තැබුවේය.

එම බෝතලයෙහි මධු සමග තවත් කරුණු එළියට පැමිණෙන්නට විය.

පරන්තාමන් හමුදාවෙහි ග්‍රහණයට ලක්ව සිර ගෙයි සිටි බව දැන ගත්තෙමි. ජීවිතයෙහි කිසිම දිනක පොලිසියකට ගොස් නොමැති මට මෙම පුවත මහත් විශාල කරුණක් විය.

මම ඉගෙන ගන්නා කාලයෙහි වණ්ණෛයානන්දන්, මාවෛ සේනාධිරාසා, කාසියානන්දන් වැනි අය සිරගෙයි සිට නිදහස්ව පැමිණෙද්දී ඔවුන් වෙනුවෙන් පැවැත්වූ පිළිගැනීමේ උත්සව ද ලෙයින් පොට්ටු තැබීම ද උතුරා යන හැඟීම් සහිතව දැක ඇත්තෙමි. සිර බත් කෑ විරුවන් යන වදන් නිතර නිතර මගේ සවන් වැකුණි. මාල කඩා සිරගතවූවෝ පවා සිර බත් කෑ විරුවන් ලෙසින් පෙනී සිටියහ. ඉගෙනගත් තරුණයන්ට යාපනයෙහි කොයිකාලයෙහිත් ගෞරවයක් ලැබුණි. පසුකලෙක මෙවන් විරුවන් හේතුවෙන් එම බලවත් බව ඇද වැටුණු බව සත්‍යයකි.

"ඒ කියන්නේ අපේ පරන්තාමනුත් සිර බත් කෑ වීරයෙක්"

"උඹට හැම එකක්ම ජෝක් නේ. තව දවස් කීපයක් ඉන්ඩ වුනානං මාවත් වැලිකඩදී මරා දමන්ඩ තිබුණා".

මා සිතෙහි කනගාටු හැඟීමක් මතු විය.

"මං හිරේ හිටියේ කුට්ටිමණි, ජෙගන් එක්කල තමයි. මං එළියට ආවෙ 83 ජූලි කලබලේ සිද්ද වෙන්න දවස් දෙක තුනකට ඉස්සෙල්ලා. හිටිය නං මාත් කපෝතියි තමයි".

"ඒකහරි. කුට්ටිමණි තංගත්තුරෛහෙම අහුවෙන්ඩ හේතුව ප්‍රභාකරන්ය කියල කතාවෙනවා. ඒක ඇත්තද?" යැයි මම ඇසූ විට

"පුතේ මෙහෙදි ඔය ප්‍රශ්න ඇති කරවන කථා කතා නොකර හිටියනං හොඳයි" යැයි ඉස්කෝලේ මහත්තයා කීවේය. "කුට්ටිමණියි තංගතුරෛ එහෙම තමයි විශ්වාස කරන්නේ. එවගේම කුට්ටිමණි කියනවා මං එළියට ගියහම ඕකට පෙන්නං නං මං කවුද කියල කියනවා මගේ කණට ඇහිල තියෙනවා"යැයි කියූ අවස්ථාවෙහි ඉස්කෝලෙ මහත්තයා "ඔය කථාව නතර කෙරුවනං තමයි හොඳ. ස්ථිරවම කියන්ඩ බැරි දේවල්" යැයි කීවේය.

ඡායාරූපයඃ කුට්ටිමණියි- තංගතුරෛ- ජෙගන් අත්අඩංගුවෙහි

1981 වසරෙහි අප්‍රේල් මාසයෙහිදී කුට්ටිමණියි, තංගතුරෛ ඇතුළු අයව මුහුදු වෙරළෙහි බලාපොරොත්තුව උන්නේ ඔවුන්ට ඉන්දියාවට යෑමට බෝට්ටු ධාවකයෙකු ප්‍රභාකරන් විසින් සංවිධානය කර දීමට නියමිත සිටි නිසාය. ඔවුන් එම බෝට්ටු ධාවකයා පැමිණෙන තෙක් සිටිද්දී අත් අඩංගුවට පත්ව ඇති බවට කථාවක් යාපනයෙහි තැනින් තැන පැතිර ගියේය. නමුත් ඉස්කෝලේ මහත්තයාගේ නිවෙසෙහිදී ඔහුගේ එම බ්ලැක් ඇන්ඩ් වයිට් බෝතලය පානය කරමින් මෙයට වඩා ඉදිරියට එම කථාව ගෙන යෑම ශිෂ්ටාචාරවත් නොවන හෙයින් එම කථාබහ මධුපානය තුළ ගිල්වා දැමුවෙමු.

ඉස්කෝලේ මහත්තයා ගෙනවිත් දුන් තෝසෙ අනුභව කර එදා රෑ ඔහුගේ නිවෙසෙහි ගත කළෙමි යැයි කියනවාට වඩා බිම වැටී උන්නෙමි යැයි කීම වඩාත් නිවැරදිය.

පරන්තාමන් හෙවත් ඥානම්ගේ ඇරයුම මත මම එපික් යනුවෙන් හැඳින්වුණු ඊළම් ජනතා විප්ලවවාදි විමුක්ති පෙරමුණෙහි තොරතුරු මධ්‍යස්ථානයට ගියෙමි. සූලෛමේඩු ප්‍රදේශයෙහි ගොඩනැගිල්ලක ඉහළ මාලයෙහි එය පිහිටා තිබුණි. එහි සිටි අය සිනාමුසු මුහුණින් යුතුව සහෝදරයා යනුවෙන් මාව පිළිගත්තා පමණක් නොව එදින රාත්‍රී ආහාරය ද ලබා දුන්හ.

එහි දෙමළ සහ ඉංග්‍රිසි පුවත්පත් පහක් ද පොත් ද තිබුණි. මම පැය දෙකක් පමණ එහි සිට පැමිණි පසුව මම ඇතුළට යන විට දොරටුව අභියස තබා ගිය පාවහන් යුගල දක්නට නැත. අනෙක් අයගේ පාවහන් යුගලක් පැළඳ ගෙන ඒමට සිත් නොදුන් හෙයින් පාවහන් රහිතව ආට්‍රිකාඩු පාරෙහි කිලෝ මීටර් භාගයක් පමණ ගොස් නව පාවහන් යුගලයක් මිලදී ගෙන නතරව උන් කාමරයට පැමිණියෙමි. පාවහන් යුගල අහිමි වුවත් සහෝදරත්වයෙන් යුතු එම ස්ථානය මගේ සිත් ගත්තේය. එමෙන්ම මගේ කුඩා වියේ මිතුරෙකු වූ කුන්ජී "උඹ ඕනෑම වෙලාවක මෙහෙ වරෙං" යැයි පැවසුවේය. එහි යන මම දිගටම පොත් කියවමින් සිටියෙමි. එම ස්ථානයෙහි කථාබහ කිරීමට අය ද කියවීමට පොත් ද තිබීම මාව ආකර්ශනය කිරීමට හේතු විය.

මම සමහරු දිනවල රාත්‍රිය එපික් කාර්යාලයෙහි ගත කර ඇත්තෙමි. කිළිටි කොට්ටයක හිස තබාගෙන බිම නිදා ගන්නෙමි. රෑ මැද්දෙ අවදිව බලන විට හිස තබාගෙන තිබූ කොට්ටය අතුරුදහන්ව ගොසින්ය. හාත්පස බිත්තිවල තිබෙන කාර්ල් මාර්ක්ස්, ලෙනින්, ස්ටාලින් වැනි අය එම පින්තූරුවලින් එළියට ඇවිත් "උඹ කවදද කොමියුනිස්ට්වාදියෙක් වෙන්නේ?" යැයි මා දෙස නෙත් යොමු කරමින් අසති. එහි මාවෝ සේතුංගේ ඡායාරූපයක් නොමැතිවීම මගේ සැනසිල්ලට කරුණක් විය. මට කොමියුනිස්ට්වාදි දර්ශනය ඉගෙන ගැනීමට හැකිවූ ස්ථානය වූවේ එම එපික් කාර්යාලයයි. මම ඔස්ට්‍රේලියාවට පැමිණෙන තෙක්

එකලම මම මාවෝ සහ ස්ටාලින්ව ලෝක ඉතිහාසයෙහි මහා ඝාතකයන් ලෙසින් හඳුනා ගෙන සිටියත් ලෙනින් කෙරෙහි සහ කාර්ල් මාර්ක්ස් කෙරෙහි ළා රතු අභිමානයක් මා තුළ විය.

1984 වසරෙහි මැයි මස මධ්‍යහ්ණ අව්වේ මම එපික් කාර්යාලයෙහි සිටි මොහොතේ පාරෙන් මහත් කෑ කෝගැසීමක් ඇසෙන්නට විය. මම පඩිපෙළ බැසගෙන අසළ වූ කුඩා පාරට පැමිණ බැලුවෙමි. ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයෙහි සහෝදරවරු වයස තිහක පමණ පුද්ගලයෙකුට පහර දෙමින් උන්හ. ඔහු විලාප දුන්නේ අම්මේ, අම්මේ යනුවෙන්ය.

"සිංහල ඔත්තුකාරයෙක්" යැයි සමහරු කෑ ගැසූහ. කළ යුත්තේ කුමක්දැයි මට සිතා ගත නොහැකි විය. බොහෝ දෙනෙක් එක්ව එක් පුද්ගලයෙකුට පහරදෙනු මා දැක්කේ පළමු වතාවටයි.

එක් අයෙක් පහරදීම නතර කර එම පුද්ගලයාගෙන් ප්‍රශ්න කළ අවස්ථාවෙහි ඔහු මලයාළම් භාෂාව කතාකරන්නෙකු බව තේරුම් ගත හැකි විය.

ඔහු අම්මේ යනුවෙන් කෑ ගැසීම මෙම පිරිසට ඔහු සිංහල අයෙකු ලෙසින් වරදවා වටහා ගැනීමට හේතු වී ඇත.

මෙම සිද්ධිය එයට සම්බන්ධ අය වූ අමතක කර ඇතුවා විය හැකිය. නමුත් මට එය අමතක කළ නොහැකි සිද්ධියකි. එම පහරදීමට ලක්වූ මලයාලි මිනිසා පිටුපස බලමින් හෙමින් ගමන් කළ අයුරුත් පහර දුන් අය ඔහුගෙන් සමාව ඉල්ලීමත් පහර දුන් සමහර සහෝදරවරු පශ්චාත් තාපයට ලක්ව කථාකළ අයුරුත් මට අමතක කළ නොහැකිය.

අහිංසක සිංහලයෙක් එසේ අසු නොවුනේ හොඳ වෙලාවට යැයි ද එසේ අසුව සිටියේ නම් ඔහුගේ ඉරණම කුමක් විය හැකිව තිබුණේ ද යන්නත් සිතීමට මගේ සිත අමතක කළේ නැත.

මම දිනක් සවස චිත්‍රපට බැලීමට ගොස් එය අහවරව එපික් කාර්යාලයට ගියේ හිසරදයෙන් පීඩා විඳිමින්ය. මම එහි සිටි සහෝදරවරුන්ගෙන් හිසරදයට බෙහෙතක් ඉල්ලා සිටියෙමි. සියලු දෙනාම නැතැයි යන පිළිතුර පමණක් දුන්හ. ඒ අවස්ථාවෙහි අඩි හයක් පමණ උසැති හොඳින් ගිතෙල් කා වැඩුණු සිරුරකින් හෙබි අයෙක් සිනාමුසුව පැමිණියහ. ඔහු මගේ සම වයසේ අයෙකු වුවත් ඔහුගේ සිරුර සහ සිනාමුසු බව ඔහු ගරුකටයුතු අයෙකු බවට පත් කර තිබුණි. සංවිධානවල බොහෝ දෙනෙක් කෘශ වූ සිරුරු ඇත්තෝ වූහ. ඊළම් ජනතා විප්ලවවාදි විමුක්ති පෙරමුණෙහි අය සාගතයෙන් පීඩා විඳි ඉතියෝපියා, සෝමාලියා වැනි රටවල අයගේ පෙනුමක් දැරූහ. එමෙන්ම ඔවුන්ට ලැබෙන ආහාරය මම දැක ඇත්තෙමි. එය මම බෙදා හදාගෙන කා ඇත්තෙමි. එහෙයින් නිශ්චිතවම මොහු ඔවුන්ගෙන් කෙනෙක් නොවිය හැකිය යැයි මගේ යටි සිත පැවසුවේය.

එම සශ්‍රීක මිනිසා "ඉන්න මං බෙහෙතක් දෙන්නං" යැයි පවසා කුමක්දෝ සුදු පැහැ ආලේපයක් මගේ නළලේ රත්වන තෙක් තැවරුවේය. මමත් ඔහු වෙදහෙදකම දන්නා අයෙක් විය යුතුය යන සිතිවිල්ලෙන් කාමරයට ගොස් නිදා ගත්තෙමි. නිශ්චිතවම හිසරදය සුව වී ඇතැයි සිතුවෙමි.

පසුදින මම එපික් කාර්යාලයට ගිය මොහොතේ කුන්ජි මාව අතින් අල්ලාගෙන කුස්සියට කැඳවා ගෙන ගොස් "උඹ කීප දවසකට මෙහෙ එන්ඩ එපා" යැයි කීවේය. මම ඒ ගැන කිසිම විමසීමක් නොකර එළියට පැමිණි මොහොතේ පෙර දින මා හමුවුණු ඒ පුද්ගලයා මා ඉදිරියට පැමිණ "දැන් කොහොමද හිසරදේ?" යැයි ඇසුවේය.

"ඔයාට පින් සිද්ද වෙන්ඩ රෑ හොඳට නිදා ගත්තා".

"මං ඔයාගේ ගෑවේ සිග්නල් දන්තාලේපය" යැයි පවසා සිනා සී තමන්ගේ නම විශාඛන් බවත් තමන් යාපනය විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබූ බවත් පවසා ඔහුව අඳුන්වා දුන්නේය. ඔහු සමඟ එදා ඔහුගේ විශ්ව විද්‍යාලයීය සගයෙකු වූ මහේශ්වරරාජා ද උන්නේය.

දින කීපයක් ගතවන තෙක් මට නොඑන මෙන් පැවසුවේ මක් නිසාද? යන්න මට ප්‍රහේලිකාවක් විය. ලංකාවෙහි කුමක්දෝ මෙහෙයුමක් කිරීමට නියමිතය යන අදහස විශාඛන් මට ඇඟවුවේය.

ඒවන විටත් වෙල්වනායගම් චන්දිරහාසන් සමඟ තමන් ඔබරල් ආයතනයෙහි වැඩ කරන බවත් එහි පැමිණ තමන්ට සහාය වන ලෙසත් විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා මගෙන් ඉල්ලීමක් කර තිබුණි. පසුදින මම එග්මෝර් ප්‍රදේශයෙහි පිහිටා තිබුණු ඔබරල් ආයතනයට ගිය අවස්ථාවෙහි ඉස්කෝලේ මහත්තයා "ඇයි, මෙච්චර දවසක් ආවෙ නැත්තේ?"යැයි ඇසුවේය.

"මං ඥානම්ලගේ තැනට ගියා" යැයි පැවසුවෙමි.

"උන් වැඩකට නැති එවුන්. නාහා විතරයි හොඳ මනුස්සයෙකුට එතැන ඉන්නේ. උන් නිකං තේරුමක් නැතිව කොමියුනිස්ට්වාදෙ දේශනා කර කර කාලය කනවා. බලන්ඩ කොටි කොහොමද කියල. එයාලා ඔය මාර්ක්ස්වාදේ, කොමියුනිස්ට්වාදෙ කතා කරනවද? උන් දන්නවා සිංහලයොන්ට කොයිතැනට ගැහැව්වොත් ද හරි කියන එක " ඉස්කෝලෙ මහත්තයා පැවසූ වදන් පැහැදිළිව තේරුම්ගත හැකි විය.

නමුත් කොටින්ගේ වැඩ කටයුතු නිවැරැදිය යනුවෙන් සිතීම මට නොහැකි විය. මට අනුව ආයුධ සන්නද්ධ අරගලය ප්‍රතික්ෂේප කළ නොහැකි නමුත් මානව හිතවාදි කටයුතුවල නිමග්නවීම වඩාත් කාලෝචිත යැයි සිතුවෙමි.

"පේරාදෙනියේ, කොළඹ විශ්ව විද්‍යාලවල ඉගෙන ගෙන උපාධි සම්පූර්ණ කරගන්ඩ නොහැකි වෙච්ච ගොඩක් අය මෙහෙ ඇවිත් ඉන්නවා. ඒ අයට තමිල්නාඩුවේ විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්ඩ අවස්ථාව සලසලා දෙන එකට අදාල වැඩවල මං යෙදිල ඉන්නවා. ඒ ගැන සාකච්ඡාවකට හෙට අධ්‍යාපන ඇමැති අරංගනායකම් මහත්තයාව හමුවෙන්න තියෙනවා. උඹත් එනවාද?"යැයි ඉස්කෝලේ මහත්තයා ඇසුවේය.

මම පසු දින අධ්‍යාපන ඇමැතිවරයා හමුවීමට යෑමට සූදානම් වූවෙමි.

## තමිල්නාඩු ඇමැති හමුවීම

උදෑසන අව්දි වූ වහාම හදිස්සිය, උනන්දුව සහ තැතිගැන්ම යනාදි හැඟීම් වෛරසයක් මෙන් අප තුළ පැතිරෙන්නට විය. ලංකාවෙහි ඇමැතිවරු සහ ඉහළ නිලධාරීන් බොහෝ දෙනෙකු සමග කතාබහ කර ආශ්‍රය කර ඇත්තෙමි. මම සේවය කළ පශු සම්පත් අංශය සමඟ සම්බන්ධ තොණ්ඩමාන් ඇමැතිතුමාව හමු වී ඇත්තෙමි. අනුරාධපුරයෙහිදි බොහෝ සිංහල ඇමැතිවරු සමඟ මම සේවය කළ මැදවච්චිය ප්‍රදේශය සංවර්ධනය කිරීම පිළිබඳව කථාබහ කර ඇත්තෙමි. එහෙයින් දැන් චෙන්නෙහි අනාථයෙකුව සිටින මම ඇමැතිවරයෙකු හමු වීමට යෑමට ලැබීමත් එයටත් වඩා අනෙක් අයගේ ප්‍රයෝජනය සඳහා සාකච්ඡා කිරීමට යෑමට ලැබීමත් මාව ධෛර්යමත් කිරීමට සමත් විය.

මම චෙන්නෙ පැමිණි පසුව මගේ ඇඳුම් පැළඳුම් පිළිබඳ සැළකිළිමත්බව අඩුවිය. චෙන්නෙහි දුහුවිල්ල සහ අව්ව මා තුළ පැලපැදියම් විය. පයින් එසේත් නොමැතිනම් බස් රථයෙන් ගමන් කරන බැවින් දහදියෙන් නැහැවී මෙම නගරයෙහි දියවී යන ලක්‍ෂ සංඛ්‍යාත ජනයාගෙන් එකෙකි නුඹ යන සමානාත්ම හැඟීම මගේ සිත තුළ ජනිත විය. කවුරු දකින්නද? කවුරු අහන්නද? දරුවොද? බිරිඳද? රැකියාවකුත් නැති අයෙක්නේ යන සිතිවිල්ල බොහෝ විට විය. එහෙයින් මම රබර් සෙරෙප්පු ජෝඩුවකින් සහ ටී ෂර්ට් එකකින් යුතු චෙන්නෙ වැසියෙකු වූවෙමි. එදා මම සුදු ෂර්ට් එකක් සහ නිල් පැහැති කළිසමකින් ද සපත්තු ජෝඩුවකින් ද සැරසී ඊළම් අනාථ සංගමයට ගියෙමි. මම එනතෙක් එහි බලාගෙන සිටි කාසි විශ්වනාදන් ඉස්කෝලෙ මහත්තයා "ඔය ඇවිල්ලා ඉන්නේ මනමාලියෙක් බලන්ඩ යන මනමාලයා වගේ. පුතෝ ඒවට නං ලැස්ති වෙන්ඩ එපා. මම කියනවා ඇමරිකාවෙ ඉන්න උඹෙ මස්සිනාට" යැයි පවසමින් නතර කර තිබූ කුලී රථයට නැංගේය. මම නිහඬවම ඔහුව අනුගමනය කළෙමි.

ඡායාරූපය: සන්දිරහාසන්

කාසි විශ්වනාදන්ට අමතරව ඊළම් අනාථ සංගමයෙහි කටයුතු කළ ඊළවේන්දන් තිදෙනෙකුගෙන් යුතු පක්ෂයක් පවත්වා ගෙන ගියේය. මම ඔහු සමඟ කතාබහේ යෙදුණු සැම අවස්ථාවකදීම මැඩම් ඉන්දිරා ගාන්ධිව හමුවීම පිළිබඳ එකම තැටිය වාදනය කරමින් උන්නේය. එපා වී ඔහුව හමුවීම වළක්වා ගැනීමට උත්සහ ගත්තෙමි. සමහර අවස්ථාවලදී සැඟවෙන්නෙමි. චෙල්වනායගම් චන්දිරහාසන් වචන කිරා මැන කථා කරන්නෙකි. තවත් බොහෝ අය සිටියත් මගේ බොහෝ ගනුදෙනු තිබුණේ කාසි විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා සමඟය.

ඔහුගේ පුතා සමඟ ඉගෙන ගත් මා සමඟ ඔහු පවත්වාගෙන ගිය මිත්‍රශීලී ආකල්පය මගේ සිත් ගත්තේය. කිසිම දේශපාලනයක් සමඟ සම්බන්ධ නොවී දෙමළ ජනතාවට උදව් කිරීම යන ආකල්පය පමණක් ඔහු තුළ විය. දක්ෂිණාංශික ප්‍රවනතාවයෙන් යුතු අයෙකු ලෙසත් කොමියුනිස්ට්වාදයට එරෙහි අයෙක් ලෙසත් ඔහු සිටියත් ඔහු පද්මනාභා පිළිබඳව පවසන විට "උඹ තමයි මේ සංවිධානවල ඉන්න අයගෙන් ශික්‍ෂණයක් සහ අවංකකමක් තියෙන එකා" යැයි පවසයි.

ඔහු බොහෝ කාලයක් යාපනය මධ්‍යම මහ විදුහලේ රැකියාව කළ හෙයින් බොහෝ අවස්ථාවල වරෙං පළයං යනුවෙන් තමයි අමතන්නේ. එම වචන තුළ ආදරය පිරී ඇති හෙයින් කිසිවෙකුටවත් ඔහුව ප්‍රතික්ෂේප කළ නොහැකිය. එමෙන්ම අවංකව හිතට එන දෙය පවසන්නෙකි.

මම ඔහු සමඟ ගත කළ කාලය මිහිරිය.

අරංගනායගම් ඇමැතිවරයාව හමුවීමට ගිය මම සහ කාසි විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා ඇමැතිවරයාගේ නිවෙසෙහි එළිපත්තේ බලාගෙන උන්නෙමු. දෙමළ චිත්‍රපටවල පෙන්වන්නාක් මෙන් සුදු වේට්ටියකින් සහ කමිසයකින් සැරසී උඩු රැවුලක් සහිත කාල වර්ණ දේහධාරී කීප දෙනෙක්ම එහි උන්හ. තට්ටය සහ ඉදිරියට නෙරා ආ උදරය බොහෝ දෙනෙකුගේ පොදු ලක්‍ෂණය විය.

1983 වසරෙහි ප්‍රචණ්ඩ සිදුවීම්වලට පසුව ලංකාවෙහි දකුණෙහි වූ විශ්ව විද්‍යාලවල තව දුරටත් අධ්‍යාපනය හැදෑරීමට නොහැකිව තමිල්නාඩුවට පැමිණි අයව තමිල්නාඩු විශ්ව විද්‍යාලවල එම වර්ෂයන්හී අධ්‍යන කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබාදිය යුතුය යන ඉල්ලීම අපි රැගෙන ගිය ලේඛණයෙහි තිබුණි. එම්.ජී.ආර්.ගේ අමාත්‍ය මණ්ඩලයෙහි අධ්‍යාපන ඇමැතිවන අරංගනායගම් එය වෙත භාර දීමට අපි බලාපොරොත්තුව උන්නෙමු. එම ඉල්ලීමට තමිල්නාඩුවට පැමිණ සිටි ලංකාවෙහි විශ්ව

විද්‍යාල සිසුන් පහලොස් දෙනෙකුගේ පමණ නම් ඇතුළත්ව තිබුණි. මෙම කරුණ පිළිබඳව උත්සහයක් දැරීමට අපව ධෛර්යමත් කළේ යාපනයෙහිදි උපවාස කරමින් සිටියදී විමුක්ති කොටි සංවිධානය විසින් පැහැර ගෙන පැමිණීමට ලක් වූ අයයි. ඔවුන්ගෙන් සමහරු ඔපර් යනුවෙන් හැඳින්වුණු ඊළම් අනාථ සංගමය වෙත පැමිණ මෙම ඉල්ලීම ඉදිරිපත් කළහ. නැවතත් ලංකාවට ගොස් ඔවුන්ට අධ්‍යාපනය හැදෑරිය නොහැකිය යන්න පැහැදිළි වූ පසුව මෙය අනිත් අයටත් අදාල වන පොදු ඉල්ලීමක් ලෙසින් ඉදිරිපත් කළෙමු.

දැන් මේ ගැන හිතන විට විමුක්ති කොටින් විසින් සිදු කළ වගකීම් රහිත බොහෝ කටයුතුවලින් එකක් ලෙසින් මෙය පෙනෙයි. නමුත් එකල එම සිසුන් පිළිබඳව කිසිවෙකුත් කනගාටු වූවේ නැත. ඔවුන්ගේ මව්පියෝ පමණක් හිතේ ගින්දරෙන් උන්නා විය යුතුය. බොහෝ කාලයක් යනතෙක් මදිවදනිගේ (මදිවදනි යනු ප්‍රභාකරන්ගේ බිරිඳයි - පරිවර්තක) පියා වූ දෙමළ ගුරු ඒරම්බු ඉස්කෝලේ මහත්තයා ඔහුගේ ගම වූ පූංගුඩුතීවු දූපතේදී විමුක්ති කොටින්ට බැන වදිමින් උන්නේය යන්න දැන ගන්නට ලැබුණි.

ඇමැතිවරයා වෙත ලබා දීම සඳහා ඉල්ලීම් ඇතුළත් සංදේශය ඔපර් සංවිධානය පවත්වා ගෙන ආ චන්ද්‍රහාසන් සහ කාසි විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා විසින් සකස් කර තිබුණි. මම දෙමළ චිත්‍රපටවල එන සැමවිටම ප්‍රධාන චරිතයට උදව් කිරීමට සිටින සහාය නළුවා මෙන් ගොස් සිටියෙමි.

අපි ඇමැතිවරයා හමුවීම වෙනුවෙන් බලාගෙන උන්නෙමු. අපේ වාරය පැමිණි විගසම ඇතුළට ගියෙමු. නිවෙසෙහි සාලයෙහි අරංගනායගම් ඇමැතිවරයා දිගු සෝපාවෙහි සුදු වේට්ටි සහ ෂර්ට් ඇඳගෙන සිනාසීමට අකැමැති අයෙක් මෙන් අසුන්ගෙන උන්නේය. ඔහුව වටකරගෙන බොහෝ දෙනෙක් උන්හ. ඔහු අප දෙස නෙත් යොමු කළ අවස්ථාවෙහි විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා ඔහුට වණක්කම් (ආයුබෝවන්) යැයි කීවේය. මම ඔහුට පිටුපසින් සිට ලංකාවෙහි ඇමැතිවරුන්ට කියන්නාක් මෙන් ගුඩ් මෝනිං යැයි කීවෙමි.

වචන නාස්ති නොකළ යුතුයැයි ඇමැතිවරයා සිතුවා විය හැකිය. මා දෙස බැලුවේවත් නැත. නමුත් ඉස්කෝලේ මහත්තයා අත වූ එම සංදේශය භාරගෙන හිස සැලුවේය.

ඇමැතිවරයා සමඟ වූ හමුව එයින් අවසන් විය. ඇමතිවරයාගේ ප්‍රතිචාරය මා තුළ ඇති කළේ බලාපොරොත්තු කඩකිරීමකි. නිවෙසෙහි දොර දක්වා අපි නැවැත පැමිණෙද්දී ඔහුගේ ලේකම් ඉතාමත් හදිසියෙන් පැමිණ දැස් තියුණු ලෙසින් විවර කර "ඇමැතිතුමාට ආචාර කරන විදිය දන්නෙ නැද්ද? මොනවද ඉගෙන ගෙන තියෙන්නේ?"යැයි ඉතාමත් බරපතළ ලෙසින් ඇසුවේය.

ඡායාරූපයඃ තමිල්නාඩුවෙහි හිටපු අධ්‍යාපන ඇමැති අරංගනායගම්

කාල වර්ණ මිටි ඉස්සරහ තට්ටය ඇති එම පුද්ගලයා දුටු වහාම ඔහු ඇසූ අන්දම මා තුළ සිනාවක් ජනිත කළේය.

"මං ඉගෙන ගත්තේ පශු වෛද්‍යකම"යැයි පැවසුවෙමි.

එම ලේකම්වරයා මුහුණේ කෝපය නොසඟවා පළ කරමින් නිහඬව යන්නට ගියේය.

"මුන්ට ඔලුව පහත් කරලයි ආයුබෝවන් කියල කියන්ඩ ඕනැ. උඹ එහෙම කෙරුවෙ නෑ. ඒකයි ප්‍රශ්නෙ" යැයි විශ්වනාදන් ඉස්කෝලේ මහත්තයා කීවේය.

" මං ලංකාවෙදි එහෙම කරල තියෙන්නෙ හාමුදුරුවරුන්ට විතරයි".

ලංකාවෙහි සිටි අවදියෙහි අනුරාධපුරයට පැමිණි ලංකාවෙහි බොහෝ ඇමැතිවරුන්ව දිසාපතිතුමා විසින් හඳුන්වාදීමෙන් පසුව වචන දෙකක් තුනක් හෝ කතාබහ කරති. මම එවක කෘෂිකර්ම නියෝජ්‍ය ඇමැති චන්ද්‍රා බණ්ඩාර සමඟ වාද කර ඇත්තෙමි. වවුනියාව දිස්ත්‍රික්ක ඇමැති මහින්දසෝම මහතා වරක් මට අත ඔසවා පහරදීමට සැරසී පසුව සමාව ගත්තේය.

තමිල්නාඩුවෙහි වැඩවසම් සමාජ ක්‍රමය ව්‍යාජ ගෞරවයන් කර තබා ගෙන යන්නේ කුමන අයුරින්ද යන්න මට අවබෝධ විය. ලංකාවෙහි පීඩාවට පත් සුළුතර සමාජයෙහි සිට පැමිණි මම ලංකාවෙහිදී අධික ලෙසින් ආත්ම ගෞරවයෙන් යුතුව වාසය කළෙමි යන්න ඒ සිද්ධිය මට අවබෝධ කර දුන්නේය.

එම කාලයෙහි තමිල්නාඩු අමාත්‍ය මණ්ඩලයෙහි ලංකාවෙහි දෙමළ ජනයා ගැන සානුකම්පිතව බැලූ අය බොහෝ දෙනෙක් උන්හ. ඒ අයගෙන් ප්‍රමුඛස්ථානය ගත්තේ ඕරත්තනාඩු ප්‍රදේශයට අයත් සෝමසුන්දරම්ය. ඔහුගේ සහ මහ ඇමැතිගේ නිර්දේශය මත සිසුහු බොහෝ දෙනෙක් තමිල්නාඩුවෙහි විශ්ව විද්‍යාලවලට ඇතුළත් වූහ. විමුක්ති කොටින් විසින් පැහැරගෙන පැමිණි අයගෙන් විමුක්ති කොටින්ගේ නායකයාගේ බිරිඳ බවට පත්වූ මදිවදනි හැර අනෙක් අය ඉන්දියාවෙහි තම අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන ගොස් හොඳ තනතුරුවල සහ රැකියාවල නියුතුව සිටිනවා ඇතැයි මම සිතමි.

..................................................

මම ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණෙහි කාර්යාලයෙහිදි හමුවූ විශාඛන් සමඟ එක්ව පාණ්ඩි බජාර්හී පිහිටා තිබූ උත්සව ශාලාවක ඉහළ මාලයෙහි වූ කුඩා කාමරයක් කුළියට ගෙන නතර වූවෙමි. එම ස්ථානය ගමනාගමනය, ආහාර පාන යනාදි වශයෙන් බොහෝ කරුණුවලට පහසුවක් විය. අපේ කාමරයට අල්ලපු කාමරයෙහි චිත්‍රපට අංශය සමඟ සම්බන්ධ අය, සහාය අධ්‍යක්ෂකවරු නතරව උන්හ. ඔවුන් සමඟ කථාබහේ යෙදීමෙන් අපි චිත්‍රපට ක්ෂේත්‍රය පිළිබඳව දැනගත්තෙමු. ඔවුන්ට ලංකාවෙහි ප්‍රශ්නය පිළිබඳව පැහැදිළි කළෙමු.

මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ තමිල්නාඩුවෙහි සිටින අයගෙන් ලංකාවෙහි ප්‍රශ්නය ගැන දන්නේ වාමාංශිකයන් පමණක්ය යන්නයි. බුද්ධිමය සංවාදයක් පැවැත්විය හැක්කේ ඔවුන් සමඟ පමණි. අනෙක් අය සිංහල දෙමළ ජනවාර්ගික ප්‍රශ්නය සිංහල අය විසින් දෙමළ අයව මරා දමනු ලැබේ යන්නට පමණක් දන්නා අය වෙති. ඒ කාලයෙහි බොහෝ දෙනෙක් සිලෝන් යන නම ශ්‍රී ලංකා ලෙසින් වෙනස්ව ඇති බවවත් දැන නොසිටියහ. මෙයට ගැලපෙන අයුරින් තමිල්නාඩු මාධ්‍ය ද ප්‍රවෘත්ති පළ කරයි. ලංකාවෙහි දකුණු පළාතේ දෙමළ ජනයා වාසය කරන බව හෝ මුස්ලිම් ජනතාව දෙමළ බස කථාකරන බව හෝ ඔවුහු නොදනිති. දෙමළ සංවිධානවලින් බහුතරයක් පවා මෙම කරුණු සුදු කළු ස්වභාවයෙන් පැවතීම යහපත්ය යනුවෙන් අදහස් කර එම හැඟීම එහි වර්ධනය කළේය.

වාමාංශික සංවිධාන වූ ඊළම් විප්ලවවාදි සංවිධානය, ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ පවා කළේ එයයි. මම පාණ්ඩිබජාර් ප්‍රදේශයෙහි සිටි අවස්ථාවෙහි අත්දැකීම්වලින් බහුතරය රසවත් සහ සඳහන් කළ යුතු වැදගත්කමකින් යුතුය.

විමුක්ති කොටි එවක තමිල්නාඩුවෙහි පුහුණු කඳවුරු පවත්වාගෙන යද්දී එම කඳවුරුවල පුහුණුව භාරව කුගන් නමින් හැඳින්වුණු පොන්නම්මාන් මාව කෝඩාම්පාක්කම් වීදියෙහිදි පැමිණි ජීප් රථය නවතා මාව හමුවූ අවස්ථාවෙහි මම විස්මයෙන් යුතුව ඔහුව පිළිගත්තෙමි. කුගන්ගේ නිවෙස පිහිටි යාපනයේ සීනියර් පටුමගෙහි ඇති නිවෙසක අපි ටික කාලයක් වාසය කළෙමු. එම නිවසට ආසන්නයෙහි කුගන්ගේ නිවෙස පිහිටියේය. කුගන් මට වඩා එක වසරකින් පහළ පංතියක හින්දු විදුහලේ අධ්‍යාපනය ලැබුවත් අපි මිතුරන්ව උන්නෙමු. අඩුම වශයෙන් සතියකට දෙවතාවක්වත් ඔහු අපේ නිවෙස ඉදිරිපිට පාපැදිය නවතා මඳ වෙලාවක් කථාබහේ යෙදී පිටව යයි. මෙය සිදුවූවේ 1971-1972 කාලයෙහිදීය. මේ අතර මට වඩා එක පංතියක් ඉහළින් අධ්‍යාපනය ලබමින් සිටි ඔහුගේ වැඩිමහල් සොයුරු නරේන් පසු කලෙක යෝගි යන නමින් විමුක්ති කොටින්ගේ දේශපාලන අංශයෙහි නායකයෙකුව කටයුතු කළේය. මම ඔහුව ඇසුරු කර තිබුණත් එය මිත්‍රත්වයක් යැයි කිව නොහැකිය. රූපයෙන් පමණක් නොව ගුණයෙන් ද මෙම දෙදෙනා වෙනස් අය වෙති. නරේන් උදැසන නෙලා ගත් මිදි ගෙඩියක් නම් කුගන් සුල්තානා මෙන් ය. කුගන් හැඟීම්බරවත් මිත්‍රත්වයෙනුත් ආශ්‍රය කරයි. නරේන් කොම්පැනියක් පාලනය කරන අයෙක් මෙන් ආශ්‍රය කරයි.

කුගන් ආරම්භයේදීම විමුක්ති කොටි සංවිධානයට එක් වූ බැවින් ඔහුගේ පවුලට ලංකාණ්ඩුවෙන් බොහෝ ගැහැටවලට මුහුණ දීමට සිදු වූ බව මම දැනගත්තෙමි. කුගන්ගේ මිත්‍රත්වය මෙන්ම ස්වාර්ථය අරමුණු කර නොගත් ක්‍රියාකාරකම් හේතුවෙන් මම ඔහු කෙරෙහි ගරුත්වයක් සහ අගයකිරීමක් සහිතව උන්නෙමි. එහෙයින් වෙන්නෙට පාරකදී ඔහුව හමුවීම මට මහත් සතුටට කරුණක් විය.

"ඉන්දියාවෙ මොනවද කරන්නේ?" යැයි ඇසූ ඔහු ඍජුවම මාතෘකාවට බැස්සේය.

ඡායාරූපය: ලෙප්ටිනල් කර්නල් පොන්නම්මාන්.

"මං ස්වෙච්ඡාවෙන් දෙමළ අනාථයන්ගේ සංවිධානේ වැඩ කරනවා".

"උන්ගෙන් කිසිම ප්‍රයෝජනයක් නෑ. ඇවිල්ලා අපිට උදව් කරපං. ඒවගේම වයිෆ්ටත් පුළුවන් අපිට වෛද්‍ය උපකාර කරන්ඩ. වියදමට මාසෙකට රුපියල් තුන්දාහක් දෙන්නං. ඒ වගකීම මට ගන්න පුළුවන්".

ඉක්මනින්ම ඔහු මට මිලක් තීරණය කළේය.

"මට සල්ලි වැදගත් නෑ. මට පුළුවන් දෙයක් මං ඔයාලට කරන්නං. ඒත් එක්කම මං අනිත් අයටත් උදව් කරන එකට ඔයාලා එකඟ නං මං එන්නං". මම කීවෙමි.

"ඒක හරියන්නේ නෑ. ඔයා අපි එක්ක විතරයි ඉන්න ඕනෑ".

"එහෙම නං ඒක හරියන්නෙ නෑ. ස්වාධීනව සේවයක් කරන්ඩයි මම කැමැති" යැයි පැවසූ මම විමුක්ති සංවිධානවල සමඟිය අවධාරණය කළෙමි.

"උඹලගේ ගෙදර වෙන එකෙක් පදිංචි කරවන්ඩ උඹ කැමැතිද?"යන කෝපාන්විත හඬ ඔහුගෙන් මතු විය. තව දුරටත් ඔහු සමඟ ඒ ගැන කතාබස් කිරීම නිෂ්ප්‍රයෝජනවත් බව තේරුම්ගත් මම කථාව වෙනතකට හැරවූවෙමි.

"මං මෙහෙට ඇවිත් තවම සති කීපයයි ගතවුනේ. මොනවද කරන්නෙ කියල තවම තීරණයක් නෑ. තව දුරටත් ඉගෙන ගන්ඩ ඕනෑ කියන අදහසත් තියෙනවා"යැයි මම කීවෙමි.

කුගත් සමුගෙන ගියේය.
කොටි සංවිධානයෙහි වූ සින්නක්කර අයිතිය වැනි ස්වභාවය ඔවුන්ගේ නායකයාගේ සිට විදෙස්රටවල සිටින ඔවුන්ගේ ආධාරකරුවන් දක්වා පිළිකාවක් මෙන් පැතිර තිබුණි. එයම ඔවුන්ගේ ජීව නාශකය බවට පත්වූවේය. මෙම ස්වභාවය බොහෝ දෙමළ බුද්ධිමතුන්ට අවබෝධ කරගැනීමට නොහැකිව යෑම වනාහි කනගාටුදායකය. වෙනත් ශිෂ්ටාචාර සමාජයක නං මෙවැනි සංවිධානයකට හිස එසවීමට හැකියාවක් නොලැබෙනු ඇත.
විමුක්ති කොටි සංවිධානයෙහි ආරම්භ කාලීන සාමාජියන්ගෙන් බොහෝ දෙනෙක් එයින් ඉවත්වූ අවස්ථාවල වෙනත් හේතු බොහොමයක් පෙන්වා දී ඇතත් මෙම ඒකාධිකාරී හිතුවක්කාර ප්‍රවනතාවය ශෝභා ශක්ති වැනි එක්කෙනෙක් දෙන්නෙක් හැර අනෙක් අය විසින් හෙළිදරව් නොකළහ.
ලංකාවෙහි ආණ්ඩුවට සහ හමුදාවට එරෙහිව නැගී සිටීමට විමුක්ති කොටින්ගේ ඒකාධිකාරී ස්වභාවයම බලවත් ආයුධය යැයි සිතා මුනිවත රැක්කහ. මෙහි අඛණ්ඩත්වය තමයි මුළු සමාජයම විනාශයට පත්ව නැවැතත් පණ ලැබිය යුතු තත්ත්වයට පත්ව ඇත්තේ මෙහි අඛණ්ඩ බවෙහි ප්‍රතිඵලයක් ලෙසටයි.

**හෙට ගැන හෙට බලාගමු**

චෙන්නෙහි රත්තරන් බඩු කඩවල් සහ රෙදි කඩවල් පිරුණු පාණ්ඩිබජාර් එකේ පිහිටි සිවුමහල් ගොඩනැගිල්ලකි. එහි පහළ කොටසේ උත්සව ශාලාවක් විය. ඉහළ මාලයෙහි කුඩා කාමර කුළියට දී තිබුණි. ඒවා පිරිමි අයට පමණක් වූ ඒවාය.

මැදියම් රැය වනතෙක් ජනයා ගැවසෙන ප්‍රදේශයක් වන හෙයින් අපිත් විනෝදයෙන් උන්නෙමු. මිතුරු විශාඛන් සමඟ සිටි කාලය මාස කීපයක් වුවත් එය ඉතාමත් රසවත් කාලයකි. විශාඛන් යාපනය විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබූවෙකි. විවාහකයෙකු වූ ඔහු ද මා මෙන් බිරිඳ සහ දරුවන්ගෙන් වෙන්ව පැමිණි සිටි හෙයින් මට ඔහු සමඟ ඉතාමත් කිට්ටු ආශ්‍රයක් පවත්වා ගත හැකි විය. ඔහු හාස්‍යමය ලෙසින් දේශපාලනය ගැන කථාබහ කරන්නෙකි. ඔහු යාපනය විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබූ හෙයින් දේශපාලන සංවිධානවල බොහෝ දෙනෙකුව හොඳින් දන්නා හඳුනන පුද්ගලයෙකු විය. ඔහු එකල වාමාංශිකයන් පවසන දේ දැන ගෙන සිටියා පමණක් නොව බොහෝ වාමාංශිකයන්ව ද දැන ගෙන උන්නේය.

ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සිට වෙන්ව ගොස් පසුව *සෙන් තමිළර්* නම් සංවිධානයෙහි නායකයාව සිටි වි.පොන්නම්බලම් මහතාව මට හඳුන්වා දුන්නේ ඔහු විසින්ය. වි.පොන්නම්බලම් මහතා අවංක දේශපාලකයෙක් යැයි බොහො දෙනාගේ හඳුනා ගැනීමට ලක් වූවෙකි. ඔහුව මම දුටුවේ ඇවිදින පුස්තකාලයක් ලෙසින්ය. එපමණක් නොව ඔහු මට තමිළ්නාඩුවෙහි බොහෝ දෙනෙකුව හඳුන්වා දී එහි රැකියාවක් කිරීමටත් උපකාරි වූ අයෙකි.

ඔහු මට පළමුව හඳුන්වා දුන්නේ සාවිත්‍රි දේවනේසන් නම් කාන්තාවයි. ඇය චෙන්නෙ ක්‍රිස්තව විශ්ව විද්‍යාලයෙහි මහාචාර්යවරයෙකු ලෙසින් කටයුතු කළ මහාචාර්ය සන්දිරන් දේවනේසන් සමඟ විවාහ වී උන්නේය. ඇය ලංකාවෙහි ප්‍රබල වාමාංශික නායකයෙකු වූ ලෙස්ලි ගුණවර්ධනගේ සහෝදරියකි. සාවිත්‍රි දේවනේසන් විසින් *Roof for Roofless* (සෙවනක් නැති අයට සෙවනක්) නම් වූ ස්වේච්ඡා ආයතනය චෙන්නෙහි පවත්වා ගෙන ගියේය. මම ඇයගේ ආයතනය සමඟ එක්ව සෙංගල්පට්ටු දිස්ත්‍රික්කයෙහි ගම්වල පශු වෛද්‍යවරයෙකු ලෙස මාසයක් වැඩ කළෙමි. එම කාලයෙහිදි මම ටි. නගරයෙහි වූ වි.පොන්නම්බලම්ගේ නිවෙසට ඔහු සමඟ කථාබහේ යෙදීමට යන අවස්ථාවල ඔහු සමඟ එක්ව වාසය කළ මාවෙ සේනාධිරාසා මහතාව ද හමුවන්නෙමි. දෙමළ දේශපලනයෙහි බොහෝ ගැට ලිහා ගැනීමට වි.පොන්නම්බලම් සහෝදරයා මහත් උපකාරි වූවේය. උමා මහේශ්වරන්, පද්මනාභා වැනි අය ඔහුව හමුවීමට නිතර නිතර පැමිණෙති. ඔහු තරුණ පරපුරෙහි දේශපාලන සංවිධාන අතර පාලමක් ලෙසින් කටයුතු කළේය. නමුත් ඔවුන් ඔහුගේ අදහස් පිළිගෙන ක්‍රියාත්මක කළ බවක් මට දැන ගැනීමට ලැබුණේ නැත.

මා මිතුරු විශාඛන් මානවවිද්‍යා උපාධිධාරියෙකි. සමාජවිද්‍යා සහ දේශපාලන කරුණු පිළිබඳව උනන්දුවක් ඇත්තෙකි. ඔහු චෙන්නෙ විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය හැදෑරීමට පැමිණ සිටින බව පැවසුවේය. ඔහු කීයූ විදියට යාපනය විශ්ව විද්‍යාලයෙහි උපාධිය අවසන් කළ වහාම ඔහුට කථිකාචාර්යවරයෙක් වීමට නොහැකි වූවේ මහාචාර්ය ඉන්ද්‍රබාලා නිසාය. "එයා මාව කැපුවා" යැයි ඔහු නිතර නිතර පවසයි.

එය සත්‍යයක් විය හැකිය. අසත්‍යයක් වුව විය හැකිය.

යාපනය විශ්ව විද්‍යාලයෙහි පමණක් නොව පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙහි පවා මෙලස කැමැත්ත අකැමැත්ත මත ශිෂ්‍යයන් තෝරා ගැනීම සිදුව ඇත. පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙහි මහාචාර්ය මහාලිංගම් මට ක්ෂුද්‍ර ජීව විද්‍යාව සිවුවතාවක් නැවැත නැවැතත් ලීවීමට සැළැස් වූ හෙයින් මගේ විශ්ෂ්ඨ සාමාර්ථ සහ පංති සාමාර්ථ මට අහිමි විය. මහාචාර්යවරුන්ගේ ලිංගික රුචිකම් කැමැත්ත අකැමැත්ත කෙරෙහි මූලික හේතුව වෙයි. මට සාමාන්‍ය උපාධියක් හිමිවුවත් පශු වෛද්‍යවරයෙකු වීම කිසිවෙකු විසිනුත් වැළැක්විය නොහැකි විය. නමුත් විශාඛන්ට සිදුවූ පාඩුව දිගටම බලපෑවේය. මෙවැනි ස්වයං ඉතිහාස ලංකාවෙහි බොහෝ දෙනෙකුට තිබුණත් දිනපතා එය පවසමින් මත්පැන් පානය කළ හැකිවන්නේ විශාඛන්ට පමණි. මහාචාර්ය ඉන්ද්‍රබාලාව වැඩිපුරම සිහිපත් කළ ශිෂ්‍යා වන්නේ මා මිත්‍ර විශාඛන් පමණි යන්න පවසා මහාචාර්යතුමාට ආඩම්බර විය හැකිය.

චෙන්නෙහි ග්‍රීෂ්ම සමයෙහි දිනක් අපි සාමාන්‍යයෙන් යනවාට කලින් නතරව සිටින කාමරයට ගියෙමු. විශාඛන්ගේ වටකුරු මුහුණ හතරැස් ස්වභාවයෙන් විය. ඔහු මහත් කනගාටුවෙන් යුතුව උන්නේය. සුපුරුදු ලෙසින් මහාචාර්යවරයාව සිහිපත් කරමින් මත්පැන් පානය කිරීමට එදින අතේ මුදල් ද නොතිබුණි.

"මොකද අද උඹේ මුහුණ අමුතුවෙලා තියෙන්නේ"?

"විමුක්ති කොටි සංවිධානේ ළඟකදී "වල් ගැලවීමක් " කෙරුණා කියල ආරංචි වුනා. අපේ මස්සිනාට මොකක් හරි කරදරයක්ද කියන එක තමයි මගේ හිතට තියෙන ප්‍රශ්නෙ" යැයි පවසා මෙහි ලිවිය නොහැකි බොහෝ වචන භාවිතා කරමින් ඔහු විමුක්ති කොටි සංවිධානෙට දෙහි කැපුවේය.

මම චෙන්නෛහි සිටි කාලයෙහිදි තම සංවිධානය තුළ වැඩිම වල් නෙළීමක් කළ සංවිධානය උමා මහේශ්වරන්ගේ නායකත්වයෙන් යුතු දෙමළ ඊළම් විමුක්ති සංවිධානයයි (PLOTE). මෙම වල් නෙළීම යන්න අපි කුඩා වයසෙහිදි කෘෂිකාර්මික පසුබිමක් නොමැති පවුල්වලට අයත් සිසුන් අතරෙහි පවා ජනප්‍රියවීමට හේතුවක් වූවේ එක්දහස් නවසිය හැටේ දශකයෙහි පසු අර්ධයෙහිදි බලයට පැමිණි ඩඩ්ලි සේනානායක ආණ්ඩුවෙහි පාලන කාලයෙහි යාපනය අර්ධ ද්වීපයෙහි සිසුන්ව වල් නෙළීමට බස්වලින් කිළිනොච්චි, පරන්තන් ප්‍රදේශවලට කැඳවා ගෙන යනු ලැබූ බැවින්ය. එවන් අවස්ථාවල ළමුන් නෙළු ඒවායෙහි වල් පැළවලට වඩා වැඩිපුර තිබුණේ ගොයම් පැළය. එයට පසුව වල් නෙළීම යන්න ද්‍රෝහින්ව ඉවත් කිරීම යන අරුතින් දෙමළ දේශපාලකයන්ගේ මුවින් පමණක් නොව සිසුන්ගේ මුවින් පවා පිටවන මන්තරයක් බවට පත් විය.

විශාඛන්ගේ බිරිඳගේ සොයුරා වූ හරිශ්චන්ද්‍ර විමුක්ති කොටි සංවිධානයෙහි සාමාජිකයෙක්ව ඉන්දියාවෙහි සේලම් ප්‍රදේශයේ උන්නේය. මම විශාඛන්ට මෙසේ කීවෙමි.

"විමුක්ති කොටි සංවිධානෙ මොකක්ද කෙරුවෙ කියල දැන ගන්ඩ විදියක් නෑ. මට කරන්ඩ පුළුවන් උදව්ව මෙච්චරයි. මගේ ළඟ තියෙන්නෙ රුපියල් පනහයි. මං ඒක උඹට දෙන්නං. උඹ ඕනෑ දෙයක් කරගනිං. හැබැයි මට මස් එක්ක කෑම පාර්සලයක් ගෙනත් දෙන්න ඕනෑ. හෙට ගැන හෙට බලා ගමු".

සුළු උනන්දුවක් පෙන්වමින් ඇඳුම් මාරු කරගෙන පඩිපෙළ බැස ගිය ඔහු පැයකින් පමණ පාර්සල් දෙකක් සමඟ පැමිණියේය. ඒ සමඟ ඔහුගේ අතෙහි සුදු පැහැ අරක්කු බෝතලයක් ද තිබුණි.

ඉන්දියාවෙහි නිෂ්පාදනය කරන ඉතාමත් හොඳ වර්ගයේ මත් පැන් ලංකාවෙහි ඇති ඉතාමත් ලාභ අරක්කුවලට පමණක් නොව ගම්වල පෙරන වඩි අරක්කුවලට පවා ළංවිය නොහැකි ඒවාය. ලංකාවෙහි හැලි අරක්කු පෙරන අය පවා එය සේවයක් ලෙසින් සලකා භය භක්තියෙන් යුතුව එය කරති. හැලි අරක්කු පානය කර මියගිය අයෙක් පිළිබඳ ප්‍රවෘත්තියක් ලංකාවෙහි පුවත්පත්වල පළ වී තිබේද?

මීගමුවෙහි හැලි අරක්කු වන දංකොටුව අරක්කු රුසියාවෙහි වොට්කාවලට සමානය. එම කලාව සිංහල සමාජයට පමණක්ම හිමි දෙයකි. ලංකාවෙහි අය වාසය කරන මැද පෙරදිග රටවල පවා මෙයට ප්‍රකටය.

විශාඛන් ගෙනා අරක්කු බෝතලේ මිල රුපියල් හතලිහකි. ඉතිරි රුපියල් දහයට ආහාර ගෙනවිත් තිබුණි. මට එම අරක්කු සුළු ප්‍රමාණයකට වඩා පානය කළ නොහැකි විය. බඩ පිච්චෙන්නට විය. නමුත් මිත්‍රයා බෝතලය හිස් කළ පසුව කෑම පාර්සලය විවෘත කළෙමි. එය තනිකර බත් පාර්සලයක් විය. නිකං බත් කන්නෙ කොහොමද යැයි ඇසූ විට ඔහු කුකුළු මස් යැයි කියමින් කුඩා පාර්සලය දිගහැරියේය. එහි කුකුළාගේ රතු පැහැ කරමලය සමඟ රතු පැහැ පා කොටස් දක්නට ලැබිණ. සමහර විට බඩවැල් ද තිබුණා විය හැකිය. පශු වෛද්‍යවරයෙකු වන මට එය ලෙක්කෝන් කුකුළෙකුගේ කොටස් බව පමණක් අවබෝධ විය.

"කොහෙන්ද යකෝ ගත්තෙ"? යැයි මම කෝපයෙන් ඇසුවෙමි.

අරක්කු තැබෑරුමට පසෙකින් වූ පෙට්ටි කඩෙන් බව ඔහු පැවසුවේය.

මට අවබෝධ විය. චෙන්නෛහි සෑම අරක්කු තැබෑරුමක් ආසන්නයෙහිම කුඩා භාජන සමගින් මෙසේ කෑම විකුණන අය සිටිති. මම කිසිවක් නොකියා බත් කටක් කා අරක්කු නිසා දැවෙන කුසේ වේදනාව අඩු කර ගත්තෙමි. අතේ මුදල් නැති නිසා කුසගින්නේ සිටිනවා මිස කළ හැකි කිසිවක් නොමැත.

"එක වේලක්වත් හරියට කුසට ආහාරයක් නැතිව කී දෙනෙක් නං දේශයේ විමුක්තිය වෙනුවෙන් අරගල කරනවාද? සංවිධානවල කොල්ලෝ මොන දුකක්ද විඳින්නෙ කියල දන්නවාද? හොඳට සල්ලි බාගෙ දේපල තියෙන පවුල්වල කොල්ලෝ සේරම අත්හැරල ඇවිල්ල ආයුධ පුහුණුව ලබනව කියන එක දන්නවද?"යැයි මම නින්දට යනතෙක්ම ඔහුගේ දේශනාව පැවතියේය.

මහාචාර්ය ඉන්ද්‍රපාලගේ ක්‍රියාව හේතුවෙන් ඇති වූ ශෝකය සමඟ තම බිරිඳගේ සොයුරා වූ හරිශ්චන්ද්‍ර පිළිබඳ ශෝකය ද සමඟින් වෙරි වී සිටින අවස්ථාවක මම මගේ පැත්තෙන් වන යුක්ති සහගත බව කෙසේ කීවත් එය පිළිගැනීමට ලක් නොවන හෙයින් මම නිහඬව උන්නෙමි.

එයට දින කීපයකට පසුව සිදුවූ තවත් සිදු වීමක් මෙයටත් වඩා හාස්‍ය ජනක විය.

සවස පැමිණෙන විට පාණ්ඩි බජාර්හිදී සිසිල් බීම බෝතලයක් මිලදී ගෙන එයින් බාගයක් පානය කර ඉතිරි බාගයට අරක්කු එක්කර බී පැමිණීම විශාඛන්ගේ පුරුද්දයි.

තමිල්නාඩුවෙහි මත්පැන් පානයට ලොකු හෝටල්වලට යා යුතුය. එසේ නැතිනම් තැබෑරුම්වලට යා යුතුය. තැබෑරුම්වලදී චෙන්නෛ කම්කරු පංතිය සමඟ එක්ව මත්පැන් පානය කළ යුතුය. එහිදී

ලංකාවෙහි අයගේ ඇඳුම්, පැළඳුම් සහ කතා කරන බසෙන් අදාල පුද්ගලයා වෙනස් කර හඳුනා ගැනීමට ලක් වෙයි. අතරමැදි මධ්‍ය පංතියේ අයට මත්පැන් පානය කිරීමට තැනක් නොමැත. මධ්‍යම පාංතිකයන් බොහෝ දෙනෙක් හැංගී මත්පැන් පානය කිරීමත් සිසිල් පැන් සමග කළවං කර සිසිල් පැන් සේ පානය කිරීමත් සුපුරුදු දෙයකි.

මම දැක ඇති අන්දමට සතුට වෙනුවෙන් ප්‍රමාණයට මත්පැන් පානය කරන්නෝ ඉතාමත් දුර්ලබය. බොහෝ දෙනෙක් ඉස් මුදුනටම පානය කිරීම තමයි මම දැක ඇත්තේ.

දවසක් මෙලෙසින් සිසිල් බීම සමග බොද්දී කීප දෙනෙක් පාණ්ඩි බජාර් පොලීසිය විසින් අල්ලා ගෙන පොලීසියට ගෙන ගොස් ඇත. එම පිරිසෙන් එක් අයෙක් ලෙස විශාඛන් සිටින බව දැනගත් මම වහාම පොලීසියට ගියෙමි.

දෙමළ සිනමාවෙහි පෙන්වනවා සේ මගේ මිතුරා යට ඇඳුම පිටින් සිටිනු ඇතැයි සිතා ගෙන ගිය විට මම දක්නට ලැබුනේ වෙනස් දෙයකි.

එහි සිටි බොහෝ දෙනෙක් හම් බෑග් සහිතව මේ දැන් කාර්යාලවල සිට පැමිණෙන අය මෙන් උන්හ. මම පොලිසියේ ඇතුළට ගොස් එක් නිළධාරියෙකුට අපි ලංකාවෙහි සිට පැමිණි අය බවත් මෙහි පවතින නීති රීති පිළිබඳව අපි නොදන්නා බවත් පැවසුවෙමි. මෙයට පසුව එසේ නොකළ යුතුය යන අවවාදය සමඟින් වහාම විශාඛන්ව නිදහස් කළේය.

එකල ඊළම් යන වචනය මන්තර ශක්තියෙන් යුතුය. සාමාන්‍ය දෙමළ ජනතාව අතරෙහි ගෞරවයක් ද තිබුණි. ඊළම් අනාථයෙක් යැයි පවසා දුම්රියෙහි ප්‍රවේශ පත්‍ර නොගෙන ගිය බොහෝ දෙනෙක් පිළිබඳව මම දනිමි. අපේ අයගේ ක්‍රියාකාරකම් වලින් මතුවූවේ සුගන්ධයකි. නමුත් පසුව මී කුණකින් නැගෙන්නක් සේ ඊළම් ගඳ ගසන්නට විය.

මම එදින ගොස් විශාඛන්ව පොලීසියෙන් බේරා ගෙන පැමිණි අවස්ථාවෙහි "මං විතරක් නෙමෙයි තමිල්නාඩු ආණ්ඩුවේ ඉහළ තනතුරු දරන බ්‍රාහ්මණ අයත් ඉන්නවා. ඒ අයට ගෙදරදී බොන්ඩ බෑ" යැයි විශාඛන් මට පැහැදිළි කිරීම් කළේය.

මෛසූර් විශ්ව විද්‍යාලයෙහි එවක අධ්‍යාපනය ලබමින් සිටි විශාඛන්ගේ බිරිඳගේ බාල සොයුරු වූ හරිශ්චන්ද්‍රව පියාගේ සොහොයුරාගේ පුතෙක් වූ ප්‍රතාපන් මාර්ගයෙන් සම්බන්ධ කරගෙන මෛසූර්වලට කැඳවා හමු වී කතා බස් කළෙමු.

එහිදී බොහෝ කරුණු දැන ගත්තෙමු. හරිශ්චන්ද්‍ර විමුක්ති කොටි සංවිධානයට ඉතාමත් විශ්වාසවන්ත අයෙකු බවත් එහි වැදගත් වගකීම් දරන අයෙක් බවත් දැනගත්තෙමු. එමෙන්ම හරිශ්චන්ද්‍ර සංවිධානය කෙරෙහි දක්වන විශ්වාසයටත් එමෙන්ම ඊළම කෙරෙහි දක්වන අභිමානයටත් වඩා අධික ලෙසින් ප්‍රභාකරන් කෙරෙහි අපරිමිත විශ්වාසයක් සහිතව සිටීම නිරීක්ෂණය කළ හැකි විය.

හින්දු විදුහලෙහි මට වඩා පංති දෙකක් පහළින් අධ්‍යාපනය ලැබූ අයෙකු වන හරිශ්චන්ද්‍රව මුහුණට මුහුණ හමුවූ මොහොතේ ඔහු කෙරෙහි ක්ෂණිකව මිත්‍රත්වයක් එසේත් නැතිනම් සහෝදර සෙනෙහසක් ඇති වෙයි. ඔහුගේ වදන් තුළ කිසිම විටක බොරුව හෝ යාපනයෙහි සරදම් වචන හෝ එසේත් නැතිනම් කුණු හරුප හෝ ඇතුළත් නොවෙයි. ඔහු කිසිම දේශපාලනයක් කථා කරනු හෝ නැතහොත් දේශපාලනයක යෙදෙනු හෝ මම දැන නොසිටියෙමි. මම පාසල් අධ්‍යාපනය හමාරව විශ්ව විද්‍යාලයට ගිය පසුව ඔහු සමඟ වූ සම්බන්ධකම් කැඩී ගියත් මම මගේ මිතුරන්ගෙන් ඔහු පිළිබඳව විමසූ විට ඔහු කොළඹ හැටන් නැසනල් බැංකුවෙහි රැකියාව කරන බව දැන ගැනීමට හැකි විය.

පසු කලෙක මම මා සමඟ ඉගෙනගත් ජෙය කුමාරන්ගේ මාර්ගයෙන් දැනගත් තොරතුරු මෙසේය.

ඔහු 1983 කෝලහාලයේදී පීඩාවට පත්ව ගමට පැමිණි බවත් පසුව විමුක්ති කොටි සංවිධානයට බැඳුණු බවත් දැන ගන්නට ලැබුණි. එම සංවිධානය තුළ ඔහු ලෙප්ටිනන්ට් කර්නල් රාධා බවට පත්ව පසු කලෙක යාපනය වගකීම් භාර තනතුරට පත්ව මරණයට පත් වූවේය.

83 කෝලහාලය දේශපාලනය කෙරෙහි කිසිම උනන්දුවක් නොදැක්වූ අය පවා සංවිධාන කරා යැමට සැළැස්සුවේය. ත්‍රස්තවාදයට එරෙහි විය යුත්තේ ත්‍රස්තවාදයෙන්මය යන්න ප්‍රභාකරන්ගේ දිව්‍යමය මන්ත්‍රය විය.

ඡායාරූපය: ලෙප්ටිනන්ට් කර්නල් රාධා

## ඉන්දිරා ගාන්ධි නොමැති ඊළම් විමුක්තිය

යාපනයෙහි ශුද්ධ වූ කන්‍යාරාමයෙහි වෛද්‍යශාලාවෙහි මගේ බිරිඳ සේවය කරමින් සිටියාය. මගේ පුතා එහි උපන්නේ 1984 ජූනි මස 18 වන දිනය. මීළඟට කළ යුත්තේ කුමක්ද? යන පැනය මා තුළ ඇති විය. යාපනයෙහි දිගින් දිගටම බෝම්බ පිපිරෙමින් පැවතිණ. එවක ගුරුනගර් හමුදා කඳවුර පිහිටා තිබුණේ බිරිඳ වැඩ කළ රෝහල ආසන්නයෙහිය. එහෙයින් මගේ උපදෙස් අනුව බිරිඳ ද ඉන්දියාවට පැමිණීමට සූදානම් වූවාය.

මෙම කාලයෙහි චෙන්නෙහි වාසය කළ මට ද අනාගතය පිළිබඳ වූවේ පිළිතුරක් රහිත ප්‍රශ්නයකි. ඊළඟට කළ යුත්තේ කුමක්ද? මුළු සමාජයම ඉපිද වැඩුණු රට අතහැර අනාථයන්ව එහෙ මෙහෙ යමින් සිටිද්දී මගේ බිරිඳට ඉන්දියාවට පිටත්වන මොහොතේ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට පෙර සඳහන් කළාක් මෙන් කැමැත්තක් නොතිබුණි. මම ඔබර් සංවිධානය සමඟ එක්ව කළ කටයුතු පිළිබඳව මා තුළ පූර්ණ තෘප්තියක් නොවිණි. කුගන් (පොන්නම්මාන්) මාර්ගයෙන් විමුක්ති කොටි සංවිධානයෙන් මට ලැබුණු ආරාධනය මම ප්‍රතික්ෂේප කළෙමි. මෙම තත්ත්වයට තුළ ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි සිටි ගුණසේකරම් හෙවත් කුංජිව හමුවුනෙමි. අපි දෙදෙනා යාපනය හින්දු පාසලේ පංතියක පරතරයක් සහිත අධ්‍යාපනය ලැබුවත් එකට නේවාසිකාගාරයෙහි ගත කළෙමු.

චෙන්නෙහි ගිනි සැරට පෑවිල්ල කම්මලක මෙන් පැවතියත් සවස් කල සූලෛ මේඩු නම් ස්ථානයෙහි පිහිටි පෙට්ටි කඩයක දෙදෙනාම තේ පැන් පානය කරන ගමන් මම විල්ස් සිගරට්ටුවක් දල්වා ගනිද්දී ඔහු පිල්ටරයක් රහිත සර්මිනාර් සිගරට්ටුවක් දල්වා ගෙන පෙනහළු පුරා නිකොටින් දුම පුරවා ගෙන තම රැවුළ පිරිමදින ගමන් " ඇයි බං මල්ලි උඹට කුම්භකෝණම්වලට ඇවිල්ලා අපිත් එක්ක ඉන්න පුළුවන්නේ. මෙහෙ ඉඳං මොකක්ද උඹ කරන්නේ" යැයි පෙර පාසල් ගුරුවරයෙක් මෙන් අවධාරණයෙන් අසයි. එසේ කතා කිරීම ඔහුගේ පුරුද්දයි.

"මං තවම කිසිම තීරණයක් අරගෙන නෑ. අනිත් එක මට මේ විමුක්ති අරගලය පිළිබඳව පැහැදිළි අදහසකුත් නෑ. ඒ වගේම ජනතාවට සේවය කරන්ඩ ඕනෑ කියන අදහසත් තියෙනවා" යැයි පවසා මම කල්පනා බරිතව ඔහුගේ තියුණු දෙනෙත් දෙස අවධානය යොමු කළෙමි.

"උඹට නිදහසේ වැඩ කරන්ඩ පුළුවන්. අපේ සංවිධානෙට කට්ටිය අවශ්‍ය නෑ. ඉන්න එවුන්ට කන්ඩ දෙන්ඩ විදියක් නැතිව අපි ඉන්නෙ. උඹ සංවිධානෙට බැඳෙන්ඩ අවශ්‍ය නෑ".

මම ඔහුගේ සරදම් සහගත කථාව ගණනකට නොගෙන " තව ටික දවසකින් අපේ පවුලේ අය යාපනේ ඉඳන් මෙහෙට එනවා. ඊට පස්සෙ ඒ ගැන තීරණයක් ගන්නං"යැයි පැවසුවෙමි.

"කුම්භකෝණම්වල ස්ටාලින් අය්යලගේ ගෙදර නවතින්ඩ හරි ගස්සල දෙන්න පුළුවන්. ඒ හින්දා කිසිම දෙයක් ගැන කනගාටුවෙන්න අවශ්‍ය නෑ" යැයි ඔහු පැවසුවේය. කුංජි සංවිධානයෙහි මධ්‍යම කමිටු සාමාජිකයෙක් ලෙසට ද මූල්‍ය කටයුතු භාරව ද කටයුතු කළේය. තවද මඩකළපුව සිරගෙය බිඳ ගෙන පළා යෑමේ සිද්ධියෙහිදි ඔහු වැදගත් කාර්යභාරයක් ඉටු කළ බව මම අසා ඇත්තෙමි. කරුණු රහසිගතව ආරක්ෂා කිරීමෙහි ද වෙස්වලා ගෙන ගැවසීමෙහිදී ද ඔහු ඉතාමත් විශිෂ්ඨ දක්ෂතාවයක් පෙන්නුම් කළේය.

කුම්භකෝණම්වලට ආසන්නයෙහි පිහිටි ශිවපුර නම් ස්ථානයෙහි එකල ඔහුන්ගේ පුහුණු කඳවුර පිහිටියේය. අනිත් සංවිධානවල පුහුණු කඳවුරු ඕරත්තනාඩු, සේලම්,තේනි ආදි වශයෙන් තමිල්නාඩුවෙහි විවිධ ස්ථානවල පැතිර තිබුණි.

බිරිඳ සහ දරුවා සමඟ මගේ මාමා සහ නැන්දම්මා කොළඹ සිට ගුවන් මාර්ගයෙන් චෙන්නෙවලට පැමිණියහ. මම ඔවුන්ව මගේ මිතුරු පරන්තාමන්ගේ නිවෙසෙහි නතර කළෙමි. ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි සියලුම දෙනා පැමිණෙන්නේ එම නිවෙසටය. මගේ දියණිය එහි පැමිණි අවස්ථාවෙහි පිළිගෙන පරන්තාමන් ගෙයි ඇතුළට කැඳවා ගෙන ගියේය. පසු කලෙක විමුක්ති කොටි සංවිධානයෙහි ඝාතන බිමක් බවට එය පත් විය. අපි සති දෙකකට පසුව කුම්භකෝණම්වල ස්ටාලින් අය්යාගේ නිවෙසට ගොස් නතර වූවෙමු.

ඡායාරූපය: කුම්භකෝණම්වල ස්ටාලින් අය්යා

මෙම ස්ටාලින් අය්යා වනාහි වෛ.ගෝපාලස්වාමි සමඟ එකට ඉගෙනගත් නීතිඥයෙකි. ඔහු ද්‍රාවිඩ පක්ෂයෙහි ආධාරකරුවෙකුව උන්නේය. පෙරියාර්ගේ මරණයට පසුව එම පක්ෂය වීරමණි සහ ආනෛමුත්තු යන දෙදෙනා යටතේ දේපළ සහ ප්‍රතිපත්ති නිසා බෙදුණු පසුව සංවිධානයෙහි ප්‍රතිපත්ති සමඟ පමණක් සිටි ඔහු ලංකාවෙහි දෙමළ ජනතාව කෙරෙහිත් ඔවුන්ගේ විමුක්තිය කෙරෙහිත් මහත්

බැඳීමකින් උන්නේය. උස සහ වැඩුණු උඩු රැවුලකින් යුතු මොහුගේ ස්වභාවය මලයාළ නළුවෙකු වන මම්මුට්ටි කෘශ වුවහොත් කෙසේ සිටියිදෝ එවන් ස්වභාවයකින් යුතුය. ඔහු එහිදී ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි ආරක්‍ෂකයෙකු ලෙසින් කටයුතු කළේය. නිතරම පිරිස් ඔහුගේ නිවෙසට පැමිණීම ද සෑම මොහොතකම ඔහුගේ නිවෙසෙහි කෑම පිසීමද දෛනිකව සිදු විය. අය්යේ යැයි කියමින් ඕනෑම මොහොතක ඔහු වටා අඩුම වශයෙන් දෙදෙනෙක්වත් සිටිති.

අපි ඔවුන්ගේ නිවෙසෙහි වාසය කරද්දී මාත් මගේ නැන්දම්මාත් අතර ගැටුම් ඇති විය. මගේ දියණිය එනම් ඇයගේ මිනිපිරිය මම කවුදෝ පිටස්තරයෙකුගේ නිවෙසෙහි රඳවා ගෙන සිටින බවටත් ළමයෙකු වැදූ තම දියණියට එහි තමන්ට නිසි ලෙසින් සළකන්නට හැකි පහසුකම් නොමැති බවත් නිදා ගැනීමට ඇඳක්වත් නොමැති බවත් පවසමින් මට දිගින් දිගටම චෝදනා එල්ල කරමින් උන්නාය. ඇයගේ මැසිවිළි දිනින් දින වර්ධනය වන්නට විය.

කුම්භකෝණම්වල මම බලාපොරොත්තු වූ අන්දමෙහි රැකියා කිසිවක් නොමැත. මම සංවිධානයෙහි පුහුණු කඳවුරට ගොස් බැලුවෙමි. කුම්භකෝණම් ප්‍රදේශයෙහි අද්දර විශාල ගොවිපළක පිහිටි පුහුණු කඳවුර වනාහි කාවේරි ගඟ අද්දර සුන්දර ස්ථානයක පිහිටා තිබුණි. මම එහි ගොස් බැලූ දවස්වල ඉතාමත් සීමිත ආයුධ ප්‍රමාණයකින් පුහුණුව ලබා දෙමින් තිබුණි. ඒ සමගම එහි ශාරීරික පුහුණුව ද ලබා දෙනු ලැබිණ. මෝටාර් උණ්ඩ නිෂ්පාදනය කරන වැඩපළක් ද මම එහි දුටුවෙමි. දිනක් පද්මනාභා කඳවුරට පැමිණි අවස්ථාවකදී ඒ.කේ.47 වර්ගයේ තුවක්කුවක් මගේ අතට දුන්නේය. මම එය අතට ගෙන බලා තැබුවෙමි.

ආයුධ පිළිබඳ ආකර්ශනයක් මා තුළ කිසිම කලෙක තිබුණේ නැත. මා කුඩා වියෙහි අපේ නිවෙසෙහි තුවක්කුවක් තිබුණි. මම කිසිම දිනක එය අතගාවත් නොබැලුවෙමි. පසු කලෙක මම මැදවච්චියෙහි රැකියාව කළ අවස්ථාවෙහි දඩයමෙහි යද්දී පවා තුවක්කුවක් ඇල්ලුවේ නැත්තෙමි. සෙට්ටිකුලම් ප්‍රදේශයෙහි දඩයමට ගියත් තුවක්කුව භාවිත කළේ මගේ මිතුරන්ය.

ආදි කාලයෙහි සිටම ස්වයං විශ්වාසය නැති අය තමයි ආයුධ දරන්නේ යන්න මගේ අදහසයි. නමුත් ආයුධ නොමැති ලෝකයක් නොපවතියි යන්නයි නිදර්ශනයක්ව පවතින්නේ.

ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි පුහුණු කඳවුරෙහිදී මා තුළ කම්පනයක් ඇති කළ කරුණක් සහ එමෙන්ම මා තුළ ආකර්ශනයක් ඇති කළ කරුණක් විය. එකල එහි සිටි අයගෙන් බහුතරය අකුරු ලිවීමට හෝ කියවීමට නොදත් අයය යන්න විශේෂයෙන්ම යාපනයෙහි අයෙකු වූ මට පුදුමයට කරුණක් විය. එමෙන්ම එහි පුහුණුව ලැබූ අය ලියන්න සහ කියවන්න හැකියාව ඇති අය බවට පත්ව පුහුණුව අවසන් කිරීම මා තුළ මහත් සතුටක් ඇති කළේය. මෙම අයගෙන් බහුතරය යාපනයේ කොන් කිරීමට ලක් වූ සමාජ කොටස්වලට සහ වතුකරයට අයත් අය වීම මෙයට හේතුවයි.

පුහුණු කඳවුරෙහි සිටින අයට නිසි ලෙසින් ආහාර ලබා දීමට නොහැකිව පැවතීම මම එහිදී දුටුවෙමි. මම බොහෝ දවස්වල ඔවුන්ගේ කෑම පිඟාන්වල දුටුවේ තැම්බූ කොණ්ඩ කඩල නැතහොත් පරිප්පුය. දහවල් ආහාරයේදී පමණක් බත් දැකිය හැකි විය. සංවිධානයෙහි බොහෝ සාමාජිකයෝ කුම්භකෝණම් ප්‍රදේශය ආශ්‍රිතව කැට හොල්ලමින් මුදල් එකතු කිරීම ද හාල් සහ පරිප්පු කඩවල්වලින් ඉල්ලා සිටිනු ද මම දුටුවෙමි.

රටට විමුක්තිය ලබා දෙන්නෙමු යැයි පවසා ආයුධ අතට ගත වෙනත් සංවිධාන මෙසේ ජනතාව අතරෙහි මුදල් එකතු කර ගැනීමට පහළට බැස තිබුණේ නැත. නමුත් මෙවැනි චින්තනයකට මාවෝවාදයෙහි සහ ලෙනින්වාදියෙහි දැඩි ලෙස එල්බ ගත් ඉන්දීය මාක්ස්වාදී සහෝදරයන් සමඟ සහෝදරත්වය ගොඩ නංවා ගෙන සිටි පද්මනාභාට පමණක් හැකි විය යැයි මම සිතමි.

අකුරු ලියන්න කියවන්න නොදත් අය මෙන්ම එම තරුණ පරපුර අතරෙහි ඉතාමත් පහසුකම් සහිත පවුල්වල සිට පැමිණි අය ද විශ්ව විද්‍යාල අධ්‍යාපනය අතරමඟ හැර දමා පැමිණි අය ද උන්හ. රටේ විමුක්තිය යන නාමයෙන් දුක් ගැහැට විඳීම පමණක් නොව දුප්පතුන් සහ කම්කරුවන් සමඟ ජීවත්වන්නේ කෙසේද? යන්න ද පුහුණුවක් ලෙසින් ගෙන සංවිධානය සමාජ ප්‍රතිසංස්කරණ සංවිධානයක් වශයෙන් පද්මනාභාගේ නායකත්වයෙන් කෙටි කාලයක් හෝ ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානය ක්‍රියාත්මක වීම නිරීක්‍ෂණයට ලක් වීමේ සිට ලංකාවෙහි දෙමළ ජනතාව අතරෙහි නැවැතත් හොඳ නායකත්වයක් ඇතිවන්නේ නම් ඒ වටා ජනතාව ඒකරාශිවීමේ හැකියාව ඇතිබව මට අනාවැකියක් ලෙසින් කිව හැකිය.

කෘෂිකාර්මික රටක්වන ලංකාවෙහි මධ්‍යම පංතිය ද කෘෂිකර්ම කම්කරුවන් ද ජාතිවාදී ද්වේශ දේශපාලනය දේශනා නොකර එක් කණ්ඩායමක් ලෙසින් ගොනුවීම ඉතාමත්ම දුෂ්කරය. නමුත් එම දුෂ්කර කාර්‍යය වසර කීපයක් වුවත් පද්මනාභාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක විය.

ඉන්දීය මැදිහත්වීම, විමුක්ති කොටින්ගේ ම්ලේච්ඡත්වය යනාදිය පද්මනාභා විසින් පමණක් නොව කිසිවෙකු විසින්වත් බලාපොරොත්තු නොවූවකි.

කුම්භකෝණම්වල වෙනම නිවෙසක පදිංචියට යෑමත් සමඟ පවුලේ තත්ත්වය යම්තාක් දුරකට යහපත් විය. මෙම කාලයෙහි මම මගේ හින්දු විදුහලේ මිතුරෙකු වූ කිරුබාකරන්ව හමුවුනෙමි. ඔහු නැඟෙනහිර

පළාතේ කාරෙරෙත්තීවු නම් ප්‍රදේශයෙන් පැමිණි අයෙකි. හොඳ ශක්තිමත් සිරුරකින් යුතු ඔහු අට වන පංතියෙහි සිට හින්දු විදුහලේ නේවාසිකාගාරයෙහි නතරව අධ්‍යාපනය ලැබූවෙකි. අපි දෙදෙනා එහි නව නේවාසිකාගාරය සහ පරණ නේවාසිකාගාරය යන ගොඩනැඟිලි දෙකෙහි නතරව අධ්‍යාපනය ලැබූවෙමු. මම ඔහුව මුණ ගැසුණු අවස්ථාවෙහි මහත් විශ්වාසයෙන් යුතුව ඔහු කතා කළේය. "ඊළම ලැබෙනවා. රෝ සංවිධානේ අපේ සහෝදරවරුන්ට උතුරු ඉන්දියාවෙදි පුහුණුව ලබා දෙනවා" යැයි ඔහු පැවසුවේය. ඔහු පැණි රස කැවිලිවලට දැක්වූවේ මහත් ප්‍රියතාවයකි. මම ඔහුට ගුලාප් ජාමුන් මිලදී දෙමි.

ඡායාරූපය: කිරුබාකරන්

මම උත්තර ප්‍රදේශයේ පුහුණුව ලැබූ අය කීප දෙනෙකු හමුවුනෙමි. එයට සම්බන්ධ රසවත් සිදුවීමක් මේ අවස්ථාවෙහි සඳහන් කළ යුතුය. ලංකාවෙහි කැළෑවල කල් ගත කරන්නේ කෙසේද? ජීවත්වන්නේ කෙසේද? යන්න පිළිබඳව ඔවුහු මා සමඟ පැවසූහ. ලංකාවෙහි කබරගොයා හැර අනෙක් සියලුම සතුන්ගේම මස් ආහාරයට ගත හැකි බව ඔවුහු පැවසූහ. පුහුණුව නිම කළ දෙදෙනෙක් කෙට්ටු කළු පූසෙකුව ලුහුබැඳ යනු මම දුටුවෙමි. මොවුන්ගෙන් ලංකාවේ හමුදාවට තර්ජනයක් එල්ලවේදෝ නොවේදෝ යන්න නිශ්චිතවම කිව නොහැකි වුවත් කෝඩම්පාක්කම් ප්‍රදේශයේ පූසන්ට නම් මහත් තර්ජනයක් බව මම තේරුම් ගත්තෙමි.

මෙහිදී 1984 අගෝස්තු මස 06 වන දින සිදුවූ සිදුවීමක් සඳහන් කිරීම වැදගත්ය. පනාගොඩ මහේශ්වරන් විසින් කොළඹට යැවීමට තිබුණු බෝම්බයක් මීනාම්පාක්කම් නම් ස්ථානයෙහිදි පුපුරා ගියේය. මෙම සිද්ධිය ඉන්දියාව තුළ විශේෂයෙන්ම තමිල්නාඩුව තුළ මහත් කම්පනයක් ඇති කළේය. එම කාලයෙහි සූර්යා නම් හින්දි පුවත්පත විස්තරාත්මකව ඉන්දියාව ලංකාවේ දෙමළ තරුණයන්ට පුහුණුව ලබා දීම පිළිබඳව ලියා තිබුණත් ඉන්දියාව දිගින් දිගටම එය ප්‍රතික්ෂේප කළේය. නමුත් මෙම බෝම්බ පිපිරීම එය හෙළිදරව් කිරීමට සමත් විය.

මම කුම්භකෝණම් ප්‍රදේශයේ සිටි කාලයේ බොහෝ වතාවක් චෙන්නෛ ප්‍රදේශයට පැමිණ නතරව සිටින්නෙමි. 1984 වසරෙහි නොවැම්බර් මස පළමු වෙනි දින උදෑසන අවදිව උදේ ආහාරය සඳහා පිටතට ගිය මොහොතේ පාණ්ඩිබජාර් ප්‍රදේශය මුළුමනින්ම පාහේ ජන ශූන්‍යව පැවැතිණ. විශාල වෙළෙඳසැල් පමණක් නොව කුඩා පෙට්ටි කඩ පවා වසා තිබුණි.

මම සුපුරුදු ලෙසින් ඉදියප්පම් කන මලයාලි ජාතිකයාගේ කඩයට ගිය අවස්ථාවේ එම කඩය පමණක් නොව කිසිම කෑම කඩයක් විවෘතව තිබුණේ නැත. ජනයා ගැවසීමක් නොතිබුණි. විනාඩි කීපයක් ගමන් කරද්දී ගසක් යට සිඟන්නෙක් වැනි අයෙකු සිටිනු දක්නට ලැබුණි. ඊයේ ඉන්දීය අගමැති ඉන්දිරා ගාන්ධි ඝාතනය කර ඇති බව ඔහු පැවසුවේය. කඩ කෑමෙන් ජීවත්වන මට අද ඉතිං බඩගින්නේ තමයි ඉන්න වෙන්නේ යැයි සිතමින් මම කෝඩම්පාක්කම් දෙසට ගුවන් පාලම මතින් යද්දී වසා ඇති පෙට්ටි කඩයක් අස්සෙන් සිහින් සද්දයක් ඇසුනේය. මම එහි දොරට තට්ටු කළෙමි.

"හර්තාල්. ඉක්මනට යන්ඩ සර්" යැයි අයෙක් තරවටු ස්වරයෙන් පැවසුවේය.  මම බඩගිනි බව පැවසූ අවස්ථාවෙහි කෙසෙල් ගෙඩි හතරක් දී "ඉක්මනට ගෙදර යන්ඩ සර්" යැයි නැවතත් පැවසුවේය.

මම ගෙයක් දොරක් රටක් තොටක් නැතිව ඇවිදින්නෙක් යැයි ඔහු සමඟ පැවසිය හැකිද?

මම මුදල් දුන්නත් ඔහු එය ලබා ගැනීම ප්‍රතික්ෂේප කළේය.

මම සූලමේඩුවල පිහිටි ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණේ එපික් කාර්යාලයට පැමිණ කෑම කා ඉන්දිරා ගාන්ධි නොමැති ඉන්දියාව පිළිබඳවත් ඇය නොමැති ඊළම් විමුක්තිය පිළිබඳවත් එහි සිටි සහෝදරවරුන් සමඟ කතා කරමින් සිටියෙමි.

ඡායාරූපය:   ඉන්දිරා ගාන්ධි

## දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානය

1984 වසරෙහි අප්‍රේල් මාසයෙහි මම ඉන්දියාවට ගොස් සිටි කාලයෙහි *ENLF* නමින් දේශපාලන සන්ධානයක් එවක ආයුධ සන්නද්ධ සංවිධානවන දෙමළ ඊළම් විමුක්ති සංවිධානය (*TELO*), ඊළම් විප්ලවකාරි ශිෂ්‍ය සංවිධානය ( *EROS*) සහ ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණ ( *EPRLF*) යන සංවිධාන තුන එක්ව ඇති කරගෙන තිබුණි. මෙම සන්ධානයෙහි නායකයෝ ද්‍රාවිඩ මුන්නේට්‍ර කළහම් පක්ෂයෙහි නායක කරුණානිධිව මුණගැසී ඡායාරූපයකට පෙනී සිටියහ. එම ඡායාරූපය තමිල්නාඩුවෙහි බොහෝ පුවත්පත්වල පළ විය.

මෙම සිද්ධිය එකල බොහෝ දෙනෙකුට සතුටට කරුණක් විය. එමෙන්ම මෙය නිසා කනගාටුවට පත්වූ අය අතර එකමුතුවක් ඇති කිරීමටත් මෙය හේතු විය. එමෙන්ම මෙම සන්ධානය එවක තමිල්නාඩුවෙහි මහ ඇමැති එම්.ජී.රාමචන්ද්‍රන්ගේ සහයෝගය අභිමිකරගත් බවටත් එවක බොහෝ දෙනෙක් පැවසුහ. එය මගේ සවනටත් අසන්නට ලැබුණි. මෙම සන්ධානය ඉන්දීය රහස් ඔත්තු සේවය වූ රෝ (*ROW*) විසින් නිර්මාණය කරන ලද බවට පසු කලෙකදී කියවිණි.

මෙම *ENLF* නම් වූ දේශපාලන සන්ධානයේ නායකයන් අතරෙහි පුද්ගලිකව එකිනෙකා හමු වී කතාබහ කරන යහපත් සම්බන්ධතාවයක් තිබුණි. මෙම සම්බන්ධතාවයට මූලික හේතුව වූවේ පද්මනාභා බව මම පසු කලෙක දැන ගත්තෙමි.

ඡායාරූපයඃ  සිරි සබාරත්නම්, ප්‍රභාකරන්,පද්මනාභා සහ බාලකුමාර්

මෙම සංවිධාන සන්ධානයක් ලෙසින් පැවතියත් ඒවායෙහි සිටි අය අතරෙහි අන්‍යෝන්‍ය විශ්වාසයක් හෝ සහෝදරත්වයක් ඉන්දියාවෙහි හෝ ලංකාවෙහි පැවැති බවක් දක්නට ලැබුණේ නැත. මෙ අයට පොදු රෝගයක්ව පැවතියේ සැකයයි. ඒ සඳහා වන ඔසුවක් එවක කිසිවෙකු සතුවවත් තිබුණේ නැත. සංවිධාන අතරෙහි පමණක් නොව සංවිධානයේ අභ්‍යන්තරයෙහි පවා වූ මෙම රෝගයෙහි අංශ මම අසා සහ දැක ඇත්තෙමි. ඒ පිළිබඳව පසුව සළකා බැලේ. මෙම සන්ධානයෙහි සිටි අය සමඟ කල් ගතවී එනම් 1984 වසරෙහි අවසානයෙහි විමුක්ති කොටි සම්න්ධකම් ඇති කරගත්තේය. "සිරි ගැනවත් එහෙම නැත්තං බාලකුමාර ගැනවත් තියෙන විශ්වාසෙන් මම ආවෙ නෑ. උඹ ගැන තියෙන විශ්වාසෙ නිසයි මං ආවේ" යැයි ප්‍රභාකරන් විසින් පද්මනාභා වෙත පැවසූ වදන් පසු කලෙක ප්‍රභාකරන් අමතක කළේය. එම වචන එකල ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණේ අය විසින් කියනු ලැබ මගේ සවනට පැමිණියේය.

විමුක්ති කොටි මෙම සන්ධානයට එක්වීමේ යටි අරමුණ වූවේ දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානය හෙවත් *PLOTE* සංවිධානය මෙම සන්ධානයට එළියෙන් තබා තනිකිරීම බව එවක දේශපාලනය නොදන්නා අය පවා දැන සිටියහ. තරුණයන් පහළොස් දාහකට ඉන්දියාවෙහි පුහුණුව ලබා දුන් විශාල සංවිධානයක් ලෙසින් ප්ලෝට් සංවිධානය එවක මහත් විශාල සංවිධානයක්ව පැවතියේය. එම සංවිධානයෙහි බිඳීයෑම සෝවියට් සමූහාණ්ඩුවෙහි බිඳීයෑමට සමානය. ඉංග්‍රීසි භාෂාවෙහි implosion යන වචනයට අර්ථ නිරූපනයක් සේ උමා මහේශ්වරන් නායකත්වය දුන් සංවිධානය එකල තිබුණි.

1984 වසරෙහිදී මෙවැනි විමුක්ති සංවිධාන සියල්ලටම පොදු වෛද්‍ය සංවිධානයක් පිහිටුවීම පිළිබඳව බොහෝ දෙනෙක් සිතුවත් එයට මූලිකවූවේ එවක ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණේ සන්නද්ධ අංශය භාරව සිටි ඩග්ලස් දේවානන්දාය. ඒ සඳහා වන පළමු රැස්වීමට ඔහු මාහට ද ආරාධානා කර සිටියේය. එම පළමු රැස්වීමට පැමිණි අයගෙන් සමහරුන්ගේ නම් මට මේවන විට අමතකව පැවතියත් සෑම සංවිධානයකින්ම අය එයට සහභාගිව උන්හ.

විමුක්ති කොටි සංවිධානය නියෝජනය කරමින් යෝගි සහ තවත් අයෙක් පැමිණ උන්හ. එමෙන්ම ප්ලොට් සංවිධානය වෙනුවෙන් මඩකළපුවේ වාසුදේවා ද උපවාස කර මියගිය දිලීපන්ගේ වැඩිමහල් සහෝදරයා ද පැමිණියහ. ටෙලෝ සහ ඊරෝශ් යන සංවිධාන වෙනුවෙන් දෙදෙනා බැගින් ද සහභාගි වූහ.

මෙවන් වෛද්‍ය සංවිධානයක අවශ්‍යතාවය සියලුම දෙනා තේරුම්ගෙන සිටියත් එම රැස්වීමේදී වැඩිපුරම කතාකළේ පද්මනාභා සහ දේවානන්දා පමණි. කිසිම දෙයක් නොපවසා හිස සළමින් සිටියේ යෝගි බව තවමත් මගේ මතකයේ පවතියි. එකල පවා මොවුන්ට නායකයා වූ ප්‍රභාකරන්ගේ දැඩි නියෝගය වී තිබුණේ කතා නොකළ යුතුය විය යුතුය යැයි මම සිතුවෙමි.

වෛද්‍ය ජෙයකුලරාජාව මෙම ආයතනයේ සභාපති ලෙසින් විමුක්ති කොටි සංවිධානය විසින් ද වෛද්‍ය ශාන්ති රාජසුන්දරම්ව උපසභාපති ලෙසින් වාසුදේවා විසින් ද ලේකම් ලෙසින් කාසි විශ්වනාදන් මාස්ටර්ව

දේවානන්දා විසින් ද යෝජනා කෙරුණහ. මෙහිදී පළමු සඳහන් දෙදෙනාගේ නාම යෝජනා ස්ථිර කෙරුණත් ලේකම් තනතුරට යෝජනා වූ කාසි විශ්වනාදන් මාස්ටර් වෛද්‍යවරයෙක් නොවෙයි යනුවෙන් ප්ලොට් සහ ඊරෝශ් යන සංවිධානවල අය විසින් විරුද්ධත්වය දැක්වූ මොහොතේ පශු වෛද්‍යවරයෙකු වූ මාව දේවානන්දා විසින් ලේකම් බවට පත් කෙරුණි. මෙහිදී භාණ්ඩාගාරික තනතුරට දොස්තර ශිවනාදන්ව තෝරා ගනු ලැබිණ. මෙලෙසින් මෙම සංවිධාන විසින් ස්ථාපිත කරගනු ලැබූ වෛද්‍ය සංවිධානය දෙමළ ජනතා වෛද්‍ය සහන සංවිධානය (*MUST*) නමින් නම් කෙරුණි. වෛද්‍යවරියක්ව සිටි මගේ බිරිඳ ද එහි සේවය කිරීමට තීරණය විය.

ඡායාරූපය: ඩග්ලස් දේවානන්දා

මෙම පිරිසෙන් මා හැර අනෙක් අය සංවිධානවල අය අතරෙහිත් ජනතාව අතරෙහිත් හොඳින් දන්නා අඳුනන අය වූහ. වෛද්‍ය ජෙයකුලරාජා විමුක්ති කොටි සංවිධානයට වෛද්‍ය ප්‍රතිකාර සහය දැක්වීම හේතුවෙන් අත් අඩංගුවට පත්ව වැළිකඩ සිරගෙදර සිරකර සිටියදී සිරගෙයි සිදු කෙරුණු ඝාතනයෙන් පණ බේරාගෙන පසුව මඩකළපුව සිර ගෙයින් පළා ගිය අයෙකි. වෛද්‍ය ජෙයකුලරාජාව ඉන්දියාවට කැඳවා ගෙන ආවේ විමුක්ති කොටි සංවිධානය විසින්ය. එමෙන්ම වෛද්‍ය ශාන්ති රාජසුන්දරම් යනු ගාන්ධියම් ව්‍යාපාරයෙහි නිර්මාතෘව සිට 1983 වසරෙහි වැළිකඩ සිරගෙයි දෙමළ සිරකරුවන් ඝාතනය කෙරුණු අවස්ථාවේ ඝාතනය වූ වෛද්‍ය රාජසුන්දරගේ බිරිඳයි. ඇය තමිල්නාඩු රජයේ පාලනය යටතේ පැවැති එළුම්පූර් පොලිස් වෛද්‍ය ශාලාවෙහි වෛද්‍යවරියක ලෙස කටයුතු කළාය.

අපේ වෛද්‍ය සංගමයෙහි භාණ්ඩාගාරික තනතුරට පත් වූ වෛද්‍ය ශිවනාදන් වාකරෙ ප්‍රදේශයේ වෛද්‍යවරයෙකු ලෙසින් කටයුතු කළ අවස්ථාවෙහිදී මඩකළපුව සිර ගෙයින් පළාගිය අයට වෛද්‍ය සේවය සැපයීම හේතුවෙන් ආරක්ෂක හමුදාවෙහි සෙවීමට ලක්ව තමිල්නාඩුවට පළා ආ අයෙකි. වෛද්‍ය ශිවනාදන්ව තමිල්නාඩුවට කැඳවා ගෙන ආවේ ප්ලොට් සංවිධානය විසින්ය. තේනී නම් ප්‍රදේශයෙහි ප්ලොට් සංවිධානය විසින් ආයුධ පුහුණු කඳවුරක් පවත්වා ගෙන යද්දී ඔහු එම සංවිධානය සමඟ සිටියේය. මෙලෙසින් මෙම අය සංවිධානවල හඳුනා ගැනීමට ලක් වුවත් සාමාන්‍ය අය යන පදනමින් ඔවුන්ව දෙමළ ජනතා වෛද්‍ය සහන සංවිධානයට එක්කර ගන්නා ලදී. මෙම සංවිධාන පහෙන් එක් සංවිධානයකින් එක් අයෙක් වශයෙන් පස් දෙනෙක් අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කෙරුණි. මෙම සංවිධානය තමිල්නාඩුවෙහි නීතිය යටතේ ස්වේච්ඡා සහන සේවා සංවිධානයක් ලෙසින් ලියාපදිංචි කෙරුණි. මෙය එක්තරා අයුරකින් අනාගත දෙමළ ඊළම් රාජ්‍යයේ සෞඛ්‍ය සංවිධානයයි යන අදහස එවක එයට තිබුණු බව ප්‍රතික්ෂේප කළ නොහැකිය.

මෙම ආයතනයෙහි ලේකම් තනතුරට පත්වූ මම පවුල සමඟ කෝඩම්පාගම් ප්‍රදේශයේ වාසය කළ හෙයින් මෙම සංවිධානයෙහි කාර්යාලය එයට ආසන්නයෙහි පිහිටා තිබීම අත්‍යවශ්‍ය විය. එහෙයින් සූලෛමේඩු නම් ප්‍රදේශයෙහි මුදල් පොළියට දෙන කඩයක ඉහළ මාලය කුළියට ගත්තෙමි.

ඡායාරූපය: වාසුදේවා

මෙම ආයතනය පවත්වා ගෙන යෑමට මුදල් ලබාදීමට කිසිම සංවිධානයක් ඉදිරිපත් නොවිය. අපි සියලුම දෙනා මුදල් නොලබා සේවය ලබාදීමට සූදානම්ව සිටියත් ගෙවල් කුළිය දිය යුතුය. ඒ වගේම කාර්යාලය පවත්වා ගෙන යෑම සඳහා මූලික වියදම් කීපයක් විය. මේ අවස්ථාවෙහි නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වූ නාග සේනාව නම් සංවිධානයේ සිට පැමිණ සිටි කරුණානිධි නම් තරුණයා චෙන්නෛ විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය ලබන බවටත් නවාතැනක් නොමැතිව සිටින බවටත් ආරංචි විය. වෛද්‍ය ශිවනාදන් මාර්ගයෙන් තොරතුරු සන්නිවේදනය කරගෙන ඔහුව සහායකයෙකු වශයෙන් පත් කළෙමු. අවම වශයෙන් ඔහුට නවාතැන් පහසුව සමඟ ආහාර සඳහා සුළු මුදලක් හෝ ලබා දිය යුතුය.

ණය ලබා ගත හැක්කේ කාගෙන් ද යැයි කල්පනා කර පිටරටවල සිටි දන්නා කියන කීප දෙනෙකු වෙත ඉල්ලීම ඉදිරිපත් කළෙමු. විශේෂයෙන්ම විමුක්ති ව්‍යාපාර එක්ව වෛද්‍ය සංවිධානයක් පිහිටුවා ගැනීම යන්න බොහෝ දෙනෙකුගේ කැමැත්තට හේතුවන කරුණක් වෙනු ඇතැයි යන විශ්වාසය අප තුළ තිබුණි.

මගේ බිරිඳගේ සොයුරා වූ අරුල් රංජිතන් එවක ඇමරිකාවෙහි වෛද්‍යවරයෙකු ලෙසින් කටයුතු කළ අතර ඔහු තම සහෝදරිය සහ මව බැලීමට ඉන්දියාවට පැමිණියේය. ඔහුව බොහෝ කාලයක් වවුනියාවෙහි ක්‍රියාත්මක වූ ගාන්ධියම් සංවිධානයට මූල්‍යාධාර කරන මානව හිතවාදියෙක් ලෙසින් මම දැනගෙන උන්නෙමි. ඔහු පසු කලෙක විමුක්ති කොටි සංවිධානයෙහි ආයතනයක් වූ දෙමළ පුනරුත්ථාපන සංවිධානයෙහි ඇමරිකාවෙහි සභාපති ලෙස ද කටයුතු කළේය. ඔහු චෙන්නෛ පැමිණ අවස්ථාවෙහි අපි සමඟ කෝඩම්පාගම් ප්‍රදේශයෙහි නතරව උන්නේය. මම ඔහුව ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි කාර්යාලයට කැඳවා ගෙන ගොස් පද්මනාභා ඇතුළු ප්‍රධාන පෙළේ අයට හඳුන්වා දුන්නෙමි.

එම කාර්යාලයෙහි බිත්තියෙහි වූ කාර්ල් මාක්ස්, ලෙනින්, ස්ටාලින් යන අයගේ පින්තූර දුටු වහාම ඔහුගේ බඩ දඟලන්නට වූවා විය හැකිය. මට එම මොහොතේ ඔහුගේ හැඟීම තේරුම්ගත නොහැකි වුවත් පසුව ඔහුගේ හැසිරීමෙන් තේරුම්ගත හැකි විය. මාවත් කොමියුනිස්ට්කාරයෙක් ලෙසින් ඔහු සැළකුවා විය හැකිය. මම ඔහුගේ නැගණියව විවාහ කරගෙන දරුවන් දෙදෙනෙකු සමඟ සිටින හෙයින් ඔහු නිහඬව ඉඳ එම

ස්ථානයෙන් පිටව යන විට "මුන් කොමියුනිස්ට්වාදේ දේශනා කරන අය" යැයි පමණක් පවසා එළියට පැමිණියේය.

අරුල් රංජිතන් සහ අපේ සංවිධානයෙහි සභාපති වෛද්‍ය ජෙයකුලරාජා විශ්ව විද්‍යාලයෙහි එකට අධ්‍යාපනය ලැබූ අය වූහ. ඔහු අපේ වෛද්‍ය සංවිධානයෙහි සිටින බව දැනගත් පසුව අපේ සංවිධානයට ඉන්දීය රුපියල් පහළොස් දාහක් දුන් බව පවසා එම මුදල් වෛද්‍ය ජෙයකුලරාජා මට සහ වෛද්‍ය ශිවනාදන්ට ලබා දුන්නේය. එමෙන්ම ඔහුගේ නැගණිය සහ මම පොදු කටයුතුවල යෙදෙමින් සිටි නිසා ඔහු මාසිකව තම නැගණියට ඇමරිකන් ඩොලර් සීයක් එවූ හෙයින් අපි දෙදෙනාම මුදල් බරකින් තොරව වෛද්‍ය සේවයෙහි යෙදීමට පටන් ගත්තෙමු.

මේ අතර පිටරටවල සිටින දෙමළ අය ද සුළු සුළු ප්‍රමාණයෙන් මුදල් එවීමට පටන් ගත්හ. මැලේසියාවෙහි වාසය කළ ලංකාවෙහි සම්භවයක් සහිත දෙමළ අය බොහෝ දෙනෙක් අපගෙන් කිසිම ප්‍රශ්නයක් නොඅසා මුදල් එවීම මගේ හිත සැහැල්ලු කිරීමට සමත් විය. සංවිධානවලට මුදල් දුන් අය එසේ දුන්නේ විවිධ අරමුණු සහිතවය. සිංහල අයගෙන් පළි ගැනීම, වෙනම ඊළමක්, එයට එහා දෙමළ වීරයෝ යන පැරණි සිතිවිළි එයට හේතු වූවා විය හැකිය. නමුත් මෙම වෛද්‍ය සේවය වෙනුවෙන් ආධාර කළ අයගේ අරමුණ ඉතාමත් පිරිසිදු විය.

ඉහළ මාලයෙහි කාර්යාල කුළිය සඳහාත් කරුණානිධි නම් ශිෂ්‍යාට මාසිකව රුපියල් තුන්සීයක් දීම සඳහාත් අපට ශක්තිය සැපයූ අරුල් රංජිතන්ට අපි ස්තුතිය පළ කළ යුතුවෙමු. අපගේ ආයතනය ආරම්භයේදී ලංකාවෙහි අයට නොමිලේ වෛද්‍ය සේවය සැපයීම යන අදහසින් එම වෛද්‍ය සායනය ආරම්භ කළෙමු. පසුව අපි එම සේවය අප ආයතනය ආශ්‍රිත ප්‍රදේශයෙහි සිටින චෙන්නෛවාසින් දක්වා ව්‍යාප්ත කළෙමු. එයට පසුව එවක තමිල්නාඩුවට අනාථයන් ලෙසින් පැමිණි අය නතරව සිටි කඳවුරුවලට ශිවනාදන් සහ මම ගොස් ඖෂධ බෙදා දුන්නෙමු. එහි සිටි අයගෙන් තෝරාගත් පිරිසකට අපි වෛද්‍ය ස්වේච්ඡා සේවක පුහුණුව ලබා දුන්නෙමු. පළමු වතාවට කෘතිම පාද සකස් කිරීම පිළිබඳව පුහුණුවක් සඳහා විස්සකට අධික පිරිසකට ජෙයිපූර්වලට යවා පුහුණුව ලබා දුන්නෙමු.

සංවිධානවල ක්‍රියාත්මකව යුද්ධයෙන් තුවාළ ලබා පැමිණෙන්නන්ට චෙන්නෛහි පිහිටි රෝහල් කරා යෑමට අපේ සංවිධානය උපකාර කළේය. මෙලෙසින් අපේ වැඩ කටයුතු එහි ව්‍යාප්ත වෙන්නට විය. එහෙයින් කඳවුරු භාරව බොහෝ දෙනෙක් පත්කර ලංකාවෙහි සිට පැමිණි වෛද්‍යවරු එම කටයුතු සඳහා එක්කර ගත්තෙමු. රුපියල් දොළොස් දාහකින් ආරම්භ කෙරුනු එම ආයතනය වසර දෙකක කාලයකදී රුපියල් ලක්ෂ ගණනාවක අරමුදලක් සහිත ආයතනයක් බවට පත් කළෙමු.

පිටරටවල ජීවත් වූ දෙමළ ජනතාවට එකල සංවිධාන සමඟ ඍජු සම්බන්ධතා තිබුණේ නැත. බොහෝ දෙනෙක් එම සංවිධාන සඳහා වන මුදල් අපට එවා ඒවා එම සංවිධානවලට දෙන මෙන් දන්වා එවා තිබුණි. බොහෝ දෙනෙකුට ලිපිනය වූවේ දෙමළ වෛද්‍ය සංවිධානයයි.

එවක සංවිධානවල සිටි අයව ඒවාගෙන් ගලවා ගැනීමට මම සහ ශිවනාදන් උදව් කළෙමු. යුරෝපයට යෑම සඳහා ඒජන්සිකරුවන් විසින් චෙන්නෛ වෙත කැඳවා ගෙන ඇවිත් පසුව අතහැර දමනු ලැබූ සමහර ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට ඔවුන්ගේ ගමන් සඳහා අපි විවිධ මාර්ගයෙන් උපකාර කළෙමු.

විමුක්ති කොටි සංවිධානයෙහි නායකයාව හැර අනෙක් අයව ඕනෑම අවස්ථාවක හමුවිය හැකි තත්ත්වයක අපි සිටියෙමු. එහෙයින් අපව ඉන්දිය ඔත්තු සේවය (*RAW* ) සහ තමිල්නාඩු රහස් පොළිසිය *(Q Branch* ) ඉතාමත් හිතවත්ව පැමිණ තොරතුරු දැන ගැනීමට කැමැත්තක් දැක්වූහ.

**සැබෑවන් දෙකකි**

*The day we see the truth and cease to speak is the day we begin to die*.
Martin Luther King Jr

මම විශාඛන් සමඟ පාණ්ඩිබජාර්හි වාසය කළ කාලයෙහි සිදුවූ සිද්ධියක් දිගු කලක් තිස්සේ සිත පාරමින් තිබෙයි. එම සිද්ධිය තවමත් මගේ සිත පාරන්නේ මක් නිසාද? එය සොයුරෙක් අහිමිවීමෙන් ඇතිවන අඛණ්ඩ ශෝකයෙහි සෙවනැල්ලයි.

අපි ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි නායක පද්මනාභාව හැඳින්වූවේ රංජන් යනුවෙන්ය. 1984 වසරෙහි එක් උදෑසනකදී ඔහු මාවත් විශාඛන්වත් අපේ කාමරයෙහිදී හමු වී අපිට වයස අවුරුදු විස්සක හෝ විසිපහක තරුණයෙක්ව හඳුන්වා දුන්නේය. පසුව ඔහුව ගමට (ලංකාවට) යවන තෙක් කෙටි කලකට අපේ කාමරයෙහි නතර කරගන්නා මෙන් ඉල්ලා සිටියේය. ඔහුගේ නම ආරුඪ නමක් වන නිසා මෙහිදී එම නම සඳහන් නොකරමි. ඔහුගේ ස්වභාවය ඉතාමත් කඩවසම් ස්වභාවයකින් යුතු වූ අතර සිරුරෙහි පැහැය උතුරු ඉන්දියානුවෙකුගේ මෙන් විය. ඔහුව දුටු වහාම බොලිවුඩ් සිනමා නළුවෙකුව සිහිපත් කරවයි. නමුත් ඔහුගේ දෙමළ උච්චාරණය අනුව ඔහු ලංකාවෙහි නැගෙනහිර පළාතට එයිනුත් අග්නිදිග ප්‍රදේශයේ අයෙකු බව තේරුම් ගත හැකිවිය. අපි ඔහුගේ ගම හෝ වතගොත දැන ගැනීමට උත්සහ නොකළෙමු. ඔහු ද ඒවා අපිට කීවේ නැත.

අපි සමඟ බැහැරට ගොස් ආහාර ගැනීමත් චිත්‍රපට බැලීමත් සිදු කළත් ඔහුගේ මුහුණේ ශෝකයෙහි ඡායා පතිතව තිබුණි. ඔහු අපව වැඩිහිටි සහෝදරයන්ගේ ස්ථානයෙහි තබා ඇසුරු කළේය. ඔහු කරාටේ පුහුණුව ලැබූ අයෙකු බව මම තේරුම් ගත්තෙමි. එමෙන්ම ඔහු ලෝහ රවුම් විසි කිරීම සහ පිහි ඉලක්කයට එල්ල කිරීම වැනි සටන් කලා පුහුණුව ද ලැබූ අයෙක් ද විය. අපි ඔහු සමඟ සිටි කාලයෙහි චෙන්නෙ බොහෝ ස්ථානවලට ගොස් රාත්‍රියෙහි චිත්‍රපට බලා මැදියම් රැයෙහි ඇවිඳගෙන ආවෙමු.

ඔහු අපෙන් සමුගෙන ගිය පසුව නැවැතත් පද්මනාභා පැමිණ ඔහුව බලාගැනීම වෙනුවෙන් අපට ස්තුතිය ප්‍රකාශ කර "එයා ඉන්දියාවෙ පුහුණුව ලබපු ඉස්ලාම් සහෝදරයෙක්. අපිත් එක්ක එකතුවෙලා ගොඩක් කල් වැඩ කළා. දැන් නැගෙනහිර පළාතේ ඇතිවෙලා තියෙන දෙමළ - මුස්ලිම් අර්බුදයත් එක්ක එයාගේ හිත රිදිල ඉන්නෙ. එයා ගමට යන්ඩ ඕනෑ කියන අදහසින් තමයි හිටියෙ. ගමට යනකං අනෙක් සහෝදරවරු එක්ක එකට ඉන්නෙක හිතට කරදරයක් වෙන්නැති. ඒක නිසයි ඔයාලත් එක්ක ඉන්න සැලැස්සුවෙ" යැයි පැවසුවේය.

පසු කලෙක එම ඉස්ලාමීය සහෝදරයා ඉස්ලාමීය ග්‍රාමාරක්ෂක සේනාවට එක්ව ක්‍රියාත්මක වූ කාලයෙහි ඊරෝශ් සංවිධානය විසින් ඝාතණය කරන ලද බවට සැළවී මම මහත් සිත් වේදනාවට පත්වූවෙමි. එකම කෑම පාර්සලය බෙදා ගෙන කා අපි මාස තුනක පමණක කාලයක් එකට ජීවත් වූවෙමු.

ලංකාවෙහි නැගෙනහිර පළාතේ එකට ජීවත් වූ සුළුතර සමාජය දෙකඩ කිරීමට මූලික වූවේ ලංකාවෙහි ආණ්ඩුව හෝ විමුක්ති කොටි සංවිධානය නොවෙයි. මෙම දෙපාර්ශ්වය වෙතම අපි පහසුවෙන් මඩ ප්‍රහාර එල්ල කළහොත් ඒවා ඉතාමත් පහසුවෙන්ම ඒවා මත දැඩි ලෙසින් ඇළී පවතියි. මක් නිසා දයත් ඒවා චෙන්නෙ මහ නගරයෙහි දුම්රිය මාර්ගය අසළ ඇති කුඩා තාප්ප මෙන්ය. එම තාප්පය අසළ වූ පැල්පත්වල වාසය කරන කාන්තාවෝ ගොම රොටියක් ලෙස සකස් කර වියළා ගැනීමට එම තාප්පය භාවිතා කරයි. කැත වචනයෙන් යුතු පෝස්ටර් අළවා ඇති හෙයින් එම තාප්පවලට ගොම ගැසුව නිසා කැත වන්නේ යැයි කිව නොහැකිය.

1984 වසරෙහි අප්‍රේල් මාසයෙහි නැගෙනහිර පළාතේ අම්පාරෙහි පිහිටි කාරෙතීවු නම් ග්‍රාමයෙහි පළමු වතාවට ගැටුම් පුපුරා ගියේය. මෙයට මුස්ලිම් අයගේ කිසිම දායකත්වයක් නැත යැයි කීමට මට නොහැකි වුවත් එකල ආයුධ සන්නද්ධව සිටි ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි සහ දෙමළ ඊළම් විමුක්ති සංවිධානයෙහි වූ කාරෙතීවු තරුණයෝ එයට සහභාගි වූ හෙයින් සාමාන්‍ය ජනතාව අතර ඇති වූ ජාතින් දෙකක් අතර ගැටුමක් බවට එය පත් විය. මෙයට පෙර ඉස්ලාමීය සහෝදරයෝ බොහෝ දෙනෙක් ප්‍රධාන වශයෙන්ම ප්ලොට් සංවිධානයට සහ ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයට බැඳී සිටියා පමණක් නොව ඉන්දීය හමුදාවෙන් පුහුණුව ද ලබා ගත්හ.

එසේ පුහුණුව ලබා ගත් තරුණයෝ එම සිද්ධියට පසුව සිතේ කහටින් යුතුව සිටිද්දී එවක චෙන්නෛහි සිටි ලංකාවෙහි නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් සංවිධානවලට එරෙහිව ක්‍රියාත්මකවීමට නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයෙහි තරුණයන්ව සම්බන්ධීකරණය කරන ලදී. මෙම කාර්‍යයට

නැගෙනහිර පළාතේ සමහර දේශපාලකයෝ ද දායකත්වය දැක්වූහ. ඒවන විට නැගෙනහිර පළාතෙන් සංවිධානවලට එක්ව කටයුතු කර පසුව අයින් වූ තරුණයන් බොහෝ දෙනෙක් ග්‍රාමාරක්ෂක සේනාවට එක්කර ගැනීමට සම්බන්ධීකරණය කර පුහුණුව ලබාදීමට විශේෂ කාර්ය බලකාය කටයුතු කළේය. එවැනි සංවිධාන මැදපෙරදිග වූ ෆැටාහ් (Fatah) සහ ජිහාඩ් (Jihad) යන නම් වලින් ක්‍රියාත්මක විය. මේවා සාමාන්‍ය ඉස්ලාමීය ජනයා සහභාගිත්වය දැක්වූ ජනතා සංවිධාන නොවූවත් මේවා ජාතින් දෙක බේදීමට භාවිත කෙරුණි. මෙලෙසින් මෙම සංවිධාන ප්‍රතිවිප්ලවීය සංවිධාන ලෙසින් වර්ධනය කෙරුණි. මෙය යුද්ධ උපක්‍රමය ගෙන ආවේ එවක ආරක්ෂක ඇමැති ලෙසින් කටයුතු කළ ලලිත් ඇතුළත්මුදලිය. පසු කලෙක මෙය ඉතාත් ප්‍රයෝජනවත් කොටි අල්ලන මන්දක් බවට පත් විය. ඔහුගේ මෙම උත්සහය වනාහි ඇත්තෙන්ම ශූර බුද්ධියකින් යුක්තය. ඒ සඳහා වන ප්‍රශංසාව ඔහුට පසු කලෙකවත් ලැබුණේ නැත. ලලිත් ඇතුළත්මුදලි ඇමැතිවරයා ඇත්තෙන්ම චානක්‍ය මෙන් ශූර බුද්ධිය ඇත්තෙකි. ඉන්දියාවෙහි මැදිහත්වීම නොවන්නට විමුක්ති කොටි සංවිධානයට 2009 වසර දක්වා පැවතිය නොහැකිය. එමෙන්ම මෙතරම් දෙමළ අය සහ සිංහල අය මරණයට පත් වන්නෙත් නැත. ෆැටාහ් (Fatah) සහ ජිහාඩ් (Jihad) සංවිධාන විසින් කළ දේවල්වලට වඩා පියවර කීපයක් ඉදිරියට ගොස් කොටි කීප ගුණයක් අධික අයහපත් කටයුතු කළහ. කාත්තාන්කුඩි මුස්ලිම් පල්ලියට එල්ල කළ ප්‍රහාරය, උතුරු ප්‍රදේශයෙන් මුස්ලිම් ජනතාව පළවා හැරීම ආදිය සිදුකර රට ඇතුළත් රටින් පිටතත් ත්‍රස්තවාදින්, ජනවාර්ගික සංහාරකයන් ලෙසින් තමන්ට තමන්ම වළ කපා ගත්හ.

..........................................................................................................................................................

මම තමිල්නාඩුවෙහි වාසය කළ කාලයෙහි විවිධ වයස්වල අය, විවිධ පසුබිම් සහිත අය මා සමඟ මිතුරුව උන්හ. ඔවුන් පිළිබඳ සැමරුම් මගේ හදවතෙහි ගැඹුරින් පතිතව ඇත. පාණ්ඩියන් සහෝදරයා ඒ අතරින් ඉතාමත් වැදගත් අයෙකි. ඔහු ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි අයෙකි. ඔහුගේ පවුලේ අය ත්‍රිකුණාමලයෙහි සිට අවතැන්ව පැමිණ චෙන්නෛහි වාසය කළහ. පාණ්ඩියන් එවක මට වඩා අවුරුදු පහළොවකින් වැඩිමහල් වියෙහි පසුවූවත් අප අතර වූවේ ඉතාමත් සමීප ඇසුරකි. වැල්වැට්ටිත්තුරෛ ප්‍රදේශය තම මුල් ගම් ප්‍රදේශය කරගත් ඔහු ත්‍රිකුණාමලයෙහි නියෝජ්‍ය නගරාධිපති පදවිය දැරුවෙකි. ඔහුගේ බිරිඳ වැල්වැටිතුරෛ ප්‍රදේශයෙහි අයෙකි. එම දෙපළට පුතුන් අටදෙනෙකි. ඔවුහු ගමේ සැප පහසුකම් සහිතව ජීවත්වූ අය වෙති. එක් පුතෙක් ඒවන විට ටෙලෝ සංවිධානයට බැඳී උන්නේය. තවත් පුතෙක් නැවක රැකියාව කළේය.

මම දිනක් සවස චෙන්නෛහි පිහිටි ඔවුන්ගේ නිවෙසට ගොස් ආහාර ගත්තෙමි. එවිට ඔහුගේ බිරිඳ "අපේ සංවිධානෙ කොල්ලො දවල් ඇවිත් කෑම කාලා ගියා" යැයි පැවසුවාය. ඒ අවස්ථාවෙහි මා තුළ සැකයක් ඇතිවිය. පාණ්ඩියන් සහෝදරයා ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති සංවිධානයෙහි සාමාජිකයෙකි. පුතා ටෙලෝ සංවිධානයෙහි සාමාජිකයෙකි. ඒ අනුව ඇය"අපේ සංවිධානෙ" යැයි කියන්නේ කුමන සංවිධානය ද? දරාගත නොහැකි මෙම මානසික ගැටලුව විසඳා ගැනීමේ අටියෙන් මම ඔහුගෙන් මේ ගැන විමසුවෙමි.

" ඔයාගේ නෝනා අපේ සංවිධානෙ කියන්නෙ මොන සංවිධානෙටද?"

" ඔයා ඔය කියන්නෙ විමුක්ති කොටි සංවිධානෙටනේ ".

මා තුළ ඇතිවූවේ දරාගත නොහැකි කම්පනයකි. ඔහු තව දුරටත් පැවසූ කරුණු මා තුළ ඇති කළේ විස්මයකි.

තම පුතා ඇතුළුව වැල්වැට්ටිත්තුරෛ ප්‍රදේශයේ තරුණයන් අසූවකට අධික සංඛ්‍යාවක් නැවේ රැකියාව කරන බවත් ඔවුන් එක් අයෙක් මාසික පවුම් දහය ගණනේ විමුක්ති කොටි සංවිධානයට ලබා දෙන බවත් ඔහු පැවසුවේය.

"උඹලගේ වැල්වැට්ටිත්තුරෛ අය සේරම විමුක්ති කොටින් එක්ක ඉද්දි ඇයි උඹ ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානෙත් එක්ක ඉන්නේ ".

"මොනව කරන්නද බං? මේ නාභා සහෝදරයා එක්ක කතාබහ කරල ආශ්‍රය කෙරුවට පස්සේ ඒ මනුස්සයාව අත්හැරල යන්ඩ බෑ".

ඔහුගේ වයස අවුරුදු පනහක් පමණ ඇති. අඩි හයකටත් වඩා වැඩි උසකින් යුතු පාණ්ඩියන් තිස්පස් හැවිරිදි පද්මනාභාව ගැන කතා කළ අයුරු මා තුළ මහත් විමතියක් ඇති කිරීමට සමත් විය. මෙම සිද්ධිය මට තවත් එක් සත්‍යයක් අවබෝධ කරවීමට සමත් විය. විමුක්ති කොටි සංවිධානයෙහි මහත් වේගවත් වර්ධනයට කුකුළු කෑමවලට කළවං කර ඇති වර්ධක හෝර්මෝනය මෙන් සමහර අභ්‍යන්තර හේතුන් ද පවතියි. එයින් එකක් නම් වැල්වැටිතුරෛ ප්‍රදේශයේ අයගේ ඒකමතික ආර්ථික අනුබලය සමඟ ඔවුන් කාලයක් තිස්සේ පළපුරුදු කරගෙන සිටි නීතිය උල්ලංඝණය කරමින් කරන ක්‍රියාවල යෙදීමේ තාක්ෂණය ද ඔවුන් විසින් විමුක්ති කොටින් වෙත ඒ අයුරින්ම කුශලතාව භාරදීමක් (*skill transfer*) ලෙසින් කළ හැකිව තිබුණි.

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පමණක් නොව එයට පෙර සිටම වැල්වැට්ටිත්තුරෙර අය ඉන්දියාවත් ලංකාවත් අතරෙහි මුහුදු වෙළෙඳාමෙහි යෙදුණු අයයි. ඔවුන් සාධාරණ ලෙසින් කළ එම වෙළෙඳාම බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවටත් ඉන්දියාවටත් නිදහස ලබා දුන් පසුව නීති විරෝධි විය. ඔවුන් ලංකාව සහ ඉන්දියාව නිදහස ලැබූ පසුව ඇති කළ නීතිය ගණන් ගත්තේ නැත. එමෙන්ම භූමියේ නීතිය දියඹේ වසන තමන්ට බලනොපාන බවට පවා ඔවුන් සිතුවා විය හැකිය. ලංකාවෙහි භූමියෙහි වාසය කළත් සිතින් පමණක් නොව භාණ්ඩ පාරිභෝජනයෙහිදී ද ඔවුන් තමිල්නාඩුවෙහි අය ලෙසින් දිස් වූහ.

මම 1977 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය ලබමින් සිටියදී ¸ උඩුප්පිටි ආසනයට දෙමළ එක්සත් පෙරමුණ විසින් මැතිවරණයට ඉදිරිපත් කර සිටි *දෙමළ සුළුතරයට* අයත් රාජලිංගම්ට (එකල දෙමළ පක්‍ෂ භාවිත කළ වදන් මම අකැමැත්තෙන් වුනත් භාවිතා කරමි) පක්‍ෂපාතිව මම ඇතුළු සිසුන් දහදෙනෙකු දින දහයක් ප්‍රචාරක කටයුතුවල යෙදුනෙමු. ඒ අවස්ථාවෙහි අපි වැල්වැට්ටිත්තුරෙ ප්‍රදේශයෙහි පිහිටි පොලිකණ්ඩි නම් ගමෙහි ගෙයින් ගෙට ගියෙමු. ඒ නිවෙස්වල මා දුටු බොහෝ භාණ්ඩ ඉන්දීය භාණ්ඩය. බිත්තිවල එල්ලා තිබුණු පින්තූරුවල සිටියේ ඉන්දීය නායකයන්ය. එසේවීම පුදුමයට කරුණක් නොවිය. එකල යාපනයෙහි බොහෝ දෙනෙකු තුළ තමිල්නාඩු පිස්සුව තිබුණි.

මෙවට වඩා මා තුළ පුදුමයක් ඇති කළ කරුණක් වූවේ අප සමග එම දින දහයෙහිම සිටි අපේ මඟපෙන්වන්නා ලෙසින් කටයුතු කළ පහළොස් හැවිරිදි පිරිමි ළමයා අවසන් දිනයෙහිදි අප සමග පැවසූ කරුණයි.

" ඔයාලා මහනුවර ඉන්නේ සිංහල අය එක්ක නේද? ඉතිං බය නැද්ද?"

" ප්‍රශ්නයක් නෑ. ඇයි එහෙම ඇහැව්වේ?" යැයි මම ඇසූ අවස්ථාවෙහි හක් ගෙඩිය ලකුණ සහිත සුදු සරමක් ඇඳ සිටි එම පිරිමි ළමයා තම ඉනෙහි තබාගෙන සිටි කුඩා කළු පැහැ රිවෝල්වර් තුවක්කුව අතට ගෙන " මගේ ළඟ රිවෝල්වර් එකක් තියෙනවා. ඕනෑ නං අරන් යන්ඩ. මොකෙක් හරි සිංහලයෙක් ඔයාලට පාර්ට් එකක් දැම්මොත් ප්‍රයෝජනවත් වෙයි" යැයි පවසා එය මා දෙසට දිගු කළේය.

" ඕනෑ වෙන එකක් නෑ කියලයි මං හිතන්නෙ" යැයි පවසමින් මම මා තුළ ඇති වූ කම්පනයෙන් මිදීමට උත්සහ කරමින් පසුබැස්සෙමි.

ඔහුගේ මුහුණේ දක්නට ලැබුණු අපේක්‍ෂා භංගත්වය තවමත් මගේ සිතෙහි තැන්පත්ව ඇත.

ඔහුට අනුව මහනුවර යනු සතුරන්ගේ ප්‍රදේශයකි. අපි වාසය කරන්නේ සතුරන්ගේ මැද්දේය යන සිතිවිල්ල ඔහු තුළ වූවා විය හැකිය.

වැල්වැට්ටිත්තුරෙහි බොහෝ නිවෙස් හොරෙන් ගෙන එන භාණ්ඩ ගබඩා කර තැබීමට භූගත කාමර සමඟ ඉදිකරන ලද ඒවාය යන්න වැල්වැට්ටිත්තුරෙ මිතුරා පවසා තිබුණි.

ලංකාව නිදහස ලැබූ පසුව උතුරු ලංකාවෙහි පළමුවෙන් ඉදිකරන ලද හමුදා කඳවුරු ලෙසින් පළමුව පළාලි හිද පසුව අලිමංකඩ ද ඉදිකරන ලද හමුදා කඳවුරු හැඳින්විය හැකිය. ඒවා ආරම්භයෙහි ඉදිකරන ලද්දේ යාපනයෙහි දෙමළ ජනයා මර්දනය කිරීමට නොවෙයි. වැල්වැට්ටිත්තුරෙහි හොර බඩු ගෙන ඒම වැළැක්වීමටත් ඉන්දියාවෙහි සිට තෝණිවලින් ලංකාවට පැමිණීම වැළැක්වීමටත් එම හමුදා කඳවුරු ස්ථාපිත කරන ලදී.

ඉතිහාසය පුරාවටම භූමියේ නීතිය ප්‍රතික්‍ෂේප කෙරුණු ස්ථානයක් වූ වැල්වැට්ටිත්තුරෙහි සිට අපගේ විමුක්ති අරගලයෙහි නායකයන් බිහිවීම යනු උත්ප්‍රාස ජනක දෙයක්ද? නැතහොත් නියමයක් ද?

විදෙස් රටවල බිහි වූ විමුක්ති ව්‍යාපාර අවම වශයෙන් තමන් අතරෙහිවත් සමහර අකැප යැයි සැලකුණ නීති රීති පවත්වා ගෙන ගියේය. නමුත් විමුක්ති කොටින් තමන් විසින් ඇති කරන ලද නීති රීති පවා උල්ලංඝණය කළේ කෙසේද? සංවිධානවල අය සම්බන්ධයෙන් වූ විවාහ රීතිවල සිට ආරක්‍ෂා හමුදා වෙත යටත් නොවී සියදිවි නසා ගැනීම වැනි රීති සියල්ලම උල්ලංඝණය කළේ කෙසේද?

## විදෙස් රටවල දෙමළ අයගේ ආධාර?

දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානය චෙන්නෛහි ආරම්භ කළ කාලයෙහි අපට පිටරටවල සිට බොහෝ උපකාර ලැබිණ. ඒවායින් බොහෝමයක් තමිල්නාඩුවෙහි අනාථ කඳවුරුවල වාසය කරන ලංකාවෙහි දෙමළ අනාථයන්ගේ අවශ්‍යතා සැපිරිය යුතුය යන ඉල්ලීම සමඟින් ලැබුණු ඒවාය.

සමහර ආධාර අපගේ ඉල්ලීමකින් තොරව අපෙන් කිසිම විමසීමකින් තොරව අනාරාධිත අමුත්තන්සේ පැමිණ අප තුළ උභතෝකෝටික ගැටළු ඇති කළේය. එහි ප්‍රතිඵලයක් වූවේ අපේ හිසරදය වැඩිවීමයි. අද පවා ඒ ගැන හිතන විට ඇතිවන්නේ එවැනි තත්ත්වයක්ය. ඒවා සියල්ලම පිටරටවල දෙමළ ජනයා විසින් ඇති කරන ලද හිසරදයන්ය.

අපේ කාර්යාලය සඳහා ස්ථානයක් කුළියට ගෙන සුළු කාලයක් ගතවෙද්දී අපේ නමට චෙන්නෛ වරායට ඇමරිකාවෙහි සිට විශාල කන්ටේනර් එකක් පැමිණ ඇති බවත් ඒවායෙහි පාවිච්චි කළ ඇඳුම් පවතින බවටත් අපට දැන ගන්නට ලැබුණි.

අපි ප්‍රමෝදයට පත් වූවෙමු.

අපි වහාම එම  කන්ටේනර් එක නිදහස් කර නොගත හොත් දිනපතා වරායට මුදල් ගෙවිය යුතුය. ඒ අතර ඒජන්සිකරුවෙකු නොමැතිව ඉන්දියාවෙහි යම්කිසි කාර්‍යයක් ඉටු කිරීම යනු කොයිතරම් දුෂ්කර ද යන්න දන්නේ සුළු කාලයක් ඉන්දියාවෙහි වාසය කළ අයෙකුය.  ශිවනාදන් සහ මම බෙල්ල කැපුණු කුකුළන් සේ චෙන්නෛ වීදිවල ත්‍රිවිලර්වලින් ගොස් සොයා බැලූවිට අරගල සංවිධානවල අය අපට උපකාර කිරීම ප්‍රතික්‍ෂේප කළහ. ඉන්දියාවෙහි අල්ලස් නොදී කිසිවක් කළ නොහැකිය. අල්ලස් දීමට අප සතුව මුදල් නොමැත. ඒ මදිවට වරායෙහි කටයුතු සිදු කෙරෙන්නේ මධ්‍යම ආණ්ඩුවෙහි නිළධාරීන් විසින්ය. එහෙයින් තමිල්නාඩු දේශපාලකයන්ගේ සහය ලබා ගැනීම වුව මෙම පුද්ගලයන් සම්බන්ධයෙන් ප්‍රයෝජනයක් නැත. ඒ නිසා ලංකාවේ අනාථයෝ යන සානුකම්පිතබව පමණක් තබාගෙන එම නිළධාරීන් සමඟ කථාබස්කර සතියකින් එම  කන්ටේනර් දෙක නිදහස් කර ගත්තෙමු.

වරායෙහි ගුදමෙහි (Godown) සිට සූලෛමේඩු ප්‍රදේශයට ගෙන ඒමට පමණක් අපි මුදල් වැය කළෙමු. ඒ කාලයෙහි මෙසේ සිංගප්පූරුවෙහි සිට පැමිණි ආයුධ කන්ටේනරයක් චෙන්නෛ වරායෙහිදි අත් අඩංගුවට පත් විය. ප්ලොට් සංවිධානයට එම ආයුධ කන්ටේනරය වරායෙන් එළියට ගෙනීමට හැකිව තිබුණානං ඊළම් අරගලයෙහි නායකයා විය හැකිව තිබුණේ උමා මහේශ්වරන්ටය.

අපේ සංවිධානයෙහි නමට ඇවිත් තිබුණු කන්ටේනර් එක වරායෙන් එළියට ගෙන ඒමට හැකි වුවත් එයින් අපේ ප්‍රශ්නය අවසන් වූවේ නැත. ඇමරිකාවෙහි සිට එය එවා තිබූ අයට අපි බැන වදිමින් උන්නෙමු. එයිනුත් දොස්තර ශිවනාදන්ට තරහ ගියොත් නැතහොත් සුළුවෙන් වෙරිවුනොත් ඇති ඔහුගේ කටින් කිසිම අඩුවක් පාඩුවක් නැතිව කුණුහරුප ගලා ගෙන එයි. ඒවා අසමින් රස විඳිමින් තමිල්නාඩු මහ ඇමැති ආණ්ඩුවෙහි බස්රථවල ලියා ඇති තිරුක්කුරල් පාඨයක් වන " පැමිණි ගැහැටට සිනහ මුසුව මුහුණ දෙන්න " යන පාඨය සිහියට ගෙන කටයුතු කළෙමු.

කන්ටේනරය ගෙන ආ පසුවත් අපේ කරදර දිගටම පැවතියේ ඇයි දැයි දන්නෙහිද?

එම කන්ටේනරයෙහි ඇමරිකාවෙහි ලංකාවෙ ගැහැණුන් ඇන්ද යට ඇඳුම් සහ පිරිමින්ගේ බැනියන් සමඟ කළිසම්, ෂර්ට්, සාරි ආදි වශයෙන් පන්දාහකටත් වඩා වැඩි ඇඳුම් ප්‍රමාණයක් තිබුණි. අපේ කාර්යාලයෙහි වහලය දක්වා උසට ඒවා ගොඩ ගැසී තිබුණි. ඒවා තෝරා වෙන් වෙන්ව තැබිය යුතුය.

ලංකාවෙහි සිට පැමිණි අනාථයන්ට නවාතැන් සපයා තිබුණු සුළි සුළං ආරක්‍ෂක කඳවුරු පිහිටා තිබුණේ තමිල්නාඩු වෙරළෙහිය. ඒවා වටා තිබුණේ ධීවර ග්‍රාමයන්ය. ලංකාවෙ ගෑණු ගවුම් ඇඳ තම පිරිමින්ව වශීකරන බවට වූ චෝදනාව අපි අනාථ කඳවුරුවලට ගිය අවස්ථාවලදී ධීවර ග්‍රාමයන්හිදී කතාවෙනු අපට අසන්නට ලැබුණි.

අනාථයන්ව ඉන්දියාවට පැමිණි ලංකාවෙහි දෙමළ කාන්තාවෝ ලංකාවෙහි පුරුද්දට එහිදී ද ගවුම් ඇන්දා විය හැකිය. ගැහැණුන්ගේ කකුල් චිත්‍රපටවල පමණක් දැක තිබූ ධීවර පිරිමින්ට මෙය වෙනස් සංස්කෘතික කම්පනයක් ඇති කළා විය හැකිය. පසු කලෙක බොහෝ තරුණ කාන්තාවෝ තමිල්නාඩු කාන්තාවන් මෙන් දිග සාය සමඟ ඇඳුම් ඇන්දහ. එමෙන්ම පංජාබි, සුඩිතාර් වැනි ඇඳුම් භාවිතයට පැමිණ මෙම සංස්කෘතික කම්පනය පසු කලෙක අඩු විය.

"    මේ ඇඳුම් අපි ගිහින් කෙල්ලොන්ට දුන්නොත්හෙම මාළුකාරයන්ගේ ගම්වල ලංකාවෙ දෙමළ අයට

විරුද්ධව කැරැල්ලක් ඇති වෙයි. ඒ හින්දා උඹ ඕනෑ දෙයක් කර ගනිං" යැයි පවසා ශිවනාදන් යන්නට ගියේය. ඔහු තිස්පස් වියත් පසුකළ අවිවාහක සදාචාරගරුක අනගාරිකයෙකි. එහෙයින් අපට ලැබුණු ඇඳුම් වෙන් කිරීම මගේ සහ මට සහායට සිටි කරුණානිධිගේ හිස මත පැටවිණ. කරුණානිධි දහවල් කාලයෙහි විශ්ව විද්‍යාලයට යන හෙයින් මට සතියක කාලයක් ඇඳුම් වෙන් කිරීම සඳහා ගත කිරීමට සිදු විය.

ඇමරිකාවෙහි සිට පැමිණි පාට පාට සාරි අනාථ කඳවුරුවල සිටින කාන්තාවන්ට දී ඒවා ඔවුන් ඇන්දොත් ඔවුන්ගේ පෙනුම කොයිවගේ වෙයිද? යන්න පිළිබඳව සිතෙන් මවා නොගෙන සිටිය නොහැකි විය. *පුදිය පරලෙව* චිත්‍රපටය මගේ සිතට නැඟුණි. එම චිත්‍රපටයෙහි සෞකාර් ජානකී ඇඳ සිටි සාරිය එකල මහත් ජනප්‍රිය විය.

යට ඇඳුම් ඉවතට විසි කළෙමි. ෂර්ට් කඳවුරුවල සිටින පිරිමින්ට දීමට තීරණය කළෙමි. නමුත් කළිසම් වෙන්කර බැලූ අවස්ථාවෙහි ඒවායෙහි එකතුව පන්සීයකි. 1984-84 කාලයෙහි ඉන්දියාවට අනාථයන් ලෙස පැමිණි අය මන්නාරම දිස්ත්‍රික්කයෙහි තලෛ මන්නාරම සහ වංගාලෛ ප්‍රදේශයේ ධීවර අයය. 1985 ආරම්භයේ පැමිණියේ ත්‍රිකුණාමලයෙහි ධීවරයෝය. එයට පසුව අනෙක් අය තමිල්නාඩුවට අවතැන්වූහ. ආරම්භ කාලයෙහි ලංකාවෙ නාවික හමුදාවෙහි හිරිහැර දරා ගත නොහැකිව ඔවුහු වල්ලම්වලින් ඉන්දියාවට පැමිණියහ. අරගල සංවිධානවල ආයුධ සහ පිරිස් ගෙන ඒමට ධීවර ප්‍රජාව උපකාර කරන්නේය යැයි ලංකාවෙහි නාවික හමුදාව අදහස් කළේය. එහි ඇත්තක් පවතියි.

අනාථයන්ව පැමිණි අය මන්නාරමේ අය යැයි කොහොමද දන්නේ යැයි ඔබ අසන්නෙහිද?

ඉන්දීය වෙරළට පැමිණ නතර වෙන බොහෝ බෝට්ටුවල ලූර්තු මේරි, අමලෝට්පව මේරි ලෙසින් මවු මාතාවගේ නම් ලියා ඇත. ගැඹුරු මුහුදේ යන බෝට්ටුවලට මවු මාතාවගේ නාමය තැබීම රක්‍ෂණ සහතික පත්‍රයක් මෙන් යැයි මන්නාරමේ ධීවරයෝ අදහස් කළහ.

ඇමරිකාවෙහි සිට පැමිණි කළිසම් මෙම පිරිමින්ට ලබාදිය නොහැකිය. ඒවා අපේ සංවිධානවල කොල්ලන්ට ගැළපෙයි යැයි මම සිතුවෙමි. ආයුධදරන සටන්කාමියෝද හොඳ කළිසමක් ඇඳගෙන ආයුධ දරාපුවාවෙ යැයි සිතාගෙන කිසිම වෙනස්කමක් නොබලා කළිසම් තොගය කොටස් පහකට වෙන් කර සෑම සංවිධානයකටම කළිසම් සීය බැගින් දීමට තීරණය කළෙමි.

මෙම කාලයෙහිදි අපි අකැමැති කටයුත්තක් ද කිරීමට සිදුවිය. ඔස්ට්‍රේලියාවෙහි සිඩ්නි නුවර සිට ක්‍රියාත්මක වන ලංකා දෙමළ සංගමය ඉන්දීය රුපියල් හැත්තෑ පන්දාහක් අපේ දෙමළ සුභසාධන වෛද්‍ය මධ්‍යස්ථානයෙහි නමට චෙක් පතක ලියා එය විමුක්ති කොටි සංවිධානයටත් ටෙලෝ සංවිධානයටත් දෙන මෙන් ඉල්ලා සිටියේය. මේ අය මොනතරං මෝඩයෝද? යන සිතිවිල්ල මා තුළ ඒ අවස්ථාවෙහි ජනිත විය.

එවූ චෙක් එක මුදල් බවට පත් වීමට මාසයකටත් වඩා ගතවෙනු ඇත. ඒ මිදිවට ආයුධ සන්නද්ධ ව්‍යාපාරයකට දීමට යැයි පවසා අපේ ආරක්‍ෂාව පිළිබඳව හෝ තමන්ගේ ආරක්‍ෂාව පිළිබඳව හෝ නොසිතා ලියා එවලනේ මෙම විදෙස්ගත අය යැයි සිතමින් මම චෙක්පත ඉරලා විසි කරන්නට පවා බොහෝ වතාවක් සිතුවෙමි.

නමුත් සටන්කරුවන් පිළිබඳව අප තුළ වූ අභිමානය එම චෙක්පත මුදල්බවට පත් කළේය. කෝඩම්පාක්කම් ප්‍රදේශයෙහි බැංකු කළමනාකරු අපේ හිතවතෙක් වූ නිසා වහාම මුදල් ලබා දියහැකි බව පැවසුවේය. අපි ස්තුති පූර්වකව මුදල් ලබා ගත්තෙමු.

කළිසම් විමුක්ති කොටි සංවිධානයට හැර අනෙක් සංවිධානවලට පහසුවෙන් ලබාදීමට හැකිවිය. ඔවුහු ස්තුති පූර්වකව ඒවා භාර ගත්හ. මුදල් සහ කළිසම් සීයක් ඔබේ සංවිධානයට තිබෙන හෙයින් පැමිණ ලබාගන්න යැයි විමුක්ති කොටි සංවිධානයට දැන්වූ විට යෝගි පැමිණියේය. හින්දු විදුහලේ ඉගෙනගත් සමයෙහි සිට මම ඔහුව දැන සිටියෙමි. දෙදෙනාම කඩයෙන් තේ බී කළිසම් ටික ත්‍රීරෝද රථයක පටවාගෙන මධ්‍යහ්නයෙහි කෝඩම්පාක්කම් බැංකුව වෙත ගියෙමු.

ඒ වනවිටත් සංවිධාන අතරෙහි ගැටුම් ආරම්භව තිබුණි. ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණේ සාමාජිකයෙකුව වවුනියාවෙහිදී විමුක්ති කොටි සංවිධානය විසින් වෙඩිතබා මරා දමා ඇති පුවත මම දැනගෙන සිටි හෙයින් "ඒක හරි නරේන්, උඹලා සේරම එකට එකතුවෙන් නේ ඉන්නෙ. ඒවගේම ඊළම් විමුක්තිය කියන අරමුණත් එකයි. ඉතිං ඇයි, වවුනියාවෙදි ඊ.පී.ආර්.එල්.එෆ්. එකේ එක්කෙනෙක්ව වෙඩි තියල මරල දැම්මේ?".

නරේන් මා දෙස බලා සිනාමුසුව පැවසුවේ "මල්ලි, කිච්ච නිසා වෙඩි තිබ්බා" යන්නයි.

ඇති වූ කම්පනයෙන් මගේ සිරුර ශීතල විය. මොහොතක් ඇස් නිලංකාරව ගියේය. මිනිස් ඝාතන මෙතරම් සැහැල්ලුවෙන් සලකන මිනිහෙක් බවට මොහු වෙනස් වුනේ කවදාද? පාසල් කාලයෙහිදි ඉතාමත් මැනවින් මදින ලද කමීසයෙහි අත් වැළිමිටට පොඩ්ඩක් පහළට වන්නට නවාගෙන ක්‍රිකට් සහ පාපන්දු ක්‍රීඩාවෙහි යෙදුණු, හින්දු විදුහලේ බොහෝ සිසුන්ට වීරයෙක් වූ අයෙක් මෙවන් වචන පිට කළ හැක්කේ කෙසේද? මොහු මා සමඟ වසර කීපයක් එකට ඉගෙනගත් අයෙකි. මිතුරෙක් නොවුනත් එකම පටුමගෙහි වසර ගණනාවක් සිටි අයෙකි. අඩුම වශයෙන් ඔහුට ඝාතණය සාධාරණීකරණය කරන්නට තිබුණි. ඝාතනයට ලක් වූ තැනැත්තාව සමාජ විරෝධියෙක් ආදි වශයෙන් සුපුරුදු හේතු දැක්වීම කළ හැකිව තිබුණි.

ඡායාරූපයඃ ප්‍රභාකරන් - යෝගි

මම ඇවිදින මළ මිනියක් මෙන් බැංකුවට ගොස් මුදල් ලබා දුන්නෙමි. එයට පසුව කිසිවක් පැවසීමට කැමැත්තක් තිබුණේ නැත. අපේ සමාජය ***විෂ පානය කළ ශිව දෙවියන්ගේ තත්ත්වයට*** පත්ව ඇති බව ඒ මොහොතේ මම සිතුවෙමි. නමුත් හලාහල විෂ උගුරෙන් පහළට නොයා වැළැක්වීමට එහි උමාදේවි සිටියත් මෙහි කිසිවෙකුත් නැත යන්න ගැන සිතුවෙමි.

................................................................................................................................................................................

මෙම කාලවකවානුවෙහිදි තිස්පස් හැවිරිදි දෙමළ අයෙකු ජර්මණියෙහි සිට පැමිණෙන බවටත් ඔහු ජර්මණියෙහි නිදහස් ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂයෙහි (Free Democratic Party) වැදගත් සාමාජිකයෙක් බවත් එමෙන්ම ඔහු එවක ජර්මණියෙහි විදෙස් ඇමැතිගේ (Hans-Dietrich Genscher ) නියෝජිතයෙක් බවත් කියා තිබුණි.

"ලංකාවට සාමය උදාවුනොත් ජර්මණිය රුපියල් කෝටි ගණනින් උතුරු නැගෙනහිර සංවර්ධනය කරනවා. ඒ වෙනුවෙන් මෙහෙ ඉන්න සංවිධානවල නියෝජිතයන්ව හමුවෙලා සාකච්ඡා කරන්ඩ ඕනැ. ඒකට උදව් කරන්ඩ" යැයි ඔහු ඉල්ලා සිටියේය. ඔහු තම පක්ෂයෙහි සාමාජික පත්‍රය ද අපට පෙන්වූ හෙයින් අපි ඔහුව විශ්වාස කළෙමු.

හොඳ දෙයක්නේ යන විශ්වාසයෙන් සටන්කාමි සංවිධානවලින් අවසරය ලබාගෙන ඒ තැනැත්තා සමඟ හමුවක් සංවිධානය කළ අතර මම සහ ශිවනාදන් ඔහුව ටෙලෝ සංවිධානය සහ ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානය වෙත ඔහුව කැඳවා ගෙන ගියෙමු.

ඔහු සංවිධාන සමඟ ජර්මන් ආයෝජන පිළිබඳව කථා නොකර අරගලය නතර කර සාම සාකච්ඡාවලට යන මෙන් ඉල්ලා සිටි නිසා ඔහුගේ අරමුණ ඉටුවූවේ නැත. ඔහු පිටව ගියේය.

ඔහු උදේ එලෙස පිටව ගිය දිනයේ පසුව ඉන්දිය මධ්‍යම රහස් තොරතුරු අංශයේ චෙන්නෙ නිළධාරියා අප වෙත ඇවිත් "ඔයාලත් එක්ක නතරවෙලා ඉන්න එක්කෙනා ලංකා ආණ්ඩුවෙ ඔත්තුකාරයෙක් කියල අපිට සැකයක් ඇතිවෙල තියෙනවා. අපිට එයාගෙන් ප්‍රශ්න කරන්ඩ ඕනැ"යැයි පැවසුවේය.

අපි ත්‍රාසයට පත්වුවෙමු.

අපි ඒ ගැන නොදන්නා බව පවසා ඔහුගේ හැසිරීම පැහැදිළි කළෙමු.

පසුව අපි ඒ ගැන කල්පනා කර බැලුවිට ජර්මන් රටේ සිට පැමිණි එම තැනැත්තා නිදා ගැනීමට පහසුකමක් නැති අපේ කාර්යාලයෙහි බිම නිදාගෙන දින පහක් ගත කළේය යන්නත් අපට ආරම්භයෙහිදි පුදුමයට කරුණක් විය. ඒ අතරම ඔත්තුකරුවෙකු විය හැකිය යන සැකය ද බලවත් කළේය.

මෙයට අමතරව වරක් උතුරු ඇමරිකාවෙහි සිට දෙමළ අය පස් දෙනෙක් පැමිණ චෝළා හෝටලයෙහි නතරව හිඳ මට සහ දොස්තර ශිවනාදන්ට පැමිණ හමුවෙන මෙන් ආරාධනා කළහ. ඔවුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවෙහිදී තමන් සතුව විශාල මුදලක් පවතින බවත් කොළඹට විශාල ප්‍රහාරයක් එල්ල කිරීමට ඉදිරිපත්වන්නේ කුමන සංවිධානය ද එම සංවිධානයට එම මුදල ලබාදීමට සූදානම් බවත් ඔවුහු පැවසූහ. මෙම පිරිසට කෙළින්ම අපේ හෙළා දැකීමේ විරෝධය පළ කිරීමේ හැකියාවක් අපට තිබුණේ නැත. මමත් ශිවනාදනුත් එයට පසුව ඔවුන් සමඟ සන්නිවේදනයෙහි යෙදුනේ නැත. ඒ නිසා මේ අයගේ මුදල් ගියේ කුමන සංවිධානයටදැයි නිශ්චිතව නොදන්නා හෙයින් ඒ ගැන කිසිවක් කිව නොහැකිය. නමුත් නිසැකවම එම මුදල් කොළඹදී බෝම්බයක් වී පුපුරා ගොස් ජීවිත පිළිගත්තේය.

ඉහත සඳහන් කළ සිදුවීම් හතර විදෙස්ගත දෙමළ ජනතාව සමඟ සම්බන්ධය. ඔවුන් පිළිබඳව මගේ අභිප්‍රාය ඉතාමත් දරුණුය.

විදෙස්ගත දෙමළ ජනතාව ජනතාවගෙන් සීයට අනූ නවයයි දශම නවයක පිරිසක් ලංකාවෙන් බැහැරවෙන විට දේශපාලනයෙහි යෙදුණු අය නොවෙයි. ලංකාවෙහි දේශපාලනය ගැන පමණක් නොව ලෝක දේශපාලනය පිළිබඳවත් නොදන්නා අය වෙති. නමුත් සංවිධානවල සාමාජිකයන්ව සිටි අය හැඟීම් පෙරදැරිව ආයුධ එසවීමට ඉදිරිපත් වූ අය වෙති. ඔවුන්ගෙන් සමහරු විශේෂයෙන්ම ප්ලොට්,ඊරෝශ් සහ ඊ.පී.ආර්.එල්.එෆ්. යන සංවිධානවල අය යම් තරමකට දේශපාලන දැනුමක් සහිතව සිටියත් ඔවුන්ට විදෙස්ගත රටවල ක්‍රියාත්මකවීමට පහසුකම් තිබුණේ නැත. තමන්ගේ නව ජීවිතයෙහි ස්ථාවර වීම වෙනුවෙන්ම ඔවුන්ට මහත් වෑයමක් දැරීමට සිදුවිය.

මෙම තත්ත්වය තුළ බටහිර රටවල පසුකාලයෙහි විමුක්ති කොටි වෙනුවෙන් ක්‍රියාත්මක වූ අය තමන් ඉදිරියට ගමන් කිරීමටත් තමන්ට වැදගත්කමක් ඇතිකර ගැනීමටත් එමෙන්ම ලංකාවෙහි ආණ්ඩුව විසින් සිදු කරන ලද බොහෝ කටයුතු හේතුවෙන් මෙම අය තුළ ආරම්භ කාලයෙහිදි ඇති වූ චිත්ත වේදනාවන් පෙන්වීමටත් මෙම අරගලය උපකාරි විය. ඊළම් අරගලයෙන් දෙමළ ජනතාව පරාජයවීමට හේතුවූවේ මේ අයමය. මේ අය විසින් කිසිම අන්දමේ චින්තන හැකියාවක් නොමැති යෝධ සත්ත්වයෙක්ව කවා පොවා ඇති දැඩි කළහ. එම සත්ත්වයා මුල්ලිවායික්කාල් වෙරළේදී අවසන් හුස්ම හෙළුවේය. ඒ නිසා දෙමළ ජනතාවගේ යුක්ති සහගත බොහෝ කරුණු දැන් ලෝකයෙහි හැම තැනකම එපමණක් නොව අරගලයට උපකාරි වූ බොහෝ දෙමළ අයට පවා අයුක්ති සහගත ලෙසින් දිස්වෙයි.

**අවසන් මොහොත දක්වාම දෙමළ ඊළම් සිහිනය සමගින් ජීවත්ව මියගිය ඩේවිඩ් මහත්තයා**

ගෘහ නිර්මාණශිල්පියෙකු ද සහ ලංකාවෙහි ගාන්ධීයම් සංවිධානයෙහි ආදිකර්තෘ වූ ද ඩේවිඩ් මහත්තයාව අපි අනුස්මරණය කළ යුතුවෙමු. නමුත් මා ඉදිරියෙහි ඇති ප්‍රශ්නය එය කළ යුත්තේ කෙසේද? යන්නයි. මියගිය අයව සිහියෙහි තබාගෙන සිටීම අපේ සංස්කෘතික හරයකි. ඥාතියෙකුගේ, ඇසුරුකළ අයෙකුගේ වෙන්ව යාම අපි දුකක් ලෙසින් සළකන්නෙමු.

හොඳටම වයෝවෘද්ධව මහළුවියට පත්ව මුනිවරයෙකු සේ ජීවත්ව මරණයට පත්වූවෙකි ඩේවිඩ් මහත්තයා. මරණය යනු ජයග්‍රහණය කළ නොහැකි තත්ත්වයක්ය යන්න තුළ ඒ ගැන දුක් නොවී අපි ඔහු කළ දේ ගැන අවධානය යොමු කළ යුතුය. ලාංකේය දෙමළ ජාතිකයෙක් වූ ඔහු අවිවාහකව පොදු ජීවිතය තුළ රැඳෙමින් සිට පිටව ගියේය. ඔහුගේ ජීවිතය සහ සේවය දෙස හැගීම්බර බවින් මිදී බැලීම අපගේ අවශ්‍යතාව වී ඇත.

එක්දහස් නවසිය පනස් ගණන්වලදී ලෝකයේ ඉතාමත් විශිෂ්ඨ විශ්ව විද්‍යාලයක් ලෙසින් සැළකුණු ඔස්ට්‍රේලියාවෙහි මෙල්බන් විශ්ව විද්‍යාලයෙහි ගෘහ නිර්මාණ ශිල්පය හැදෑරූ ඔහු පසුව එන්ගලන්තයෙහිදී නාගරීකරණය අංශයෙහි අධ්‍යනය ලැබුවේය. පසුව සුළු කාලයක් කෙන්යාවෙහි රැකියාව කළේය.

යුරෝපයේ සහ සහ උතුරු ඇමරිකාවෙහි හැර ලෝකයේ වෙනත් රටවල නාගරීකරණය අධ්‍යනයය සිදු කෙරුණේ එක්දහස් නවසිය පනස් ගණන්වලට පසුවයි. එම කාලවකවානුවෙහි ඩේවිඩ් මහත්තයා කොයිතරම් වැදගත් මිනිසෙක්ද?

ඔහු සහ දොස්තර රාජසුන්දරම් එක්ව ඇතිකළ ගාන්ධීයම් සංවිධානය එවක විදෙස්ගත දෙමළ ජනතාවගේ ආධාරය ලැබූ පළමු ස්වේච්ඡා ආයතනයයි. ඔවුන් දෙදෙනා තම ගාන්ධීයම් සංවිධානය මාර්ගයෙන් ඉඩම් නොමැති කඳුරට දෙමළ ජනතාවට ඉඩම් ලබා දී පදිංචි කරවීමට කළ සේවය සාමාන්‍ය වෑයමක් නොවීය.

ලංකාවෙහි දෙමළ දේශපාලනය ප්‍රධාන වශයෙන් පාර්ශ්ව තුනකින් නිර්මාණය වූවකි. එනම්:

1) බල කෑදරකම නිසා මරණය තෙක් පුටුව අත් නොහරින පිරිස.
2) ධනය ඉපයීමට කැමැත්තෙන් වන අය.
3) අනෙක් අය විශේෂයෙන්ම තරුණයෝ හැගීම් උද්දීපණය වී ප්‍රාණය සහ අවයව දන් දුන් අය.

මෙවන් තත්ත්වයක් තුළ ඩේවිඩ් මහත්තයා තමන් විසින් නිර්මාණය කළ ගාන්ධීයම් සංවිධානයත් තමනුත් බිල්ලට දුන් හෙයින් ඔහුගේ දැනුම, ඉගැනුම ඇතුළු සියල්ලම ඔහුව අතහැර දැමුවේය.

ඡායාරූපය: ඩේවිඩ් මහත්තයා

බොහෝ රටවල අරගල සංවිධානවල ක්‍රියාත්මක වී ඒවා පිළිබඳව අසහනයට පත්වූවන්, අතෘප්තියට පත් වූවන් ස්වේච්ඡා සමාජ සේවා ආයතනවල ක්‍රියාත්මකවීම පිළිබඳව අසා ඇත්තෙමි. ඒවගේම අරගල සංවිධාන විසින් ස්වේච්ඡා ආයතන ඇති කරනු ලැබ ඒ මාර්ගයෙන් මුදල් රැස්කිරීම ද දැක ඇත්තෙමි. මෙයට නිදසුන් ලෙසින් විමුක්ති කොටි සංවිධානය විසින් දෙමළ පුනරුත්ථාපන සංවිධානය (TRO) සහ දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානය (TAMED) යනාදි වශයෙන් සමහර සංවිධාන ඔස්ට්‍රේලියාවෙහි පවත්වා ගෙන යෑම පැවසිය හැකිය. නමුත් ගාන්ධීයම් වැනි අවංක ස්වේච්ඡා සංවිධානයක් අරගලකරුවන්ගේ සංවිධානයක් බවට පත් කිරීමෙහිදී ඩේවිඩ් මහත්තයාට ඇත්තේ වැදගත් දායකත්වයකි.

මෙහිදී මම කීමට කැමැත්තෙන් සිටින කරුණක් ඇත. එය නම් දෙමළ අයගෙන් විවිධ අංශයන්ගෙන් දස්කම් සහ නිපුණතාව පිරි බොහෝ දෙනෙක් අයුක්තියට පක්ෂපාත අය වශයෙන් ද එමෙන්ම දේශපාලනයෙහි හෝඩියවත් නොදන්නා අය වශයෙන් ද සිටිති යන්නට උදාහරණයක් වශයෙන් ඩේවිඩ් මහත්තයා උන්නේය යන්නයි.

වෘත්තියෙන් ඉංජිනේරුවෙකු වන මගේ මිතුරෙක් නිතර නිතර මා සමග ඩේවිඩ් මහත්තයා පිළිබඳව කතා කරයි. ඩේවිඩ් මහත්තයා සහ ඔහු මෙල්බන් විශ්ව විද්‍යාලයෙහි එකට අධ්‍යාපනය ලැබූ බව ඔහු පවසයි. එවිට මමත් ඩේවිඩ් මහත්තයාව හොඳින් දන්නා බව පවසමි. ඊළම් විමුක්ති අරගලය නම් වූ බලකොටුවෙහි සිරගෙයි තම අත්තටු සිරකරගෙන දිගටම මහත් දුක් විඳි මිනිසෙකි ඔහු. නමුත් ඔහුගේ දේශපාලනය පිළිබඳව කිසිම විශ්වාසයක් මා තුළ තිබුණේ නැත. මා සඳහන් කළ මෙම ඉංජිනේරුවරයා කඳුකරයෙහි අයෙක් නිසා

උතුරු නැගෙනහිරට බැහැරින් ජීවත්වන දෙමළ ජනතාවට යුක්තිය ඉටු නොවන විමුක්ති අරගලය යන මගේ දේශපාලනය සමඟ එකඟවන්නෙකි.

ඩේවිඩ් මහත්තයා සමඟ එක්ව අධ්‍යාපනය ලැබූ ඔහු මට 2005 වසරෙහිදී පමණ මෙල්බොන් නගරයෙහිදී ඩේවිඩ් මහත්තයාගේ ලිපියක් පෙන්නුවේය. එය ඔහුට ඩේවිඩ් මහත්තයා විසින් ලියූවකි. එය කියවූ මට එහි වූ එක් අදහසක් මට තව දුරටත් සිතන්නට පෙළඹුවේය. "දෙමළ අය හැමෝම දැන් ප්‍රභාකරන් මලයගේ තරුණ උරහිස මත්තේ මුළු බරම පටවල. එයාට මේ බර තනිවම ඔසවන්ඩ බෑ. මෙම බර අඩුකරන්ඩ පිටරටවල ඉන්න දෙමළ අය උපකාර වෙන්ඩ ඕනෑ" යන්න එම අදහසයි.

මෙය කියවූ පසුවත් එමෙන්ම ඔහු සමඟ වූ සම්මුඛ සාකච්ඡාව කියවූ පසුවත් බොහෝ වතාවක් මම හමුවී ඇති ඩේවිඩ් මහත්තයා පිළිබඳව සිතා බැලිය යුතු විය. නමුත් ලිවීමට අවස්ථාවක් ලැබුණේ නැත.

මට ඔහුව හඳුන්වා දුන්නේ වෛද්‍ය ශිවනාදන් මිතුරා විසින්ය. මඩකළපුව සිරගෙයි සිටි දෙමළ සටන්කාමීන් සිරගෙය කඩාගෙන පළායන මොහොතේ ඩේවිඩ් මහත්තයා ද එසේ පළාගිය එක් අයෙකි. මෙසේ සිරගෙය කඩාගෙන පළා යෑම පිළිබඳව දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය (PLOTE) සහ ඊළම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණ ( *EPRLF*) යන සංවිධාන දෙක වගකීම භාරගෙන අත් පත්‍රිකා බෙදාහැරියේය. ඔවුහු එසේ පළා එනවිට නැගෙනහිර පළාතේ වාකරෙ ප්‍රදේශයේ ආණ්ඩුවෙහි රෝහලේ වෛද්‍යවරයෙකුව සිටි දොස්තර ශිවනාදන් සිරගෙයින් පළා ආ අයට උපකාර කළ හෙයින් පසුව ලංකාවෙන් පිටව ගියේය. මෙසේ එකට පළාගිය අය පසුව තම තමන්ගේ සංවිධානවලට අනුව වෙන් වෙන් මුහුදු යාත්‍රාවලින් ඉන්දියාවට පිටත්ව ගියහ. මගේ මිතුරු ශිවනාදන් වෛද්‍යවරයා පැමිණි මුහුදු යාත්‍රාව දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානයට (PLOTE) අයත්වූවෙන් ඔහු සුළු කාලයක් ඔවුන් සමඟ තේනි ප්‍රදේශයේ පිහිටා තිබුණු කඳවුරෙහි වාසය කළේය. ඩේවිඩ් මහත්තයා පිළිබඳව උනන්දුවකින් සිටියේ දොස්තර ශිවනාදන්ය.

දොස්තර ශිවනාදන් දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය (PLOTE) සමඟ වූ තම සම්බන්ධකම් විසන්ධි කරගත්තත් පෞද්ගලිකව ඔවුන් සමඟ ආශ්‍රය කළේය. ඔහුව දෙමළ වෛද්‍ය අරමුදලෙහි (MUST) භාණ්ඩාගාරික තනතුරට යෝජනා කළේ වාසුදේවා විසින්ය. වෛද්‍ය රාජසුන්දරම්ගේ බිරිඳ වූ ශාන්ති අක්කාව දෙමළ වෛද්‍ය අරමුදලෙහි උප සභාපතිනිය බවට පත් කළේ ද ඔහුය. ශාන්ති අක්කා කිසිම සටන්කාමී සංවිධානයක් සමඟ සම්බන්ධ නොවී චෙන්නෙහි එග්මෝර් පොලිස් රෝහලෙහි රැකියාව කරන ගමන් එම උප සභාපතිධුරයෙහි කටයුතු කළාය.

එම කාලයෙහිදි දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය (PLOTE) පිළිබඳව දිනපතා බොහෝ පුවත් වෛද්‍ය ශිවනාදන්ට ලැබෙයි. ඔහු එම අවස්ථාවල නළලට ගසා ගනිමින් "මුන් හදන්ඩ පුළුවන් එවුන් නෙමෙයි" යැයි වේදනාවෙන් යුතුව මට පවසයි.

දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානයෙහි (PLOTE) අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් බොහෝ දෙනෙක් මරා දමනු ලබන බවත් අතුරුදහන් කෙරෙන බවත් එහි නායක උමා මහේශ්වරන්ගේ නායකත්වයට අකැමැත්තෙන් සංවිධානව තුළ බේදීම් ඇතිවන බවත් බොහෝ දෙනෙක් පැමිණ දොස්තර ශිවනාදන්ට පවසති. ඔහු ඒවා ඔහු මා සමඟ පවසමින් උමා මහේශ්වරන්ට බැන වදියි.

සූලෙලෙමේඩු පාරෙහි වූ අපේ කාර්යාලයෙහි මමත් ශිවදාසනුත් වැඩ කරමින් සිටි එක්තරා දිනක මධ්‍යාහ්නයෙහි සන්දතියාර් සහ ඩේවිඩ් මහත්තයා එහි පැමිණියහ. ඔවුහු කැළඹීමට පත්ව උන්හ. එදින මම සන්දතියාර් කියූ දේවල්වලට ඇහුන්කන් දුන්නෙමි. මම වැඩිපුර කථා නොකළෙමි. ඔවුන්ගේ කථාබහ සංවිධානයෙහි අභ්‍යන්තර ඝාතන පිළිබඳවත් එමෙන්ම උමා මහේශ්වරන්ගේ ඒකාධිපති ප්‍රවනතාව පිළිබඳවත් විය. මෙහිදී සන්දතියාර් යනු ඉතාමත් අවංක අයෙක් යැයි අසා තිබුණු හෙයින් මා තුළ ඔහු කෙරෙහි ඇගයීමක් විය. ඒ වගේම එවක දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය (PLOTE) විසින් ඉන්දීය විදේශ ප්‍රතිපත්තියෙහි වැරදි ක්‍රියාකාරීත්වය පෙන්වා දෙමින් "*වංගම් තන්ද පාඩම්*" (බංග්ලා දේශය ඉගැන්වූ පාඩම) නමින් පොත් පිංචක් ප්‍රකාශනය කළේය. එම පොත් පිංච දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානයෙහි ඉන්දීය විරෝධී ප්‍රවනතාව පෙන්වා දෙන්නක් යැයි බව බොහෝ දෙනෙකු විසින් පවසන ලදී. මට ද ඒ අදහස තිත්ත විය. ඉන්දියාවට එරෙහි වී ලංකාවෙහි දෙමළ ජනතාවට කිසිම ප්‍රගතියක් ලබාගත නොහැකිය යන්න මගේ දැනුමට එකළ තේරුම්ගත හැකිව තිබුණි.

දිගින් දිගටම ඔවුන්ගේ පක්ෂ අභ්‍යන්තරයෙහි වූ ගැටුම් පිළිබඳව කථාකරමින් සිටි ඔවුහු එය අසාගෙන සිටි මා කෙරෙහි තැකීමක් නොකළහ. මම අවසානයෙහි සන්දතියාර්ගෙන් ප්‍රශ්නයක් ඇසිය හැකිදැයි ඇසුවෙමි. සන්දතියාර් "ඔව්, අහන්න" යැයි පැවසුවේය. "ඔයා උමා මහේශ්වරන් එක්ක ඉතාමත් කිට්ටුවෙන් ආශ්‍රය කරපු කෙනෙක්. ඒ විතරක් නෙමෙයි උමාව දැන් ඉන්න තත්ත්වෙට ගේන්න වැඩ කරපු කෙනෙක්. ගොඩක් කාලයක් මිත්‍රත්වයෙන් ආශ්‍රය කරපු ඔයාට ඒ කාලෙ උමා මහේශ්වරන්ගේ ඒකාධිපති ස්වභාවය තේරුණේ නැද්ද?".

සන්දතියාර් මඳ වෙලාවක් කල්පනා කර "ඔයා අහන ප්‍රශ්නෙ යුක්ති සහගත ප්‍රශ්නයක්" යැයි පවසා නැගිට පිටව යද්දි "ඔයාව ආපහු හමුවෙයිද කියල දන්නෙ නෑ" යැයි පවසා ඩේවිඩ් මහත්තයා සමඟ පිටව ගියේය.

ඡායාරූපයඃ සන්දතියාර්

එම වදන් මාව කම්පනයට පත් කළේය. දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානයෙහි (PLOTE) අවංක පුද්ගලයෙක් යැයි දොස්තර ශිවනාදන් මට සන්දතියාර් පිළිබඳව පවසා තිබුණේය.

දින කීපයකට පසුව මට මෙම පුවත ආරංචි විය.

රාත්‍රි කාලයෙහි සන්දතියාර්ව සොයා ගිය දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානයෙහි කණ්ඩායමක් සන්දතියාර් යැයි සිතා ඩේවිඩ් මහත්තයාව ගෝනියක දමා බැඳගෙන පැහැර ගෙන ගොස් ඇත. පසුව තමන් විසින් පැහැරගෙන ඇවිත් සිටින්නේ ඩේවිඩ් මහත්තයාව බව දැනගත් වහාම ඔහුව වෙන්නෙහි අණ්ණානගර් ආසන්නයෙහි කනත්තක දමා ගොස් ඇත.

ඩේවිඩ් මහත්තයා විසින් ඝාතක මුකුන්දන් (උමා මහේශ්වරන්) සහ ඔහුගේ සහායක වාසු (මඩකළපුවෙහි වාසුදේවා) යනුවෙන් ප්‍රබල ලිපියක් ලියුවේය. එකල ඔහුගේ නිර්භීතබව අපි සියලු දෙනාම ඇගයුවෙමු. එක්තරා අයුරකින් උමා මහේශ්වරන්ගේ පිරිහීමට මෙම ලිපිය බලපෑවේය.

උමා මහේශ්වරන්ගේ කණ්ඩායමෙන් ඇතිවිය හැකිව තිබූ මරණය රවටමින් එයට පසුව ඩේවිඩ් මහත්තයා අවුරුදු තිහක් පමණ ජීවත්ව උන්නේය. එම පැහැරගෙන යෑමේ සිද්ධියෙන් දින ගණනකට පසුව සන්දතියාර් අතුරුදහන් වූ පුවත ලැබිණ.

දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය ඊළම් විමුක්ති අරගලයෙහි විශ්වාස කළ හැකි ලෙසින් ප්‍රගතිශීලි ප්‍රත්පත්ති සහ බාහිර සම්බන්ධකම් සහිත අරගල සංවිධානයක් ලෙසින් ආරම්භයෙහිදී පැවතියේය. එක් කාලයක එය පුහුණුව ලැබූ තරුණයෝ හයදාහකටත් වඩා වැඩි පිරිසක් සහිත සංවිධානයක් විය.

ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණ (EPRLF) සහ දෙමළ ඊළම් විමුක්ති සංවිධානය (TELO) විනාශ කරමින් ද ඊළම් විප්ලවකාරි ශිෂ්‍ය සංවිධානය (EROS) තමන්ට එකතු කරගනිමින් ද නැති කළ විමුක්ති කොටි සංවිධානයට මහන්සි වීමට ඉඩක් නොතබා තමන් විසින්ම තමන්ව විනාශ කරගත් සංවිධානයක් බවට දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය (PLOTE) පත් විය.

1987 ජූලි මාසයෙහිදි මම ඉන්දියාවෙන් පිට වූ අවස්ථාව වන විට මගේ ලංකා විදේශ ගමන් බලපත්‍රයෙහි ඉන්දීය වීසා වලංගු කාලය අවසන්ව වසර තුනක් පමණ ගතව තිබුණි. ඒ අවස්ථාවෙහි මම දන්නා ඉන්දීය රහස් තොරතුරු අංශයෙහි නිළධාරියෙකුගේ මාර්ගයෙන් මම වීසා අලුත් කර ගත්තෙමි. එම නිළධාරියා සතුව එවක ඉන්දියාවෙහි ක්‍රියාත්මක වූ දෙමළ ඊළම් සංවිධාන විසින් සිදු කරන ලද අභ්‍යන්තර ඝාතනවල ලැයිස්තුවක් තිබුණි. දෙසිය පනහකට වැඩි පිරිසක් ඝාතනය කරමින් දෙමළ ඊළම් මහජන විමුක්ති සංවිධානය එහි පළමු ස්ථානයෙහි තිබුණි. දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය (LTTE) ඝාතන 32ක් ද දෙමළ ඊළම් විමුක්ති සංවිධානය (TELO) ඝාතන 18ක් ද සිදු කර තිබුණි. ඊළම් විප්ලවකාරි ශිෂ්‍ය සංවිධානය (EROS) සහ ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණ (EPRLF) විසින් සිදු කළ ඝාතන පිළිබඳව ලැයිස්තුවක් ඔහු ළඟ තිබුණේ නැත. නමුත් මම වීසා අලුත් කර ගැනීමත් ඉන්දියාවෙන් පිටවීමත් අතර කාලයෙහි ඊළම් විප්ලවකාරි ශිෂ්‍ය සංවිධානය (EROS) විසින් මදුරෙ ප්‍රදේශයෙහිදී සිවු දෙනෙකු ඝාතනය කළ බවට දැන ගන්නට ලැබුණි. එම ඝාතනත් එම නිළධාරියා සතුව තිබුණි. මෙයට අමතරව තව බොහෝ ඝාතන තොරතුරු ඔවුන්ට නොලැබී තිබීමට හැකියාව ඇත? තවද එම ලැයිස්තුවෙහි කාලය 1987යි. එනම් ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කළ කාලයයි.

මම ඕස්ට්‍රේලියාවට පදිංචියට පැමිණි පසුව එක් වරක් ඩේවිඩ් මහත්තයාව ඉන්දියාවෙහිදි හමුවූවෙමි. ඔහු සමඟ කළ කථාබහෙන් මට දැනගන්නට ලැබුණේ ඔහු දෙමළ පාර්ශ්වයෙහි වෙන්ව යෑම ඉතාමත් දැඩිලෙසින් හිතවාදිව කටයුතු කිරීමත් සිංහල විරෝධයෙහි ඉතාමත් දැඩි ස්ථාවරයකත් සිටින බවයි.

ඔහුගේ සිංහල විරෝධය ජාති විරෝධයක් ලෙසින් පෙනෙන්නට තිබුණි. පසු කලෙක ඔහුට විමුක්ති කොටින් පිළිබඳව විශ්වාසය තැබීමට හැකි වූවේ ඒ නිසාය.

ඩේවිඩ් මහත්තයා කිතුනුවෙක් වුවත් ඔහුගේ ජීවිතය හින්දු ආගමෙහි සාමිවරයෙකුගේ මෙන් විය. ඔහු විවාහ නොවූවා පමණක් නොව ඇඳුම් පිළිබඳව ද දැඩි ස්ථාවරයක උන්නේය.

එංගලන්තයෙහිදි ඔහු සපත්තු පැළඳගෙන සිටියා විය හැකිය. නමුත් මම ඉන්දියාවෙහිදී ඔහු සෙරෙප්පු පැළඳ සිටිනු නොදුටුවෙමි. ශිවනාදන් දොස්තර මහත්තයා "ඩේවිඩ් මහත්තයා සෙරෙප්පු දාන්නෙ දෙමළ ඊළම දිනා ගත්තට පස්සෙ" යැයි පවසා සිනාසෙයි. එහි කොයිතරම් දුරකට ඇත්තද? බොරුද යන්න නොදනිමි.

ඊළම් බෙදුම්වාදියෙකු වූ ඔහු නිරාශා සහිතව සාධුවරයෙකු මෙන් හැසිරුණේය. නමුත් ඔහුගේ දඩබ්බරකම තුළ බොහෝ ප්‍රතිගාමී ලක්ෂණ දක්නට ලැබිණ. ඔහු ආරම්භයෙහිදී ගාන්ධීයම් නමින් සුන්දර

ළදරුවෙකු බිහිකළත් ඔහු වගකීමෙන් යුතුව එම ළදරුවාව හදා වැඩුවේ නැත. ඔහු එම ළදරුවාව ආයුධ සන්නද්ධ සංවිධාන අතට දුන්නේය. ඔහු මුලදී උමා මහේශ්වරන් කෙරෙහි ද පසුව ප්‍රභාකරන් කෙරෙහි ද විශ්වාසය තැබුවේය. කොටි සංවිධානයෙහි මාර්ගයෙන් ලංකාවෙහි දෙමළ ජනතාවට ප්‍රභාතය උදාවෙනු ඇතැයි යන විශ්වාසයෙහි ඔහු උන්නේය.

ඔහු දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙතැයි යනුවෙන් යෝගිවරයෙකු ලෙසින් ද එමෙන්ම දඩබ්බර ළමයෙකු ලෙසින් ද තමන් වටා කාල්පනික තාප්ප ඉදිකරගනිමින් ජීවත් වූ මිනිසෙකි.

ඊළම් අරගලයට කුමන හෝ අයුරකින් දායකත්වය දැක්වූවෝ අත්කරගත්තේ පරාජයයි. කිසිවෙක් ජයග්‍රහණය නොකළ එම අරගලයෙහි බොහෝ දෙනෙක් කල් පමා වී තමන්ව ආරක්ෂා කර ගත්හ. තව බොහෝ දෙනෙක් ලැබුණු වාසි සමඟ මඩි තරකර ගත්හ.

නමුත් මට ඩේවිඩ් මහත්තයාව අනුස්මරණය කළ හැකිව තිබෙන්නේ ඔහු මොන තරම් මානසික බරකින් යුතුව තමන්ගේ අවසන් දවස් ගත කරන්නට ඇති ද යන්න පිළිබඳව සිතාය.

## අහිංසකයන්ව මරා දමන ත්‍රස්තවාදය

රජකෙනෙක් තමන්ගේ රටේ තිබෙන නමුත් තමන් මෙතෙක් දැක නැති පළතුරක් ගෙනවිත් පෙන්නුවහොත් තම දියණිය සරණ බන්ධනය කර දෙන බවටත් නමුත් එම පළතුර තමන් දැන සිටින එකක් වුවහොත් එය ගෙන ආ තැනැත්තාගේ කටෙහි ඔබා පිටත් කර යවන බවත් දැනුම් දුන්නේය. පිරිස මිදි, කෙසෙල් ආදි පළතුරු ගෙනවිත් පෙන්නුවත් ඒවා තමන් දන්නා බව පැවසූ රජු ඒවා ඔවුන්ගේ කටේ ඔබා පිටත් කර හැරියේය.

ඔවුහු සිනාසෙමින් පිටව ගියහ. අයෙක් අන්නාසි ගෙඩියක් ගෙන ආහ. එවිට ද රජු එය දැක ඇති බව පවසා එය ඔහුගේ කටේ ඔබා පිටත් කළේය. කට ඉරී ගියත් ඔහු ඇඬුවේ නැත. ඔහු සිනාසුනේය. එවිට රජතුමා "මොකද හිනා වෙන්නේ? ඇයි රිදෙන්නේ නැද්ද?" යැයි ඇසුවේය. "නෑ, මට හිනා ගියේ මට පිටිපස්සෙන් ඉන්න කෙනා වරකා ගෙඩියක් අරගෙන ඉන්න එකටයි" යැයි පැවසුවේලු. මේ අයුරින් රැවටීමට පත්වෙමින් සිටින ලංකාවෙ දෙමළ ජනතාවටත් වඩා අනුකම්පාවට ලක් විය යුතු අය නම් සිංහල වාමාංශිකයෝය. දෙමළ සංවිධානවල ඊළම් විමුක්ති අරගලය යනු සාධාරණ අරගලයක් යැයි ද ඒ මඟින් දෙමළ ජනතාවට අයිතිවාසිකම් ලැබෙනු ඇතැයි ද එපමණක් නොව එයින් සිංහල පීඩිත පංතියටත් සැනසුමක් ලැබෙනු ඇතැයි ද යනුවෙන් විශ්වාස කළ සිංහල වාමාංශිකයෝ බොහෝ දෙනෙක් උන්හ. ඔවුන්ගෙන් සමහරු ප්ලොට් සංවිධානය සමඟ සම්බන්ධකම් පැවැත්වූ බව මම දැන සිටියෙමි. නමුත් මට ඔවුන් සමඟ සෘජුව සම්බන්ධකම් තිබුණේ නැත. නමුත් ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානය සමඟ සහයෝගයෙන් සිටි විකල්ප කණ්ඩායම නම් වූ දයාන් ජයතිලකගේ කණ්ඩායම ඉන්දියාවෙහිදි හමුවුනෙමි. එම කණ්ඩායමෙහි සිවු දෙනෙක් මා සමඟ ඉතාමත් කුළුපගව ආශ්‍රය කළහ. ජෝ සෙනෙවිරත්න, චින්තන ඩි සිල්වා (කමල්), පියල් සහ ශ්‍රී ලාල් එම සිවු දෙනාය. මොවුහු ලංකාවෙහි ජීවත්වීමට නොහැකිව චෙන්නෛ නගරයට අනාථයන් ලෙස පැමිණ සිටියහ.

ඊළම් දෙමළ විමුක්ති ව්‍යාපාර පිළිබඳව විශ්වාසය තැබූ ලංකාවෙහි දෙමළ ජනතාව ඉතාමත් අසරණ පිරිසක්ය යන්න මගේ අදහසයි. ඔවුන් පසුපස ගොස් අවයව සහ ජීවිත අහිමිකරගත් අය සැමදා මගේ හදවතෙහි සිටිති. සමහර හේතූන් නිසා ඔවුන්ගෙන් කෙනෙක් බවට මම පත් නොවීම මගේ වාසනාවකි. ආණ්ඩුවෙන් නින්දාවට පත්ව අයුක්තියට මුහුණ දීමට සිදුවනවිට කෝපයට පත්වීම මිනිස් ස්වභාවයයි. මම ද වසර කීපයක් එම තත්ත්වයෙහි සිටියෙමි. මගේ සිතෙහි කෝපය ගිනි දැල්ලක් ලෙසින් මතු වූ කාලය පාසල් සමයයි. විශ්ව විද්‍යාල සමයෙහි එය නිවී ගියත් පසුව 1983 වසරෙහි කෝලාහලයේදී එය යළිත් ගිනි පුපුරක් සේ මතු විය. නමුත් දෙමළ ජාතියෙහි අරගලයෙහි එක අවස්ථාවක් දුටු විට එය නිවී ගියේය.

මම අධ්‍යාපනය ලැබූ යාපනය හින්දු විදුහලෙන් වසරකට අවම වශයෙන් පනස් දෙනෙක් විශ්ව විද්‍යාලයට යති. එම සංඛ්‍යාව ප්‍රමිතිකරණය හේතුවෙන් අඩු වෙන්නට පටන්ගෙන මම විශ්ව විද්‍යාලයීය ප්‍රවේශය ලැබූ 1974 වසරෙහිදි දිස්ත්‍රික්ක මට්ටමෙහි තෝරා ගැනීමත් එක්ව බූරුවෙක් වැහැරි කුහුඹුවකු බවට පත් වූවා සේ එම සංඛ්‍යාව පස් දෙනෙක් බවට පත් විය. ජීව විද්‍යා අංශයෙන් තේරුණේ මා පමණි. සිසුහු දෙදෙනෙක් ඉංජිනේරු පීඨයටත් දෙදෙනෙක් කලා පීඨයටත් තේරුණහ. පාසල පැත්තේ එන්න එපා යැයි පහර දී මාව පළවා හැරිය විදුහල්පති සභාලිංගම් මහතා තමන් ඉදිරියෙහි පුටුවක මාව අසුන් ගන්වා මා සමඟ කථාබහ කළේය. මෙම කාලයෙහි මම විභාගයෙහි ලබාගත් ලකුණුවල අගය අඩු කිරීම දැන ගත්තෙමි. එනම් දෙමළ සිසුන් වෛද්‍ය පීඨය සඳහා පාඩම් හතරෙන් ලකුණු 250ක් ලබා ගත යුතුව තිබෙද්දී සිංහල සිසුන්ට ලකුණු 229ක් ප්‍රමාණවත් විය. එමෙන්ම ඉංජිනේරු පීඨය සඳහා දෙමළ සිසුන්ට ලකුණු 250ක් අවශ්‍ය වූ අතර සිංහල සිසුන් සඳහා එය 227ක් විය.

මෙම ක්ෂණික වෙනස දෙමළ සිසුන් සහ මව්පියන් තුළ කෝපයක් ඇති කළේය. එවක දෙමළ දේශපාලන පක්ෂ ලංකාවෙහි දෙමළ ජනයාගේ අරගලයට දැක්වූ හේතු ගණනාවක් පෙන්විය. දැන් බලන විට ඒවා බැරෑරුම් ඒවා ලෙසින් පෙනෙන්නට නැත. ඒවා ජීවිත පූජාකර සටන් කළ යුතු ඒවාද? යන ප්‍රශ්නය අවම වශයෙන් නැඟිය හැකි ඒවාය.

1) ආරම්භක ප්‍රශ්නය වූ වතුකරයෙහි දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිය පැහැර ගැනීම - ඇත්තෙන්ම හොඳ දෙයක් නොවෙයි. නමුත් ඉන්දීය ආණ්ඩුව විසින්ම ඔවුන්ව ඉන්දියානුවන් ලෙසින් පිළිගන්නා තත්ත්වයක්

තුළ අපට කළ හැක්කේ කුමක්ද? පසුව පැමිණි ඉන්දු ලංකා ගිවිසුමත් ඔප්පු කළේ එයමයි.

2) නැගෙනහිර පළාතේ රජයේ ඉඩම්වල සිංහල ජනපදකරණය පවා නැගෙනහිර පළාතේ අයට ප්‍රමුඛත්වය ලබා දී අනෙක් දිස්ත්‍රික්කවල අයට ලබා දුන්නේ මාස හයකට පසුවය. ලංකාවෙහි නැගෙනහිර පළාතේ ඉඩම් නොමැති අය ඉතාමත් හිඟය.

3) තෙවැන්න අපේ දෙමළ නායකයෝ ඔසවා ගෙන සිටියේ සිංහල ශ්‍රී අකුරයි. ඉංග්‍රීසි ඉලක්කම් වෙනුවට සිංහල. එය මදක් කෝපය ඇති කරන්නක් වුවත් ඒ වෙනුවෙන් ජීවිතය පිදිය යුතු නැත. රජයේ බස්වල ශ්‍රී භාවිතය පිළිබඳව ඩී.බී.එස්.ජෙයරාජ් පැවසූ තොරතුරුවලට අනුව එදා අලුතෙන් ආනයනය කරන ලද බස්වල සිංහල ශ්‍රී අක්ෂරයත් පැරණි බස්වල ඉංග්‍රීසිත් තිබුණි. පරණ බස් යාපනයට යැවුවහොත් ආණ්ඩුව පරණ බස් දෙන බවට බෙරිහන් දෙනු ඇතැයි සිතා අලුත් බස් යැවූ බව ගමනාගමන අංශයේ ප්‍රධානියෙක් පැවසුවේලු. එමෙන්ම සිංහල ශ්‍රී අකුරෙහි තාර ගෑමට ආරම්භයේදී දෙමළ තරුණයන් තාර බාල්දි සමඟ ගිය අවස්ථාවෙහිදී සමහර දෙමළ මන්ත්‍රීවරු තමන් එම කාර්ය ඉටුකරන බව පවසා එයට ඉදිරිපත් වූහ. මෙම තරුණයන්ගෙන් සමහරු දැන් ඇමරිකාවෙහි සිටින හෙයින් එම පුවත තහවුරු කිරීමට හැකි වූ බව ඩී.බී.එස්.ජෙයරාජ් පවසයි.

ලංකාවෙහි දෙමළ ජනයා තවමත් තමන්ගේ ඔළු ගෙඩිවල මිරිස් ඇඹරීමට දෙමළ නායකයන්ට ඉඩ දෙමින් සිටියි.

4) සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කළ බණ්ඩාරනායකගේ නීතිය.

දෙමළ අයව පීඩාවට පත් කරවයි. නමුත් භාෂා දෙකම භාවිතය පිළිබඳ ව්‍යවස්ථා සංශෝධනය දෙමළ තරුණයන් ආයුධ එසවීමට පෙරම නීතියක් බවට පත් විය. නමුත් එය ක්‍රියාත්මක කිරීමෙහිදී බොහෝ ගැටළු පැවැති බව මම පිළිගනිමි. මේවා පිළිබඳව සාකච්ඡා කර ප්‍රාණ ඝාතන වළක්වා ගත හැකිව තිබුණි.

මෙම භාෂාව පදනම් කරගත් ප්‍රමිතිකරණය පමණක් දෙමළ තරුණයන්ව පීඩාවට පත් කළේය. විශ්ව විද්‍යාලයට යෑමට සිතාගෙන සිටි අය පමණක් නොව ඉගෙනීමට කැමැත්තක් නැති අය පවා "ඉගෙන ගත්තත් සිංහලයෝ විශ්ව විද්‍යාලයට යෑමට ඉඩ දෙන්නේ නෑ" යන තර්කය ඉදිරිපත් කළහ.

ප්‍රභාකරන් පවා එසේ සිතුවා විය හැකිය. කවුද දන්නේ?

දෙමළ ගුරුවරයාගේ පුතා පශු විද්‍යාව ඉගෙන ගත්තා සේ ඉඩම් නිළධාරියෙකු වූ වේලුප්පිල්ලෙගේ (ප්‍රභාකරන්ගේ පියා) පුතා වෛද්‍යවරයෙකු හෝ ඉංජිනේරුවරයෙකු බවට පත් විය හැකිව තිබුණි.

ප්‍රමිතිකරණය නොවන්නට මෙම යුද්ධය ඇති නොවන්නට තිබුණි.

මම විභායට මුහුණ දී සිටි කාලයෙහි 1974 ජූනි මාසයෙහිදී අපේ පාසලේ සිසුවෙකු වූ ශිවකුමාරන්ගේ මරණය සිදුවිය. මම ද බොහෝ මිතුරන් සමඟ මළ ගෙදරට ගියෙමි.

හොඳ වෙලාවට මම නිවෙසෙහි වැඩිමහල් දරුවා වශයෙන් නිවෙසෙහි වගකීම් සහිතව සිටීම නිසාත් ප්‍රේමවන්තයෙකුව සිටි නිසාත් වෙන කළ හැකි දෙයක් නොමැතිව පශු වෛද්‍ය අංශයට ගියෙමි. නමුත් මෙම ප්‍රමිතිකරණය හේතුවෙන් එවක ලංකාවෙහි ආණ්ඩුව පිළිබඳ මගේ කෝපය අඩු වූවේ නැත.

දින ගතවෙත්ම විශ්ව විද්‍යාලයෙහි පරිසරය මාව වෙනස් කළේය. සිංහල මිතුරු ඇසුර එහිදී වැදගත්ය. එයටත් වඩා ජනතා විමුක්ති පෙරමුණෙහි සිට සිරගතව සිටි බොහෝ දෙනෙක් නැවතත් විශ්ව විද්‍යාල අධ්‍යාපනය කරා පැමිණියහ. මම ඔවුන් බොහෝ දෙනෙකු සමඟ මිත්‍රත්වයෙන් උන්නෙමි. මෙවන් මිතුරන් සහ ගුරුවරුන් විසින් මාව යාපනය ස්ථාවරයෙහි සිට වෙන්කර තැබූවත් 1977 අප්‍රේල් මාසයෙහිදී දෙමළ විමුක්ති පෙරමුණෙහි නායක චෙල්වනායගම් මහතා මිය ගිය අවස්ථාවෙහි පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙහි දෙමළ සිසුන් නියෝජනය කරමින් විශාල මල් වඩමක් මහනුවරින් මිලදී ගෙන දුම්රියෙන් පොල්ගහවෙල හරහා පැමිණ ඔහුගේ අවමංගල්‍ය පෙරහැරට සහභාගි වූවෙමි.

1983 කෝලාහලය නැවැතත් කෝපය ගිනි දැල් ඉහළට නංවන්නට සැළැස්සුවේය.

ඉන්දියානු රජය සටන්කාමී සංවිධානවල තරුණයන්ට ආයුධ පුහුණුව ලබා දෙන්නේය යන පුවත දැනගැනීමට ලැබුණු අවස්ථාවෙහිදී අවම මට්ටමේ ස්වෛරීභාවයක් අපට නිශ්චිතවම ලැබෙන්නේය යන හැඟීම ඇති විය. තව දුරටත් ජාතිවාදි කෝලහාල ඇති නොවී ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත් වීමට මෙම ආයුධ සන්නද්ධ අරගලය මඟ සලස්වනු ඇතැයි මම වසර කීපයක් වත් විශ්වාස නොකළෙමි යැයි බොරු කීමට මගේ හෘදය සාක්ෂිය මට ඉඩ නොදෙයි. නමුත් එම සිතිවිල්ල ඉතාමත් ඉක්මනින් සුළඟෙහි ගසාගෙන යෑමට සැළැස්වූ සිද්ධිය මෙහිදී සටහන් කිරීමට කැමැත්තෙමි.

වෙන්නෙහි ජීවත් වූ ලංකාවෙහි දෙමළ ජනයාට බහුලව වැළඳෙන රෝග දෙකක් ලෙසින් ටෛපොයිඩ් සහ හෙපටයිටීස් යන රෝග දෙක සඳහන් කළ හැකිය. මෙම රෝග දෙකම අපිරිසිදු ජලයෙන් වැළඳෙන ඒවාය. කෑම කඩවල්වල එකම බාල්දියේ ජලයෙන් භාජන සේදීමත් මළපහ කිරීමෙන් පසුව අත් නොසේදීමත් මෙම රෝගවලට හේතු වෙයි.

චෙන්නෛහි මට හමුවූ විකල්ප කණ්ඩායමෙහි ජෝ සෙනෙවිරත්නට ටෛපොයිඩ් රෝගය වැළඳුණි. ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයෙහි අය සිංහලයෙකු වූ ඔහුව චෙන්නෛ රෝහලෙහි නතර කර සුව කිරීමට අකැමැතිව මහල් නිවසක නවතාගෙන උන්හ. එයට පසුව ඔහුව බලාකියා ගන්නා මෙන් පද්මනාභා මගෙන් ඉල්ලා සිටියේය. ඔහුගේ ඉල්ලීමට අනුව මම මගේ බිරිඳ ද සමඟ දෙවතාවක් ජෝ සෙනෙවිරත්න නතරව සිටි මහල් නිවසට ගොස් කථාබහෙහි යෙදුනෙමි. එහිදී අපි කොමියුනිස්ට්වාදය ඇතුළු බොහෝ ලෝක ව්‍යවහාරයන් පිළිබඳව කථාබහ කළෙමු.

දිනක් මම මගේ ටී.වී.එස්. යතුරු පැදිය නතරකර ඔහු වෙත යමින් සිටිද්දී ටෙලෝ සංවිධානයෙහි මා දන්නා තරුණයෙක් " අය්යේ, අනුරාධපුරයේ සිංහල අයව සැහෙන ගාණක් මරා දාලලු" යැයි කීවේය.

"කවුද කරල තියෙන්නෙ?"

"වෙන කවුද? කොටි තමයි" යැයි පවසා ඔහු පිටව ගියේය. ඔහු එම සිද්ධිය බරපතල ලෙසින් ගත්තේ නැති බව ඔහුගේ වචනවලින් තේරුණි.

මෙම පුවත සිංහල සහෝදරයෙකු වෙත පවසන්නේ කෙසේද? යන්න මගේ සිතට බරක් විය. විනාඩි දෙකකින් ඉහළට නැග යන එම පඩිපෙළ එදා මහ කන්දක් නගින්නාසේ විය.

මම ඇතුළට යත්ම ඔහු "කොහොමද සහෝදරයා" යැයි ඔහු ඉංග්‍රිසියෙන් ඇසුවේය.

මම එම පුවත පැවසූ පසුව එම සිංහල මිතුරා හිසෙහි අතගසා ගෙන "ඔක්කොම ඉවරයි" යැයි පැවසුවේය.

මම වහාම "සිංහල අය දෙසීයක් විතර මරා දමපු නිසාද එහෙම කියන්නේ?" යැයි ඇසුවෙමි.

"නෑ. මෙයින් පස්සේ මැරෙන දෙමළ අය ගැන හිතලයි මම දුක්වෙන්නෙ" යැයි ඔහු පිළිතුරු දුන්නේය.

"කරුණාකරල මට ඒක පැහැදිළි කරන්ඩ පුළුවන්ද?" මම ඇසුවෙමි.

"දැන් තියෙන තත්ත්වෙට අනුව දෙමළ අරගලකරුවෝ විමුක්ති අරගලකරුවෝ නෙමෙයි, ත්‍රස්තවාදියෝ කියල ජේ.ආර්. ජයවර්ධන සිංහල ජනතාවටත් ලෝකයටත් කියයි. ඒ මාර්ගයෙන් මුළු සිංහල ජනතාවගෙත් ලෝකයේ රටවලත් සහයෝගය එයා ලබා ගන්න උත්සහ කරයි. දෙමළ ජනතාවට ආණ්ඩුව අයහපතක් සිද්ද කරනවයි කියලා ආයුධ ඔසවල අරගල කරන අවස්ථාවක සාමාන්‍ය සිංහල ජනතාව ඝාතනය කිරීම මගින් වෙන්නේ ලංකාවෙ හමුදාවෙ තත්ත්වෙට පහතට වැටෙන එකයි. මේක විමුක්ති අරගලකරුවන් කළ යුතු මානවවාදි ක්‍රියාවක් නෙවෙයි. පළිගැනීමේ ක්‍රියාවක්. මේකෙන් විමුක්ති අරගලයට කැළලක් ඇති වෙනවා.

දෙවැනි කාරණේ තමයි ආණ්ඩුවෙ හමුදාව යුද්ධ කෙරුවත් සිංහල ජනතාව යුද්ධෙත් එක්ක සම්බන්ධ නෑ. ඒ වගේම අපි වගේ සිංහල සුළු පිරිසක් ඔයාලගේ අරගලේ සාධාරණත්වය දැකල සහයෝගය දක්වනවා. සාමාන්‍ය සිංහල ජනතාව ඝාතනය කරද්දි මේ තත්ත්වය වෙනස්වෙලා ඒක ජාතින් දෙකක් අතරෙ ජාති අරගලයක් බවට පත්වෙනවා. ඒ වගේ ජාති අරගලයකින් ඔයාලට දිනන්ඩ අවස්ථාවක් ඇත්තෙම නෑ. සමස්ත දෙමළ ජනතාවම එකට එකතුවෙලා ආයුධ එසවුවත් ඔයාලාට සිංහල අයව පරාජය කරන්ඩ බෑ.

තුන්වෙනි කාරණාව තමයි ජාත්‍යන්තර මට්ටමෙන් ත්‍රස්තවාදයට කවදාවත් අනුමැතියක් ලැබෙන්නේ නෑ. ඔයාලට කෙටි කාලීනව ප්‍රචලිතවීමක් ලබාගන්ඩ පුළුවන් වුනත් දීර්ඝකාලීනව කිසිම ප්‍රයෝජනයක් නෑ. So this is morally, stragically and tactically wrong (ඒ නිසා මේක ආචාර ධාර්මිකවත්, ක්‍රමෝපායිකවත් එවගේම උපායශීලිවත් වැරැදියි) යැයි ඔහු අවසානයට පැවසුවේය.

එම සිංහල සහෝදරයන් සමඟ ගත කළ කාලය මිහිරිය. චින්තන ඩි සිල්වා පෙනුමින් විජය කුමාරතුංග වැනිය. ඔහු කුඩා කළ සිට අපස්මාරයෙන් පීඩා විඳින්නෙකි. පියල් තමන් පාකිස්ථානයෙහි ගත කළ කාලය නිතර සිහිපත් කරයි.

සිරිල් දරු පවුල්කාරයෙකි. දුගී පවුලක උපන් ඔහු තෝරාගත් දේශපාලනය හේතුවෙන් ගම ඔහුව ප්‍රතික්ෂේප කළේය. මම ඕස්ට්‍රේලියාවට පැමිණි පසුව ඔහු තමන් පවුලේ තත්ත්වය පවසා උපකාරයක් ඉල්ලා සිටි අවස්ථාවෙහි මම අධ්‍යාපන කටයුතුවල යෙදී සිටි හෙයින් ඔහුගේ ලිපිය මා මිතුරු දිව්‍යනාදන් වෙත පෙන්වා ඔහුගෙන් මුදල් ඉල්ලා ගෙන සිරිල්ට යැව්වෙමි.

අනුරාධපුරයෙහි ඝාතනය කෙරුණු සිංහල අය විසින් විමුක්ති කොටින්ගේ අභ්‍යන්තරය ඒ අවස්ථාවෙහි මට ගෙනහැර දැක්වීම සිදු කෙරුණි. ඔවුහු ත්‍රස්තවාදි කටයුතුවල දිගින් දිගටම යෙදීම දුටු මා තුළ ආයුධ සන්නද්ධ අරගලය කෙරෙහි වූ උනන්දුව සම්පූර්ණයෙන්ම පහව ගියේය.

එයට පසුව සිදු වූ දේවල් අපේ අරගලය ජයග්‍රහණය නොකරයි යන්න පැහැදිළි කළේය.

1987 ජූලි මාසයෙහිදි ඕස්ට්‍රේලියාවට පැමිණි වහාම පනස් දෙනෙකු පමණ සහභාගි වූ රැස්වීමකදී මම මෙය පවසා මම මගේ සාක්කුවෙහි වූ ලේන්සුව ගෙන පෙන්වා "ඔබලාවත් පීඩාවට පත්වෙල ඉන්න ජනතාවගේ කඳුළු පිහදන්න මේ විදියට භාවිතා කරන එකයි හොඳ" යැයි පැවසූ අවස්ථාවෙහි එම රැස්වීමට සහභාගිව සිටි විමුක්ති කොටි ආධාරකරුවෝ බොහෝ දෙනෙක් ගෙරවූහ.

තවමත් සමහරු තැන් තැන්වල ගොරවමින් සිටිති.

ඡායාරූපඃ

චින්තන ඩී සිල්වා පියල්

සිරිල් ගලගේ ජෝ. සෙනෙවිරත්න

## ලේ තැවරුණු කබා

" Is it true TELO killed Kavaloor Jeganathan…?"
"Yes".

මුහුණු පොතේ මිතුරෙකුගෙන් මෑතකදී ලබාගත් පිළිතුරක් ඉහත දක්වා ඇත.

චෙන්නෛහි දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානය (MUST) පවත්වා ගෙන ගිය කාලයෙහිදි සිදුවූ සිද්ධින් පිළිබඳව ලියමින් සිටින්නෙමි. මම ලියන සමහර දේවල් සමහරුන්ට බලපෑමක් සිදුවෙතැයි යන චකිතයෙන් මම ලියමින් සිටි එම කොළම ලිවීම නතර කළෙමි. මෑතකදී මගේ මුහුණු පොතේ මගේ මිතුරෙකු ලියූ සටහනක් මාව කම්පිත කළේය. එය මෙතුවක් කල් ප්‍රහේලිකාවක්ව තිබුණු කරුණකට පිළිතුරු සොයා ගත හැකි කවුළුවක් විවර කළේය. මම ඔහුට මගේ ස්තුතිය පළකර සිටින්නෙමි. මම මෙහිදී ඔහුගේ නම හෙළි කරන්නේ නැත.

1985 කාලයෙහිදි චෙන්නෛහි සන්ධ්‍යා කාලයක්. හිරු බැස ගොස් චෙන්නෛ නගරයෙහි විදුලිය පහන් දැල්වෙන්නට පටන් ගත්තේය. මම සූලෛමේඩු පාරෙහි පිහිටි දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි සිට ඊළම් ජනතා විප්ලවාදි විමුක්ති පෙරමුණ විසින් පවත්වා ගෙන ගිය තොරතුරු මධ්‍යස්ථානයට (EPIC) යමින් සිටියෙමි. එයට එතරම් දුරක් නැත. විනාඩි පහේ ගමණ. සවස පුවත්පතක් වන මක්කල් කුරල් එම කාර්යාලයට එම වෙලාවට ලැබෙයි. නිවෙසට යෑමට පෙර ලංකාවෙහි යුද්ධ පුවත් දැනගත යුතුය යන්න මගේ අරමුණයි. තොරතුරු මධ්‍යස්ථානයෙහි මාව පිළිගැනීමට සංවිධානයෙහි සහෝදරවරු සිටිනු ඇත.

එම දෙමහල් ගොඩනැගිල්ල අසළට ගිය මම දරුවෙකු ළයේ හොවාගෙන කාන්තාවක් අඳුරෙහි සිටිනු දුටුවෙමි. ඇත්තෙන්ම එම දරුවා වැඩුණු දරුවෙක් හෙයින් එම කාන්තාව දරන බර මුහුණින් ප්‍රකට විය.

මම අසළට ගිය අවස්ථාවෙහි එම ස්ත්‍රීය සිනාවක් පෑවාය. දන්නා කියන මුහුණක් වුවත් එක්වරම අඳුරා ගැනීම අපහසු විය. මම චකිතයෙන් යුතුව "ඔයා කවුද ?" යැයි ඇසුවෙමි.

"මම ජෙගනාදන්ගේ වයිෆ්. ඔයා අපේ ගෙදරට ඇවිත් තියෙනවා".

"ආ.. ඒක තමයි. දැකල පුරුදුයි. නමුත් එකපාරටම මතකෙට ආවෙ නෑ. සමාවෙන්න".

කාවලූර් ජෙගනාදන් මා සමඟ යාපනය හින්දු විදුහලේ නේවාසිකාගාරයෙහි සිටියේය. ඔහු මට වඩා වසරක් ජ්‍යෙෂ්ඨ සිසුවෙක් වුවත් පරණ නේවාසිකාගාරයෙහි ඔහු මගේ අල්ලපු ඇඳෙහි උන්නේය. කුඩා කබඩ් එකින් අපේ ඇඳවල් දෙක වෙන් කෙරුණේ නවය සහ දහය පංතියෙහි ඉගෙන ගද්දීය. නිදා ගන්නට යද්දීත් ඇහැරෙන විටත් අපි දෙදෙනාගේ මුහුණු සම්මුඛ වෙයි. වසර දෙකක් පමණ මෙසේ ළඟින් ජීවත්වුනෙමු. මගේ පවුලේ අය එළුවෙතීවු දූපතේ සිට පදිංචියට යාපනයට පැමිණි හෙයින් මම නේවාසිකාගාරයෙන් ඉවත් වුනෙමි. එයට පසුව මට ජෙගනාදන් සමඟ සම්බන්ධයක් වූවේ නැත.

පසුව මම පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙහි පශු වෛද්‍ය පීඨයෙහි අධ්‍යාපනය ලබද්දී මම මගේ පෙම්වතිය (දැන් මගේ බිරිඳ) සමඟ පේරාදෙනිය හන්දියට ගමන් කරද්දී අනපේක්ෂිත ලෙස සිනාමුසුව අප දෙසට පැමිණෙමින් සිටි වේට්ටියක් ඇඳ සිටි ජෙගනාදන්ව හමුවූවෙමි. ඔහු දුටු වහාම මම විස්මයට පත්වුනෙමි. පේරාදෙනියෙහි වේට්ටියක් ඇඳගෙන ගමන් කරනු දැකීම ඉතාමත් දුර්වලය. කුරිංජි කුමරන් කෝවිලට යන්නන්ගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණ වේට්ටි ඇඳගෙන සිටිනු දැක ඇත්තෙමි.

" අඩෝ, උඹ කොහෙද මෙහෙ? මොනවද මෙහෙ කරන්නේ?"

ඔහු අසළ වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දෙසට අත දිගු කර "අරහේ තමයි වැඩ කරන්නේ" යැයි පැවසුවේය.

එයට පසුව අප අතර සම්බන්ධයක් නොතිබුණි. නමුත් මේ ජෙගනාදන් තමයි කාවලූර් ජෙගනාදන් යන නමින් කතා ලියන ලේඛකයා යන්න මම වසර ගණනාවකට පසුව සමහරුන්ගේ කතාබහෙන් දැනගත්තෙමි. මම ලංකාවෙහි සිටින තාක් කිසිම ලේඛකයෙක් හෝ සාහිත්‍යකරුවෙක් සමඟ සම්බන්ධයක් තිබුණේ නැත.

ඡායාරූපයඃ කාවලූර් ජෙගනාදන්

එය 1985 වසර යැයි සිතමි. මම කෝඩම්පාක්කම් නගරයෙහි ලිබර්ටි සිනමා ශාලාව කිට්ටුව වාසය කළ කාලයේ දිනක් මම නුංගම්පාක්කම් පාරේ ගමන් කරමින් සිටින විට අයෙක් මගේ අතින් අල්ලා ඇද්ද හෙයින් මම පිටුපස හැරී බැලුවෙමි. ජෙගනාදන්. සුපුරුදු ලෙසින් වේට්ටිය ඇඳගෙන සුපුරුදු සිනහවෙන්.

"වරෙං, ගෙදරට ගිහිල්ල එමු. මේ ළඟ." යැයි පවසා ඔහු මාව බලයෙන්ම ත්‍රිරෝද රථයකට නංවා ගත්තේය. අහුමුළු අස්සෙන් ඔහුගේ නිවෙසට ගියෙමු. කුඩා නිවෙසකි. බිරිඳව සහ දරුවන්ව මට හඳුන්වා දී දිවා ආහාරය ද ලබා දුන්නේය.

මම එසේ ඔහුගේ නිවෙසෙන් දිවා ආහාරය ලබාගෙන දින කීපයකට පසුවයි ඔහුගේ බිරිඳ සහ දරුවාව තොරතුරු මධ්‍යස්ථානයෙහිදී (EPIC) දකින්නට ලැබුණේ.

"ඇයි මෙතැනට වෙලා ඉන්නේ?"

"අපේ එක්කෙනා දැන් දවස් දෙකක් තිස්සෙ ගෙදර ආවෙ නෑ. මේ අයගෙන් අහල බලන්ඩ කියල"

"කාවද හම්බ වෙන්ඩ ඕනෑ?"

"නායකතුමා පද්මනාභාව"

"හරි, මාත් එක්ක එන්න"

මම ඉහළ මාලයට කැඳවා ගෙන ගියෙමි. මම එහි සිටි අයගෙන් රන්ජන් සහෝදරයාව හමුවිය හැකිදැයි ඇසුවෙමි. (පද්මනාභාව බොහෝ දෙනෙකු ඇමතුවේ රන්ජන් යන නමින්ය.)

" කාමරෙ ඉන්නවා"

මම ගොස් දොරට තට්ටු කරද්දී "නඩේසන් සහෝදරයා යැයි ඔහු මාව ඇමතුවේය. තවත් කීප දෙනෙක් එහි සිටියත් මට ඔවුන්ගේ නම් මතක නැත.

"මං සහෝදරයාව හමුවෙන්ඩ අමුත්තෙක් එක්කර ගෙන ඇවිත් ඉන්නේ"

"කාවද?"

"කාවලූර් ජෙගනාදන්ගේ වයිෆ්. ළමයත් එක්ක ඇවිත් ඉන්නේ"

ඔහු හිස මත අත තබාගෙන "මේ ගැන අපි දන්නෙ නෑ සහෝදරයා" යැයි පැවසුවේය.

" ඔයා දන්නෙ නැත්තන් කාගෙන් ද මේ ගැන අහන්ඩ ඕනෑ කියන එක කියන්ඩ. ජෙගනාදන් මගේ පාසල් මිතුරෙක්"මම දැඩි ස්වරයෙන් පැවසුවෙමි.

ස්වල්ප මොහොතකට පසුව "බාලකුමාරගෙන් අහන්ඩ. මම කිව්වයි කියල අහන්ඩ"යැයි කීවේය.

මම එළියට පැමිණ ජෙගනාදන්ගේ බිරිඳ සමඟ මෙසේ පැවසුවෙමි. "ඒ ගොල්ලො කියනවා එයාලා දන්නෙ නෑ කියල. ඊරොශ් බාලකුමාරගෙන් අහන්ඩ කියලත් කිව්වා. මේ අය මේකට සම්බන්ධ නෑ කියන විශ්වාසෙ මට තියෙනවා. එහෙම සම්බන්ධ නං අඩුම වශයෙන් මේ අය මට කියනවා මේකට මැදිහත් වෙන්ඩ එපා කියල".

මම ත්‍රීරෝද රථයකින් ඇයව ඊරෝශ් බාලකුමාර්ගේ කාර්යාලයට කැඳවා ගෙන ගියෙමි. එය පිහිටා තිබුණේ එතරම් දුරකින් නොවෙයි. එම ස්ථානය වඩ පලනිය යැයි සිතමි.

මම ඔවුන්ගේ කාර්යාලයට ගිය අවස්ථාවෙහි බාලකුමාර් ඉහළ මාලයෙහි සිට මා දෙස බැලුවේය.

"මොකෝ මේ පැත්තේ?"යැයි ඔහු එම ස්ථානයෙහි සිට ඇසූ හෙයින්

"කාවලූර් ජෙගනාදන්ගේ වයිෆ් එයාගේ මහත්තයාව හොයාගෙන ඊ.පී.ආර්.එල්.එෆ්. ඔපිස් එකට ආවා. එහෙදි පද්මනාභා කිව්වා ඔයාගෙන් අහන්ඩ කියලා".

"අපි දන්නෙ නෑ"

"දෙගොල්ලම එහෙම කියල හරියනවද?"

"ඇත්තෙන්ම අපි දන්නෙ නෑ" යැයි පවසා ඔහු ඇතුළට ගියේය.

එම පිළිතුර මා තුළ ඊරෝශ් බාලකුමාර් පිළිබඳව සැකයක් ඇති කළේය. එමෙන්ම බාලකුමාර් කෙරෙහි කෝපයක්ද ඇති කළේය.

ජෙගනාදන්ගේ බිරිඳ අඬමින් උන්නාය. මට කළ යුතු කිසිවක් සිතාගත නොහැකි විය. මම ඇයව ඇයගේ නිවෙසට කැඳවා ගෙන ගොස් මම මගේ නිවෙසට ගියෙමි.

සෑම සංවිධානයක්ම සාමාජිකත්වය දැරූ දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි ලේකම් වශයෙන් කටයුතු කළ හෙයින් මට බොහෝ දෙනෙකු සමඟ සම්බන්ධකම් තිබුණේය. එමෙන්ම එය මම ඔවුන්ගේ ආයුධ සන්නද්ධ අරගලය පිළිබඳව විශ්වාසය තබා ගෙන සිටි කාලයයි. ජෙගනාදන්ගේ ප්‍රශ්නය ඉදිරියට ගෙන යන්නේ කෙසේද? යන්න නොදැන සිටි හෙයින් මම එයට පසුව ජෙගනාදන්ගේ බිරිඳ සමඟ සන්නිවේදනයෙහි යෙදුනේ නැත. ජෙගනාදන්ව ඝාතණය කර ඇති බව මම පසුව දැනගත්තෙමි. මහත් සිත් වේදනාවට පත් වූවෙමි.

ඝාතණයට හේතුව ලෙසින් විවිධ අය විවිධ හේතු දැක්වූහ. ලංකා ආණ්ඩුවෙ ඔත්තුකාරයෙක්. පුද්ගලික ප්‍රශ්නයක්. මුදල් ප්‍රශ්නයක්. මෙම අයුරින් බොහෝ අනුමාන මැද්දේ එම ඝාතණය අභිරහසක්ව තිබුණි. මේ අතර මම ඕස්ට්‍රේලියාවට පිටත්වීමට පෙර ඊරෝශ් සංවිධානය විසින් මදුරාසියෙහි ඝාතණ හතරක් කළ බව තමිල්නාඩු රහස් පොලීසිය පැවසුවේය.

ටෙලෝ,විමුක්ති කොටි සහ ප්ලොට් යන සංවිධාන විශාල ඝාතන සංඛ්‍යාවක් තමිල්නාඩුවෙහි සිදු කර තිබුණි. ඉන්දීය පොලිසිය සහ තමිල්නාඩු පොලිසිය විසින් ලංකාවේ සන්නද්ධ සංවිධාන ඝාතන සිදු කිරීමට එරෙහිව පියවර ගත්තේ නැතත් කුමන ස්ථානයෙහි කීදෙනෙක් ඝාතනය කරනු ලැබුණි ද යන්න පිළිබඳව සංඛ්‍යා ලේඛණ විස්තර නිවැරැදිව තමන් සතුව තබාගෙන උන්නේය. මෙහිදී ලංකාවත් ඉන්දියාවත් අතර මුහුදු ප්‍රදේශයේ සිදු කෙරුණු සමහර ඝාතන පිළිබඳ තොරතුරු මගහැරුණා විය හැකිය.

කාවලර් ජෙගනාදන්ගේ මරණය පිළිබඳ විෂය මගේ හිතේ දිගු කාලයක් ප්‍රෙහේලිකාවක්ව තිබුණේය. එයට අමතරව ජෙනාදන්ගේ මල්ලි වන ඩෑන් රූපවාහිනියේ කුගනාදන් 2009 සිට මගේ සමීප මිතුරෙක් වූ හෙයින් ඔහුට මේ පිළිබඳව කිසියම්හෝඩුවාවක් ලැබී ඇතිදැයි මම විමසුවෙමි.

මෙසේ ප්‍රහේලිකාවක්ව පැවැති කරුණ ඒ කාලයෙහි ටෙලෝ සංවිධානයෙහි සාමාජිකයෙකුව සිටි අයෙකු මෑතකදී මුහුණු පොතේ ලියා තැබූ සටහනක් හේතුවෙන් මාව තිගැස්මට පත් කළේය. ඔහු පැවසූ අයුරින් ටෙලෝ සංවිධානය විසින් කාවලූර් ජෙගනාදන්ව ලංකා ආණ්ඩුවෙ ඔත්තුකරුවෙක් යැයි සැකකර සින්මයා නගරයෙහිදී ඝාතනය කර ඇත. එවක ටෙලෝ සංවිධානයට නායකත්වය දුන් සිරි සභාරත්තිනම් දැන් ජීවතුන් අතර නැතත් එම සංවිධානයෙහි ඉහළ පෙළේ අය තවමත් සිටිති. දැන් මුල්ලිවායික්කල්වල සිදුවූ දේවල් පිළිබඳව කථාකරන මොවුහු සංවිධාන අභ්‍යන්තර ඝාතන සිදු කළේ මක් නිසාද යන්න ද ඒසමග ප්‍රසිද්ධියේ පැවසිය යුතුය. මෙම ඝාතන සිදු කර අවුරුදු විසි පහකටත් වඩා අධික කාලයක් ගතව ඇතත් දෙමළ අය විසින්ම දෙමළ අයව ඝාතනය කළ ඉතිහාසයක් අපට ඇත.

අරගල සංවිධාන යන මත්වීමෙන් මෙම සංවිධාන සීමා උල්ලංඝණය කර ක්‍රියාකිරීම එම කිළිටි ඉතිහාසයට අයත්ය. 1990 දක්වා විමුක්ති කොටින් හැර අනෙකුත් සංවිධාන සුළුවෙන් සහ මහ පරිමානයෙන් බොහෝ ඝාතන සිදු කළේය.

වර්තමානයෙහි දේශපාලන කටයුතුවල යෙදෙන දෙමළ සංවිධානවල නායකයෝ හමුදාව මුල්ලිවායික්කාල්වලදී කළ ඝාතන හෙළා දකිති. සිර ගෙවල්වල සිටින දෙමළ සිරකරුවන් පිළිබඳව කථා කරති. ඒ පිළිබඳව නිවේදන නිකුත් කරති. නමුත් පැරණි සංවිධානම තවමත් ඔසවා ගෙන යති. සංවිධානවල ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිළි කිරීම සිදු කරන අතර දෙමළ තරුණයන්ට සහ යුවතියන්ට සිදුවූවේ කුමක්ද යන්න පිළිබඳව ඔවුන්ගේ දෙමව්පියන්ට පැහැදිළි කිරීමක් කිරීමේ වගකීම ඇත.

අතුරුදහන් වූ සාමාන්‍ය ජනතාව සොයා දෙන මෙන් කොමිසම් ඉදිරියෙහි ඥාතියෝ පෙනී සිටිති. ඒ වගේම ආයුධ සන්නද්ධව සිටි දෙමළ විමුක්ති සංවිධාන විසින් අතුරුදහන් කළ අය පිළිබඳව එම සංවිධානවල වර්තමාන නායකයෝ කියන්නේ කුමක්ද?

මම විමුක්ති කොටි අතහැර කථා කරමි.

පිස්සු බලු රෝගය වැළඳුණු බල්ලෙක් මෙන් තමන් සමග එකග නොවන්නන් ලෙසින් අදහස් කරනු ලැබූ අයව ජාති, ආගම් භේදයකින් තොරව ඝාතනය කෙරුණි. පිස්සු බලු රෝගය වැළඳුණු බල්ලා එම රෝගයෙන් දින පහලොවකින් මරණයට පත්වෙයි.

වර්තමානයෙහි ලංකාවෙහි දේශපාලනය තුළ ක්‍රියාත්මක වන තමිළරසුක්කට්චි පක්ෂයේ මගෙහි පැමිණි අය හැර එසේ නොපැමිණි දෙමළ විමුක්ති සංවිධානවල නායකයෝ වගකිව යුත්තෝය. මෙම දෙමළ සංවිධාන විසින් ලංකාවෙහි ද බොහෝ ඝාතන සිදු කර ඇත. සමහර නායකයන්ගේ ලේ ගෑවී නැතත් ඔවුන් ඇද ගෙන සිටින ඇඳුම්වල අපමණ අහිංසකයන්ගේ ලේ ගෑවී ඇත.

ලංකා ආණ්ඩුවෙහි ඔත්තුකරුවෙක්, සමාජ විරෝධියෙක්, ද්‍රෝහියෙක් වැනි චෝදනා එල්ල කර මෙම සංවිධානවල අය විසින් ඝාතන සිදු කරන ලදී. මෙලෙසින් මෙම සංවිධාන විසින් එල්ල කරන ලද චෝදනාම පසු කලෙක විමුක්ති කොටි සංවිධානය විසින් මේ අය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙයින් පැහැදිළි වන්නේ කුමක්ද?

සෑම අයෙක් බලවත්ව සිටින අවස්ථාවෙහි අනෙක් අයට දැමූ චෝදනා තමයි දැන් විමුක්ති කොටින්ගේ ආධාරකරුවෝ ඔවුන් සහයෝගය දැක්වූ සංවිධානයෙහි ප්‍රබලයන් කෙරෙහිත් එල්ල කරන්නේ. තමිළිනිගේ *තියුණු අසිපතක සෙවන* යට කෘතිය කියවූ පසුව එක් කරුණක් පැහැදිළි විය. මාත්තයා නම් නායකයාව කොටින් විසින් ඝාතනය කළේ මක් නිසා ද යන්න තමිළිනි ඒ අවස්ථාවෙහි දැන නොසිටියාය. ඇය පමණක් නොව ඉහළ පෙළේ නායකයන් වූ කරුණා හෙවත් මුරලිදරන් හෝ කේ.පී. හෙවත් පද්මනාදන් හෝ දැන නොසිටියහ.

මේනිසා කවුරුන් හෝ අල්ලා ඔහුට දඬුවම් දිය යුතුය යන්න මගේ අරමුණ නොවෙයි.

එම ඝාතන සිදු කළේ කවුද? සිදු කළේ ඇයි? යන්න අපේ සමාජයත් ඝාතනයට ලක් වූවන්ගේ ඥාතින් ද දැන ගැනීම අත්‍යවශ්‍යය. අවම වශයෙන් කළ වැරැදි පිළිගත යුතුය. එමෙන්ම කළ පව්වලට පිළියමක් සේ පැරැණි හැව වූ සංවිධාන අත්හැරදා එළියට පැමිණීමෙන්ම ජනතාව තුළ විශ්වාසයක් ඇති කළ හැකිය. එම අයගේ පව් ක්ෂමා කෙරෙනු ඇත.

ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණ තම නම වෙනස් කළ බව පැසසුම් කටයුතුය. අනෙක් අයට එය ආදර්ශයක් විය යුතුය.

## එම දින තුන

ලියූ පැන මේසය මත තබා පසෙකින් සිටින අය දෙස නෙත් යොමු කළෙමි. එම කාමරයෙහි සිටියේ ඊළම් විමුක්තිය උදෙසා අරගල කළ සංවිධානවල නියෝජිතයෝය. මගේ අසළින් සිටියේ දොස්තර ශිවනාදන්, දොස්තර ජෙයකුලරාජා සහ දොස්තර ශාන්ති රාජසුන්දරම්ය.

මගේ බඩ දඟලන්නට විය. දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි ලේකම් වශයෙන් එහි පැවැත්වූ රැස්වීමේ සටහන් ලියා ගැනීම සඳහා මාව යොමු කෙරුණි. එළියේ චෙන්නෛ නගරයෙහි පෑවිල්ල වීදි දාමරිකයෙක් මෙන් ප්‍රචණ්ඩය. ඇතුළට එන සුළඟ ද ගිනියම්ය. සූලෛමේඩු පාරෙහි ගමන් කරන වාහනවලින් නැගෙන ඝෝෂාව සහ දුම ඉහළ මාලයෙහි 144 දරන කාමරයෙහි වූ අපේ කන් සහ නාස් ද්වාරයන් අවහිර කරයි.

1985 වසරෙහි ජූලි මාසයෙහි චෙන්නෛ මැරීනා මුහුදු වෙරළෙහි අඛණ්ඩ උපවාසයක් පැවැත්වීමට ඊළම් සංවිධාන තීරණය කළේය. එහි සම්බන්ධීකාරක ලෙසින් දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානයෙහි වාසුදේවා විසින් මගේ නම යෝජනා කරනු ලැබ විමුක්ති කොටි සංවිධානයෙහි යෝගි විසින් ඇඟිල්ල ඔසවා ප්‍රකාශ කිරීමෙන් අනුමත කෙරුණි.

මෙයට පෙර ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණේ නායක පද්මනාභා මෙවන් අඛණ්ඩ උපවාසයක් සිදු කළ යුතුය යන අදහස මා සමග සාකච්ඡා කර තිබුණි. එය විමුක්ති කොටි සංවිධානය සමග අනෙක් සංවිධාන එක්ව කටයුතු කළ කාලයයි. එහෙයින් මෙය ඔවුන් තම සමගිය ප්‍රකට කිරීම සඳහා කරනු ලබන දේශපාලන උත්සහයක්ය යැයි සිතා මම එය අමතක කර සිටියෙමි.

මෙහිදී මාව ඉදිරියට තල්ලු කෙරෙනු ඇතැයි මම නොසිතුවෙමි. ඒවනවිටත් විමුක්ති කොටි සංවිධානයෙහි ආධාරකරුවෙකු ලෙසින් දොස්තර ජෙයකුලරාජා කටයුතු කළේය. ඔහු අපේ සංවිධානයෙහි සභාපති පමණක් නොව වයසින් ද වැඩිමහල්ය. එමෙන්ම වැළිකඩ සහ පසුව මඩකළපුව සිර ගෙයි සිටි අයෙකි. එහෙත් ඔහුව අතහැර මාව එයට තෝරා ගැනීම අනෙකුත් සංවිධාන විසින් ද එලෙසින්ම පිළිගැණුණි.

ඒ කාලයෙහි සංවිධාන එකට එක්ව කටයුතු කළත් තමන්ගේ අය සමග අනෙක් අයව සමච්චලයට ලක් කිරීම දක්නට ලැබුණි. ඒ නිසා සියලුම දෙනා ඒකඡන්දයෙන් එක් අයෙකුට කැමැත්ත ප්‍රකාශ කරද්දී මා තුළ ආඩම්බරයට වඩා ඇතිවූනේ භයකි. බිළි පූජාවට තෝරාගත් එළුවාට තම ගෙලට මාලය දැමෙන අවස්ථාවෙහි දැනෙන්නාක් මෙන් හැඟීමක් මා තුළ ඇති විය.

සිතෙහි පවතින දේ විවෘතව පැවසිය නොහැකිය. සංවිධාන අතරෙහි සමගිය පිළිබඳව මම බොහෝ දෙනෙකුට අවධාරණය කළ අයෙක්මි. වැළිකඩ සිරගෙයි මියගිය අය පිළිබඳව දැනුවත් කිරීමක් උපවාසයක් මාර්ගයෙන් ඇති කිරීම යහපත් දෙයක් වන නිසාත් මෙම වගකීම භාරගත යුතුය.

මේ දක්වා වෛද්‍ය කටයුතුවල යෙදීමෙහිදි සිතේ කිසිම චකිතයක් ඇති නොවුණි. මෙය උපවාසයක් යැයි කීවත් දේශපාලන ප්‍රචාරක කටයුත්තකි. එය ද දෙමළ ජනතාව අතරෙහි ඊළමෙහි අවශ්‍යතාවය අවධානය කෙරෙන මාර්ගයක්ය යන්න අවබෝධවූවෙන් සිතෙහි චකිතයක් ඇති විය.

වෙනත් මාර්ගයක් නැත. එහෙයින් භාරගත්තෙමි.

ඒ සඳහා වන ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කෙරුණි. ඉන්දීය දේශපාලන පක්ෂවල නායකයන්ව උපවාසයට සහභාගි කර ගැනීම, දෙමළ සංවිධානවල නායකයන් විසින් ප්‍රභූවරුන්ට ආරාධනා කරවීම යනාදිය පිළිබඳව තීරණය කෙරුණි. වැඩකටයුතු බෙදා ගනු ලැබිණ. මට ඒ තරම් වැඩක් තිබුණේ නැත. පැමිණෙන අයව පිළිගැනීමත් ඔවුන් සමග කථාබහ කිරීමත් මට පැවරිණ.

කිසිම සංවිධානයක් ඍජුව උපවාසයට සම්බන්ධවූවේ නැත. මෙයට ටික කාලයකට පෙර යාපනයෙහි පැවැත්වූ උපවාසයක් කඩාකප්පල් කළ විමුක්ති කොටි සංවිධානය එම උපවාසයට සම්බන්ධ වූ අයව ඉන්දියාවට පැහැර ගෙන ආවේය. අනෙක් අයටත් උපවාසය යනු අපේ මාර්ගය නොවන බව පෙන්වා දිය යුතුය. මෙය ලංකාවෙහි සාමාන්‍ය දෙමළ ජනතාවගේ උපවාසයයි. සැමටම පොදු දෙයක්. මේකේ සංවිධානයෙහි දේශපාලනය නැත යන්න පෙන්නීමේ උවමනාව තිබුණි.

මැරීනා මුහුදු වෙරළේ පාරත් වැළිතලයත් අතරෙහි මඩුවක් සකස් කර බැනර් ගසා තුන දිනක් පැවැත්වූ මෙම උපවාසයට මම ඍජුවම ගොස් බොහෝ නායකයන්ට ආරාධනය කළෙමි. ඒ අය අතරින් මගේ මතකයෙහි සිටින්නේ එවක විරුද්ධ පක්ෂ නායක අමිර්තලිංගම් මහතා සහ නීතිවේදියෙකු වූ වානමාමලෛ වැනි කොමියුනිස්ට් පක්ෂයෙහි නායකයන්ය.

අම්ර්තලිංගම් මහතා සහ ඔහුගේ බිරිඳ මතකයෙහි පැවතීමට හේතුව නම් මම ඔවුන්ගේ නිවෙසට ගොස් පැමිණෙන මෙන් ආරාධනා කර පැමිණෙන ලෙස පැවසූ වෙලාවට විනාඩි දහයකට පෙරම ඔවුහු පැමිණීමයි. අනෙක් සෑම දෙනෙක්ම පැමිණියේ පැවසූ වෙලාවට වඩා ප්‍රමාදවය.

ගිනිගහන අව්වේ දහවල පුරා උපවාසය සිදු කෙරෙයි. අඩුම වශයෙන් සිය දෙනෙක්වත් උපවාස භූමියේ සෑම වෙලාවකම සිටිති. සංවිධානවල අය සහ තමිල්නාඩුවෙහි ප්‍රභූවරු පැමිණ උපවාසයට ඉඳගෙන කථාබහ කර පිටව යති. එතුවක් කල් ආගමික ව්‍රතයක් ලෙසින් ආහාර නොගෙන සිටිමේ ශීලය සමාදන් නොවූ මම මෙම උපවාසයට සහභාගි වූවෙමි. බහුතරයක් දෙනා පැමිණ පැය කීපයක් උපවාස භූමියේ ගතකර ගිය හෙයින් එය හැඳින්විය යුත්තේ සංකේත උපවාසයක් ලෙසින්ය. අපි බලාපොරොත්තු වූ පරිදිම තමිල්නාඩුවෙහි පුවත්පත් එක හතක් කර පළ කළේය.

මෙය ලංකාවෙහි ජන මාධ්‍ය විසින් ආවරණය කළේද යන්න නොදනිමි. නමුත් ඊළම් විමුක්ති ව්‍යාපාර එක්ව රැස්වීම්වලට සහභාගි වූහ. ඔවුන් දින තුනක් ස්වේච්ඡාවෙන් සිටි හෙයින් උපවාසය පැවැත්වූ එම දින තුන විශේෂිතය.

වසර තිහකට පසුව මෙම දින තුනට අදාළව මගේ සිතෙහි පවතින කරුණු දෙකක් ඉතාමත් වැදගත් යැයි සිතමි.

උපවාසයෙහි පළමු දිනයෙහි කහ පැහැති අත්කොට කමිසයකින් සහ ලස්සන උඩු රැවුළකින් යුතු පුද්ගලයෙක් මා ළඟට පැමිණ අතට අත දුන්නේය. මම ඔහුට අතට අත දී පසෙක සිටි වාසුදේවා දෙස නෙත් යොමු කළෙමි.

"මෙයා තමයි උමා මහේශ්වරන් " යැයි ඔහු පැවසුවේය.

මම ඒ වනතෙක් උමාව හමුවී නොසිටියෙමි. මම ලංකාවෙහි සිටින විට ඔහුව ඡායාරූපවල දැක සිටියෙමි. ඔහුට අතට අත දීම මාතුළ සතුටක් ඇති කළේ නැත. මම ඒ කාලයෙහි දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානය විසින් සිදු කරන ලද ඝාතන පිළිබඳව අසා ඇත්තෙමි. ඒ වගේම මගේ බිරිඳගේ ඥාතියෙකුගේ පුතෙක් උමාගේ ශරීරාරක්ෂකයන්ගෙන් අයෙක් විය. එම සංවිධානයෙහි සිදු කෙරෙන අභ්‍යන්තර ඝාතන හේතුවෙන් එම තරුණයාගේ දෙමව්පියෝ කවදාදා තම පුතාව එම සංවිධානයෙන් ඉවත් කරගෙන කැනඩාවට යවන්නේ යැයි සාකච්ඡා කරමින් සිටි අතර ඒ සඳහා මුදල් ලබාදීමට සූදානම්ව සිටි බවත් මම දැන සිටියෙමි. මෙවැනි කරුණු හේතුවෙන් නොදැනම උමා කෙරෙහි පිළිකුළක් ඇති විය.

උමා ඉතාමත් ලස්සන පෙනුමක් සහිත අයෙක් පමණක් නොව ඔහුගේ පෙනුම ආත්ම විශ්වාසයක් ඇති කරන සුළුය. නායකත්වයට අවශ්‍ය ආකර්ශනය සහිත මිනිසෙකි. ලංකාවෙහි දෙමළ දේශපාලන නායකයන්ගෙන් අම්ර්තලිංගම් සතුව තිබූ එම ආකර්ශනය උමා සතුව ද විය. පෙනුමෙන් එවන් අය දෙමළ ඊළම් දේශපාලනඥයන් අතරෙහි මම එයට පසුව තවමත් දුටුවේ නැත. නමුත් ඔවුන් දෙදෙනොම එය නිවැරැදිව භාවිතා නොකළහ යන්න සත්‍යයකි.

ඡායාරූපයඃ උමා මහේශ්වරන්

උමා මහේශ්වරන් පිළිබඳව විශාල පිරිසක් විශ්වාසය තබාගෙන උන්හ. එක් කාලයකදී තරුණයෝ පහළොස් දාහක් ඔහු කෙරෙහි විශ්වාසයෙන් උන්හ. ඔවුන්ගෙන් හය දාහකටත් අධික පිරිසක් ආයුධ පුහුණුව ලැබූ අයයි. ඔහුගේ සෙන්පතිවරුන්ව සහ දෙවන පෙළ නායකයන්ව සිටි බොහෝ දෙනෙකුව පෞද්ගලිකව දැන සිටි අයෙකි. තමිල්නාඩුවෙහි මහ ඇමැති එම්.ජී.ආර්. පවා ඔහු කෙරෙහි විශ්වාසයෙන් උන්නේය. තමන් සතුව තිබූ බිත්තර වී ටික බත් බවට පත් කළ මිනිසෙක්ය යන්න ඔහු පිළිබඳ මගේ අදහසයි. ඔහුගේ සංවිධානයෙහි වැදගත් තනතුරක් දැරූ පුද්ගලයෙකු මෑතකදී හමුවූ මොහොතේ පැවසූ කරුණක් මා තුළ විමතියක් ඇති කළේ නැත.

" දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානයෙ මධ්‍යම කමිටු රැස්වීම පැවැත්වෙන කොට කවුරුවත් සටහන් තියා ගන්නෙ නෑ. ඒකට හේතුව ඒ සටහන් ලීක් වෙයි කියන එක. නමුත් උමා මහේශ්වරන් අනෙක් අය කියන දේවල්වලට ඇහුන්කන් දීලා සටහන් ලියා ගන්නවා. එක දවසක් එක සාමාජිකයෙක් කිව්වා අද බලමු මොකක්ද මේ ලියපු නෝට් එකට කරන්නෙ කියලා. මම උමාව නිරීක්ෂණය කෙරුවා. උමා ඉස්සෙල්ල ඒ කඩදාසිය නැමුවා. පස්සේ එයා එළියට යන කොට ඒක හොඳට ගුලිකරලා පාරට විසි කෙරුවා".

මෙම සිද්ධිය කල්පනය කිරීම අවශ්‍යයද?

කල්පනය අවශ්‍ය නැත.

රාජවරෝදයම් සම්බන්ධන් මහතා පුවත්පත කියවන ගමන් සිරගෙයි දුක් විඳින සිරකරුවන් පිළිබඳව කථාකරනු මෑතකදී මුහුණු පොතේ දුටුවෙමි.

අපි විශ්වාස කළ දෙමළ නායකයන් නම් වෙනස්වුවත් එකම වර්ගයේ සෙවනැළි සේ දිගැදෙන බව පෙන්වීමට මෙම සිද්ධිය සඳහන් කළෙමි.

මිනිස් සෙවනැළි රූපයෙහි වෙනස්කම් නොපෙන්නයි නොවෙයිද?

උපවාසයෙහිදී පළමු දින දෙක තුළදී විමුක්ති කොටි සංවිධානයෙහි ප්‍රමුඛයන් නොපැමිණීම අඩුපාඩුවක්ව දක්නට ලැබිණ. මෙම උපවාසය පැවැත්වූවේ ඔවුන්ගේද එකඟතාවය මතය.

මම තමිල්නාඩුවෙහි සිටි කාලයෙහි සමහරු සැමවිටම මා සමඟ උන්හ. ඔවුන් සංවිධානවලට අයත් අය මෙන්ම වෛද්‍ය මධ්‍යස්ථානයෙහි මා සමඟ වැඩ කරන්නන්ද වූහ. තෙවැනි දිනයෙහි මම කුමක්දෝ වැඩක නියුතුව සිටිද්දී මඩකළපුවෙහි මිතුරන් කීප දෙනෙකු මා වෙත පැමිණ "අය්යේ, කාසි අය්යා ඇවිත් ඉන්නවා"යැයි පැවසූහ. "හරි, එයාව එක්කර ගෙන ගිහින් උපවාසකරන අය අතරෙ වාඩි කරවන්න. මං ඇවිල්ලා කතා කරන්නං" යැයි පැවසූ මම තවදුරටත් ඔවුන්ට මෙසේ පැවසුවෙමි. " විමුක්ති කොටි එක්ක එකට එකතුවෙලා ඉන්න වෙලාවෙ ඇයි වවුනියාවේදි ඊ.පී.ආර්.එල්.එෆ්. එකේ සහෝදරයෙකුට වෙඩි තිබ්බෙ ඇයි කියල අහන්ඩ. මොකද ඒ අයත් අරගලයටනේ ඇවිත් ඉන්නේ".

පලස්තීන විමුක්ති සංවිධානෙ ආයුධ පුහුණුව ලබපු රීගන් නම් සහෝදරයෙකුට එවක වවුනියාවේදී විමුක්ති කොටි කිසිම හේතුවක් නොමැතිව වෙඩි තබා තිබුණි.

සවස් කල බෙංගාල බොක්කේ නැඟෙන රළ සමඟ තරඟයට මෙන් මුහුදු වෙරළට ජනයා පැමිණෙමින් උන්නේය. ඔවුහු මහත් උනන්දුවෙන් අප දෙස නොත් යොමු කළහ. ඔවුන්ගේ නායකයන් කරමින් සිටි දේවල් ලංකාවෙහි අය කරන්නේ ඇයි? යන ප්‍රශ්නය ඔවුන්ගේ සිත්වල ඇතිවුනා විය හැකිය. අවසන් දිනය හෙයින් මගේ ඉවසීමත් හීනව තිබුණි. අවසන් කළ යුතු වැඩ කටයුතු රාශියක් වූ හෙයින් කළබලකාරී ස්වභාවයකින් යුතුව උන්නෙමි. පැමිණි අයට ස්තුතිය පළ කළ යුතුය. උපවාසය අවසන් කිරීම සඳහා වන වෙලාව ආසන්න වී ඇත. මඩුව අයින් කළ යුතුය. මේ ආදි වශයෙන් බොහෝ කටයුතු හිත තුළ වූ හෙයින් අපේ රටේ විප්ලවකාරී කවියා පැමිණ සිටින බව මට අමතක විය.

සියලුම කටයුතු අවසන් වූ පසුව මම පෙර සඳහන් කළ මඩකළපුවෙහි මිතුරන්ගෙන් " මොකක්ද වුනේ? කාසි ආනන්දන් ආවෙ නැද්ද?" යැයි ඇසුවෙමි.

" අය්යෙ, ඔයා කිව්වනේ අර වවුනියාවේදි ඊ.පී.ආර්.එල්.එෆ්. එකේ සහෝදරයෙක්ට වෙඩි තිබ්බේ ඇයි කියල අහන්ඩ කියල. ඉතිං අපිත් ඇහැව්වා. ඒකට එයා "මල්ලිගෙන් (ප්‍රභාකරන්) අහල කියන්නං කියල ආපු ත්‍රිවිල් එකෙන්ම හැරිල ආපහු ගියා"යැයි පවසා ඔවුහු සිනාසුනහ.

" එදා එසේ උපවාස මඩුවට නොපැමිණ ගිය කාසි ආනන්දන් 2002දී එස්.පොන්නුතුරෙ පැවැත්වූ චෙන්නෙ දෙමළ සාහිත්‍ය සමුළුවේදි මගේ අල්ලපු අසුනේ සිටියේය. ඒ වෙලාවෙහිදී මට "අර වවුනියාවේදි ඊ.පී.ආර්.එල්.එෆ්. එකේ සහෝදරයෙක්ට වෙඩි තිබ්බේ ඇයි කියල තවම ඇහැව්වේ නැද්ද?" යැයි ඇසිය යුතු යැයි මට සිතුණි.

නමුත් කරුණු දෙකක් මාව එසේ ඇසීමෙන් වැළැක්වුවේය.

එකක් නම් මගේ බිරිඳ පසෙකින් සිටීමයි. අනෙක් කාරණය මා එසේ ඇසුවහොත් "මල්ලිගෙන් (ප්‍රභාකරන්) අහල කියන්නං" යැයි පවසා නැගිට පිටව ගියහොත් මගේ වණ්ණාත්තික්කුලම් පොත ප්‍රකාශනය කළ එස්.පොන්නුතුරෙගේ හිත කැළඹෙයි යන්නයි. එහෙයින් මම ඔහු සිටින දෙසට නොහැරී පැය තුනක් උන්නෙමි.

මම නැවත එම ප්‍රශ්නය ඇසුවහොත් "මල්ලිගෙන් ඒක අහන්ඩ ඉස්සෙල්ලා 2009 මැයි 18 මල්ලි ගියානේ " යන පිළිතුර ලැබෙනු ඇත.

ඡායාරූපය: කාසි ආනන්දන්

## දෙමළ පුනරුත්ථාපන සංවිධානය - ප්‍රභවය

වෙන්නෙහි දෙමළ වෛද්‍ය ආයතනය ස්ථාපිත කළ අවස්ථාවෙහි වැලිකඩ සිරගෙයි සිට පණ බේරා ගෙන ආ දොස්තර ජෙයකුලරාජා එහි සභාපති බවට පත් වූ අතර මම එහි ලේකම් ලෙස කටයුතු කළෙමි. අරගල සංවිධාන පහක් අප සමඟ එක්ව උන්නේය. වසරක් ගතවන තෙක් මෙම සාමූහික උත්සහය කිසිම බාධාවකින් තොරව පැවතිණ. මෙම කාලයෙහි ප්ලොට් සංවිධානය හැර අනෙකුත් සංවිධාන එකට එක්ව උන්නේය. සංවිධානවලට අයත් අයටත් අනාථයන්ටත් අපේ වෛද්‍ය සේවය ලැබිණ. එමෙන්ම ඉන්දීය වෛද්‍යවරු සහ දේශපාලන ප්‍රමුඛයන් අතරෙහි වැඩ කිරීමට මෙම සාමූහික උත්සහය මහත් උපකාරි විය.

අපේ සංවිධානය විදෙස්ගත දෙමළ ජනතාව සහ ස්වේච්ඡා ආයතනවලින් ලබාගත් මුදල්වලින් වර්ධනය වෙමින් තිබුණි. වසරකට පසුව 1986 වසරෙහි ආරම්භක වකවානුවෙහි අපේ පළමු වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීමට නියමිත විය.

සූලෙලෙමේඩු වීදියේ අංක 144හී ඉහළ මාලයක පෙරවරු 10ට රැස්වීම සංවිධානය කර තිබුණි. ලේකම් වශයෙන් මම සියලුම කටයුතු සංවිධානය කර රැස්වීම පැවැත්වීමට නියමිත වෙලාවට පැය භාගයකට පෙර මාම්පළම් ප්‍රදේශයෙහි වාසය කරන සිටින සභාපතිවරයාව ත්‍රිරෝද රථයකින් ගොස් කැඳවා ගෙන එනමෙන් අපේ සහායකයාව සිටි කරුණානිධිව යැව්වෙමි.

සභාපතිවරයාව කැඳවා ගෙන ඒමට එසේ වාහනයක් යැවුවේ පළමු වතාවටයි. සාමාන්‍යයෙන් මා එසේ කරන්නේ නැත. නමුත් එදා මගේ සිතෙහි අනාවැකි කියන පක්ෂියෙක් අද සභාපති නොවෙයි යැයි කිවේය. දහය පසුවිය. රැස්වීම ආරම්භ කළ යුතු වෙලාව පසුවිය. උප සභාපති තනතුර දැරූ දොස්තර ශාන්ති රාජසුන්දරම් පැමිණියාය. විමුක්ති කොටි සංවිධානයෙහි හැර අනෙක් සංවිධානවල නියෝජිතයෝද රැස්වීමට පැමිණියහ. අපි සභාපතිවරයාගේ පැමිණීම බලාරොත්තුව උන්නෙමු.

අපේ ආයතනය පිහිටියේ සූලෙලෙමේඩු වීදියේ ඉහළ මාලේ ගොඩනැගිල්ලකය. පාරේ යන වාහනවල ඝෝෂාව මැඩගෙන පඩිපෙළ නැග එන කරුණානිධිගේ සෙරෙප්පු සද්දය පැහැදිළිව ඇසෙන්නට විය. එම සෙරෙප්පු හඬට මගේ සවන් තියුණු විය. කරුණානිධි සමඟ සභාපතිවරයාගේ පැමිණීම බලාපොරොත්තුව සිටියත් පැමිණියේ කරුණානිධි පමණක් වීම අපේ අපේක්ෂා සුන් කිරීමට සමත් විය.

කරුණානිධි හිස ඔසවා අප දෙස බලා "ඩොක්ටර් කිව්වා එයා සෙංකල්පට්ටිවල තියෙන අනාථ කඳවුරට යන්න තියෙනවා කියලා. එයාට එන්ඩ වෙලාවක් නෑ කියල කිව්වා".

සියල්ලන් තුළම ඇතිවූ විස්මය මුහුණුවලින් ප්‍රකට විය. නමුත් මුව ගොළුය. ආයතනයෙහි සභාපතිවරයා මහ සභා රැස්වීමට නොපැමිණෙයි. ඒ වෙනුවට වෙනත් දෙයකට යායුතුය යන්න ඉතාමත් අසාමාන්‍ය තත්ත්වයකි. අනෙක් අය තුළ මහත් විස්මයක් ඇති කිරීමට එය සමත්වුවත් මා තුළ සහ මූල්‍ය භාරකරු දොස්තර ශිවනාදන් තුළ එය එතරම් විස්මයක් ඇති කළේ නැත. නමුත් සභාපතිවරයාගේ ගාණක් නැති පිළිතුර ඔහු පිළිබඳව සිතේ වේදනාවක් ඇති කළේය.

එකල අඩෙයාරු ප්‍රදේශයෙහි සෙංගල්පට්ටු දිස්ත්‍රික්කයෙහි සුළි සුළං ආරක්ෂිත කඳවුරෙහි පිහිටි අනාථ කඳවුරු දෙකකට ඇඩෙල් බාලසිංහම් මහත්මිය ගොස් ඖෂධ බෙදාදීමත් ඇය සමඟ දොස්තර ජෙයකුලරාජා ද යැමත් මමත් දොස්තර ශිවනාදනුත් දැන සිටියෙමු. එය ඔහු පුද්ගලිකව සිදු කරන්නේය යනුවෙන් අපි සිතා සිටියෙමු. නමුත් ඔහු තමන් නායකත්වය දරන මෙම ආයතනය ඔහු අතරමඟදී අනපේක්ෂිත ලෙසින් අත්හැර දමනු ඇතැයි අපි සිහිනෙන්වත් නොසිතුවෙමු. නමුත් අපි එදා රැස්වීමට පැමිණ සිටි පිරිස අතරෙහි මෙම සත්‍යය නොපැවසුවෙමු. උප සභාපතිගේ නායකත්වයෙන් වාර්ෂික රැස්වීම පැවැත්වූවෙමු. එයට පසුව දොස්තර ජෙයකුලරාජා තමන් අපේ ආයතනයෙන් ඉවත්වන බව දන්වා එවූ පසුව දොස්තර ශාන්ති රාජසුන්දරම් අපේ ආයතනයෙහි සභාපති ලෙස කටයුතු කළාය.

දොස්තර ජෙයකුලරාජා ඉතාමත් අවංක සහ හොඳ හදවතක් ඇත්තෙකි. කිසිම අවස්ථාවක උස් හඬින් කථා නොකරන්නෙකි. මම ඔහු සමඟ කටයුතු කළ කාලය තවමත් මම සතුටුමත් කාලයක් ලෙසින් සිතන්නෙමි. එවන් පුද්ගලයෙකුගේ මෙම ක්‍රියාව අපට තේරුම් ගත නොහැකි දෙයක් විය. ඔහු පසුව දෙමළ පුනරුත්ථාපන සංවිධානයෙහි සභාපති බවට පත්වූවේය. දිනක් මම ඔහුව හමුවූ මොහොතේ "ඇයි එහෙම කෙරුවේ? අපිට කියල අයින් වෙන්න තිබුණනේ?"යැයි පැවසුවෙමි. එවිට ඔහු ඉතාමත් සංක්ෂිප්තව " මම මල්ලිට (ප්‍රභාකරන්ට) යුතුකම් ඉටු කරන්ඩ ඕනෑ"යැයි පැවසුවේය. ඔහුගේ තත්ත්වය අපි නොදැන සිටියත් එය අපි වැරැද්දක් යැයි නොසිතුවෙමු.

මෙම දෙමළ වෛද්‍ය සංවිධානය ආරම්භ කිරීම සඳහා ඉන්දීය රුපියල් දොළොස් දාහක් ඇමරිකාවෙහි වසන මගේ මස්සිනා විසින් දොස්තර ජෙයකුලරාජා වෙත ලබා දුන් බව මෙහිදි සිහිපත් කළ යුතුය. ඔහු එම මුදල අප වෙත දී කෝඩම්පාක්කම්වල බැංකු ශාඛාවෙහි ගිණුමක් ආරම්භ කරන මෙන් පැවසුවේය. එහෙයින් මෙම ආයතනයෙහි මූලික දායකයා ඔහුය.

දෙමළ පුනරුත්ථාපන සංවිධානය ආරම්භ වූවේ මෙයට පසුවයි. එහි සභාපති ලෙස දොස්තර ජෙයකුලරාජා කටයුතු කළේය. ඔවුන් සතුව සුදු පැහැ වෑන් එකක් තිබුණි. දෙමළ සහනාධාර අරමුදල සඳහා තමිල්නාඩුවෙහි මහ ඇමැති විසින් දෙමළ ජනතාවගෙන් එක්රැස් කළ රුපියල් කෝටි හතරෙන් කෝටි තුනක මුදලක් දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය මෙම වෑන් රථයෙන් ගොස් ලබාගත් බව දිනමණි පුවත්පතේ ඡායාරූපයක් සහිතව පළ වී තිබුණි. පසුකලෙක විදෙස් රටවල අති විශාල මුදලක් ආයුධ සඳහා එක්රැස් කිරීමට මෙම ආයතනය උපකාරි විය. මම මෙල්බෝන් නගරයට පැමිණි පසුව දොස්තර ජෝයිස් මහේශ්වරන් මෙම ආයතනයෙහි ජාත්‍යන්තර සභාපති ලෙසත් පසුව ලංකාවෙහි ආණ්ඩුව සමඟ පැවැත්වූ සාකච්ඡා කණ්ඩායමෙහි සාමාජිකයෙක් ලෙසත් කටයුතු කළේය යන්න මෙහිදී සඳහන් කළ යුතුය. ආරම්භයේදී විමුක්ති කොටි ඇතුළු සංවිධාන පහක් ඇතුළත් වූ දෙමළ වෛද්‍ය ආයතනය කපා ඉවත් කරගෙන එහි නායකයාව සිටි තැනැත්තාව භාවිතා කර විමුක්ති කොටි සංවිධානය විසින් දෙමළ පුනරුත්ථාපන සංවිධානය පිහිටුවන ලදී. මෙම සිද්ධියට පසුව විමුක්ති කොටි සංවිධානයට අනෙකුත් සංවිධාන සමඟ ගැටුම් ඇති විය. අනෙකුත් සංවිධාන අභ්‍යන්තර අරගලවල යෙදී සිටි අවස්ථාවෙහි ගිනි පුපුරක් අපේ ආයතනය ඇතිවීම පිළිබඳ අවධානයෙන් නොසිටිම පිළිබඳව පැවසීමට මෙම කරුණු විස්තර කළෙමි. මෙය දේශපාලන සමුද්‍රයෙහි රුවල් නැවක් පැදවීම වැනිය. කුඩා වෙනසක් පිළිබඳව පවා සැළකිළිමත් නොවූවෝ ජීවිත බේරා නොගනිති.

ඡායාරූපයඃ ජෝයි මහේශ්වරන් පසුකලෙක කොටි සංවිධානයෙහි නායකයෝ සමඟ

එම වාර්ෂික මහා සභා රැස්වීමට පසුව විමුක්ති කොටි සංවිධානයෙහි නියෝජිතයෝ අපේ මාසික රැස්වීම්වලට සහභාගි නොවූවත් අපේ ආයතනය අඛණ්ඩව අනාථ කඳවුරුවලට සේවය සැපයුවේය. නමුත් දෙමළ පුනරුත්ථාපන සංවිධානයෙහි අය අපව තරගකරුවන් ලෙසින් බැලූහ.

ආරම්භ කාලයෙහිදි ඉන්දීය වෙරළට අනාථයන් ලෙස පැමිණි අය මන්නාරමෙහි මුහුදුකරයේ වාසය කළ අය සහ ඉන්දීය සම්බන්ධකම් සහිතව මන්නාරම් ප්‍රදේශයෙහි සුළු වශයෙන් ගොවිතැන් කටයුතුවල යෙදුණ අය වෙති. මෙම දෙපිරිසම සංවිධාන සමඟ සම්බන්ධ අය ලෙසින් සලකා හමුදාවෙන් සහ නාවික හමුදාවෙන් පීඩාවට පත්වීම හේතුවෙන් පිටත්ව ආ අය වෙති. 1985 වසරෙහි අවසන් භාගයේදී ලංකාවෙහි හමුදා ප්‍රහාර හේතුවෙන් ත්‍රිකුණාමලය ප්‍රදේශයෙහි බොහෝ දෙනෙක් පැමිණියහ. ඔවුන්ගෙන් බොහෝදෙනෙක් වැල්වැටිත්තුරෙයෙන් අවාහ විවාහ කරගත් අය වෙති. මෙම අය පැමිණි අවස්ථාවෙහි ඔවුන්ට නවාතැන් සපයන ලද්දේ නාගපට්ටනම්හි පිහිටි සුළි සුළං ආරක්ෂක කඳවුරුවලය.

දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානය විසින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට ප්‍රථමාධාර පුහුණුව ලබාදෙන ලදී. එහි නිත්‍ය වගකීම පවරා ත්‍රිකුණාමලයෙහි තරුණයන් දෙදෙනෙකුව පත් කළෙමු. ඔවුන්ගෙන් එක් අයෙක්වූ රවි චන්දිරන් දිනක් උදෑසන පැමිණ මා සමඟ මෙසේ පැවසුවේය. " ආයේ මේ පැත්තේ එන්ඩ එපා, දෙමළ පුනරුත්ථාපන සංවිධානේ මේ වැඩ කරගෙන යයි කියල කොටි අපව පැන්නුවා. නමුත් මිනිස්සු කැමති අපි වැඩ කරනවට. ඒත් අපේ පැත්තට කතා කරපු ගැහැණු අයට කවුදෝ කෙනෙක් එයා ප්‍රභාකරන්ගේ මාමා කියල තමයි කිව්වේ, කුණු හරුපෙන් බැනලා එයලා තමයි මේ කඳවුරුවල වගකීම භාරව ඉන්නේ කියල කිව්වා, අපි බයේ දුවල ආවා".

මොන හත්තිලව්වක්ද මේ? වෛද්‍ය සේවෙ කරන්න ඇවිල්ල කොටි එක්ක හැප්පෙන්ඩ වෙලා තියෙන්නෙ යැයි යටි හිතේ බයක් ඇති වූවත් මම එය බැහැරට නොපෙන්විය යුතුය. මම ආයතනයේ ලේකම්. කුමක් හෝ කළ යුතුය. මම මගේ හිතේ කැළඹුම යටපත් කරගෙන රවි චන්දිරන්ගෙන් මෙසේ ඇසුවෙමි.

"හරි කවුද දැන් නාගපට්ටනම්වල වැඩ කරන්නේ?"

"ඩොක්ටර්,ජෙයකුලරාජා නාගපට්ටනම්වලට ඇවිත් නතරවෙලා ඉන්නෙ"

" හරි, එහෙමනං එයාත් එක්ක කතා කරමු"යැයි පැවසූ මම සිකුරාදා දින පැමිණ ප්‍රශ්නය විසඳා ගැනීමට කැමැත්තෙන් සිටින බව ඔහුගේ මාර්ගයෙන් දැනුම් දුන්නෙමි.

බ්‍රහස්පතින්දා උදේ මම දොස්තර ශිවනාදන් සහ රවී සමඟ චෙන්නෙහි සිට පිටත්ව නාගපට්ටනම් වෙත ගොස් පහට දොස්තර ජෙයකුලරාජා නවාතැන් ගෙන සිටි හෝටල් කාමරයෙහි දොරට තට්ටු කළෙමු.

කියූ දිනට දවසක් පෙර යෑමට හේතුව සිකුරාදා අපි යන බව දැනගෙන අපව බෝට්ටුවෙන් මුහුදට ගෙන ගොස් ගල් ගැට ගසා මුහුදට තල්ලු කළ හොත් කිසිවෙක් එය නොදනිති. මෙයට පෙර ටෙලෝ, ප්ලොට්, කොටි වශයෙන් සෑම කෙනෙක්ම තමන්ගේ අයව බෝට්ටුවලින් රැගෙන ගොස් මුහුදට තල්ලු කර ඇත. එකල ඉන්දිය (තමිල්නාඩු) රහස් තොරතුරු අංශය ගොඩබිම්දී සිදු කළ අපරාධ පමණක් සංඛ්‍යා ලේඛන සඳහා

ගණන් තබා ගනියි. නමුත් ඔවුහු මුහුදෙදි සිදු කෙරෙන අපරාධ පිළිබඳව ගණන් හිලව් තබා ගන්නේ නැත. මෙම කරුණු දොස්තර ශිවනාදන් සහ මම දැනගෙන උන්නෙමු.

මමයි ශිවනාදනුයි ත්‍රිකුණාමලේ රවීයි බස්එකේ යද්දිත් හිටියෙත් බියෙන්ය. එදා බස් එකේ යද්දී බැලූ චිත්‍රපටියේ නම මතක නැත යන්නම අපේ එදා මානසික තත්ත්වය පැහැදිළි කිරීමට ප්‍රමාණවත්ය. මෙම ගමන ගැන නිවෙසෙහි අයට පැවසුවේ ද නැත.

නාගපට්ටනම් බස් නැවතුම්පළට පැමිණ බසයෙන් බසින විට අරුණළු වැටී තිබුණේ නැත. කඩවල් දෙකක් තුනක් පමණක් එම අවස්ථාවෙහි විවෘතව තිබුණි. අපි තේ බී ත්‍රීරෝද රථයකින් ගොස් කාමරයෙහි දොරට තට්ටු කළ අවස්ථාවෙහි දොර විවෘත කළ දොස්තර ජෙයකුලරාජා අපව දැක තිගැස්මට පත් වූවේය.

"මේ මොකෝ මේ වෙලාවෙ?"

ඔයාලගේ මල්ලිගේ අයට බයේ තමයි කිව්ව දවසට දවසක් ඉස්සෙල්ල ආවේ යැයි ඔහුට පැවසිය නොහැකිය.

"තවත් වැඩ කීපයක්ම යෙදිල තිබුණා. ඒ නිසා එක සැරේම කරල ඉවරයක් කරන්ඩ හිතා ගෙන ආවා. උදේම ආවම තමයි ඔයාව හමුවෙන්ඩ පුළුවන් නිසා තමයි මේ වෙලාවේ ආවේ".

"ඇතුළට එන්ඩ".

" ඩොක්ටර්, ඔයා දන්නවනේ අපි මේ කඳවුරේ ඔයාගේ කාලෙ ඉඳන්මනේ වැඩ කරන්නෙ".

" මේ අය කතා කරන්ඩ දන්නෙ නැති අය".

" හරි ඒකට කමක් නෑ. මෙහෙ තියෙන අනාථ කඳවුරු දහයෙන් පහක් අපි භාර ගන්නං.ඩොක්ටර් ඔයාලා පහක් ගන්ඩ. සමාජ සේවෙ කරන්ඩ ඇවිල්ල මොකට ද ගැටුම් ඇති කරගන්නෙ? එහෙම බැරිනං, කඳවුරු සේරම ඔයාලට ඕනෑ නං කියන්ඩ, අපි අල්ලපු දිස්ත්‍රික්කෙට යන්නං" යැයි මම කීවෙමි.

දොස්තර ජෙයකුලරාජා කාමරයෙන් එළියට ආ අවස්ථාවෙහිදි රවී " මෙයා තමයි අපිව එළෙව්වේ. මෙයා ප්‍රභාකරන්ගේ මාමාලු" යැයි පැවසුවේය.

මම පිටුපස හැරී ඔහු පෙන්වූ තැනැත්තා දෙස බැලූ අවස්ථාවෙහි ඔහු වෙනත් පැත්තකට හැරුනේය. සුදු පැහැ කමීසය ද දණහිසට ඉහළින් වන්නට බැඳ ගෙන සිටි නිල් පැහැ කොටු සහිත සරම ද කාල වර්ණ රෝම සහිත දෙපා ද තවමත් මගේ මතකයෙහි ඇත.

එයට පසුව එවක දෙමළ පුනරුත්ථාපන සංවිධානයෙහි ලේකම් තනතුර දැරූ නාදන් නම් තැනැත්තා මට " යාපනේට වරෙං, බලා ගන්නං"යැයි පැවසුවේය.

මම සිනාමුසුව ඔහුව මගහැර ආවෙමි.

නමුත් ඔහුගේ වදන් හිස් ඒවා නොවෙයි. පසුකලෙක ඕමන්දෙ සෝදිසි මුරපළෙහි මගේ ඡායාරූපය සහිත ඇල්බමයක් තිබුණු බව මම දැනගත්තෙමි. මෙල්බොන්හි සිටින අය කුමන අන්දමේ ඡායාරූපයක් දුන්නාදැයි නොදනිමි.

එයට පසුව මම වසර කීපයක් යනතෙක් වෙන්නෙ පාරවල්වල යනවිට සුදු වෑන් එකක් දුටුවහොත් පැන පළා යෑමට තැනක් තිබේද යන්න පිළිබඳව අවධානය යොමු කරමි. විමුක්ති කොටි තම ඒකාධිකාරය යටතේ තබා ගත්තේ යුද්ධය පමණක් නොවෙයි. දෙමළ ජනතාව උදෙසා සැපයූ වෛද්‍ය සේවය පවා ඔවුහු තම ඒකාධිකාරය යටතේ පවත්වා ගැනීමට උත්සහ ගත්හ. මෙය තමිල්නාඩුව තුළ පමණක් නොව පසු කාලයක දෙමළ ජනතාව වාසය කළ සෑම ස්ථානයකටම පැතිරුහ.

කාලය වසර ගණනක් ගත වූවත්, කොන්ත්‍රාක් ගත් අය අමතක කළත් කොන්ත්‍රාක් ගත් ක්‍රම පිළිබඳ ස්මරණයන් මැකී නැත. ගතවූ කාලයෙ වූ මේ සියල්ල අමතක කළ යුතු වුවත් එසේ අමතක කෙරෙයිද?

## දොස්තර ප්‍රමොද් ක්‍රන් සේති පිළිබඳ මතකය

දෙමළ වෛද්‍ය අරමුදලට ටිකින් ටික මුදල් රැස්වෙද්දී අපි අපේ කටයුතු ව්‍යාප්ත කිරීමට උත්සහ ගත්තෙමු. ඒ අවස්ථාවෙහි මගේ බිරිඳ ශ්‍යාමලා පමණක් වෛද්‍ය කටයුතුවල නිමග්නව උන්නාය. වැඩිපුරම වෛද්‍ය පහසුකම් ලබාගත්තේ අපට ආසන්නයෙහි සිටි ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණෙහි අයයි. එමෙන්ම ලංකාවෙහි සිට අවතැන්ව පැමිණ සිටි ලංකාවෙහි දෙමළ ජනතාව ද ප්‍රතිකාර සඳහා පැමිණියේය. අසල්වැසි චෙන්නෛ දෙමළ ජනතාව ද පැමිණීමත් සමඟ වැඩ කටයුතු අධික විය.

තමිල්නාඩුවෙහි අනාථ කඳවුරුවල සිටින ජනතාවට වෛද්‍ය දැනුම ලබාදීම සඳහා කඳවුරුවල වාසය කරන අධ්‍යාපනය ලබා ඇති අය විශේෂයෙන්ම තරුණ කාන්තාවන්ව චෙන්නෛ වෙත කැඳවා සතියක කාලයක් තුළ මූලික ශරීර සෞඛ්‍ය පිළිබඳ කරුණු ඉගැන්වීමටත් ප්‍රථමාධාර පුහුණුවක් ලබාදීමටත් සැළසුම් කළෙමු.

අනාථ කඳවුරුවල සිටින වෛද්‍යමය දැනුවත් කිරීම් කළ හැකි කීප දෙනෙක් තෝරා ගෙන තිරුප්පූර්හී පිහිටි රාජ්‍ය නොවන ආයතනයක් මාර්ගයෙන් තවත් සති දෙකක පුහුණුවක් සඳහා ගිවිසුමක් අත්සන් කළෙමු. එම කාලයෙහි චෙන්නෛහි වෛද්‍ය ක්ෂේත්‍රයෙහි නිපුණත්වයක් දැරූ අය වෙත අපි ලිපි රැගෙන ගොස් දුන් අවස්ථාවෙහි අඩු ගාස්තුවක් යටතේ එසේත් නැතිනම් නොමිලේ එම සේවය සැපයූහ. එකල තමිල්නාඩුවෙහි ඊළම් යන වචනය බලගතු මන්ත්‍රයක් විය. මෙය අවභාවිත කළ අයත් විශේෂයෙන්ම සමහරු තමන් අනාථයන් බව පවසා තමිල්නාඩුවෙහි ඇති සෑම කෝවිලකටම වන්දනය සඳහා නොමිලේ දුම්රියෙහි ගමන් කළ බවත් මම දනිමි.

අනාථ කඳවුරුවල වාසය කරන අය සඳහා වෛද්‍ය පුහුණුව මගේ බිරිඳ විසින් ලබා දුන් අවස්ථාවෙහි කඳවුරුවලට ගොස් පුහුණුව සඳහා පිරිස කැඳවා ගෙන ඒම මගේ රැකියාව විය. කන්‍යාකුමාරි සහ තූත්තුක්කුඩි යන ප්‍රධාන දිස්ත්‍රික් දෙක හැර අනෙක් සෑම දිස්ත්‍රික්කයකටම මම ගියෙමි. චෙන්නෛහි සිට දකුණෙන් මණ්ඩපම් දක්වා වන තමිල්නාඩු මුහුදුකරයෙහි සෑම තැනකත් ලංකාවෙන් පැමිණි අය රැඳී සිටි සුළි සුළං ආරක්ෂක කඳවුරු කරාත් දෙපා වැල්ලේ එරෙද්දි උරහිසෙහි එල්ලා ගත් බෑගය සමඟින් ගමන් කළ කාලය මිහිරිය. මහත් වැදගත් කාර්‍යභාරයක් ඉටු කිරීම සඳහා මම ඉන්දියාවට පැමිණ සිටිමි යැයි මම සිතූ දවස්ය එම දවස්.

දවසක් නාගපට්ටනම් අසළ පිහිටි අනාථ කඳවුරට යෑමට සිදු විය. බසයෙන් බැස කිලෝ මීටර් කීපයක් පයින් යා යුතුය. එදා මගේ සහයට කරුණානිධි ද පැමිණියේය. ඊරෝශ් සංවිධානයෙහි සහෝදරයෙක් (නම මතකයෙහි තබා නොගනිමින් ඊරෝශ් සහ ඊ.පී.ආර්.එල්.එෆ්. සහෝදරවරු යැයි පැවසීම පහසුය) මමත් කරුණානිධිවත් තම යතුරු පැදියෙහි නංවා ගෙන ගමන් කළේය.

තිදෙනක් එක යතුරු පැදියක ගමන් කරන හෙයින් පොලිසියෙන් බේරීමට ප්‍රධාන පාරවල් මඟහැර ගොවිබිම් මැදින් ගමන් කරද්දී මධ්‍යහ්න අව්වෙන් දැවෙන්නට වූවෙමු. යතුරුපැදියෙහි මම මැද්දෙන් ද කරුණානිධි පිටුපසින් ද ඉඳගෙන සිටිද්දී එම පැරණි යතුරුපැදිය මහත් ශබ්දයෙන් යුතුව එම ප්‍රදේශය මැද්දෙන් ගමන් කරන්නට විය. තැනින් තැන තල් ගස් සහ පොල් ගස් වැවුණු වැලි සහිත ප්‍රදේශයකි එය.

වැසි කාලයෙහි වගා කළ රටකජු වගාව අස්වැන්න නෙළීමට සූදානම් තත්ත්වයෙහි තිබුණි. අප ඉදිරියට පැමිණෙන සුළඟෙහි මුසුව තිබූ ලවන රසය දිවට දැනෙද්දී අප සිටින්නේ මුහුදට ආසන්නයෙහි බව තේරුම්ගත හැකි විය.

පාර දෙපස තල් ගස් මුරකරුවන් මෙන් නැඟී සිටින පාරෙන් ගමන් කරද්දී එක්වරම ගස්වලට මුවා වී සිටි දස දෙනෙකුගෙන් පමණ යුතු පිරිසක් අපේ යතුරු පැදිය වටකර ගත්තෙන් අපි යතුරු පැදිය නතර කළෙමු. ආපසු හැරී යන මෙන් කෑ ගසා ගෙන පැමිණි ඔවුහු අපව බය කිරීමේ තැතක් ලෙසින් අපට අතින් පහර දෙන්නට වූහ. එම පහරදීමෙහි සතුරුකමෙහි නපුරුබවක් නොතිබුණි. මම යතුරුපැදියෙහි මැද්දේ සිටි හෙයින් වැඩිපුරමට ගුටි පහරවල් වැදී තිබුණේ කරුණානිධිට සහ ඊරෝශ් සංවිධානයෙහි සහෝදරයාටය. කරුණානිධි යතුරුපැදියෙන් බැස තම හිස බදා ගත්තෙන් පහරවල් ඔහුගේ උරහිස් මත පතිත විය. මගේ ජීවිතයෙහි පහරදීම් වලට මුහුණ දී නොසිටි හෙයින් මම ගල් ගැහී උන්නෙමි. ඊරෝශ් සංවිධානයෙහි සහෝදරයා හෙල්මට් පැළැඳ සිටි හෙයින් ඔහුගේ හිස බේරුනත් ඔහුගේ පපුවට සහ උරහිසට පහර එල්ල

විය. ටික වෙලාවක් ගත වෙත්ම ඔහු කුමක්දෝ හේතුවක් නිසා "අපි ලංකාවෙ අය" කියත්ම මන්ත්‍ර බලයෙන් මෙන් එල්ලවූ පහරවල් නතර විය.

පහර දුන් අය වහාම සමාව අයැද සිටියහ.

පහර දුන් අයගේ නායකයා යැයි සිතිය හැකි සුදු වේට්ටියකින් සැරසී සිටි තැනැත්තා හේතුව පැහැදිළි කළේය.

එම කඩල වගාවෙහි අස්වැන්න නෙළීම සඳහා ගමේ කම්කරුවෝ කුළිය වැඩියෙන් ඉල්ලා ඇත. එය ප්‍රතික්ෂේප කළ වගා හිමියා ගමෙන් බැහැරින් කුළීකරුවෝ ගෙන ඒමට නියමිතව සිටි හෙයින් එසේ පැමිණෙන්නන්ට පහර දීමට ගමේ කම්කරුවෝ තල් ගස්වලට මුවා වී උන්හ. ඒ අවස්ථාවෙහි එම පාරෙන් අපි පැමිණි හෙයිනුත් එම පහරවල් අපට එල්ල විය. එසේ අපට පහර දුන් අය අපව ඔවුන්ගේ නිවෙස්වලට කැඳවා ගෙන ගොස් අපට සංග්‍රහ කළහ. අපි ඔවුන් සමග ස්වල්ප වෙලාවක් ගත කර අනාථ ජනතාව වාසය කළ කඳවුරට ගියෙමු.

මම තමිල්නාඩුවෙහි වාසය කළ කාලය තුළදී මම තමිල්නාඩු ජනතාව තුළ දුටු ලක්ෂණයක් නම් ඔවුහු ඉතාමත් පහසුවෙන් රංචු මානසිකත්වයට (mob mentality) ගමන් කරති. එයට ඒ තරම් හේතු අවශ්‍ය නැත. නමුත් සැබෑව සහ යුක්තිය අවබෝධ කර ගන්නේ තනිවම සිටින විටය.

අපේ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි දහවල් කාලයෙහි වෛද්‍ය සේවය සැපයීම මගේ බිරිඳ විසින් සිදු කළ හෙයින් රාත්‍රි කාලයට අයෙක් පත් කිරීමට තීරණය කළෙමු. අපේ සහයට සිටි කරුණානිධි සමග තව වෛද්‍යවරයෙකුව පත් කිරීමට කටයුතු කළ මොහොතේ එකල ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පීඩාවට පත්ව වතුකරයෙහි සිට පැමිණි අයෙකුව පද්මනාභා විසින් හඳුන්වා දෙනු ලැබිණි. ඔහුගේ සහෝදරයෙක් ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයෙහි සාමාජිකයෙක් නැතහොත් ආධාරකරුවෙක් යැයි සිතමි. දොස්තර පොස් යනුවෙන් හැඳින්වුණු මෙම වෛද්‍යවරයා වතුකරයෙහි වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කරද්දී 1983 කළු ජූලියෙහිදි පීඩාවට පත්වූවෙකි. ඔහු දරුවන් දෙදෙනෙකු සහ බිරිඳ සමග වාසය කළ හෙයින් දහවල් කාලයෙහි මගේ බිරිඳ සායනය පවත්වා ගෙන යන බැවින් රාත්‍රිකාලයට ඔහුගේ සේවය ලබා දෙන මෙන් ඉල්ලා සිටියෙමු." අපිට දෙන්න පුළුවන් ඉන්දීය රුපියල් පන්සීයක් විතරයි. ඒක ඔයාට දෙන වැටුපක් විදියට හිතන්න එපා. එහෙම වැටුපක් දෙන්න හැකි මට්ටමක අපි නෑ. ඒ වුනත් මේ මුදල ඔයාට උපකාරයක් වෙයි කියල අපි හිතනවා"යැයි පැවසුවෙමු.

දොස්තර පොස් වගකීම භාර ගත්තේය. ඔහු නිතරම අත්දිග කමීසයක් ඇඳ එහි අත් නොනවා මැණික් කටුව ළඟින් බොත්තම් දමා සිටින්නෙකි. ලංකාවෙහි වතුකරයෙහි ශීත ප්‍රදේශයෙහි පුරුද්ද ඔහු චෙන්නෛ පැයිල්ලෙහි ද අත් නොහැරියේය.

මෙම කාලයෙහි සංවිධානවල සමහරු දෙපා අහිමිව සිටිනු අපට දක්නට ලැබුණි. ජේප්පූර් කෘතිම දෙපා පිළිබඳ අපට දැන ගන්නට ලැබුණේ මෙම අවස්ථාවෙහිදීය. 1986 වසරෙහිදි දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි ලේකම් වන මම සහ මා මිතුරු දොස්තර ශිවනාදන් ජේප්පූර් කෘතිම පා නිෂ්පාදනය කරන ස්ථානයට ගියෙමු.

බොම්බායෙහි භරත නැටුම් හැදෑරූ සුදා චන්දිරන් තිරුච්චිවලදී මුහුණ දුන් රිය අනතුරක් හේතුවෙන් පාදයක් අහිමිවී ජේප්පූර්හිදී කෘතිම පාදයක් සවි කළ පසුව නර්තනයෙහි යෙදී මයූරි චිත්‍රපටයෙන් සිනමා නිළියක බවට පත්වූවාය. මෙම පුවත එකළ මහත් අධික ලෙසින් කතාබහට ලක් විය.

අස්ථි වෛද්‍ය විශේෂඥයෙකු වූ දොස්තර ප්‍රමොද් ක්‍රන් සෙති (Dr Pramod Kran Sethi) සහ රාම් චන්ද්‍රා (Ram Chandra ) විසින් ආරම්භයේදී නිර්මාණය කළ මෙම ඇලුමිනියම් පාද පසුව දොස්තර ප්‍රමොද් ක්‍රන් සෙති විසින් ගුණාත්මක වශයෙන් දියුණු කර බොහෝ දෙනෙකුට සවි කරන ලදී. මෙම කෘතිම පාද පාවහන් නොපැළඳි අයට ගැළපෙන ලෙසින් පවතින හෙයින් තෙවන ලෝකයේ රටවල අයට සුදුසුය. ඉතාමත් අඩු පිරිවැයකින් සකස් කළ හැකිය. බිම ඉඳගෙන කකුළ නවා ගෙන සිටීමටත් කුඹුරට බැස වැඩ කිරීමටත් ආදි වශයෙන් මෙම කෘතිම පාද භාවිතය පහසුය. එකල යුද්ධ පැවතුණු ඇෆ්ගනිස්ථාන්, මොසැම්බික් වැනි රටවල බිම් බෝම්බවලට හසු වී පා අහිමි වූවන්ට මෙම පාද මහත් මහෝපාකාරි විය.

එහෙයින් ජේප්පූර් කරා යෑමට පළමුව දුම්රියෙන් දිල්ලියට ගොස් එහි සිට ජේප්පූර් කරා ගිය ගමන අමතක නොවන අත්දැකීමකි. ගොඩනැගිළි ලා රතු පැහැයෙන් ද විවිධ වර්ණයෙන් යුතු තලප්පා බැඳි පිරිමින්ගෙන් ද මොට්ටාක්කු දමාගත් කාන්තාවගෙන් ද පිරි පාරෙහි බහුලව දක්නට ලැබුණු ඔටුවන් ද සහිත ජේප්පූර් එකල මා තුළ මහත් ආශ්චර්යක් ඇති කළේය.

ඡායාරූපයඃ දොස්තර ප්‍රමොද් ක්‍රන් සෙති

ජේප්පූර්වලට රාත්‍රි කාලයෙහි ගිය බැවින් හෝටලයක නවාතැන් ගෙන පසුදින උදේ සේවා මාන්සිං රෝහලට ගොස් විමසුවෙමු. එහි සිටි අය ලංකාවේ දෙමළ අය දෙදෙනෙක් පැමිණ සිටින බව දැනුම් දුන්හ. වහාම එවන මෙන් දැනුම් දෙනු ලැබිණ.

එම තරුණ අරුණ පැතිරි මොහොතේ අපි දොස්තර ප්‍රමොද් කුන් සෙතිගේ නිවෙසෙහි ආගන්තුක සත්කාරය භුක්ති වින්දෙමු.

අප ගිය එම කාලයෙහි දොස්තර සෙති රැකියාවෙන් විශ්‍රාම ලබා සිටියත් කෘතිම පාද නිෂ්පාදනය විෂයෙහි අඛණ්ඩවම යෙදී උන්නේය. ජාත්‍යන්තර රතු කුරුස සංගමයෙන් කෙරුණු ආරාධනයක් මත තමන් ඇෆ්ගනිස්ථානයට ගිය බවත් එහිදී තමන් කෘතිම පාද නිෂ්පාදනය පිළිබඳව පුහුණුවක් ලබා දුන් බවත් එම නිහතමානී මිනිසා අප සමඟ පැවසුවේය. අපි ලංකාවෙහි පවතින යුද්ධය පිළිබඳව විස්තර කර දැනට විශාල අවශ්‍යතායක් නැතත් ඉදිරියෙහිදී ඇතිවිය හැකි තත්ත්වය පිළිබඳව සැළකිල්ල යොමුකර කීප දෙනෙකුට කෘතිම පාද නිෂ්පාදනය කිරීම පිළිබඳව පුහුණුවක් ලබා දීම පිළිබඳව උනන්දුවක් දක්වන බව පැවසුවෙමු. ඔහු එයට අවශ්‍ය කටයුතු කරන බවට සහතික වූවේය. උදෑසන ආහාරය ඔහුගේ නිවෙසෙන් ලබා ගැනීමෙන් පසුව අපි පිටව ආවෙමු. පැය කීයක ඔහු සමඟ වූ සංවාදයෙහිදි ඔහුගේ චාම්බවත්, මානව හිතවාදි ගුණයත් සේවය කිරීමෙහි ආකල්පයත් මා තුළ මහත් ආකර්ශනයක් ඇති කළේය.

ඔහු ලෝක ප්‍රකට අස්ථි ශල්‍ය වෛද්‍යවරයෙක්ය යන්නට කිසිම සඳහනක් ඔහු පැවසූ වදන් තුළ අන්තර්ගත නොවීය. ඔහු වෛද්‍ය ශිල්පීය වචන කිසිවක් භාවිතා නොකර සාමාන්‍ය පුද්ගලයෙක් ලෙසින් කථා කළේය. අවසානයෙහි " මේ ජෙය්ප්පූර් කකුළ හැදුවේ ඔයාද?" යන ප්‍රශ්නයට ඔහු ඉතාමත් සන්සුන්ව " ඒ ගෞරවෙ හිමිවෙන්ඩ ඕනෑ රාම් චන්ද්‍රාට" යැයි පැවසුවේය.

කාශි ප්‍රදේශයෙහි උපන් ප්‍රමොද් කුන් සෙති වෛද්‍යවරයෙකු බවට පත් වූ පසුව එඩින්බොරෝහි අස්ථි භංග ශල්‍ය කර්මය පිළිබඳ පුහුණුව ලැබූ අයෙකි. ආරම්භයේදී දැවයෙන් සහ රබර්වලින් ජෙය්ප්පූර් පාද නිර්මාණය කළ රාම් චන්ද්‍රාගේ නිර්මාණය පසු කලෙක ඇලුමිනියම් භාවිතයෙන් එම පාදයෙහි බර අඩු කරන ලදී.

එයට පසුව තුන් වතාවක් ජෙය්ප්පූර්වලට ගොස් ලංකාවෙහි දෙමළ ජාතිකයන් දහඅට දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී. එයට පසුව ලංකාවෙහි බොහෝ දෙනෙකුට ආණ්ඩුවෙහි මාර්ගයෙන් පුහුණුව ලබා දුන්නෙමු.

අස්ථි ශල්‍ය වෛද්‍යවරයෙකු වූ ප්‍රමොද් කුන් සෙති මහාචාර්යවරයෙකු ලෙසින් විශ්‍රාම ලැබුවේය. ඔහුගේ සේවය අගයා ඉන්දීය රජය පද්ම ශ්‍රී සම්මානයත් පිලිපීනයේ රජය රාමන් මෙග්සේසේ සම්මානයත් පිරිනමා ගෞරවය පුද කළේය.

ඉන්දියාවට පමණක් නොව ලෝකයටම හිමි දොස්තර ප්‍රමොද් කුන් සෙති තම අසූවන වියෙහි 2008 ජනවාරි 06 වන දින මෙලොව හැර ගියේය.

## විනාශකාරයන්ගේ වදන් නොඅසන්න.

ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යුවහයකින් තොර ආයුධ සන්නද්ධ සංවිධාන අභ්‍යන්තරයෙන් බෙදී යැමත් විනාශව යැමත් අඩුපාඩු සහිත දරු කැළලක් ගබ්සාවක් වී බැහැර වීම මෙන් ස්වභාවික ක්‍රියාවකි. ඒ වගේම ශක්තිමත් දේ පැවතීමත් දුර්වල දේ විනාශව යැමත් ඩාවින්ගේ දර්ශනයයි.

සහෝදර සංවිධාන විමුක්ති කොටි සංවිධානය විසින් විනාශ කළ බොහො දෙනෙක් පැවසුවත් එය අතිශයෝක්තියකි. නමුත් එම සංවිධානවල සිටි අයව විමුක්ති කොටි සංවිධානය විසින් දඩයම් කරනු ලැබූ බව සත්‍යයකි.

මේ දෙක අතරෙහි ඇති වෙනස කුමක්ද? යැයි ඔබ ඇසිය හැකිය.

අනෙක් සංවිධාන අභ්‍යන්තර බෙදීම් (Implosion ) හේතුවෙන් තම හිස් මතට තුවක්කුවෙන් වෙඩි තබා ගත්තේය. සංවිධානවල ඉතිහාසය දන්නා අය මෙය දනිති. නමුත් ජාතියේ විමුක්තිය පමණක් අරමුණක් කරගෙන පැමිණි තරුණයන්ව පණ ගැහෙද්දි  වෙඩි තබා ඝාතණය කිරීම වනාහි විමුක්ති කොටි සංවිධානය විසින් කළ පාප කර්මයකි.

එම පාපයන් ඔවුන් පසුපසින් සෙවනැල්ලක් සේ පැමිණියේය. අවසානයෙහි ඔවුහු අනිත් අයට කළ දේ ලංකාවේ ආණ්ඩුව විසින් ඔවුන්ට සිදු කරන ලදී.

සමහරුන්ට එය සිදුවූවේ වෙනස් අන්දමින්ය. ටෙලෝ සංවිධානයෙහි තරුණයන්ව ඝාතණය කළ කිට්ටු සහ මාත්තයා යන අය මියගියේ වයසට ගොස් නොවෙයි. ඒ වගේම ප්‍රභාකරන් මුල්ලිවායික්කාල්වලදී අනිවාර්‍යයෙන්ම සිරි සබාරත්තිනම්ගේ අවසන් මොහොත ගැන නොසිතා සිටියා විය නොහැකිය. සමහර විට " මම රාජපක්‍ෂ එක්ක සාකච්ඡා කරල බලන්නං"යැයි ලංකාවෙහි හමුදාපති සමඟ කියන්නට ඇති.

1980 ගණන්වලදී ඉතාමත් බලවත්ව පැවැති ටෙලෝ සංවිධානය දෙකට බෙදී තම විනාශය අත්පත් කර ගත්තේය. ඉන්දියාවෙහි සිටි සමයෙහි මම එය අසා සහ දැක හැකි පමණින් එය වැළැක්වීමට උත්සහ කළෙමි. විනාශකාරයන්ගේ වදන්වලට සවන් නොදෙන්න යන වචනවල අරුත මම තේරුම් ගත්තෙමි.

මගේ එවක මතකයන් ස්මරණය කරද්දී බඩ විරේකය සඳහා රාත්‍රියෙහි පානය කළ තිත්ත බෙහෙත් උතුරට එන්නා සේ හැඟීමක් දැනෙයි.

1986 වසරෙහිදි මමත් දොස්තර ශිවනාදනුත් දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි වැඩ කටයුතු සමඟ ආරච්චි මහත්තයාගේ කාරියත් සිදු කළෙමු. ඒවා අපි අපේ කැමැත්තෙන් කළ ඒවා නොවෙයි. ඒවාගේම ඒවා අපගේ වෘත්තීය කුශලතාවයන් සමඟ සම්බන්ධ ඒවා ද නොවෙයි. කිසිම ලාභයක් ලැබුණු ඒවා ද නොවෙයි. නමුත් ඒවා අවසානයෙහි මානසික අසහනකාරීත්වයක් ඇති කරගෙන එදා රාත්‍රියට අතේ තියෙන මුදල වියදම් කරගෙන මධුපානයෙහි උකුළට දෙදෙනාවම රැගෙන ගොස් නවතියි.

මධුපාන ගැන නොපවසා මගේ ඉන්දීය ස්මරණයන් තරණය කළ නොහැකිය.

මධුපාන යන විෂයෙහි ඉන්දියාව සහ ලංකාව අතර පවතින්නේ සැහෙන වෙනසකි. ලංකාවෙහි හැළි අරක්කු පවා සාදන්නේ භය භක්තියෙන් යුතුවය. එහිදී ද ලංකාවෙහි දකුණේ අයගේ අත් ගුණය විශේෂිතය. දංකොටුව ප්‍රදේශයෙහි නිෂ්පාදනය කළ අරක්කු දැන් පවතින සිංගල් මෝල්ට්වලට වඩා යහපත්ය. නමුත් ඉන්දියාවෙහි හැම එකක්ම පානය කළ නොහැකිය. එය අද මෙන් විදේශිය මධුපාන නොමැති කාලයක්ය. පසුදින හිසරදය නොපවතියි, නැඟිට වැඩට යා හැකිය යන්න ගැන උනන්දුවෙන්  සිටි අපට ගැලපෙන ඉන්දීය මධු පානය වූවේ රෝයල් චාලඥ් නම් වූ විස්කිය. මිල අධිකය. නමුත් රෝයල් චාලඥ්වල ඇත්තේ උක් යුෂවලින් පෙරූ මධුය. එසේනම් එයට නම් තැබිය යුත්තේ රම් නැතහොත් අරක්කු යනුවෙන් නොවෙයිද? ඉන්දියාවෙහි බාර්ලි නොවැවෙයි. උක් බහුලය. එහෙයින් ආනයනය කෙරෙන බාර්ලි සමඟ උක් යුෂ එක්කර එය සාදනු ලැබෙයි. ඒ කාලයෙහි මට රෝයල් චාලඥ් ගුණාත්මක යැයි සිතුණි. ඒ වගේම මට දුම්බීමේ පුරුද්ද ද තිබුණි.

අපි දෙදෙනා කළ ආරච්චිලගේ කාරියන් විවිධාකාරය. අදාල අයගේ නම් පැවසිය නොහැකි නිසා කළ කාරියන් පමණක් මෙහි සඳහන් කරමි.

ලංකාවෙහි සිට යුරෝපයට චෙන්නෛ හරහා යෑමට සිටි තරුණ තරුණියන්ට බොහෝ වාරයක් උපකාර කර ඇත්තෙමු. එම කාලයෙහි සංවිධානවල අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් එක් පාර්ශ්වයක් ද විමුක්ති කොටි සංවිධානය විසින් විනාශ කරන ලද සංවිධානවල සිට පහරට ලක්වූ වදයෙන් පළා යන බඹරුන් සේ තවත් පාර්ශ්වයක් ද චෙන්නෛහි සිට පිටරටවලට යෑමට චෙන්නෛහි රැස්ව උන්හ. ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍ර, පිටවීම් බලපත්‍ර බොහෝ දෙනෙකුගේ අවශ්‍යතා විය.

මත්කුඩු ව්‍යාපාරිකයෙකුව මුදල් ලබා ගැනීම සඳහා විමුක්ති සංවිධානයක් විසින් පැහැර ගෙන ගියේය. ඔහුගේ බිරිඳ තම අතදරුවා සමඟ අපව හමුවීමට පැමිණ ආයාචනා කර සිටියාය. අපේ මැදිහත්වීමෙන් එම සංවිධානයෙහි අය ඉල්ලූ මුදල් ප්‍රමාණය කීප ගුණයකින් අඩු කිරීමට හැකිවිය.

අපි ළඟින් ආශ්‍රය කළ තැනැත්තෙකුට බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රයකින් කැනඩාවට යෑමට උපකාරි වූවෙමු. පසු කළෙක මා මෙල්බෝන්වල වාසය කරද්දී ටයිමස් සඟරාව තැපෑලෙන් මගේ නිවෙසට පැමිණෙද්දි එක් කලෙක අප්‍රිකානු ජාතිකයන්ගේ ඉංග්‍රීසි විදෙස් ගමන් බලපත්‍රය ටයිමස් සඟරාවෙහි මැද්දේ පැමිණීම තවමත් සිහිමට පොළඹවයි.

විමුක්ති කොටි සංවිධානය විසින් තමිල්නාඩුවෙහි කණ්ඩායම් දහයකට පුහුණුව ලබා දෙන ලදී. එම කණ්ඩායම්වලින් අවසන් කණ්ඩායමෙහි බොහෝ දෙනෙක් එයින් ඉවත් වූහ. එසේ පළා ආ අයට සහ දඬුවම් හේතුවෙන් පළා ආ බොහෝ දෙදෙනකුට උපකාර කළෙමු. එමෙන්ම ප්‍රේම සම්බන්ධතා සමඟ සම්බන්ධ ප්‍රශ්න ද අප කරා යොමු කෙරුණි. ඒවා ඉතාමත් සංකීර්ණ ඒවා විය. මම පවුල් ජීවිතයක් ගත කළ හෙයින් බොහෝ ප්‍රශ්න කෙළින්ම මා කරා පැමිණියේ නැත. බොහෝ ප්‍රශ්න ගෙන එන්නේ දොස්තර ශිවනාදන් විසින්ය. ඒවා පසුව අප දෙදෙනාගේ ප්‍රශ්න බවට පත් වෙයි. විමුක්ති සංවිධානවල අභ්‍යන්තර ප්‍රශ්න උද්ගත වූ විට ඒවා අප කරා පැමිණෙයි. සමහර අවස්ථාවල අපි ප්‍රශ්න කරා යෑම ද සිදු වෙයි.

1986 මැයි මස 06 වන දිනය යනු ටෙලෝ සංවිධානයෙහි නායක සිරි සභාරත්නම් මිය ගිය දිනයයි. මෙම සිද්ධිය සිදුවූවේ හරයටම එයට මාසයකට පෙරය.

රාත්‍රි දහයටත් චෙන්නෛ නගරය යෝධ සත්ත්වයෙකු සේ ආලෝකයෙන් සහ ශබ්දයෙන් ද දූහුවිල්ලෙන් සහ දුර්ගන්ධයෙන් ද යුතුව ක්‍රියාත්මකය. ලිබර්ටි සිනමා ශාලාව අසළ පිහිටි නිවෙසට යෑම සඳහා මම මගේ පරණ *TVS 50* යතුරු පැදියෙන් ප්‍රධාන පාරෙන් හැරී නිවසට යමින් සිටියෙමි. මම *EPIC* කාර්යාලය අසළින් යද්දී කළු පැහැ කළිසමකින් ද සුදු පැහැ කමීසයකින් ද යුතුව කල්පනාවක නිමග්නව මා ඉදිරියට එමින් සිටි ඊ.පී.ආර්.එල්.එෆ්. නායක පද්මනාභාව දුටු වහාම යතුරු පැදිය නතර කළෙමි. සාමාන්‍යයෙන් කවුරුන් සමඟ හෝ ගමන් කරන ඔහු අද තනිව පැමිණෙමින් සිටිනු දුටු මා තුළ ඇති වූවේ විස්මයකි.

"රන්ජන්, ටෙලෝ එකේ ප්‍රශ්නයක් වගේ. දාස්වයි බොබිවයි (ටෙලෝ සංවිධානයෙහි මිලිටරි අංශයෙහි භාරකරුවන්) අතරෙ තමයිලු ගැටුම"

"මටත් එහෙම තමයි හිතෙන්නේ. යමුද? ගිහින් සිරීව හමුවෙමුද?"

මම එකඟ බව පැවසීමට හිස සළවනවාත් සමඟ පද්මනාභා වහාම මගේ *TVS 50* යතුරු පැදියට නැංගේය. හෙල්මට් නොමැති හෙයින් අපේ යතුරු පැදිය ගමන් කළේ ඉතාමත් සෙමින්ය. නැතත් පරණ යතුරු පැදියක් හෙයින් වේගයෙන් ගමන් නොකරයි. මම යන ගමන් " ආරක්ෂාවට ආයුධයක් තියෙනවාද?"යැයි ඇසුවෙමි.

"නෑ. ඇයි සහෝදරයා අපි බය වෙන්ඩ ඕනෑ?"

ඒ මොහොතේ මගේ සිරුර හිරි වැටී ගියේය. හෘදය ස්පන්දනය වේගවත් විය.

සාලික්කිරාමම් කරා කොයි තරම් ඉක්මණින් යා හැකිද? යතුරු පැදිය ගමන් කරන්නේ වැසි කළ ගොළු බෙල්ලෙකු සේය. එය මෙයට වඩා වේගයෙන් ගමන් නොකරයි. කෙටි පාරකින් සාලික්කිරාමම් කරා යා හැකිද? ත්‍රිරෝද රියඳුරෙක් පාර මාරුවූ අයෙකුට "අඩෝ, ආපහු එන්නෙ නෑ කියල ගෙදරට කියලද ආවේ යකෝ?" යැයි ඇසූ මොහොතේ මමත් නිවෙසට නොකියා යන බව මතක් විය.

මම බොහෝ ස්මරණයන් සමඟ නිහඬව උන්නෙමි. හිතේ භය පහව ගියේ නැත. ඒ වනවිටත් මෙම සංවිධාන ඉන්දීය භූමිය තුළ තමන්ගේ අය ද වෙනත් සංවිධානවල අයවද මැසි මදුරුවන් සේ මරා දමන්නට විය. එපමණක් නොව පැහැරගෙන මුහුදු වෙරළට ගෙන ගොස් ගල් බැඳ මුහුද මැද්දේ ගිල්වා දැමීම ද මරා දැමීම ද සිදු කෙරෙන කාලයක මෙම මිනිසා තම ආරක්ෂාව පිළිබඳ තැකීමක් නොකරයි. මාත් මේකට අසුවුනානේ? හිතේ සිතිවිළි ආලෝකයේ වේගයෙන් ගමන් කරද්දී අපි ටෙලෝ කාර්යාලය පිහිටි සාලික්කිරාමම් කරා යමින් උන්නෙමු.

අපි ටෙලෝ කාර්යාලයට යනවිට දහය හමාරට පමණ ඇති. අල්ලපු නිවෙසෙහි දරුවෙක් වටා ගෙන සිරි සභාරත්තිනම් පැමිණියේය. මම ඔහුව මෙතරම් සමීපව දැක්කේ මුල් වතාවටය. නිල් පැහැ කොටු සහිත කමිසය මගේ මතකයේ පවතියි. එම දරුවා ටෙලෝ සංවිධානයෙහි සිට මියගිය අයෙකුගේ දරුවෙක් බව ඔහු පැවසුවේය.

ඡායාරූපයඃසිරි සභාරත්තිනම්

හතර වනතෙක් පද්මනාභා සහ සිරි සභාරත්තිනම් බොහෝ කරුණු පිළිබඳව සාකච්ඡා කළහ. මෙලෙස ලියන්නට සිදුවෙතැයි දැන සිටියේ නම් ඒවා සටහන් කර ගන්නට තිබුණි.

ඊළම් විමුක්ති අරගලයෙහි මෙම අය වැදගත්ය යන්න සිතෙහි සටහන් විය. මම සංවිධානයෙහි අයෙක් නොවෙන බව පිළිබඳ කිසිම තැකීමක් නොමැතිව කාලය පිළිබඳවත් අනාගත සැළසුම් පිළිබඳවත් ඔවුහු සාකච්ඡා කළහ. මම ඒ දෙදෙනා පිළිබඳවම ගරුත්වයක් සහිතව උන්නෙමි. මම නිහඬව බලා ගෙන උන්නෙමි. ටෙලෝ සංවිධානය කැඩී යෑමට නියමිතය. එනිසා මෙම හමුවෙන් කිසියම් යහපත් දෙයක් සිදුවිය යුතුය යන්න මගේ හිතේ පිරී තිබුණි. මම පලස්තීන සංවිධාන කැඩීයැම පිළිබඳ කතාව කියවා සිටියෙමි.

සිරි සභාරත්තිනම් සමඟ පැය පහක් තිස්සේ පද්මනාභා කථා කළේ ඔබලාගේ අභ්‍යන්තර ප්‍රශ්නය සාකච්ඡාවෙන් විසඳා ගන්න යන්නයි. නිහඬව හිස සළමින් අසා සිටි සිරි සභාරත්තිනම් උදෑසන මුහුදු වෙරළට යන බව පැවසුවේය. මමත් පද්මනාභාත් යම් කිසි කර්තව්‍යයක් ඉටු කළ තෘප්තියෙන් තවමත් හරියට එළිය වැටි නැති මොහොතේ කෝඩාම්පාක්කම් බලා පිටත්වූවෙමු. රාත්‍රියේ නිවෙසට නොපැමිණීම හේතුවෙන් මුහුණ හකුළුවා ගත් බිරිඳ නැවැතත් යථා තත්ත්වයට පැමිණීම සඳහා දින කීපයක් ගතවිය. නිවෙසෙහිදී බිරිඳව සැනසීමට පත් කිරීම සඳහා කුමක් හෝ කළ යුතුය යන අදහසින් සිගරට් පානය මාසයකට නතර කළෙමි.  එය බිරිඳට මගේ කැස්ස කනට නොඇසුණු මාසයක් විය.

විමුක්ති කොටි සංවිධානය විසින් ටෙලෝ සංවිධානයට පහර දෙන බවට පුවත අසන්නට ලැබුණේ එම මාසයෙහිදීය. මම ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයෙහි වයර්ලස් සන්නිවේදන උපකරණය තබා ඇති ස්ථානයට ගියෙමි. එහි සිටි අය රිසිවරය මගේ සවන් මත තැබූහ. එය උදෑසනකි. මම පැයක කාලයක් ලංකාවෙහි සිටින විමුක්ති කොටි සංවිධානයෙහි අයත් අඩෙයාර්හි සිටින විමුක්ති කොටි සංවිධානයෙහි අයත් අතර වන සංවාදයට ඇහුන්කන් දුන්නෙමි. නැඟෙනහිර පළාතේ මූතූර් ප්‍රදේශයේ විමුක්ති කොටි සංවිධානයෙහි භාරකරු ගනේෂ් නම් තැනැත්තා එයට පෙර නැඟෙනහිර පළාතේ අය බොහෝ දෙනෙක්ව යාපනයෙහිදි ඝාතණය කෙරුණු නිසා තව දුරටත් ඔවුන්ව ඝාතනය කිරීමට චකිතයක් දැක්වීම මට ඔවුන්ගේ කථාවෙන් පැහැදිළි විය. නමුත් එයට ප්‍රතිචාරයක් ලෙසින් කුණුහරුප තොගයක් අඩෙයාර්හි සිට ගුවන් තරංග ඔස්සේ ගමන් කරන්නට විය.

මම මහත් හිත් වේදනාවට පත්ව එම ස්ථානයෙන් පිටව ආවෙමි. ඉදිරියට ආ අයෙකුගෙන් ෆිල්ටර් රහිත සාර්මිනාර් වර්ගයෙහි සිගරට්ටුවක් ඉල්ලා ගෙන විශාල දුම් උගුරක් පෙනහළුවලට ඇද ගත්තෙමි. මාසයකට පමණ පසුව දුම සහ නිකොටින් අලුත් අත්දැකීමක් විය. චෙන්නෛහි සිගරට්ටුවක සුවය විඳිය හැක්කේ අලුයම කාලයෙහිදීය.

යාපනයට ගිය සිරි සභාරත්තිනම් දාස්ව යාපනයෙහි රෝහලේ දී ඝාතනය කිරීමත් පසුව සිරි සභාරත්තිනම් සමඟ දෙසීයකටත් වඩා වැඩි පිරිසක් විමුක්ති කොටින් විසින් ඝාතණය කිරීමත් ඓතිහාසික සිදුවීම්ය.

ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධානයෙහි බොහෝ දෙනෙක් මහත් කෝපයට පත්ව විමුක්ති කොටි සංවිධානයෙහි නායක ප්‍රභාකරන්ට පහර දී හෝ මෙම ඝාතන නතර කිරීමට උත්සහ කළ අවස්ථාවෙහි පද්මනාභා විසින් එයට බාධා කළ බව මම දැන ගත්තෙමි. එදා රෑ සාකච්ඡාවෙහිදී සිරි සභාරත්තිනම් ඉතාමත් බලවත් ආයුධ විශාල ප්‍රමාණයක් ඉන්දියාව ලබා දී ඇති බවත් ඒවා ත්‍රිකුණාමලය ප්‍රදේශයෙහි භාවිත කරන මෙන් දන්වා ඇති බවත් පවසනු මට ඇසිණ. තවද  සිරි සභාරත්තිනම් කියූ දේවල්වලට අනුව ලංකාවට යන මෙන් ඉන්දීය ඔත්තු සේවය වූ රෝ දන්වා ඇති බව මට තේරුම් ගියේය. එසේනම් විමුක්ති කොටින් විසින් ටෙලෝ සංවිධානය විනාශ කරනු ලැබීම ඉන්දියාවට වැළැක්විය හැකිය තිබුණි. අවම වශයෙන් සිරි සභාරත්තිනම්ව ආරක්ෂා කළ හැකිව තිබුණි. නමුත් ඔවුන් ඒ කිසිවක් කළේ නැත. රෝ කාර්යාලයට පැමිණි ටෙලෝ සංවිධානයෙහි අය ආයාචනා කළ බව නාරායන සාමි *ටයිගර්ස් ඔෆ් ලංකා* පොතෙහි සඳහන් කරයි.

ටෙලෝ සංවිධානය සම්බන්ධයෙන් 1986දී එසේ කටයුතු කළ ඉන්දියාව 2009 දී වෙනස් අයුරකින් කටයුතු කරනු ඇතැයි විමුක්ති කොටි සංවිධානය හෝ ඔවුන්ගේ ආධාරකරුවන් හෝ සිතීම උත්ප්‍රාසජනක නොවෙයිද? බලවත් දේ විසින් දුබල දේ විනාශ කිරීම ස්වභාව ධර්මය නොවෙයිද? ඉතිහාසය පෙන්වා දෙන්නේ එය නොවෙයිද?

### දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානයෙන් අසු වූ ආයුධ

වෙන්නෙහි ඉඩෝර කාලය. මධ්‍යහ්න වෙලාවෙ පැමිණි දොස්තර ශිවනාදන් මුහුණෙන් දාඩිය ගලමින් තිබුණි. "මේ මුහුන්දන් එක්ක මොකවත් කරන්ඩ බෑ" යැයි පවසද්දී ඔහුගේ මුහුණ අෂ්ඨකෝණ හැඩයෙන් විය.

මට එය ආරම්යේදි තේරුම්ගත නොහැකි විය. දෙමළ ඊළම් ජනතා විමුක්ති සංවිධානයෙහි (ප්ලොට්) නායක උමා මහේශ්වරන් ගැන කියන බව තේරුණත් මම " ඇයි, මොකක්ද උනේ?"යැයි ඇසුවෙමි.

"ප්ලොට් ඔපිස් එකේ වැඩ කරපු ගෑනු ළමයෙක් මෙහෙ ඇවිත් රස්සාවක් ඉල්ලනවා. එහෙ වැඩ කරන්ඩ බෑ කියල අඬනවා"

" අපි මොනවද කරන්නේ?"

" පව්. කසාද නොබැඳපු ළමයෙක්. ප්ලොට් එකේ අයට නිකරවැටිය බැංකු කොල්ලේදි උදව් කරපු නිසා එහෙ ඉන්ඩ බැරුව ඉන්දියාවට ඇවිල්ලා".

" උදව් කරපු අයට උදව් නොකරන එවුන් කොහොමද ජනතාවට උදව් කරන්නේ?" යැයි මම මගේ නොහැකියාව ප්‍රකාශ කළෙමි.

අපේ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි ඒ වනවිටත් ලිපිකාරිනියක් වූවාය. අමතරව තවත් අයෙක් පත්කර වැටුප් දීමට මුදල් නොමැත.

මාසයකට වරක් පැවැත්වෙන රැස්වීමේදි පත් කිරීම් සහ වැදගත් තීරණ සඳහා වන අනුමැතිය ඔවුන්ගෙන් ලබා ගත යුතුය. එවක මෙම ප්‍රධාන සංවිධාන පහේ නියෝජිතයෝ මෙම ආයතනයෙහි පාලක සභාවෙහි අධ්‍යක්ෂකවරු ලෙසින් සිටියහ. ප්ලොට් සංවිධානයත් එයට අයත්ය. එහෙයින් ප්ලොට් සංවිධානයෙන් ඉවත්ව පැමිණි අයෙක් අපේ ළඟ වැඩ කිරීමට එම සංවිධානය නිශ්චිතවම විරෝධය දක්වන බව අපි දනිමු.

නම මතකයේ නැතත් සාමාන්‍ය තත්ත්වයට වඩා වැඩි සුන්දරබවකින් යුතු එම යුවතියගේ දුක්බර මුහුණ තවමත් මගේ මතකයට එයි.

මගේ හදවත ගිනි අභියස ඉටි මෙන් විය. අවම වශයෙන් ඊළඟ රැස්වීම පැවැත්වීමට තව මාසයකට ආසන්න කාලයක් ඇත. රැස්වීම මඳක් කල් දැමිය හැකිය. එම කාලය තුළ එම යුවතියට වෙනත් තැනක වෙනත් රැකියාවක් සොයා ගත හැකිය. එහෙයින් හදිසි කාර්යයක් සඳහා යැයි මම මගේ සිත හදා ගෙන එම යුවතියට රැකියාව ලබා දුන්නෙමු. මාසයකට ඉන්දීය රුපියල් තුන් සීයක් දිය හැකිවිය.

සුපුරුදු ලෙසින් රැස්වීම ආරම්භ විය. සංවිධාන පහේම අය පැමිණියහ. ලේකම් වශයෙන් මට අනෙකුත් සියලු කරුණු සාකච්ඡාවට භාජනය කිරීමට හැකිවිය. මෙම පත්කිරීම පිළිබඳ කරුණ අවසානයෙහි ඉදිරිපත් කිරීමට මම අදහස් කරගෙන සිටියෙමි.

ප්ලොට් සංවිධානයෙහි නියෝජිතයා වශයෙන් පැමිණ සිටි වාසුදේවාට මගේ කල් ඇරීම හිතට ඇල්ලුවේ නැත. මගේ කථාවට බාධා කරමින් "සංවිධානවලින් අයින් කරපු අයට ඔයාලා රස්සා දෙන්ඩ එපා. ඒක එහෙම වුනොත් අපේ සමඟියට බාධාවක්. අනෙක් අයත් මේක පුරුද්දට ගන්නවා"යැයි පැවසුවේය.

අපේ රැස්වීමෙහි කථාකරන දේවල්වලට ඇහුන් කන්දෙමින් එම යුවතිය අල්ලපු කාමරයෙහි සිටියි. මා තුළ මහත් කෝපයක් ඇති විය. "පසුගිය කාලේ ඔයාලා දෙසිය පනහකටත් වැඩියෙන් මරා දාලා තියෙනවා. එහෙවු ඔයාලා තමයි සංවිධාන අතරෙ සමඟිය ගැන කථා කරන්නේ". එමෙන්ම එයට ප්ලොට් සංවිධානයෙන් *තීප්පොරි* (ගිනි පුපුර) කියන කණ්ඩායම වෙන් වෙලා ගිය කාලයයි. බොහෝ කරුණු ඇසීමට සිතුවත් ඇසීමට නොහැකිව මගේ මුව වසා තිබුණි.

මේසය වටා සිටි අයගෙන් මම මා ඉදිරියෙන් සිටි දොස්තර ශිවනාදන් දෙස බැලුවෙමි. ඔහු බිම බලාගෙන උන්නේය. ඔහුට තරහ ගියහොත් වචන පැටලෙන අතර කුණු හරුප එළියට එයි. එහෙයින් නිහඬව සිටිම යහපත්ය. සභාපති ධුරය දැරූ දොස්තර ශාන්ති රාජසුන්දරම් ද කථා කළේ නැත.

මම මෙසේ පැවසුවෙමි.

" ඔයාලාගේ සංවිධානේ ඉඳලා වෙන් වෙලා ආව බවක් අපි දන්නේ නෑ. ලංකාවෙ කෙනෙක් උපකාරයක් ඉල්ලපු වෙලාවෙ කෙරුවා. ඒකත් තාවකාලික උපකාරයක් විතරයි".

වාසුදේවා තම අවසානය දක්වා උමා මහේශ්වරන්ට විශ්වාසවන්තව උන්නේය. අනෙක් අය උමාව අත්හැර යද්දි අවසානය දක්වාම සහයට සිටි අයෙක් වශයෙන් නිශ්චිතවම මෙය සිදු කෙරී ඇත්තේ උමාගේ කීමට අනුවය. මට ඒ අවස්ථාවෙහි ගමේ අය කියන කොම්බේරි මූක්කන් නම් වූ සර්පයා මතක් විය. එම සර්පයා දෂ්ටකර යමෙක් මිය ගියේ නම් සොහොනෙහි එම පුද්ගලයාගේ සිරුර දැවෙද්දි ගසක සිට එම සර්පයා බලා ගෙන සිටින්නේලු.

අපේ රැස්වීම අවසන් වූ වහාම එම යුවතිය කඳුළු පිරි දෙනෙතින් යුතුව පිටතට ගිය දර්ශනය මගේ සිතෙහි සටහන්ව ඇත. මම කිසිවක් කළ නොහැකි අසරණ තත්ත්වයක සිටින බව තේරුම් ගත්තෙමි.

සැබැව, යුක්තිය යනාදියට වඩා සංවිධානවල සමගිය පිළිබඳව සිතූ හෙයින් අපි එදා නිවටයන්ව සිටියෙමු.

රැස්වීම අවසානයෙහි ප්ලොට් සංවිධානය ලංකාවෙහි කිසිම අන්දමේ හමුදාමය ප්‍රහාරයක් සිදු නොකළත් එදා මහ විශාල ජයග්‍රහණයක් කළා යැයි සිතාගෙන වාසුදේවා පිටව ගියා විය හැකිය.

මෙම සිදුවීමෙන් පසුව ස්වල්ප කාලයක් ගත විය. දිනක් වාසුදේවා තනිව එද්දි මමත් දොස්තර ශිවනාදනුත් ඔහු සමඟ කථා කළෙමු. නමුත් වාසුදේවාට වචන භාවිත කළේ ප්‍රශ්න පත්‍රයක හිස්තැනක් පුරවන්නාක් මෙන්ය. වාසුදේවා අප දෙදෙනා ඉදිරියේ සිටියේ පහර දී මුල්ලකට විසි කර දමන ලද සත්ත්වයෙකු සේය.

උමා මහේශ්වරන් තමිල්නාඩුවෙහි කාර් රථයෙන් ගමන් කරද්දී වූ අනතුරකින් බේරුණු බව දැන ගෙන සිටියෙමු. නමුත් එදින ඔහු සමඟ වාසුදේවා ද ගමන් කළ බව දැන ගත්තේ එදිනය.

ශිවනාදන් ඔවුන් සමඟ ආශ්‍රය ඇත්තෙකි. " අරූ මුහුන්දන් සල්ලි නෑ කියල පැත්තකට උනාලු. වාසුදේවාට බෙහෙත් කරන්ඩ සල්ලි ඕනෑලු" දොස්තර ශිවනාදන් කීවේය. මම ශිවනාදන් දෙස රවා බැලුවෙමි.

සංවිධානවල අයට මේ දක්වා ඖෂධ සහ සැත්කම්කර උදව් කර ඇත්තෙමු. මුදලින් උපකාර කිරීමට ආයතනයෙහි නීතිරීතිවලින් ඉඩක් නොමැත. නීතිරීති උල්ලංඝණය කර හෝ දීමට ආයතනය සතුව මුදල් නැත. දොස්තර ශිවනාදන් මගේ කරට අතදමාගෙන " මිනිහගේ පවුල සැහෙන අමාරුවක ඉන්නෙ. වාසුගේ වයිෆ් පව්, දරුවො දෙන්නටම ලෙඩ". ඔහු වෛද්‍ය ආයතනයෙහි පරිපාලන වගකීමෙ සිට නීතිඥයෙකු බවට පත් වූවේය.

රුපියල් තුන් දාහක් වාසු වෙත දුන්නෙමි.

තමන් සමඟ එක්ව තුවාළ ලැබූ වාසුදේවාගේ වෛද්‍ය කටයුතු සඳහා යෙදීමට උමා මහේශ්වරන් සතුව මුදල් නොතිබුණිද? නැතහොත් හිතක් නොතිබුණිද? යන ප්‍රශ්නය අද දක්වාම මා තුළ පවතියි.

**************************************************************************************************************

1985 වසරෙහි අප්‍රේල් මාසයෙහි ඉන්දීය රේගු දෙපාර්තමේන්තුව ප්ලොට් සංවිධානයෙහි හදවතට පහරක් එල්ල කළේය. තුවක්කු එක්දහස් හාරසීයක් ද මැෂින් තුවක්කු තුන් සීයක් ද තවත් සන්නිවේදන උපකරණ ද කන්ටේනරයක පැමිණි අවස්ථාවෙහි ඉන්දීය රේගු නිළධාරිහු එය විවෘතකර බලා අත්පත් කර ගත්හ. ඒවායෙහි වටිනාකම ඇමරිකන් ඩොලර් තුන් ලක්ෂයකි. එය සියලු දෙනා දත් කරුණකි.

මෙම ආයුධ අත්පත් කරගැනීමෙහි පසුබිමෙහි හදවත දැදුරු කරන කතාවක් මා සතුව ඇත.

1986 වසරෙහි එක් පුද්ගලයෙක් නිතර නිතර අප හමුවට පැමිණෙයි. එවක ඔහුගේ වයස අවුරුදු හතලිහක් පමණ ඇති. ඔහු සුදෝසුදු කමිස ඇඳ සිටියි. දකින පුද්ගලයෙකුට ඔහු සමඟ ගරුත්වයෙන් යුතුව කථා කළ යුතුය යන අදහස ඇතිවෙයි. වැදගත් පෙනුමක් සහිත ඔහු ඉතාමත් සන්සුන්ව වචන තෝරා බේරා කථා කරන්නෙකි. ඔහු පැමිණියේ වෛද්‍ය සේවය ලබා ගැනීම සඳහා නොවෙයි. අප සමඟ කථාබහ කිරීමටම ඔහු පැමිණෙයි. එයිනුත් ඔහු වැඩිපුරම කථා කරන්නේ මා සමඟය. ඔහු ප්ලොට් සංවිධානයෙන් ඉවත් වූ අයෙක් බව මා සමඟ කළ කතාබහෙන් දැනගන්නට ලැබුණි.

එකල බොහෝ සුළු සුළු ඊළම් විමුක්ති ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් දීපාවලිවලට පත්තු කරන රතිඤ්ඤා වැලක රතිඤ්ඤා සේ පිපිරී තැනින් තැන විසිර ගියේය. ඒවායෙහි සිටි අය විනායගර් සදුර්ති උත්සව දිනයට පසුව මුහුදට විසි කෙරෙන ගණදෙවි රූප මෙන් විය. එවැනි අයට ඇවිත් කථාකර කර ඉඳ යැමට බෝ ගසක් මෙන් අපි උන්නෙමු. එයට තවත් හේතුවක් වූවේ දොස්තර ශිවනාදන් චීන හිතවාදි වාමාංශිකයෙක් වීම සහ ඔහුගේ උපන් ගම කරවෙට්ටිවීමත් හේතුවෙන් බොහෝ දෙනෙක් ඔහුව සොයා පැමිණීමයි.

මෙම සුදු ඇඳුම්කාර පුද්ගලයා සමඟ කෙරෙන කථාබහේදි මට ඔහුගේ උපන් ගම මගේ බිරිඳගේ ගම වූ කන්කසංතුරෙ බව දැන ගැනීමට හැකිවිය. පාසල, ගම ආදිය ආදිය ගැන කථා කෙරෙන විට යාපනයේ අයවන අපේ ඇගේ ලේ රත් වෙන්නට පටන් ගනියි. හදවතින් වඩාත් සමීප වී ඇත්ත කතා කරන්නට පටන් ගනිමු. දැන් කාලයෙහි එය කෙසේදැයි නොදනිමි.

එම පුද්ගලයා තමන් ප්ලොට් සංවිධානයට බැඳුණ කථාව මා සමඟ කීවේය.

ඔහුගේ උපත ලංකාවෙහි සිදුවුනත් ඔහු සිංගප්පූරුවෙහි ඉතාමත් සුව පහසු ජීවිතයක් ගත කළ තැනැත්තෙකි. ඊළම් අරගලය පිළිබඳ අභිමානයෙන් යුතුව ඔහු ප්ලොට් සංවිධානය සමඟ සම්බන්ධතා ඇති කරගත් අතර ආයුධ ජාවාරමෙහිදි සම්බන්ධ වූවේය. තායිවානයෙහි සිට සිංගප්පූරුවට ගෙනා ආ ආයුධ පරණ කඩදාසි සහිත කන්ටේනරයකට රාත්‍රි කාලයෙහිදී සිංගප්පූරුවෙහිදි මාරු කරන ලදී. මෙය බොහෝ

දෙනෙක් එකතුව කළ නොහැකි කාර්‍යයක් වූ හෙයින් එය තමන් රෑ පුරා තම දෑතින් සිදු කළ බව ඔහු පැවසුවේය. සිංගප්පූරුවෙහි සිට පැමිණි කන්ටේනරය චෙන්නෛහිදී අසු වූ පුවත ලැබුණු වහාම මෙම පුද්ගලයා අත් අඩංගුවට පත්ව වධ හිංසාවට පත් කර ඇත. එම වධ බන්ධනවල කොටසක් ලෙසින් මෙම පුද්ගලයාව අධි ශීත කාමරයක පැය කීපයක් සිර කර තබා ඇත. අවසානයෙහි ඔහුට මරණ දඬුවම නියම කර ඇත. එම කාලපයෙහි සිංගප්පූරුවෙහි ජනාධිපති ධුරය දැරූ අයෙක්ව වහාම තනතුර අත්හැර දැමීමට නියම කෙරුණ අතර එම ජනාධිපති මෙම පුද්ගලයාව දන්නා කියන අයෙක්ව සිටි හෙයින් ඔහුගේ තනතුරෙහි අවසන් කාලයෙහිදී මෙම පුද්ගලයාට ජනාධිපති සමාව හිමි විය.

මෙම පුද්ගලයා නිදහස් වන අවස්ථාව වන විට ඔහු තම මුදුගිල්ලේ කොටසක් සහ දතක් අහිමිව උන්නේය. ඔහුගේ කථාව මම මෙහි ඔහු කියූ ලෙසින් ලියා ඇති නමුත් ඔහුගේ අවයව අහිමිව තිබීම මම දුටුවෙමි.

මෙම පුද්ගලයාට ජනාධිපත් සමාව හිමිවුවත් ඔහුගේ මුදල් සහ දේපළ සිංගප්පූරු රජය මඟින් රාජසන්තක කෙරුණි. එමෙන්ම ඔහුව රටින් පිටුවහල් කළ යුතු හෙයින් ඔහුගෙන් ලංකාව ද ඉන්දියාව ද යැයි ඇසූ අවස්ථාවෙහි ඔහු ඉන්දියාව තෝරා ගෙන ඇත.

ඔහු තමන්ව ගුවන් තොටුපල දක්වා කැඳවා ගෙන ආ සිංගප්පූරු පොලීසියෙහි නිළධාරින්ට තමන් මෙම සිංගප්පූරුවට දෙමළ ඊළමෙහි තානාපතිවරයා ලෙසින් පැමිණෙන බව පවසා පැමිණි බව පැවසුවේය. ඔහු එය පැවසූ අවස්ථාවෙහි මගේ දෑස් තෙත් විය. ඔහු කොයි තරම් සුඛෝපභෝගි ජීවිතයක් කැප කර ඇත්තෙක් ද යන්නට වඩා ඔහු තුළ ඊළම් විමුක්තිය පිළිබඳව වූ ගැඹුරු විශ්වාසය මා තුළ ලොමුගැහැවන්නට සමත් විය.

"මං කන්දක් වගේ විශ්වාස කරපු උමා මහේශ්වරන් හැම දෙනෙක් දිහාම බැලුවේ සැකෙන්. තේ එකක් පවා බොන්නේ තමන්ම උණු වතුර බෝතලේ දාලා තියා ගෙනයි. වාහනයක ගියත් ඩ්‍රයිවර්ට පිටුපස්සේ සීට් එකේ කෙනෙක් වාඩි කරවලා එයාගේ පැත්තකින් තමයි ඉන්නේ" යැයි ඔහු පැවසුවේය.

මම අවසන් වතාවට ඔහුව හමු වූ අවස්ථාවෙහි තමන් චෙන්නෛහි තෝසෙ කඩයක් ආරම්භ කිරීමට යන බව පැවසුවේය. මෙතරම් විස්තරයක් පැවසූ එම පුද්ගලයා තමන්ගේ පවුලේ විස්තර කිසිවක් පැවසුවේ නැත. ඔහු පමණක් නොව බොහෝ දෙනෙක් මව, පියා, බිරිඳ, දරුවෝ වශයෙන් පවුලේ අයගෙන් වෙන්ව යාග ගින්නට පැන්නහ.

නමුත් ප්‍රතිඵලය?

අවසානයෙහි මහත් අසහනයට පත්ව සිටි එම පුද්ගලයා අපේ සුලෛමේඩු ගොඩනැගිල්ලෙහි සිට පිටව ඇවිද ගෙන යනු මම ඉහළ මාලයෙහි සිට බොහෝ වෙලාවක් බලාගෙන උන්නෙමි.

## නැවතත් පිටව යෑම

ලංකාවෙහි සිට ඉන්දියාවට පැමිණි අනාථ ජනතාවටත් ඊළම් විමුක්ති ව්‍යාපාරවල අවශ්‍යතා සඳහාත් පිහිටුවනු ලැබූ අපේ ආයතනයෙහි මාර්ගයෙන් යුද්ධය හේතුවෙන් අවයව අහිමි වූ අයට උපකාර කිරීමට කැමැත්ත දැක්වූවෙමු. පා අහිමි වූ අයට සේවය කිරීම සඳහා ජෙය්ප්පූර් කෘතිම පාද නිෂ්පාදනය කිරීම, එය නිර්මාණය කළ දොස්තර ප්‍රමොද් කුන් සෙති හමුවී ඇති කරගත් ගිවිසුමට අනුව බොහෝ තරුණයන්ට ජෙය්ප්පූර් රෝහලේ දී පුහුණුව ලබා දුන්නෙමු. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ජෙය්ප්පූර් වෙත කැඳවා ගෙන ගියෙමු. නමුත් මමත් දොස්තර ශිවනාදනුත් බොහෝ වතාවක් ජෙය්ප්පූර් වෙත ගියත් ජෙය්ප්පූර් නගරයෙහි කිසිම ස්ථානයක් බැලීමට අවස්ථාවක් ලැබුනේ නැත. දැන් ඒ ගැන සිතන විට එය පුදුමයට කරුණකි.

එයට කරුණු දෙකක් හේතුවිය. පළමුවැන්න අපි අපේ සේවය පිළිබඳව කේන්ද්‍රීයබවින් යුතුව සිටියෙමු. දෙවැන්න අපි අපේ ගමන් සිදු කළේ පොදු මුදලින්ය. පසුකලෙක මම ඕස්ට්‍රේලියාවට පැමිණි පසුව මම සංචාරකයෙක් ලෙසින් දෙවතාවක් ජෙය්ප්පූර් වෙත ගියෙමි.

ජෙය්ප්පූර් ගමන දින දෙකක් ගතවෙන දුම්රිය ගමනකි. දුම්රියෙන් ගමන් කරද්දී ගමන මැද නවදිල්ලියෙහි නතරව සිටීම සුපුරුදු ලෙසින් සිදු කෙරෙන්නකි. ඒ ආශ්‍රිත සමහර මතකයන් මෙහිදී සටහන් කිරීම වැදගත් යැයි සිතමි.

එය නවදිල්ලියෙහි ග්‍රීස්ම සමයයි. වැලි සමඟ බැදෙන රටකජු සේ අව්ව අපව බදියි. අපි නතරව සිටි ස්ථානයෙහි විදුලිය පංකා හෝ වායු සමීකරණ යන්ත්‍ර හෝ තිබුණේ නැත. පාරේ ගමන් කරද්දී නිතර නිතර ජලය පානය කළ යුතුය. වතුරට ගම්මිරිස් දමා පානය කිරීම දැන ගත්තේ එහිදීය. මුහුණ දවන ගිනියම් සුළඟ මට අනලතීවු දූපතේ දුම්කොළ පෝරණු සිහිපත් කරවීමට සමත් විය. නමුත් මෙහි වැලි මිස දුම්කොළ නැත. කාන්තාරයෙහි වැල්ල. රෑට නින්ද නොඑයි. දිනක් රෑ පොළවට වතුර ඉස පොලිතින් ඇතිරිල්ලක් එළා නිදාගත් බව මගේ සිහියට එයි.

නවදිල්ලියෙහි ගතකළ බොහෝ දිනවල රාත්‍රියටත් උදේටත් චප්පාති සහ පරිප්පු ආහාරයට ලැබෙයි. එහෙම නැතිනම් පාන්. බොහෝ ස්ථාන ආහාර ගැනීම පිළිබඳ භය ඇතිකරවන සුළුය. මෙයට පෙර ලංකාවෙහිදි ඇති වූ ලෙඩ පිළිබඳ අත්දැකීම් හේතුවෙන් ඉන්දියාවෙහි සිටි කාලය තුළ දී ටයිපොයිඩ් හෝ අක්මාවෙහි රෝග ඇති නොවිය යුතුය යන්න පිළිබඳව පරිස්සම් වුනෙමි. ඒනිසාම කුසගින්නේ සිටි අවස්ථා ද ඇත. දිනක් මිතුරන් සමඟ නව දිල්ලියෙහි ආන්ද්‍රා භවන් ආපනශාලාවට ගියෙමි. කෑම රසවත්ය. නමුත් හැඬූ කඳුළින් යුතුව කැවෙමි. මම ඉන්දියාවෙහි සිටියදී ලංකාවෙහිදී මියගිය මගේ අම්මාගේ මළ සිරුර දැකීමට නොහැකිව හැඬුවෙමි. බොහෝ රෑ කාලයන්හිදී ඇඳේ කොට්ටය කඳුළින් තෙත් වෙයි. නමුත් මාව මහ දහවල කඳුළු සළන්නට හේතුවූවේ ආන්ද්‍රා භවන්හී දිවා ආහාරයයි.

නව දිල්ලියෙහි සිටි දිනයකදී මම සිහිනෙන් මට ප්‍රිය පරා වර්ගයෙහි මාළු දැක උදෑසන ඇඳ සිටි සරම පිටින් මාළු ගෙන ඒම සඳහා ත්‍රිරෝද රථයකින් පිටත්වූවෙමි. නව දිල්ලියෙහි මාළු අළෙවි ස්ථානය සොයා ගත් මම ආකිමිඩිස් මෙන් කෑ නොගැසුවා පමණි. එය විශාල වෙළෙඳපළක් නොවෙයි. කාන්තාවෝ කූඩවල විවිධ වර්ගයෙහි මාළු අළෙවි කරමින් උන්හ. බැලූ බැල්මට එම මාළු මුහුදු මාළු නොව වැව් මාළු මෙන්ය. වෙන දවසකදී නම් මම ඒ මාළු අසළට යන්නේවත් නැත. මම මේ දක්වා යාපනයෙහි කෑ හොඳ මාළු වර්ග ද උගුරෙන් පහළට යෑමට අකැමැති පොල් කිරෙන් ඉවූ යාපනයෙහි දූපත්වල මාළු හොද්ද පිළිබඳව ද සිතමින් මාළු වෙළෙන්දියක් අසළට ගියවිට ඇය මගේ සරම අල්ලා ගෙන කුමක්දෝ ඇසුවාය. එයින් මට තේරුණේ කල්කටා යන වචනය පමණි.

මම සරම බිමට වැටීම වළක්වා ගැනීමට වැරෙන් අල්ලා ගන්නා ගමන් එම කාන්තාව දෙස බැලුවෙමි. මම යාපනේ හැටියට සරම ඇඳගෙන උන්නෙමි. යටට කිසිවක් නැත. ඇඳෙන් නැගිට්ට ගමන් මාළු පිළිබඳ සිහියෙන් පැමිණියෙමි. එයට අමතරව මෙහෙ කවුද අපිව දන්නේ යන සිතිවිල්ල.

මගේ පසෙකින් සිටි ඉන්දීය මිතුරා සිනාමුසුව පැහැදිළි කළේය. "කවදද කල්කටාවෙ ඉඳන් ආවේ? එහෙ මොනවද අලුත් තොරතුරු? කියල මේ ගෑණු එක්කෙනා අහනවා".

"සරමෙන් අඳින්නෙ නැතුව ඒක අහන්ඩ බැරිද?"

"මේ වගේ කොටු කොටු සරම් මෙහෙ අඳින්නෙ බෙංගාලි අය. බෙංගාලි අය තමයි මෙහෙ මාළු ගන්නෙත් ඒ වගේම විකුණන්නෙත්. ඔයා සරම ඇඳගෙන ඉන්න නිසා එයාලගේ කෙනෙක් කියලය හිතල තියන්නේ" යැයි ඔහු පැවසුවේය.

මෙවැනි අත්දැකීමකට චෙන්නෛහිදී ද මුහුණ දුන්නෙමි. මාළු මිලදී ගන්නා අවස්ථාවලදී ඔයා මලයාලම්ද? යැයි අසා ඇත. එවැනි අවස්ථාවල මම සිනාමුසුව ඉවත්ව යමි. පසුකලෙකකදී ලංකාවෙහි අය විශාල සංඛ්‍යාවක් ඉන්දියාවට පැමිණි හෙයින් ඔයා සිලෝන් ද? යැයි අසති. එයට පසුව චෙන්නෛහි අය සිලෝන්කාරයෝ ඇවිල්ල මාළු මිල ඉස්සුවා යැයි දොස් කියනු මම බොහෝ වතාවක් අසා ඇත්තෙමි.

මමයි දොස්තර ශිවනාදනුයි නවදිල්ලියෙහි සිටි දිනක දී පද්මනාභාගෙන් පණිවිඩයක් ලැබුණි.

"අශෝකා හෝටලයට එන්න. එහෙ සැහෙන බියර් තියෙනවා".

සංවිධාන පහෙම අය නව දිල්ලියට පැමිණ සිටින බව අපි එවිට දැනගත්තෙමු. මෙය ලියන්නේ වසර තිස් දෙකකට පසුව නිසා කාලය නිශ්චිත නැත. ඉන්දු - ලංකා ගිවිසුමට මඟ සැකසෙන කාලයයි. ටෙලෝ සංවිධානය විමුක්ති කොටි සංවිධානය විසින් විනාශ කිරීමෙන් පසුව ආ කාලයයි.

රෝ හෙවත් ඉන්දීය ඔත්තු සේවයෙහි අයෙක් කළු පැහැ කාරයකින් පැමිණ අපව කැඳවා ගෙන ගියේය. එම හෝටලය පිහිටියේ නව දිල්ලියෙහි කුමන ප්‍රදේශයෙහිද යැයි නොදනිමි. රාත්‍රියෙහි පූර්වභාගයෙහිදී මම සහ ශිවනාදන් කාර් රථයේ පසුපස අසුනේ ඉඳ ගෙන ගමන් කළෙමු.

අපි නවදිල්ලියෙහි හෝටලයට පැමිණි වහාම පද්මනාභා සමඟ ශාන්තන් සහ යෝග සංබරි පැමිණ අපව කැඳවා ගෙන ගියහ. එයට පසුව මා හමු වී ඊරෝශ් සංවිධානයෙහි බාලකුමාරන් සහ ටෙලෝ සංවිධානයෙහි සෙල්වම් කථාබහ කළහ. ඊරෝශ් සංවිධානය ස්ථාපතනය කළ රත්තින සභාපති ඒ අවස්ථාවෙහි වෙරිපිට පැමිණියේය. ඔහු දොස්තර ශිවනාදන් සමඟ අඩේ යැයි අඬගසන තරමට සමීප ඇසුරක් ඇත්තෙකි. මම ඔහුගෙන් මඳක් දුරස්ථව සිටින්නෙමි.

අපව හමුවීමට නොපැමිණියේ ප්‍රභාකරන් සහ උමා මහේශ්වරන් පමණි. හෝටලයේ ඔවුන් දෙදෙනාට දී තිබූ කාමර දෙක තිබුණේ ආසන්නයෙහිය. මගේ හිතේ ඇතිවූවේ තිගැස්මකි. ඒ දෙදෙනාම මෙම ස්ථානයෙන් පළා යන්නේ කොයි වෙලාවෙද ? යන සිතිවිල්ලෙන් සිටිනවා විය හැකි යැයි මම සිතුවෙමි.

ඉන්දීය ඔත්තු සේවයෙහි නිරීක්ෂණය යටතේ හෝටල් කාමරවල සිටින අය තම ජනතාව වෙනුවෙන් එක්ව සිටීම ප්‍රතික්ෂේප කරන්නේ මක් නිසාද? නිමේෂයන් කීපයක් තුළ එකිනෙකට ප්‍රතිවිරුද්ධ සිතිවිළි ඇති වී නැති විය.

ඒ අවස්ථාවෙහි රත්තින සභාපති " වරෙං ගිහිං ප්‍රභාකරන් මලයවයි උමාවයි බලලා එමු. මං එක්කර ගෙන යන්නං" යැයි අප දෙදෙනාගේ අත්වලින් අදින්නට වූවේය. මම උමාව උපවාස කාලයෙහිදී හමු වී ඇතත් මම ප්‍රභාකරන් ළඟට ගොස් ඔහුව හමු නොවූ අයෙක්මි. "නෑ. මම එන්නේ නෑ" යැයි මම කීවෙමි. මා දෙස බැලූ දොස්තර ශිවනාදන් ද ගියේ නැත.

ඡායාරූපය: පද්මනාභා සහ යෝග සංබරි

එයට පසුව මගේ පාසැල් මිතුරා වූ යෝග සංබරි අපව ඔහුගේ කාමරයට කැඳවා ගෙන ගියේය. ඔහුගේ ඇඳට වී අන්‍යෝන්‍ය සුහදත්වයෙන් කථාබහෙ යෙදුණු අපි ඔහුගේ කාමරයෙන් බියර් බෝතල් කීපයක් සමඟ එළියට පැමිණ කාර් රථයෙන් නැවතත් අපේ ස්ථානයට පැමිණියෙමු.

එදා රෑ මම උමාව සහ ප්‍රභාකරන්ව ඔවුන්ගේ කාමරවලට ගොස් හමුවීම ප්‍රතික්ෂේප කිරීම මම අදත් ආඩම්බර විය හැකි විරෝධයක් ලෙසින් සලකමි. එයට හේතුව නම් අනෙකුත් නායකයන් පවා ඝාතන නියෝග නිකුත් කර ඇතිවා විය හැකි වූවත් මේ දෙදෙනා ඍජුවම ලේ තැවරුණු අයය යන අදහස එක්දහස් නවසිය අසූ ගණන්වලම මා තුළ ජනිතව තිබුණි.

මිතුරු යෝග සංබරි විමුක්ති කොටි විසින් පසු කලෙක ඝාතන කෙරුණු අවස්ථාවෙහි එදා මම ඔහු සමඟ අශෝකා හෝටලයෙහි කාමරයක ඇඳමත හිඳගෙන ඔහු සමඟ කළ කථාබහ සිතට පැමිණ මගේ ශෝකය තීව්‍ර කළේය.

මම චෙන්නෛහි ගත කළ අවසන් දින කීපය තුළ ඊළම් ජනතා විප්ලවකාරි විමුක්ති පෙරමුණෙහි බෙදීමක් ඇති විය. ඔවුන්ගේ චෙන්නෛ කාර්යාලයෙහි සිටි මගේ මිතුරු මිත්තිරන්, මහේශ්වරරාජා වැනි අය එයින් වෙන්ව ඩග්ලස් දේවානන්දා සමඟ ගියහ. එයට පසුව සිදු වූ සූලෛමේඩු සිද්ධිය ආරංචි විය. දිනක් මම ඔවුන්ගේ තොරතුරු මධ්‍යස්ථානයට ගිය අවස්ථාවෙහි එයට සුළු මොහොතකට පෙර ඩග්ලස් දේවානන්දා එහි ආ බවත් වාද විවාද සිදු කෙරුණු බවත් දැන ගන්නට ලැබුණි.

එකල ඔවුන්ගේ වෙන්වීම කනගාටුවට කරුණක් වුවත් අවම වශයෙන් ජීවිත හානි නොමැතිව වෙන්ව යෑමේ සංස්කෘතියක් ඇති කරනු ලැබ තිබීම සතුටට කරුණක් විය. අනෙක් දෙමළ සංවිධාන පමණක් නොව දෙමළ දේශපාලන පක්ෂවලින් වෙන් වූ අය පවා ද්‍රෝහීන් බවට පත් කෙරුණි.

ඊළම් අරගලය පමණක් නොව ඉන්දීය පසුබිම සහ දෙමළ සංවිධාන සියල්ල අවසානයට ළඟා වන බව ඒ තරම් දේශපාලන දැනුමක් නැති මට අවබෝධ වන්නට විය. ඒ දක්වා ඕස්ට්‍රේලියාවට සහ ඇමරිකාවට යෑමට ආරාධනා ලැබෙමින් තිබුණත් මම විදෙස්ගතවීම කල් දමමින් උන්නෙමි. මගේ බිරිඳගේ මව්පියෝ මම තම දියණියත් දියණියගේ දරුවනුත් දුක් කරදර විඳවන්නට සලස්වා ඇති බවට චෝදනා කර ඕස්ට්‍රේලියාවට ගියා පමණක් නොව අඛණ්ඩවම මගේ බිරිඳට බලපෑම් කරන්නට වූහ.

අවසානයෙහි 1987 වසරෙහි මැද භාගයේදී ඕස්ට්‍රේලියාවට යෑමට සූදානම් වූ කාලයෙහි මගේ පාසල් මිතුරෙක්වූ ද පසු කළෙක උතුරු නැගෙනහිර පළාත් සභාවෙහි මුදල් ඇමැති ද වූ කිරුබාකරන් ඉන්දීය හමුදා රාමනාදප්පුරම්වල වෙරළෙහි සිටින බව සැළ කළේය.

ගුවන් තොටුපල දක්වා පැමිණ මාව පිටත් කිරීමට සිටි සෙන්දිල් නම්වූ කුන්ජි "මචං, මට එන්න විදියක් නෑ මචං. ඉන්දියන්කාරයෝ අපිව කැඳවලා" යැයි පැවසූ අවස්ථාවෙහි මම මා වාසය කළ නිවෙසෙහි යතුර ඔහු අතට දී ගුවන් තොටුපල කරා ගියෙමි.

දෙමළ වෛද්‍ය මධ්‍යස්ථානයෙහි දොස්තර තනිකාසලම් විසින් අඛණ්ඩව වෛද්‍ය සේවාව පවත්වා ගෙන යන ලදී. සභාපති තනතුරෙහි දොස්තර ශාන්ති රාජසුන්දරම් ද මූල්‍ය කටයුතු භාරව දොස්තර ශිවනාදන් ද කටයුතු කළේය. රුපියල් ලක්‍ෂයකට නොවැඩි අරමුදලක් ද විය. මම දැරූ ලේකම්ධුරය පසුකලෙක මහාචාර්ය තනතුරට පත් ආචාර්ය පොන් රගුපති වෙත ලබා දෙන ලදී.

වසර තුනකුත් මාස දෙකක් වූ ඉන්දියාවෙහි වාසය කළ කාලය මට පේරාදෙනියෙහිදි වසර හතරක් පශු වෛද්‍ය හැදෑරුවා මෙන් අලුත් පාඩම් කියා දුන් කාලයක් විය. මම විවෘත හදවතින් කටයුතු කළ හෙයින් මා ගිය ස්ථාන, හමුවූ මිනිසුන් මට ගුරුවරු වූහ. වසර තුනකට පෙර තලෛමන්නාරමෙන් නැවට නඟිද්දී තිබුණු කැළඹුණු සිතම තමයි චෙන්නෙහි ගුවන් යානයට ගොඩ වෙනවිටත් තිබුණේ වුවත් මම ඕස්ට්‍රේලියාවට යද්දී චෙන්නෛහිදී ලැබූ අත්දැකීම් ද මා සමඟ පැමිණියේය. බිරිඳ සහ දරුවෝ ඕස්ට්‍රේලියාව පිළිබඳ දීප්තිමත් අදහස් සමඟ උන්හ.

**නිමි**